327 වන කාණ්ඩය - 08 වන කලාපය
தொகுதி 327 - இல. 08
Volume 327 - No. 08

2026 ජූනි 26වන සිකුරාදා
2026 யூன் 26, வெள்ளிக்கிழமை
Friday, 26th June, 2026

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

# අන්තර්ගත ප්‍රධාන කරුණු


**නිවේදන:**
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව සහ සෞඛ්‍ය සහ ජනමාධ්‍ය කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව: සාමාජිකයකු ආදේශ කිරීම [තීරුව 1373]
තැනැත්තන් වෙළඳාම පිළිබඳ දැනුවත් කිරීමේ සහ අවබෝධතා වැඩසටහන [තීරුව 1374]
දියවන්නා පොසොන් බැති ගී සරණිය [තීරුව 1374]

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු** [තීරු 1382-1415]

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**
ශ්‍රීලන්කන් ගුවන් සේවය සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග [තීරුව 1415]
මන්නාරම මහ රෝහල සඳහා CT Scan යන්ත්‍රයක් ලබාදීම [තීරුව 1417]

**හජ් වන්දනාකරුවන් මුහුණ දුන් දුෂ්කරතා:**
බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගේ ප්‍රකාශය [තීරුව 1421]

**ශ්‍රී ලංකා විදුලිබල පනත:**
නියමය [තීරුව 1427-1488]

**කල්තැබීමේ යෝජනාව:**
මත්ද්‍රව්‍ය උවදුරට එරෙහිව සටන් කිරීම [තීරු 1491-1549]

**ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු** [තීරුව 1550]


# பிரதான உள்ளடக்கம்


**அறிவிப்புகள்:**
கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழு மற்றும் சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழு: உறுப்பினர் பதிலீடு [ப: 1373]
மனித விற்பனை குறித்த விளக்கமளித்தல் மற்றும் விழிப்புணர்வு நிகழ்ச்சி [ப: 1374]
தியவன்னா பொசொன் பக்திப் பாடல் சங்கமம் [ப: 1374]

**வினாக்களுக்கு வாய்மூல விடைகள்** [ப: 1382-1415]

**தனி அறிவித்தல் மூல வினா:**
ஸ்ரீலங்கன் விமான சேவை தொடர்பான எதிர்கால நடவடிக்கைகள் [ப: 1415]
மன்னார் பொது வைத்தியசாலைக்கு CT Scan இயந்திரம் வழங்கல் [ப: 1417]

**'ஹஜ்' யாத்திரிகர்கள் எதிர்கொண்ட சிரமங்கள்:**
புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சரினது கூற்று [ப: 1421]

**இலங்கை மின்சாரச் சட்டம்:**
கட்டளை [ப: 1427-1488]

**ஒத்திவைப்புப் பிரேரணை:**
போதைப்பொருள் அச்சுறுத்தலை எதிர்த்துப் போராடுதல் [ப: 1491-1549]

**வினாக்களுக்கு எழுத்துமூல விடைகள்** [ப: 1550]


# PRINCIPAL CONTENTS


ANNOUNCEMENTS:
Ministerial Consultative Committee on Education, Higher Education and Vocational Education and Ministerial Consultative Committee on Health and Mass Media: Substitution of Member [Col. 1373]
Policy Briefing and Awareness Programme on Human Trafficking [Col. 1374]
Diyawanna Poson Bhathi Gee Saraniya [Col. 1374]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 1382-1415]

QUESTION BY PRIVATE NOTICE:
Future Measures in Relation to SriLankan Airlines [Col. 1415]
Provision of CT Scanner for General Hospital, Mannar [Col. 1417]

HARDSHIPS FACED BY HAJJ PILGRIMS:
Statement by Minister of Buddhasasana, Religious and Cultural Affairs [Col. 1421]

SRI LANKA ELECTRICITY ACT:
Order [Cols. 1427-1488]

ADJOURNMENT MOTION:
Combatting the Drug Menace [Cols. 1491-1549]

WRITTEN ANSWERS TO QUESTIONS [Col. 1550]

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2026 ජූනි 26වන සිකුරාදා***
*2026 யூன் 26, வெள்ளிக்கிழமை*
*Friday, 26th June, 2026*

**පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය. නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] මූලාසනාරූඪ විය.**

பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது. பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.30 a.m., MR. DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] in the Chair.

## නිවේදන
## அறிவிப்புகள்
## ANNOUNCEMENTS

### අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව සහ සෞඛ්‍ය සහ ජනමාධ්‍ය කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව: සාමාජිකයකු ආදේශ කිරීම
### கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழு மற்றும் சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழு: உறுப்பினர் பதிலீடு
### MINISTERIAL CONSULTATIVE COMMITTEE ON EDUCATION, HIGHER EDUCATION AND VOCATIONAL EDUCATION AND MINISTERIAL CONSULTATIVE COMMITTEE ON HEALTH AND MASS MEDIA: SUBSTITUTION OF MEMBER

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

I wish to inform that the Hon. Thahir Marrikkar, Member of Parliament, has been nominated to serve in the Ministerial Consultative Committee on Education, Higher Education and Vocational Education and the Ministerial Consultative Committee on Health and Mass Media by the Committee of Selection on 25th June, 2026, in terms of the provisions of Standing Order No. 130(3) of the Parliament, to fill the vacancies occurred due to the resignation of the Hon. M. A. M. Thahir from the memberships of those two Ministerial Consultative Committees.



## II

### තැනැත්තන් වෙළඳාම පිළිබඳ දැනුවත් කිරීමේ සහ අවබෝධතා වැඩසටහන
### மனித விற்பனை குறித்த விளக்கமளித்தல் மற்றும் விழிப்புணர்வு நிகழ்ச்சி
### POLICY BRIEFING AND AWARENESS PROGRAMME ON HUMAN TRAFFICKING

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

I wish to kindly inform all the Hon. Members of Parliament that a “Policy Briefing and Awareness Programme on Human Trafficking” for Hon. Members of Parliament will be held today, Friday, 26th June, 2026, from 11.30 a.m. to 1.30 p.m. in Committee Room No. 01 of Parliament with the participation of resource persons from the National Anti-Human Trafficking Task Force functioning under the Ministry of Defence.

## III

### දියවන්නා පොසොන් බැති ගී සරණිය
### தியவன்னா பொசொன் பக்திப் பாடல் சங்கமம்
### DIYAWANNA POSON BHATHI GEE SARANIYA

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

I wish to inform you that arrangements have been made to hold the “Diyawanna Poson Bhathi Gee Saraniya” jointly organized by the Parliamentary Staff of Sri Lanka and the Parliamentary Staff Buddhist Association near Copper Door of Parliament under the patronage of the Hon. Speaker to celebrate the Poson festival on Tuesday, 30th June, 2026 from 3.00 p.m. to 5.00 p.m.

I kindly invite all Hon. Members of Parliament to attend the event.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු අනුර කරුණාතිලක මහතා (වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ බලශක්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு அனுர கருணாதிலக்க - துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் வலுசக்தி அமைச்சரும்)
(The Hon. Anura Karunathilaka - Minister of Ports and Civil Aviation and Minister of Energy)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මම පහත සඳහන් වාර්තාව සහ ප්‍රකාශය ඉදිරිපත් කරමි.

(i) 2025 මූල්‍ය වර්ෂය සඳහා රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලයේ වාර්ෂික ණය කළමනාකරණ වාර්තාව; සහ

[ගරු අනුර කරුණාතිලක මහතා]

(ii) 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 11 වගන්තිය ප්‍රකාරව, 2027 වර්ෂය සඳහා මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය.

මෙම වාර්තාව සහ ප්‍රකාශය රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මම 2024 වර්ෂය සඳහා ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සහ ගිණුම් ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව අධ්‍යාපනය, ශ්‍රම බලකාය සහ මානව ප්‍රාග්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2025 වර්ෂය සඳහා තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව; සහ

(ii) 2025 වර්ෂය සඳහා කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයේ කාර්ය සාධන වාර්තාව.

මෙම වාර්තා ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මම රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119 (4) ප්‍රකාරව, නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු අනුර කරුණාතිලක ඇමතිතුමා විසින් ඉදිරිපත් කරන ලද 2027 වර්ෂය සඳහා වන මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් කරන්න මම කැමතියි. ඒ අනුව, 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 11 වගන්තිය ප්‍රකාරව සකස් කරන ලද 2027 වර්ෂය සඳහා වන මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය ගරු මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා වෙනුවෙන් මම අද පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ප්‍රකාශයට පත් කරනවා. මෙම පනත යටතේ සෑම වර්ෂයකම ජූනි මාසයේ 30වැනි දින හෝ ඊට පෙර මුදල් අමාත්‍යවරයා විසින් අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලත් මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු වෙනවා. ඒ අනුව 2027 වර්ෂය සඳහා වන මෙම මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය සඳහා පසුගිය ජූනි මාසයේ 22වැනි දින අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගත්තා. ඒ අනුව අද දින මම මෙම වාර්තාව මේ ගරු සභාවට ඉදිරිපත් කරනවා.

මෙම ප්‍රකාශය ප්‍රධාන කොටස් දෙකකින් සමන්විත වෙනවා. පළමු කොටසේ සඳහන් වෙන්නේ 2027 වර්ෂය සඳහා වන මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශයයි. ඒ අනුව ඉදිරි වසර පහක කාල සීමාවක් සඳහා රජයේ මධ්‍ය කාලීන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති, අරමුණු සහ ප්‍රමුඛතා පිළිබඳව ක්‍රමෝපාය ප්‍රකාශය තුළ ඉදිරිපත් කරනවා.

2026 වසරේ සිට 2031 වසර දක්වා වූ කාලය සඳහා මධ්‍ය කාලීන මූල්‍ය රාමුව මේ ප්‍රකාශය තුළ ඇතුළත් වන අතර, රාජ්‍ය ණය තිරසර මට්ටමකට ගෙන ඒම, ප්‍රාථමික අතිරික්තයක් පවත්වාගෙන යාම, රාජ්‍ය ආදායම් ශක්තිමත් කිරීම, වියදම් විචක්ෂණශීලී ලෙස කළමනාකරණය කිරීම සහ ආර්ථික වර්ධනය සඳහා අවශ්‍ය රාජ්‍ය ආයෝජනය ලබා දී ප්‍රවර්ධනය කිරීම සඳහා වූ ඉලක්ක හා ප්‍රතිපත්ති මෙහි සඳහන් වෙනවා. මෙම මධ්‍ය කාලීන මූල්‍ය රාමුව සෑම වර්ෂයකම යාවත්කාලීන කරන අතර, එය ඉදිරි වර්ෂ පහක කාලයක් සඳහා අදාළ වෙනවා. රාජ්‍ය මූල්‍ය සැලසුම්කරණයේ පාරදෘශ්‍යභාවය, වගවීම සහ පූර්ව සැලසුම්කරණය තවදුරටත් ශක්තිමත් කිරීම තමයි මෙහි ප්‍රධාන අරමුණ වන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම ලේඛනයේ දෙවැනි කොටසෙන් වෙන්නේ මූල්‍ය අවදානම් පිළිබඳ ප්‍රකාශය ඉදිරිපත් කිරීමයි. ඒ අනුව රජය විසින් අපේක්ෂා කරනු ලබන රාජ්‍ය මූල්‍ය ඉලක්කයන්ට බලපෑම් කළ හැකි අවදානම් සාධක හඳුනාගෙන ඒවා විශ්ලේෂණය කරලා තිබෙනවා. විශේෂයෙන්ම සාර්ව ආර්ථික අවිනිශ්චිතතාව හේතුවෙන් පැන නඟින මූල්‍ය අවදානම්, රාජ්‍ය ව්‍යවසායන්ගෙන් පැන නඟින මූල්‍ය අවදානම්, රාජ්‍ය ණය සහ රාජ්‍ය ඇපකර සම්බන්ධ මූල්‍ය අවදානම්, ස්වාභාවික ආපදා සහ දේශගුණික විපර්යාස හේතුවෙන් ඇතිවිය හැකි මූල්‍ය බලපෑම්, රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්ව ව්‍යාපෘති යටතේ ඇති විය හැකි බලපෑම් පිළිබඳව මෙම ප්‍රකාශයේ විස්තරාත්මකව සඳහන් වෙනවා.

මෙම මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය, රාජ්‍ය මූල්‍ය අවදානම් පිළිබඳ ප්‍රකාශය මහජනතාවගේ දැනගැනීම සඳහා, වැඩිදුර අදහස් ලබා ගැනීම සඳහා සහ සංවාද සඳහා මුදල්, ක්‍රම සම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවියේ අද දින ප්‍රසිද්ධියට පත් කරනවා. 2027 වර්ෂය සඳහා වූ මෙම ප්‍රකාශය, 2027 අය වැය සකස් කිරීම සඳහා මධ්‍යකාලීන මූල්‍ය රාමුව සපයන අතර, එය රජයේ මධ්‍යකාලීන මූල්‍ය ප්‍රතිපත්ති, ඉලක්ක සහ ප්‍රමුඛතා පිළිබඳව

පාර්ලිමේන්තුව සහ මහජනතාව දැනුවත් කිරීම එහි ප්‍රධාන අරමුණක්. ඒ වාගේම ශ්‍රී ලංකාව මුහුණ දුන් ආර්ථික අර්බුදයෙන් පසු රාජ්‍ය මූල්‍ය ස්ථාවරත්වය යළි ගොඩනැඟීම, රාජ්‍ය ණය තිරසර මට්ටමකට ගෙන ඒම, රජයේ ආදායම් වැඩිදියුණු කිරීම, වියදම් විචක්ෂණශීලී ලෙස කළමනාකරණය කිරීම සහ ආර්ථික වර්ධනයට අවශ්‍ය රාජ්‍ය ආයෝජන ප්‍රවර්ධනය කිරීම මෙහි මූලික අරමුණු වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නිසි කළමනාකාරිත්වයකින් යුතුව ආර්ථිකය හැසිරවීම හේතුවෙන් 2025 වර්ෂයේදී අපට සියයට 5ක ආර්ථික වර්ධනයක් පවත්වා ගන්න පුළුවන් වුණා. ඒ වාගේම රාජ්‍ය ආදායම, දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් විධියට සියයට 16.7ක් ලෙස පවත්වා ගන්න පුළුවන් වුණා. මෑත කාලීනව අපි මුහුණ දුන් "දිට්වා" සුළි කුණාටුවේ අහිතකර බලපෑම් සහ වර්තමානයේ අපට මුහුණ දෙන්න සිදුවුණු මැද පෙරදිග ඇති වූ අර්බුදය හමුවේ, ගෝලීය සහ දේශීය අභියෝග තත්ත්වයන්ට ඉතාම සාර්ථකව මුහුණ දීමට අපට හැකි වුයේ, අප රජයේ විචක්ෂණශීලී ප්‍රතිපත්ති හා යහපත් ආණ්ඩුකරණය පිළිබඳ ගොඩනගා ගත්ත ප්‍රතිපත්ති මත සහ ඒ ඔරොත්තු දීමේ හැකියාව අපේ ප්‍රතිපත්ති අතර පෙන්නුම් කරපු නිසායි.

විශේෂයෙන්ම මේ සුළි කුණාටුව හේතුවෙන් සිදුවූ ව්‍යසනය මඟින් ඇති වෙච්ච බලපෑම වෙනුවෙන්, විශේෂයෙන් ආපදාවට ලක් වූ ප්‍රදේශවල ජීවත් වෙන මිනිස්සු වෙනුවෙන්, ඒ ප්‍රදේශ යථා තත්ත්වයට පත් කිරීමට අදාළ ඒ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා අප විසින් 2026 වර්ෂයට රුපියල් බිලියන 500ක අතිරේක ප්‍රතිපාදනයක්ද ලබා දුන්නා. ඒ වාගේම මෑත කාලීන මැද පෙරදිග යුදමය තත්ත්වය හමුවේ ලංකාවේ ආර්ථිකයට ඇති වෙච්ච බලපෑමට මුහුණ දීම සඳහා විශේෂයෙන්ම රුපියල් බිලියන 100ක මූල්‍ය සහන පැකේජයක් ලබාදීලා කඩිනමින් එය ක්‍රියාවට නැංවීමටත් රජය පියවර අරගෙන තිබෙනවා. එවැනි සහන සලසන අතරතුරේදීම රටේ ආර්ථික ස්ථාවරත්වය ආරක්ෂා කරමින්, 2026 පළමු කාර්තුව තුළ සියයට 5.1ක සාධනීය ආර්ථික වර්ධනයක් අත්පත් කර ගැනීමට සහ පවත්වා ගැනීමට අපි සමත් වෙලා තිබෙනවා.

මේ වසරේ මැයි මාසය වන විට උද්ධමනය සියයට 5.5ක මට්ටමකට පාලනය කර ගැනීමටත් අපට හැකි වෙලා තිබෙනවා. එමෙන්ම මැයි මාසය අවසාන වන විට අපේ දළ නිල සංචිත වත්කම් ඇමෙරිකානු ඩොලර් බිලියන 6.8ක ඉහළ මට්ටමක පවත්වා ගැනීමටත් අපට පුළුවන් වෙලා තිබෙනවා. ඒ වාගේම විදෙස්ගත ප්‍රජාව තුළ ඇති අඛණ්ඩ විශ්වාසය තවදුරටත් තහවුරු කරමින් විදේශ ශ්‍රමික ප්‍රේෂණ පසුගිය වසරේ පළමු මාස පහට සාපේක්ෂව සියයට 26කින් කැපී පෙනෙන ලෙස වර්ධනය වෙලා තිබෙනවා.

රාජ්‍ය මූල්‍ය අංශයේ ක්‍රියාකාරිත්වය පිළිබඳව සලකා බැලීමේදී, 2025 වසරේ දී දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් විධියට 5.4ක ප්‍රාථමික අතිරික්තයක් වාර්තා කරමින් ශ්‍රී ලංකා ඉතිහාසයේ ඉහළම ප්‍රාථමික අතිරික්තය අත්පත් කර ගන්න අපට පුළුවන් වෙලා තිබෙනවා. එහි ප්‍රතිඵලයක් ලෙස රාජ්‍ය ණය අනුපාතය ද 2024ට සාපේක්ෂව 2025 වර්ෂයේදී පහළ වැටී තිබෙනවා. එය අප ගෙන යන රාජ්‍ය මූල්‍ය ප්‍රතිසංස්කරණවල සාර්ථකත්වය පිළිබඳ සාක්ෂියක් වන අතර, එම සාර්ථකත්වය තවදුරටත් පවත්වා ගනිමින් 2026 වසරේ ජනවාරි මාසයේ සිට මැයි මාසය දක්වා කාලය තුළ සමස්ත ආදායම, පසුගිය වසරේ එම කාලයට සාපේක්ෂව සියයට 30.6ක කැපී පෙනෙන වර්ධනයක් සනිටුහන් කරනවා. බදු පරිපාලනය විධිමත් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස 2026 වර්ෂයේ මැයි මාසයේ අග වන විට රුපියල් බිලියන 2,536.8ක සමස්ත ආදායමක් අපි උපයාගෙන තිබෙනවා. එහිදී දේශීය ආදායම් දෙපාර්තමේන්තුව රුපියල් බිලියන 1,096ක් ද, ශ්‍රී ලංකා රේගුව රුපියල් බිලියන 1,079ක් ද ලෙස ඉහළ ආදායම් වාර්තා කර තිබෙනවා. මෙහිදී වඩාත්ම වැදගත් වන කරුණ තමයි, වියදම් ඉතාම දැඩි කළමනාකාරිත්වයකින් පාලනය කිරීමෙන් අපි පෙන්වනු ලබන දැඩි මූල්‍ය විනය හේතුවෙන් 2025 වර්ෂයේ දී පැවැති අය වැය හිඟය වෙනුවට 2026 ජනවාරි-මැයි කාල සීමාව තුළ රුපියල් බිලියන 197.4ක අතිරික්තයක් සහිත අය වැය ශේෂයක් වාර්තා කර තිබීම. ඒ අනුව ඉලක්කගත ප්‍රමාණයෙන් සියයට 314ක, එනම් රුපියල් බිලියන 1,131ක අතිරික්තයක් ළඟා කර ගැනීමට අපට හැකිවෙලා තිබෙනවා. 2027 මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය මඟින් හඳුන්වා දෙන ප්‍රතිසංස්කරණ තුළින්, ඉදිරි වර්ෂවලදී ද අප රටේ රාජ්‍ය මූල්‍ය ස්ථාවරත්වය තවදුරටත් තිරසර ලෙස පවත්වා ගනිමින් මේ ආර්ථික වර්ධනය පවත්වාගෙන යනවා.

ඒ අනුව, 2027-2031 කාලය සඳහා රජය විසින් පහත සඳහන් ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ඉලක්ක පවත්වාගෙන යාමට අපේක්ෂා කරනවා.

- 2032 වසර වන විට රාජ්‍ය ණය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් විධියට සියයට 95ට අඩු මට්ටමකට ගෙන ඒම.
- 2027 වසරේ සිට අවම වශයෙන් දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 2.6ක ප්‍රාථමික අතිරික්තයක් පවත්වාගෙන යෑම
- රජයේ ආදායම දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 15ට වැඩි මට්ටමක පවත්වා ගෙන යෑම
- විශේෂයෙන්ම 2027 වසරේදී රුපියල් බිලියන 5,064ක නාමික අගයක් සහිතව, ප්‍රාථමික වියදම් දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 13ට අඩු මට්ටමක පවත්වා ගෙන යෑම
- 2027 වසරේ සිට රාජ්‍ය ආයෝජන දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 4.4ක මට්ටමක පවත්වා ගෙන යෑමට කටයුතු කිරීම
- අය වැය හිඟය මධ්‍ය කාලීනව දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 5ට වඩා අඩු මට්ටමකින් පවත්වා ගෙන යෑම කියන කාරණා තමයි සමස්තයක් වශයෙන් තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය මඟින්, ඉහත දක්වා ඇති පරිදි ණය තිරසරභාවය අත්පත් කර ගැනීම, මූල්‍ය විනය පවත්වා ගෙන යෑම, විනිවිදභාවය, වගවීම සහ දිගු කාලීන ආර්ථික ස්ථාවරත්වය තහවුරු කිරීමට අපි අපේක්ෂා කරනවා. ඒ වාගේම, අනාගත පරපුර මත පීඩනයක් ඇති නොවන පරිදි රාජ්‍ය මූල්‍ය කළමනාකරණය ශක්තිමත් කිරීම සඳහා මෙම මධ්‍ය කාලීන මූල්‍ය රාමුව අපට මහ පෙන්වීමක් ලබා දෙන බව සඳහන් කරන්න කැමැතියි. ඒ අනුව, රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 11වන වගන්තියට අනුව සකස් කරන ලද 2027 මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය ගරු සභාවේ අවධානය සඳහා මෙයින් ඉදිරිපත් කරනු ලබනවා. බොහොම ස්තුතියි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Leader of the Opposition?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු අමාත්‍යවරයා රටේ මූල්‍ය ක්‍රමෝපාය, මූල්‍ය ස්ථාවරත්වය පිළිබඳව වාර්තාවක් ඉදිරිපත් කළා. ඇත්ත වශයෙන්ම ඒ වාර්තාවේ අඩංගු කරුණු කාරණා පිළිබඳව අප තුළ පරස්පර මත තිබෙනවා. විශේෂයෙන්ම ප්‍රාථමික අතිරික්තය මේ රට ලබා ගත්තේ ජනතාව මත බදු බර පටවලා. රාජ්‍ය ආදායම ඉහළ ප්‍රතිශතයක් ලබා ගත්තේ බදු බර පටවලා, සුබසාධනය කප්පාදු කරලා, ප්‍රාග්ධන වියදම් කප්පාදු කරලා. පැහැදිලිවම මේ මොහොත වන විටත් ඇමෙරිකානු ඩොලර් මිලියන 2.5ක, එහෙම නැත්නම් ලක්ෂ 25ක විදේශ ණය ගෙවීමේ වාරිකයට මොකක්ද වුණේ කියන එක ගැන පැහැදිලි ප්‍රකාශයක් මේ පාර්ලිමේන්තු සභාවට ඉදිරිපත් කරලා නැහැ. ඇත්ත වශයෙන්ම එතුමා ඉදිරිපත් කළ වාර්තාවේ කරුණු කාරණා රැසක් පිළිබඳව අපට ගැටලු තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Leader of the Opposition, we are now proceeding with Presentation of Papers.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

මම ඉල්ලීමක් කරනවා, කරුණාකර ඒ වාර්තාව පදනම් කරගෙන පාර්ලිමේන්තු විවාදයක් අපට ලබා දෙන්න කියලා. ඒ පිළිබඳව පාර්ලිමේන්තු විවාදයක් අපට අනිවාර්යයෙන්ම අවශ්‍යයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට තව පොඩි වේලාවක් දෙන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Sajith Premadasa, shall we move on? There are two more presentations of Papers to be made.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

තවත් පුංචි අවස්ථාවක් දෙන්න. තවත් points දෙකයි. පළමුවෙනි එක මේකයි. මම ඊයේත් මතු කළා, මේ ප්‍රශ්නය. මේ මොහොත වන විට ඩෙංගු ප්‍රශ්නය නිසා 49,000ක් දෙනා විපතට පත් වෙලා සිටිනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Leader of the Opposition, that was taken up yesterday. Shall we move with the presentation of Papers?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ඒ අය අතරින් 25,000ක්ම බස්නාහිර පළාතේ. ඒ පිළිබඳව පියවරක් ගන්න ඕනෑ.

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Yes, Hon. Minister?

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ වෙලාවේ තිබෙන්නේ, ලිපිලේඛනාදිය ඉදිරිපත් කිරීම. මෙහෙම සම්ප්‍රදායයක් පාර්ලිමේන්තුවේ නැහැ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Minister of Plantation and Community Infrastructure.

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)

මා හිතන විධියට, අපි පාර්ලිමේන්තුවේ සාමාන්‍ය වැඩ කටයුතු ආරම්භ කරමින් ඉස්සරහට යන්න ඕනෑ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Yes, Hon. Leader of the Opposition? I did listen to you.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

Sir, it is under Standing Order No. 92(1). මා මතු කරන්න හැදුවේ කරුණු දෙකයි. 49,000ක් දෙනා ඩෙංගු උවදුර නිසා අද විපතට, ආපදාවට පත් වෙලා සිටිනවා. ඒ අය අතරින් 25,000ක්ම බස්නාහිර පළාතේ. ගරු නියෝජ්‍ය කථානායකතුමාත් බස්නාහිර පළාතේ. ඒ නිසා ඒ පිළිබඳව රජය මීට වඩා සැලකිල්ලක් දක්වන්නට ඕනෑ.

අද මේ පාර්ලිමේන්තුව තුළ විශේෂ කාරක සභාවක් ක්‍රියාත්මක වෙනවා, පළාත් සභා ඡන්දය ගැන. ඇයි පළාත් සභා ඡන්දය පවත්වන්නේ නැත්තේ? *[බාධා කිරීමක්]* ඇයි පළාත් සභා ඡන්දය පවත්වන්නේ නැත්තේ?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Leader of the Opposition, shall we proceed with the Presentation of Papers? Next, the Hon. Minister of Plantation and Community Infrastructure. *[Interruption]*

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්ථාවර නියෝග 92(1) යටතේ තිබෙන්නේ ඊට වඩා සම්පූර්ණයෙන් වෙනස් කාරණයක්. මොකක් හරි ස්ථාවර නියෝගයක අංකයක් කියලා මෙතුමාට

එහෙම නැගිටින්න බැහැ. *[බාධා කිරීම්]* අසත්‍ය කියන්න එපා. මොනවාද මේ? ස්ථාවර නියෝග හොඳට කියවන්න, විපක්ෂ නායකතුමා. නිකම් කටට ආවාට ස්ථාවර නියෝගයක අංකයක් කියන්න එපා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Back to Presentation of Papers. Hon. Minister of Plantation and Community Infrastructure, please.

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා වෙනුවෙන් මම 2023 වර්ෂය සඳහා සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගමේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2025 වර්ෂය සඳහා ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව; සහ

(ii) 2025 වර්ෂය සඳහා රත්නපුර සහ මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල වාර්ෂික කාර්ය සාධන හා ගිණුම් වාර්තා.

මෙම වාර්තා රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා (අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன - கல்வி, உயர் கல்விப் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Madhura Senevirathna - Deputy Minister of Education and Higher Education)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පානදුර, වෑකඩ, හොරණ පාර, අංක 117 යන ලිපිනයෙහි පදිංචි ඩබ්ලිව්.ටී.ඩී. ප්‍රනාන්දු මෙනෙවියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. D.V. Chanaka. - *[Not in the Chamber.]*

***ඉදිරිපත් කරන ලද පෙත්සම මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுவை பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petition ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Question No. 1 - 193/2024 - (1), the Hon. Nalin Bandara Jayamaha. - *[Not in the Chamber.]*

### විශේෂ පාර්ලිමේන්තු ඔම්බුඩ්ස්මන්වරයකු පත් කිරීම: ප්‍රගතිය
### விசேட பாராளுமன்ற ஒம்புட்ஸ்மன் ஒருவரை நியமித்தல்: முன்னேற்றம்
### APPOINTMENT OF SPECIAL PARLIAMENTARY OMBUDSMAN: PROGRESS

232/2024

**2. ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) නීතිපති දෙපාර්තමේන්තුවේ කටයුතු සම්බන්ධයෙන් අගතියට පත්වන පාර්ශ්වයට සිය දුක්ගැනවිලි ඉදිරිපත් කිරීමට හැකි වන පරිදි 'විශේෂ පාර්ලිමේන්තු ඔම්බුඩ්ස්මන්වරයකු' පත් කිරීමට 'පොහොසත් රටක්-ලස්සන ජීවිතයක්' ප්‍රතිපත්ති ප්‍රකාශය මඟින් පොරොන්දුවී තිබේද;

(ii) එසේ නම්, එම පොරොන්දු ප්‍රකාරව පත් කර ඇති ඔම්බුඩ්ස්මන්වරයාගේ නම සහ කාර්යාල ලිපිනය කවරේද;

(iii) මෙතෙක් එම පත්කිරීම සිදුකර නොමැති නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) சட்டத்துறை தலைமையதிபதி திணைக்களத்தின் நடவடிக்கைகள் காரணமாகப் பாதிக்கப்படும் தரப்பினர் தமது மனக்குறைகளை முன்வைக்கக் கூடியவாறு "விசேட பாராளுமன்ற ஒம்புட்ஸ்மன் ஒருவரை" நியமிப்பதற்கு "வளமான நாடு-அழகான வாழ்க்கை" கொள்கைப் பிரகடனத்தில் வாக்குறுதி அளிக்கப்பட்டுள்ளதா என்பதையும்;

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

(ii) அவ்வாறாயின், அந்த வாக்குறுதியின் பிரகாரம் நியமிக்கப்பட்டுள்ள ஒம்புட்ஸ்மனின் பெயர் மற்றும் அலுவலக முகவரி யாது என்பதையும்;

(iii) இதுவரையில் அந்த நியமனம் மேற்கொள்ளப்படவில்லை எனின், அதற்கான காரணங்கள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Justice and National Integration:

(a) Will he inform this House -

(i) whether the policy statement "A Thriving Nation - A Beautiful Life" pledged to appoint a "Special Parliamentary Ombudsman" to enable the aggrieved parties to present their grievances regarding the activities of the Attorney-General's Department;

(ii) if so, the name and the office address of the Ombudsman appointed in keeping with aforesaid promise; and

(iii) the reasons, if the aforesaid appointment has not been made yet?

(b) If not, why?

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

(ii) දක්වා ඇති ලෙස ඔම්බුඩ්ස්මන්වරයෙකු මේ අවස්ථාවේදී පත් කොට නොමැත.

(iii) "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශය යටතේ නීතිපති දෙපාර්තමේන්තුව ශක්තිමත් කිරීම යන උපායමාර්ගික දිශානතිය සඳහා ප්‍රධාන ක්‍රියාකාරකම් පහක් යෝජනා කර ඇත. ඒ යටතේ මේ වන විට, අධිකරණ පද්ධතිය තුළ සිදුවන ප්‍රමාදය තුරන් කිරීමේ යාන්ත්‍රණයක් ලෙස රජය වෙනුවෙන් නඩු කටයුතු මෙහෙයවීමේ ස්වාධීන යාන්ත්‍රණයක් ලෙස ස්වාධීන රජයේ අභිචෝදක කාර්යාලයක් ස්ථාපිත කිරීම සඳහා නව නීතියක් හඳුන්වා දීම පිළිබඳව අධ්‍යයනය කර වාර්තා කිරීමටත්, අවශ්‍ය අවස්ථාවල දී දැනට බලපවත්නා නීති සඳහා අවශ්‍ය සංශෝධන හඳුන්වා දීම පිණිස නිර්දේශ ඉදිරිපත් කිරීමටත් ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු, ජනාධිපති නීතිඥ යසන්ත කෝදාගොඩ මැතිතුමාගේ සභාපතිත්වයෙන් යුතු තාක්ෂණික විශේෂඥ කමිටුවක් පත් කර ඇත.

එසේම රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශයේ ඔම්බුඩ්ස්මන්වරයකු පත් කිරීමට යෝජනා කර ඇත්තේ නීතිපති දෙපාර්තමේන්තුවේ කටයුතු පිළිබඳ අගතියට පත්වන පාර්ශ්වයට සිය දුක්ගැනවිලි ඉදිරිපත් කිරීම සඳහා ය.

කෙසේ වෙතත්, ප්‍රතිපත්ති ප්‍රකාශයේ සඳහන් මෙම ක්‍රියාකාරකම් සියල්ල එකිනෙකට අන්තර් සම්බන්ධිත වේ. එබැවින්, එක් පොරොන්දුවකට අදාළව යම් පියවරක් ක්‍රියාත්මක කිරීමේදී එය සිදු කරනු ලබන ආකාරය මත අනෙකුත් පොරොන්දු මඟින් බලාපොරොත්තු වනු ලබන අවශ්‍යතාවන්ට සහ කර්තව්‍යයන්ට බලපෑමක් සිදු විය හැකිය.

එවැනි අවස්ථාවකදී එවැනි බලපෑමට ලක් වන, එහෙත් ක්‍රියාත්මක කර නොමැති පොරොන්දු සම්බන්ධයෙන් පියවර ගැනීමට පෙර, එහි අවශ්‍යතාව පිළිබඳව නැවත තක්සේරුවක් සිදු කළ යුතු වේ.

කරුණු එසේ හෙයින්, මෙම අවස්ථාවේදී නීතිපති දෙපාර්තමේන්තුව සහ රජයේ ප්‍රධාන අභිචෝදක කාර්යාලයක් පිහිටුවීම සම්බන්ධයෙන් වන ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම කුමන ආකාරයෙන් සිදු කරන්නේද යන්න පිළිබඳව රජය විසින් තීරණය කිරීමෙන් පසු එය ක්‍රියාත්මක කිරීමේදී මෙම ප්‍රශ්නයේ දක්වා ඇති ඔම්බුඩ්ස්මන්වරයෙකු පත් කිරීමේ අවශ්‍යතාවත් ඔම්බුඩ්ස්මන්වරයාගේ බලතල හා කර්තව්‍යයන් පිළිබඳවත් නැවත සලකා බැලිය යුතු වන හෙයින් මෙතෙක් එම පත් කිරීම සිදු කිරීමට රජය තීරණය කොට නොමැත.

(ආ) පැන නොනඟී.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

නීතිපති දෙපාර්තමේන්තුවේ කටයුතුවලදී අගතියට පත්වන පාර්ශ්වයන්ට සිය දුක්ගැනවිලි ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි විශේෂ පාර්ලිමේන්තු ඔම්බුඩ්ස්මන්වරයෙක් පත් කිරීමට "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" ප්‍රතිපත්ති ප්‍රකාශනයෙන් පොරොන්දු වෙලා තිබුණා. පාර්ලිමේන්තු ඔම්බුඩ්ස්මන්වරයා පාර්ලිමේන්තුව ආශ්‍රිතව, පාර්ලිමේන්තුවට අනුයුක්තව ඇති කරන ධුරයක්. එතකොට නීතිපති දෙපාර්තමේන්තුව වාගේ ඉහළ ස්වාධීනත්වයක් අපේක්ෂා කරන ආයතනයක තීරණයක් පිළිබඳව නැවත සලකා බලන්න, යම් අභියෝගයක් කරන්න, සොයා බලන්න හැකියාව ලැබෙන්න ඕනෑය කියන පැහැදිලි මූලධර්මය ඉතා වැදගත් මූලධර්මයක්. ඒක වර්තමාන රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ තිබුණා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

අද වෙනකල් මේ විශේෂ පාර්ලිමේන්තු ඔම්බුඩ්ස්මන්වරයා පත් කිරීම සම්බන්ධව මොනම දෙයක්වත් වෙලා නැහැ. මේ ප්‍රතිපත්තිය පිළිබඳ කරුණු කැබිනට් මණ්ඩලයට ගිහිල්ලා නැහැ, කෙටුම්පතක් සකස් කරලා නැහැ, ඒ පිළිබඳ සාකච්ඡාවක් වෙලා නැහැ. පාර්ලිමේන්තුව තුළ හෝ අද මේ ප්‍රශ්නය මම මතු කරන කල් කිසිම දෙයක් වෙලා නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ගරු ඇමතිතුමනි, ප්‍රතිපත්ති ප්‍රකාශනයට මෙවැනි බරපතළ කාරණයක් ඇතුළත් කරන කොට ඒ ගැන සලකා බැලීම වැදගත් වෙනවා. අපිත් විශ්වාස කරනවා, නීතිපති දෙපාර්තමේන්තුව තුළ කාර්යක්ෂමතාව ඇති කිරීමට වැදගත්වන ක්‍රියාමාර්ග අපි ගත යුතුයි කියලා. ඒ වාගේම නීතිපති දෙපාර්තමේන්තුව තුළින් පුරවැසියාට යම් ගැටලුවක්, අගතියක් සිදු වෙනවා නම්, නීතිපති දෙපාර්තමේන්තුවේ ස්වාධීනත්වය, ගරුත්වය ආරක්ෂා වන අන්දමට ඒ පිළිබඳව සොයා බැලීමේ ව්‍යුහයක අවශ්‍යතාව නිසා තමයි ඔබතුමන්ලාගේ රජය බලයට පත් වීමේදී මේ ප්‍රතිපත්ති ප්‍රකාශනයට මේ විශේෂ පාර්ලිමේන්තු ඔම්බුඩ්ස්මන්වරයා පිළිබඳ යෝජනාව ඉදිරිපත් කළේ. ගරු ඇමතිතුමනි, ඇයි ඒකට මෙච්චර

පරක්කු? තව මාස කිහිපයකින් ගරු ජනාධිපතිතුමාගේ ධුර කාලයට අවුරුදු දෙකයි. ඇයි ඒකට මෙච්චර කාලයක් ප්‍රමාද වෙන්නේ? මොකක්ද දැන් සැලසුම? මොකක්ද මේ පිළිබඳව තිබෙන මාර්ග සිතියම? මම පිළිගන්නවා, මේ කාරණය අනෙක් දේවල් එක්කත් සම්බන්ධයි කියලා. දැන් ඔම්බුඩ්ස්මන්වරයා සම්බන්ධ සැලැස්මකුත් නැහැ. ඒ වාගේම ඔහු සමඟ බැඳෙන නීතිපති දෙපාර්තමේන්තුවේ ස්වාධීන අභිචෝදක කාර්යාලය පිහිටුවීම පිළිබඳ ප්‍රගතියකුත් නැහැ. මොකක්ද තිබෙන ප්‍රගතිය?

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා අහන කාරණයට අදාළ කරුණු මම ලබා දුන් උත්තරයේම තිබුණා. නමුත් එය පැහැදිලි මදි නිසා මම නැවත පැහැදිලි කරන්නම්.

අපි අභිචෝදක කාර්යාලය පිහිටුවීමේදී බලාපොරොත්තු වන්නේ නීතිපතිවරයාගේ කාර්යභාරය කුමක්ද, අභිචෝදක කාර්යාලයට අපි දෙන බලතල මොනවාද යන්නයි. මේ ඔම්බුඩ්ස්මන්වරයා සම්බන්ධ වෙන්නේ දැනට - වර්තමානයේ - නීතිපතිවරයාගේ බලතල ක්‍රියාත්මක කිරීමේදී අඩුපාඩුවක් වුණොත් ඒ ගැන දුක් ගැනවිලි ඉදිරිපත් කරන්නයි. නමුත් අභිචෝදක කාර්යාලයේ බලතල සහ නීතිපති කාර්යාලයේ බලතල වෙන් කර ගන්නේ නැතුව ඔම්බුඩ්ස්මන්වරයා ස්ථානගත කරන්න ඕනෑ කොයි ආකාරයටද කියන එක හිතා ගන්න බැහැ, මේ මොහොතේ. අන්න ඒ නිසා තමයි අභිචෝදක කාර්යාලයේ බලතල බෙදීම සම්බන්ධයෙන් වූ වාර්තාව ආවාට පසු ඒ ක්‍රමයට අනුව ඔම්බුඩ්ස්මන්වරයා ස්ථානගත කරන්න වෙන්නේ.

අපි දැන් වැඩ කරනවා. වැඩ නොකරනවා නොවෙයි. ඒ අවසාන වාර්තාව නැති එක විතරයි තිබෙන්නේ. ඒක නිසා මොකුත් නොකළා නොවෙයි, කරනවා. නමුත් මේ පියවර ගනිමින් පවතිනවා. ඔම්බුඩ්ස්මන්වරයා පත් නොකරන්න හේතුවයි මම මේ පැහැදිලි කළේ.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, ඔබතුමා හොඳින්ම දන්නවා, මේ රටේ පරිසර දූෂණය පිළිබිඳ විශාලතම අභියෝගය එල්ල වුණේ එක්ස්ප්‍රස් පර්ල් නෞකාව නිසා සිදු වුණු හානිය තුළින් බව. එක්ස්ප්‍රස් පර්ල් නෞකාව නිසා සිදු වුණු පාරිසරික හානිය පිළිබඳව මේ රටේ විද්වත්, වගකිව යුතු පුරවැසියන් රාශියක් විසින්, ගිහි-පැවිදි කණ්ඩායම් ගණනාවක් විසින් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත මූලික අයිතිවාසිකම් නඩු ඉදිරිපත් කළා. ඒ අනුව ගරු ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ඩොලර් බිලියනයක් මූලික වන්දි වශයෙන් ලබා ගැනීමට හැකියාවක් සහිතව, දිගු කාලීන පාරිසරික හානි පියවීම සඳහා වූ සහන ලබා දීමක් පිළිබඳව ගැඹුරු විස්තරාත්මක නඩු තීන්දුවක් දුන්නා. ඒ වාගේම, ඒ නඩු තීන්දුව අනුව නීතිපති දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරිත්වය ගැන කිව්වා. ඒ කියන්නේ, එක්ස්ප්‍රස් පර්ල් නෞකාව සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරිත්වය පිළිබඳව, ස්වාධීනත්වය පිළිබඳව සොයා බැලීමට, ඒ කියන්නේ මේ ප්‍රශ්නයේ අහලා තිබෙන විධියට මේ දුක්ගැනවිලි පිළිබඳව සොයා බැලීමට අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමට පැවරුවා. ඒ වාගේම ඒ සඳහා මුදල් - වන්දි - අය කර ගැනීම පිළිබඳව වෙනම ක්‍රියාමාර්ගයක් යෝජනා කළා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වෙලාවේ මේ පාර්ලිමේන්තුවේ අජිත් මාන්නප්පෙරුම මැතිතුමාගේ සභාපතිත්වයෙන් පැවැති කමිටුවටත් බලපෑම් ආවා. මේ නඩුව ලංකාවේ පවරන්න පුළුවන්කම තියෙද්දි, අධිකරණ බලය ලංකාවට තියෙද්දි, ඒක සිංගප්පූරුවට අරන් ගියේ ඇයි කියන කාරණය පිළිබඳව විමසනකොට ඒ පාර්ලිමේන්තු කමිටුවේ ක්‍රියාකාරිත්වයත්, නීතිපති දෙපාර්තමේන්තුවේ නියෝජිතත්වයත් නතර කළා. නීතිපති දෙපාර්තමේන්තුවේ නියෝජිතයෝ පාර්ලිමේන්තුවට එන එක නතර කළා.

ගරු ඇමතිතුමනි, ඔබතුමා දැක් වූ කරුණුවලට අදාළවයි මම මේ කියන්නේ. ඊයේ මේ රටේ යම් සිදුවීමක් සිද්ධ වුණා. ඒ සිදුවීමට සම්බන්ධ පුද්ගලයනුත් මේ ක්‍රියාවලියට සම්බන්ධයි. ඒ වෙලාවේ නීතිපති දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරිත්වයට, නීතිපති දෙපාර්තමේන්තුවේ ස්වාධීනත්වයට බලපෑම් කරපු පුද්ගලයන් ගැන විමර්ශන කටයුතු තියෙද්දි, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම මේ පිළිබඳව පරීක්ෂණයක් ආරම්භ කරලා තියෙද්දි, එම ශ්‍රේෂ්ඨාධිකරණයම පංච පුද්ගල විනිශ්චය මණ්ඩලයක් දීපු තීන්දුව, ඊට වඩා අඩු ත්‍රිපුද්ගල විනිසුරු මඬුල්ලකින් දීපු තීන්දුවක් මඟින් හදිසියේම අත්හැර දැමුවා, ඒ සම්පූර්ණ ක්‍රියාදාමය. ඒ ගැන මැදිහත් වෙන්න ක්‍රමයක් නැහැ කියලා දැන් ඔබතුමාට කියන්න පුළුවන්.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Ajith P. Perera, would you please finish asking your Question?

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම අවසන් කරන්නම්.

ගරු ඇමතිතුමනි, ශ්‍රේෂ්ඨාධිකරණයේ තීන්දුවට මැදිහත් වෙන්න බැහැ කියලා ඔබතුමාට කියන්න පුළුවන්. නමුත්, රජය හැටියට නීතිපති දෙපාර්තමේන්තුව හා සම්බන්ධව එල්ල වුණු ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවේ තිබුණු නිර්දේශය,- මොකද, ඔබතුමා යටතේ තමයි නීතිපති දෙපාර්තමේන්තුව තිබෙන්නේ. එහි ස්වාධීනත්වය පිළිබඳව, එම දෙපාර්තමේන්තුව ඉතාම අපකීර්තියට පත් වෙන ආකාරයෙන් සිදු වුණු ඒ සිදුවීම පිළිබඳව වගකිව යුත්තේ කවුද, එම පරීක්ෂණ කටයුතුවල ප්‍රගතිය මොකක්ද, ඒ වාගේම මේ නඩුව සිංගප්පූරුවට අරගෙන ගිහිල්ලා සිංගප්පූරුවේදී නඩුව අනාථ කරන්නට දායක වෙච්ච පුද්ගලයන් කවුද කියලා විමර්ශනය කිරීමට රජයේ ඇමතිවරයෙකු වශයෙන් ඔබතුමා කටයුතු කරනවාද?

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ස්ථාවර නියෝග 33 (1)හි දෙවැනි ඡේදයට ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. එහි මෙසේ සඳහන් වෙනවා:

> "එසේ වුව ද, එම අතුරු ප්‍රශ්න මගින් මුල් ප්‍රශ්නයෙහි ඇතුළත් නොවන කාරණා මතු කරනු නොලැබිය යුතු අතර, වාචික පිළිතුරකින් පැන නගින යම් කාරණයක් වඩාත් පැහැදිලි කර ගැනීමේ කාර්යය සඳහා පමණක් විමසනු ලැබිය යුත්තේ ය."

මුල් ප්‍රශ්නයෙන් අහලා තිබෙන්නේ ඔම්බුඩ්ස්මන්වරයා ගැන. දැන් අහන්නේ එක්ස්ප්‍රස් පර්ල් නැව ගැන. *[බාධා කිරීම්]* මම පැහැදිලිව කියනවා, අපට මේවාට උත්තර දෙන්න පුළුවන්. නමුත්, සභාවේ රීති අනුව නිවැරදිව අතුරු ප්‍රශ්න අහන්න කියලා ඉල්ලීමක් කරනවා. මේ පිළිතුරට උත්තර දෙන්න මම බැඳිලා නැහැ.

## 2015 සිට භාණ්ඩ අපනයනය සහ ආනයනය: ආදායම සහ වියදම
## 2015 முதல் பண்டங்களின் ஏற்றுமதியும் இறக்குமதியும்: வருமானமும் செலவினமும்
## EXPORT AND IMPORT OF GOODS SINCE 2015: INCOME AND EXPENDITURE

308/2024

**3.** ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) 2015 වර්ෂයේ සිට මේ දක්වා -

(i) භාණ්ඩ අපනයන වටිනාකම සහ එමඟින් ලැබූ ආදායම;

(ii) භාණ්ඩ ආනයන වටිනාකම සහ ඒ සඳහා වියදම්;

(iii) වෙළඳ ශේෂය;

(iv) දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස අපනයන වටිනාකම;

ශ්‍රී ලංකා රුපියල් සහ ඇමරිකානු ඩොලර් මුදලින් වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) 2015 වර්ෂයේ සිට මේ දක්වා -

(i) ප්‍රධාන කාණ්ඩ 10ක් දක්වමින් සේවා අංශයෙන් අපනයන ඉපැයීම්;

(ii) විදේශීය සේවාවන් සඳහා සිදුකළ ගෙවීම්වල වටිනාකම;

(iii) සේවා වෙළඳ ශේෂය;

(iv) දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස සේවා;

(v) ගෙවුම් ශේෂ අතිරික්තය හෝ හිඟය;

ශ්‍රී ලංකා රුපියල් සහ ඇමරිකානු ඩොලර් මුදලින් වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) (i) ගෙවුම් ශේෂ හිඟය වැඩිදියුණු කිරීම සඳහා ඉලක්ක කර ඇති ක්ෂේත්‍ර කවරේද;

(ii) (අ)(i) හි සඳහන් අපනයන අයිතම 15 කවරේද;

(iii) පසුගිය වර්ෂ 10 තුළ මෙරටට ගෙන්වා නොමැති, විදේශයන්හි රඳවාගෙන ඇති අපනයන ආදායමේ වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එලෙස මුදල් රඳවා ගැනීමට අවසර දී ඇති කාලසීමාව කොපමණද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) 2015 முதல் இன்று வரை -

(i) பண்டங்களின் ஏற்றுமதிப் பெறுமதி மற்றும் அதிலிருந்து கிடைத்த வருமானம் யாது என்பதையும்;

(ii) பண்டங்களின் இறக்குமதிப் பெறுமதி மற்றும் அதன் மீதான செலவினம் யாது என்பதையும்;

(iii) வர்த்தக மீதி எவ்வளவு என்பதையும்;

(iv) மொத்த உள்நாட்டு உற்பத்தியின் சதவீதமாக ஏற்றுமதிகளின் பெறுமதி யாது என்பதையும்;

இலங்கை ரூபா மற்றும் அமெரிக்க டொலர்களில், வெவ்வேறாக அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) 2015 முதல் இன்று வரை -

(i) 10 பிரதான வகுதிகளைச் சுட்டிக்காட்டி, சேவைத் துறையிலிருந்து பெற்ற ஏற்றுமதி வருமானங்கள் யாவை என்பதையும்;

(ii) வெளிநாட்டுச் சேவைகளுக்கான கொடுப்பனவுகளின் பெறுமதி யாது என்பதையும்;

(iii) சேவைகள் வர்த்தக மீதி எவ்வளவு என்பதையும்;

(iv) மொத்த உள்நாட்டு உற்பத்தியின் சதவீதமாக சேவைகளின் பங்களிப்பு யாது என்பதையும்;

(v) சென்மதி நிலுவை மிகை அல்லது துண்டுவிழும் தொகை யாது என்பதையும்;

இலங்கை ரூபாய் மற்றும் அமெரிக்க டொலர்களில், வெவ்வேறாக அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) (i) சென்மதி நிலுவை துண்டுவிழும் தொகையைக் குறைப்பதற்கு இலக்கு வைக்கப்பட்டுள்ள துறைகள் யாவை என்பதையும்;

(ii) (அ)(i)இல் குறிப்பிடப்பட்டுள்ள 15 ஏற்றுமதிப் பண்டங்கள் யாவை என்பதையும்;

(iii) கடந்த 10 ஆண்டுகளில், நாட்டுக்கு மீள அனுப்பப்படாது வெளிநாடுகளில் வைக்கப்பட்டுள்ள ஏற்றுமதி வருமானத்தின் பெறுமதி வெவ்வேறாக யாது என்பதையும்;

(iv) அவ்வாறு வைத்திருப்பதற்கு அனுமதிக்கப்பட்ட காலப்பகுதி யாது என்பதையும்;

அவர் மேலும் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல் ஏன்?

asked the Minister of Finance, Planning and Economic Development:

(a) Will he inform this House, separately in LKR and USD, from the year 2015 to date the -

(i) value of exports of goods and income therefrom;

(ii) value of imports of goods and expenditure thereon;

(iii) trade balance; and

(iv) value of exports as a percentage of Gross Domestic Product?

(b) Will he also inform this House, separately in LKR and USD, from the year 2015 to date the-

(i) export earnings from the services sector, indicating 10 main categories;

(ii) value of payments for services overseas;

(iii) services trade balance;

(iv) services, as a percentage of Gross Domestic Product; and

(v) balance of payments surplus or deficit?

(c) Will he further inform this House the -

(i) areas targeted to improve the balance of payments deficit;

(ii) 15 export items mentioned in (a)(i);

(iii) value of export proceeds retained overseas without repatriation over the last 10 years, separately; and

(iv) permitted retention period?

(d) If not, why?

**ගරු නිශාන්ත ජයවීර මහතා (ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு நிசாந்த ஜயவீர - பொருளாதார அபிவிருத்தி பிரதி அமைச்சர்)

(The Hon. Nishantha Jayaweera - Deputy Minister of Economic Development)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා ඉතාම කාලීන ප්‍රශ්නයක් තමයි විමසා තිබෙන්නේ. මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i)

| වර්ෂය | අපනයන අගය | |
|---|---|---|
| | රුපියල් බිලියන | එ.ජ.ඩො. මිලියන |
| 2015 | 1,431 | 10,546 |
| 2016 | 1,501 | 10,310 |
| 2017 | 1,732 | 11,360 |
| 2018 | 1,934 | 11,890 |
| 2019 | 2,135 | 11,940 |
| 2020 | 1,859 | 10,047 |
| 2021 | 2,487 | 12,499 |
| 2022 | 4,235 | 13,106 |
| 2023 | 3,899 | 11,911 |
| 2024 | 3,857 | 12,772 |
| 2025 (අ) | 4,087 | 13,581 |
| 2026 ජන.- අප්‍රේ. (මාස 4 සඳහා) (අ) | 1,414 | 4,535 |

(අ) තාවකාලික

(ii)

| වර්ෂය | ආනයන අගය | |
|---|---|---|
| | රුපියල් බිලියන | එ.ජ.ඩො. මිලියන |
| 2015 | 2,572 | 18,935 |
| 2016 | 2,794 | 19,183 |
| 2017 | 3,199 | 20,980 |
| 2018 | 3,607 | 22,233 |
| 2019 | 3,565 | 19,937 |
| 2020 | 2,975 | 16,055 |
| 2021 | 4,104 | 20,637 |
| 2022 | 5,737 | 18,291 |
| 2023 | 5,493 | 16,811 |
| 2024 | 5,686 | 18,841 |
| 2025 (අ) 2026 ජන. - අප්‍රේ. (මාස 4 සඳහා) (අ) | 6,469 2,569 | 21,480 8,228 |

(අ) තාවකාලික

(iii)

| වර්ෂය | වෙළඳ ශේෂය | |
|---|---|---|
| | රුපියල් බිලියන | එ.ජ.ඩො. මිලියන |
| 2015 | -1,141 | -8,388 |
| 2016 | -1,294 | -8,873 |
| 2017 | -1,466 | -9,619 |
| 2018 | -1,673 | -10,343 |
| 2019 | -1,430 | -7,997 |
| 2020 | -1,116 | -6,008 |
| 2021 | -1,617 | -8,139 |
| 2022 | -1,502 | -5,185 |
| 2023 | -1,593 | -4,900 |
| 2024 | 1,828 | -6,069 |
| 2025 (අ) 2026 ජන.- අප්‍රේ. (මාස 4 සඳහා) (අ) | -2,383 -1,155 | -7,899 -3,693 |

(අ) තාවකාලික

(iv)

| වර්ෂය | අපනයන අගය | |
|---|---|---|
| | එක්සත් ජනපද ඩොලර් මිලියන | දළ දේශීය නිෂ්පාදිතයෙහි ප්‍රතිශතයක් ලෙස |
| 2015 | 10,546 | 12.4 |
| 2016 | 10,310 | 11.7 |
| 2017 | 11,360 | 12.0 |
| 2018 | 11,890 | 12.5 |
| 2019 | 11,940 | 13.4 |
| 2020 | 10,047 | 11.9 |
| 2021 | 12,499 | 14.1 |
| 2022 | 13,106 | 17.1 |
| 2023 | 11,911 | 14.2 |
| 2024 | 12,772 | 12.8 |
| 2025(අ) | 13,581 | 12.5 |

(අ) තාවකාලික

(ආ) (i) අපනයන ඉපැයීම් ඇමුණුම 01හි සඳහන් වේ. එය දීර්ඝ විස්තරයක්.

(ii)

| වර්ෂය | සේවා:ගෙවීම් | |
|---|---|---|
| | රුපියල් බිලියන | එක්සත් ජනපද ඩොලර් මිලියන |
| 2015 | 553 | 4,072 |
| 2016 | 620 | 4,259 |
| 2017 | 674 | 4,421 |
| 2018 | 748 | 4,608 |
| 2019 | 827 | 4,625 |
| 2020 | 410 | 2,216 |
| 2021 | 177 | 889 |
| 2022 | 308 | 953 |
| 2023 | 772 | 2,363 |
| 2024 | 1,045 | 3,475 |
| 2025(අ) | 1,012 | 3,359 |
| 2026 ජනවාරි- අප්‍රේල් (මාස 4 සඳහා) (අ) | 387 | 1,241 |

(අ) තාවකාලික

[ගරු නිශාන්ත ජයවීර මහතා]

(iii)

| වර්ෂය | සේවා:ශුද්ධ | |
|---|---|---|
| | රුපියල් බිලියන | එක්සත් ජනපද ඩොලර් මිලියන |
| 2015 | 316 | 2,325 |
| 2016 | 419 | 2,879 |
| 2017 | 503 | 3,302 |
| 2018 | 611 | 3,766 |
| 2019 | 511 | 2,849 |
| 2020 | 150 | 819 |
| 2021 | 316 | 1,586 |
| 2022 | 645 | 2,110 |
| 2023 | 1,001 | 3,053 |
| 2024 | 1,044 | 3,435 |
| 2025(අ) | 1,114 | 3,707 |
| 2026 ජනවාරි-අප්‍රේල් (මාස 4 සඳහා)(අ) | 374 | 1,202 |

(අ) තාවකාලික

(iv)

| වර්ෂය | සේවා: ලැබීම් | | සේවා: ශුද්ධ | |
|---|---|---|---|---|
| | එක්සත් ජනපද ඩොලර් මිලියන | දළ දේශීය නිෂ්පාදිත යෙහි ප්‍රතිශතයක් ලෙස | එක්සත් ජනපද ඩොලර් මිලියන | දළ දේශීය නිෂ්පාදිතයෙහි ප්‍රතිශතයක් ලෙස |
| 2015 | 6,397 | 7.5 | 2,325 | 2.7 |
| 2016 | 7,138 | 8.1 | 2,879 | 3.3 |
| 2017 | 7,724 | 8.2 | 3,302 | 3.5 |
| 2018 | 8,374 | 8.8 | 3,766 | 4.0 |
| 2019 | 7,474 | 8.4 | 2,849 | 3.2 |
| 2020 | 3,035 | 3.6 | 819 | 1.0 |
| 2021 | 2,475 | 2.8 | 1,586 | 1.8 |
| 2022 | 3,062 | 4.0 | 2,110 | 2.7 |
| 2023 | 5,416 | 6.4 | 3,053 | 3.6 |
| 2024 | 6,910 | 6.9 | 3,435 | 3.4 |
| 2025 (අ) | 7,066 | 6.5 | 3,707 | 3.4 |

(අ) තාවකාලික

(v) ශ්‍රී ලංකා මහ බැංකුව දැනට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ගෙවුම් තුලනය සහ අන්තර්ජාතික ආයෝජන තත්ත්ව අත්පොතෙහි හයවන සංස්කරණය - BPM6 - මත පදනම්ව ගෙවුම් තුලන සංඛ්‍යා දත්ත සම්පාදනය කරයි. BPM6 වාර්තාකරණ රාමුවට අනුව, ජංගම සහ ප්‍රාග්ධන ගිණුම්වල ඒකාබද්ධ ශේෂය, ලෝකයේ සෙසු රටවලට, ආර්ථිකයේ ශුද්ධ ණය දීමේ - අතිරික්තය මඟින් - හෝ ශුද්ධ ණය ගැනීමේ -හිඟය මඟින්- තත්ත්වය නියෝජනය කරයි. සෛද්ධාන්තිකව, වැරදීම් සහ අත්හැරීම් නොමැති බව උපකල්පනය කළහොත්, මෙම ශේෂය මූල්‍ය ගිණුමේ ශුද්ධ ශේෂයට අනුරූප විය යුතුය. ඒ අනුව, BPM6 සම්පාදන හා වාර්තාකරණ රාමුවට අනුව ගෙවුම් තුලනය සම්පාදනය කිරීමේදී, "ගෙවුම් තුලනයේ සමස්ත ශේෂය" -ගෙවුම් තුලනයේ අතිරික්තය හෝ හිඟය- යන සංකල්පය, ගෙවුම් තුලනය භාවිතයෙන් ඍජුව සම්පාදනය කර ගත නොහැක. විශ්ලේෂණාත්මක මිනුමක් ලෙස, සමස්ත ශේෂය යනුවෙන් වෙනත් සංකල්පයක් ඇති අතර එය යම් කාලපරිච්ඡේදයක් තුළ ශුද්ධ ජාත්‍යන්තර සංචිතවල වෙනස පිළිබිඹු කරයි.

ජංගම ගිණුමේ ශේෂය සහ සමස්ත ශේෂය පිළිබඳ දත්ත ඇමුණුම 02හි දක්වා ඇත. එය දීර්ඝ විස්තරයක්.

(ඇ) (i) ශ්‍රී ලංකාවේ ගෙවුම් ශේෂ හිඟය වැඩිදියුණු කිරීම සඳහා ඉලක්ක කරගත් ප්‍රධාන ක්ෂේත්‍ර අතරට,

- අපනයන ඉපැයීම් වැඩි කිරීම.

  අපනයන ඉපැයීම් වැඩි කිරීම සඳහා වෙළෙඳ භාණ්ඩ අපනයනය -තේ, ඇඟලුම්, රබර් නිෂ්පාදන, ICT සේවා ආදිය- පුළුල් කිරීම සහ අපනයන වෙළෙඳ පොළ හා නිෂ්පාදන විවිධාංගීකරණය කිරීම.

- සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම.

  සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම සඳහා වැඩි සංචාරක පැමිණීම් ආකර්ෂණය කර ගැනීම තුළින් සංචාරක ආදායම වැඩි කිරීම.

- ඍජු විදේශ ආයෝජන ආකර්ෂණය කර ගැනීම.

  ඍජු විදේශ අයෝජන - FDI - වැඩි කිරීම සඳහා නිෂ්පාදන අංශ හා යටිතල පහසුකම් සඳහා විදේශ ආයෝජන දිරිමත් කිරීම.

- සේවක ප්‍රේෂණ වැඩිදියුණු කිරීම.

  සේවක ප්‍රේෂණ වැඩි කිරීම, විදේශ රැකියා අවස්ථා සඳහා පහසුකම් සැලසීම සහ විධිමත් මාර්ග හරහා ප්‍රේෂණ දිරිමත් කිරීම.

- ආනයන කළමනාකරණය කිරීම.

  ආනයන කළමනාකරණය සඳහා ආනයන ආදේශක දේශීය නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම.

  සේවා අපනයන පුළුල් කිරීම

  සේවා අපනයන වැඩිදියුණු කිරීම සඳහා ICT/ BPM සේවා, මූල්‍ය සේවා, නැව්ගත කිරීම සහ සැපයුම් අංශ පුළුල් කිරීම.

- විදේශ විනිමය සංචිත ශක්තිමත් කිරීම.

  බාහිර මූල්‍යකරණය සහ ණය කළමනාකරණය සඳහා සහන මූල්‍යකරණය ලබා ගැනීම හා විදේශ සංචිත ඵලදායී ලෙස කළමනාකරණය කිරීම.

- බාහිර ණය කළමනාකරණය වැඩිදියුණු කිරීම.

  විදේශ විනිමය සංචිත ශක්තිමත් කිරීම සඳහා සංචිත සමුච්චය වැඩි කිරීමට හා විනිමය අනුපාතික ස්ථාවරත්වය පවත්වා ගැනීමට ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම.

(ii) විස්තරාත්මක වගුවක් ඇමුණුම 03හි දක්වා ඇත.

ඇමුණුම් 01, 02 සහ 03 **සභාගත*** කරමි.

(iii) 1953 අංක 24 දරන විනිමය පාලන පනත යටතේ නිකුත් කරන ලද 1993.03.26 දිනැති අංක 759/15 දරන ගැසට් නිවේදනය මඟින් අපනයනකරුවන් විසින් අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීමේ අවශ්‍යතාවෙන් නිදහස් කරන ලදී.

- එසේ වුවත්, විනිමය පාලන පනත යටතේ නිකුත් කරන ලද 2016.04.01 දිනැති අංක 1986/43 දරන ගැසට් නිවේදනය මඟින් ඉහත නිදහස් කිරීම අවලංගු කරන ලදී.
- ඒ අනුව 1993 වසරේ සිට 2016 වසර දක්වා අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීමේ අවශ්‍යතාවක් නොතිබුණි.
- 2017 අංක 12 දරන විදේශ විනිමය පනත ක්‍රියාත්මක කිරීම සහ විනිමය පාලන පනත අවලංගු වීමත් සමඟ විදේශ විනිමය පනතෙහි නියමයන් ප්‍රකාරව අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීමේ අවශ්‍යතාව අඛණ්ඩව පැවතිණි.
- 2020 වසරේ සිට විදේශ විනිමය සංචිත පහළ යාමත් සමඟ 1949 අංක 58 දරන මුදල් නීති පනත යටතේ රීතීන් නිකුත් කරමින් අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීම අනිවාර්ය කිරීම සඳහා පියවර ගන්නා ලදී.
- 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ විධිවිධානයන් යටතේ නිකුත් කරන ලද 2024 අංක 01 දරන අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට ගෙන ඒමේ රීති ප්‍රකාරව, සියලුම භාණ්ඩ සහ/හෝ සේවා අපනයනකරුවන් විසින් අදාළ භාණ්ඩ නැව්ගත කරන ලද දිනයේ සිට හෝ සේවාවන් සැපයූ දිනයේ සිට දින එකසිය අසූවක් ඇතුළත තම අපනයන ඉපැයීම් අනිවාර්යයෙන්ම ශ්‍රී ලංකාව වෙත ගෙන්විය යුතුය.
- මේ රීතීන්ට අනුකූලව සියලුම බලපත්‍රලාභී බැංකු, අපනයනකරුවන්, වක්‍ර අපනයනකරුවන් විසින් වාර්තා/ප්‍රකාශන ශ්‍රී ලංකා මහ බැංකුවේ විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත යොමු කළ යුතුය.
- ශ්‍රී ලංකා මහ බැංකුවට අනුව සහ බැංකු විසින් ඉදිරිපත් කරන ලද වාර්තාවලට අනුව, 2022, 2023, 2024 සහ 2025 යන වර්ෂවලදී පිළිවෙළින් එක්සත් ජනපද ඩොලර් මිලියන 14,596ක්, 11,165ක්, 11,417ක් සහ 12,027ක් භාණ්ඩ අපනයන ආදායම් ලෙස ශ්‍රී ලංකාවට ලැබී ඇත. පසුගිය වසර හතරක කාල සීමාව තුළ භාණ්ඩ අපනයන වටිනාකමෙන් සියයට 96ක් පමණ මෙරටට නැවත ගෙන්වා ඇති බව මෙයින් පිළිබිඹු වේ.
- මේ අතර අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට ආපසු ගෙන්වා ගැනීම සමීපව නිරීක්ෂණය කිරීමේ අරමුණින් 2023 වසරේදී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් "අපනයන ඉපැයීම් අධීක්ෂණ පද්ධතිය" නමින් පද්ධතියක් හඳුන්වා දෙන ලදී. මෙම පද්ධතියේ සැසඳීම් ක්‍රියාවලියට අනුව බැංකු හා තෝරා ගත් අපනයනකරුවන්ගේ අනුකූලතාව නිරන්තරයෙන් පරීක්ෂා කරමින්, භාණ්ඩ අපනයන ඉපැයීම් රට තුළට ගෙන්වා ගැනීම තහවුරු කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව කටයුතු කරයි.

(iv) ඉහත සඳහන් රීතිවලට අනුව භාණ්ඩ හා සේවා අපනයනය කරන ලද සියලු අපනයනකරුවන් විසින් තම අපනයන ආදායම, භාණ්ඩ නැව්ගත කරන ලද දිනයේ සිට හෝ සේවාවන් සැපයූ දිනයේ සිට දින 180ක් ඇතුළත අනිවාර්යයෙන්ම ශ්‍රී ලංකාවට ගෙන්විය යුතුය. ඒ අනුව අපනයනකරුවෙකුට භාණ්ඩ නැව්ගත කළ දිනයේ හෝ සේවාවන් සැපයූ දිනයෙන් පසු තම අපනයන ආදායම උපරිම වශයෙන් දින 179ක් පමණක් විදේශයන්හි රඳවා තබා ගැනීමට අවසර ඇත.

(ඇ) පැන නොනඟී.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Ravi Karunanayake, you can raise your Supplementary Question now.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු නියෝජ්‍ය ඇමතිතුමා ලබා දුන් පිළිතුර පරිශීලනය කරලා බලනකොට අපට කොටස් දෙකක් පෙනෙනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා (c) (iii)ට ලබා දුන් පිළිතුර සහ (c) (iv)ට ලබා දුන් පිළිතුර අතර පරස්පරයක් තිබෙනවා. මොකද, (c) (iii)ට ලබා දුන් පිළිතුරෙන් කියනවා, 1953 අංක 24 දරන විනිමය පාලන පනත සංශෝධනයට ලක් වුණා, ඒ නිසා අපනයන ආදායම රටින් පිටත තිබෙනවාය කියලා. ඊට පසුව (c) (iv)ට ලබා දුන් පිළිතුරෙන් කියනවා, අපනයන ආදායම දවස් 179කට වඩා රටින් පිටත තියන්න බැහැ කියලා.

මගේ පළමුවන අතුරු ප්‍රශ්නය වන්නේ මේකයි. ඔබතුමන්ලා බලයට ආවට පසුව කියා තිබුණා, US Dollars 50 billion රටින් පිටත තිබෙනවාය කියලා. ඒක කොයි විධියකටවත් වෙන්න බැහැ, මේ පිළිතුර අනුව. ඔබතුමන්ලාගේ දත්ත අනුව දැනට අපනයනකරුවෙකුට අපනයන ආදායම උපරිම වශයෙන් විදේශයන්හි රඳවා තබා ගැනීමට අවසර තිබෙන්නේ දවස් 179යි. ඒක රටට ඔරොත්තු දෙන්නේ නැත්නම් ඔබතුමන්ලාට සම්පූර්ණ අයිතිය තිබෙනවා, ඒක මුළුමනින්ම නැති කරන්න. ඒ කාරණය ඔබතුමා පිළිගන්නවාද? ඒ වාගේම 2026 දෙසැම්බර් 31වැනි දා වනකොට ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ වන ගිවිසුම අවසන් වෙනවා.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමන්ලා සුමාන දෙකකට ඉස්සෙල්ලා ජාතික අපනයන සංවර්ධන සැලැස්ම ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ අනුව අද වනකොට ඩොලර් බිලියන 20ක් වශයෙන් තිබෙන අපනයන ආදායම තව අවුරුදු පහකින් ඩොලර් බිලියන 36කට වැඩි කරනවාය කියලා තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මම මේ සම්බන්ධයෙන් ප්‍රශ්න අහලා තිබෙන්නේ ඒ සඳහා පිළිතුරක් ලබා ගන්නයි. අවුරුදු 20ක් සියයට 4-5 අතර අගයක තිබුණු දළ දේශීය නිෂ්පාදනයේ වර්ධන වේගය, අන්තිම අවුරුදු 10 තුළ සියයට 3.5-4 අතර අගයක තිබුණා. ඔබතුමන්ලාගේ ඒ සැලැස්ම අනුව සියයට 16ක වර්ධන වේගයක් තියාගෙන හැම අවුරුද්දේම US Dollars 5 billion වැඩි කරනවාය

---
** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු රවි කරුණානායක මහතා]

කියලා කිසිම ප්‍රායෝගික අත්දැකීමක් නැති සැලැස්මක් තමයි ඉදිරිපත් කරලා තිබෙන්නේ. මේ තිබෙන දත්ත අනුව මේ අවුරුදු පහ තුළ සියයට 300ක ප්‍රවර්ධනයක් ඇති කරන්න පුළුවන් වන්නේ කොහොමද? රජයේ නිලධාරින් ඔබතුමන්ලාට වැරදි තොරතුරු දීලා තිබෙනවා. ඒ තොරතුරුවලට අනුව රටේ අභිවෘද්ධිය විකෘති වන ස්වරූපයේ පිළිතුරක් දෙන්න එපා කියලා මම ඔබතුමාගෙන් ඉල්ලනවා. කරුණාකර ඔබතුමාට ඒ කාරණය සාක්ෂාත් කරන්න පුළුවන්ද?

**ගරු නිශාන්ත ජයවීර මහතා**
(மாண்புமிகு நிசாந்த ஜயவீர)
(The Hon. Nishantha Jayaweera)
ඔබතුමා ඉස්සෙල්ලා සඳහන් කරපු දින 179 සම්බන්ධයෙන් කියපු කාරණය පිළිබඳව විධිමත්ව සලකා බලා එය ඉටු කරන්න පුළුවන්ද කියලා අපි සොයා බලන්නම්. අපනයන සංවර්ධන සැලැස්ම ගත්තොත්, ඉතා විධිමත් විධියට අපි එතැනට යන්නේ කොහොමද කියලා පියවරෙන් පියවර,- *[බාධා කිරීමක්]*

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමන්ලාගේ දත්ත අනුව අවුරුදු 20ක් සියයට 4 - 5 අතර වර්ධන වේගයක් තිබෙන්නේ. එතකොට මේක 400 ගුණයකින් වැඩි වෙන්නේ කොහොමද?

**ගරු නිශාන්ත ජයවීර මහතා**
(மாண்புமிகு நிசாந்த ஜயவீர)
(The Hon. Nishantha Jayaweera)
ඔබතුමාට ඒ සැලැස්ම මම ඉදිරිපත් කරන්නම්. ඒ සැලැස්ම ඇතුළේ පැහැදිලිව දක්වා තිබෙනවා, එතැනට යන්නේ කොහොමද කියන road map එක. අපනයන සංවර්ධන මණ්ඩලය විසින් මැදිහත් වෙලා මොන මොන ක්ෂේත්‍ර වැඩිදියුණු කරලාද මේ වර්ධනය ලබා ගන්න බලාපොරොත්තු වෙන්නේ කියන එක ඉතා විධිමත් විධියට සඳහන් කරලා තිබෙනවා. අපි ඒ සැලැස්මේ ගමන් මග ඉතා පැහැදිලිව ඉදිරිපත් කර තිබෙනවා. ඒ අනුව තමයි ඒ නිලධාරින් කටයුතු කරන්නේ. අපි සියලු දෙනාටම අවශ්‍ය වන්නේ අපනයනය වැඩි කර ගන්න නේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
නිවැරදි දත්ත ඉදිරිපත් කරන එක අත්‍යවශ්‍යයි කියන එක ඔබතුමා පිළිගන්නවා ඇති නේද? *[බාධා කිරීමක්]*

**ගරු නිශාන්ත ජයවීර මහතා**
(மாண்புமிகு நிசாந்த ஜயவீர)
(The Hon. Nishantha Jayaweera)
පිළිගන්නවා නොවෙයි,- *[බාධා කිරීමක්]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, you may pose your second Supplementary Question.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Okay, Sir. I can see that your normal, friendly atmosphere is being fast-paced, as you are trying to finish. But, Sir, we have seven Members who would not be asking Questions, just to put you at ease.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මම කාරුණිකව මේ කාරණය ඉල්ලා සිටිනවා. මෑතකදී ආනන්ද විජේපාල ඇමතිතුමාත්, ඊයේ ජනාධිපතිතුමාත් විශේෂ ප්‍රකාශයක් කළා, ඒ තිබෙන සල්ලි ප්‍රමාණය අනුව නීත්‍යනුකූල නොවන මට්ටමට අපනයනය කරලා තිබෙනවා කියලා. ඒක බරපතළ ප්‍රශ්නයක් ලෙස තිබෙනවා. ඒ වාගේම ඔබතුමා ඉදිරිපත් කර තිබෙන පිළිතුර අනුව එය විශාල ගෙවුම් ශේෂ හිඟයකට බලපානවා. ඒ වාගේම රුපියල දෝලනය වෙලා අද ඩොලරය රුපියල් 342ක, 343ක වාගේ අගයක තිබෙනවා. ඒ නිසා මම ඔබතුමාගෙන් අහන්නේ අපනයන ආදායම දවස් 179කට වැඩියෙන් විදේශයන්හි රඳවා තියන්න බැරි නම්, NDB එක වාගේ මේක වංචනිකව ගෙවලා තිබෙනවා නම් මෙතරම් නිහඬව සිටින්නේ ඇයි කියලායි.

දැන් ඔබතුමන්ලා වාචිකව අසන ප්‍රශ්නවලට සහ ඔය යම් අතුරු අදහස් ඇවිල්ලා තිබෙන දේවල්වලින් අත්අඩංගුවට ගන්නවා නම්, ඇයි මීට වැඩිය විධිමත්ව මේ අපනයන ක්ෂේත්‍රය සහ ඩොලරය ශක්තිමත් කරන්න පුළුවන් වැඩකටයුතු කරන්නේ නැත්තේ? ඒ සම්බන්ධයෙන් අපනයන ස්වරූපය අඩු වෙනවා නම්, ගෙවුම් ශේෂය වැඩි වෙනවා නම්, රුපියල දෝලනය වීමේ අවස්ථාවට ඉඩ ලබා දෙන්න එපා කියන එක මම කාරුණිකව ඉල්ලනවා. එහෙම නැත්නම් කොහොමද මේක ශක්තිමත් කරන්නේ කියන එක ඔබතුමන්ලා මේ දුන්නු උත්තර තුළින් කොහොමද වෙන්නේ කියන එක සම්බන්ධයෙන් කරුණාකරලා මේ සභාවත්, මේ පාර්ලිමේන්තුවත්, ජනතාවත් දැනුවත් කිරීම ඔබේ වගකීමක් නොවෙයිද කියන එක මම අහනවා.

**ගරු නිශාන්ත ජයවීර මහතා**
(மாண்புமிகு நிசாந்த ஜயவீர)
(The Hon. Nishantha Jayaweera)
ඇත්තටම ඔබතුමාගේ අදහස් දැක්වීම ඉතාම වැදගත්. ඒක තමයි ඊයෙත් අපේ ගරු ජනාධිපතිතුමා මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා කිව්වේ. මෙතෙක් කාලයක් ඇමෙරිකානු ඩොලර් බිලියනයකට ආසන්න ප්‍රමාණයක් රටෙන් පිටවෙලා තිබෙනවා. ඒක ඇත්තටම ඔබතුමා කියනවා වාගේ ඩොලරයේ අවප්‍රමාණයටත් බලපානවා. ඇත්තටම ඩොලරය අවප්‍රමාණය වෙන්නත් ඒක බලපානවා. ඒ වෙනුවෙන් රජය විධියට නීතිමය ක්‍රියාමාර්ග ගන්න ගමන්ම ඒ වාගේ සිද්ධීන් නැවත ඇති නොවන්න අවශ්‍ය පියවර ඉතාම පැහැදිලිව අරගෙන තිබෙනවා. ඇත්තටම අපි රජයක් විධියට ඒ සිද්ධීන් හඳුනාගත්ත ගමන්ම ඒකට අදාළ පරීක්ෂණ එක පැත්තකින් යන ගමන් අනික් පැත්තෙන් එවැනි සිද්ධීන් නැවත ඇති නොවෙන්න අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග අපි ගනිමින් සිටිනවා. *[බාධා කිරීමක්]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Members, we will move onto the next Question.

Question No. 4 - 599/2025 - (1), the Hon. Dayasiri Jayasekara.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක ඉතාම වැදගත් කාරණයක්. අද ඩෙංගු උවදුර නිසා ඩෙංගු රෝගීන් පිරිලා රට ඉවරෙට ඉවරයි. හැබැයි, ඇමතිත් නැහැ; නියෝජ්‍ය ඇමතිත් නැහැ. අද වැඩ බලන සභානායක විතරයි ඉන්නේ. වැඩ බලන සභානායක ඉන්නවා. *[බාධා කිරීමක්]* වැඩ බලන සභානායක, මේකට උත්තරයක් දෙන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Member, this was discussed at length yesterday.

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)

එතුමා වැටුප් සම්බන්ධයෙන් අහලා තිබෙන්නේ. වැටුප් සහ ඩෙංගු අතර සම්බන්ධයක් නැහැ.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

නැත්තේ මොකද?

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)

ඉතිහාසයේ පළමු වතාවට නොවෙයි නේ, පිළිතුරු ලබා දීම සඳහා කල් ගන්නේ. - *[බාධා කිරීම්]* ස්ථාවර නියෝග අනුව පිළිතුරු ලබාදීම සඳහා කල් ගන්න පුළුවන්. *[බාධා කිරීම්]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Members, we will move onto the next Question.

Question No. 5 - 656/2025 - (1), the Hon. Rohana Bandara. - *[Not in the Chamber.]*

## පුනර්ජනනීය බලශක්ති සංවර්ධන සැලැස්ම: විස්තර
## மீள்புதுப்பிக்கத்தக்க வலுசக்தி அபிவிருத்தித் திட்டம்: விபரம்
## PLAN FOR ADVANCEMENT OF RENEWABLE ENERGY: DETAILS

828/2025

**6. ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)

බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) ඉදිරි පස් වසරක පුනර්ජනනීය බලශක්ති සංවර්ධන සැලැස්මක් අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කර තිබේද;

(ii) එසේ නම්, එම සැලැස්මට අනුව අනාගත පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති පිළිබඳ විස්තර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

வலுசக்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) எதிர்வரும் ஐந்தாண்டுகளுக்கான மீள்புதுப்பிக்கத்தக்க வலுசக்தி அபிவிருத்தித் திட்டமொன்று அமைச்சால் சமர்ப்பிக்கப்பட்டுள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், மேற்படி திட்டத்தின்படி எதிர்கால மீள்புதுப்பிக்கத்தக்க வலுசக்திக் கருத்திட்டங்கள் பற்றிய விபரங்கள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Energy:

(a) Will he inform this House -

(i) whether the Ministry has submitted a plan on the advancement of renewable energy for the next five years; and

(ii) if so, the details of future renewable energy projects as per the said plan?

(b) If not, why?

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

2026.01.19 දින "පුනර්ජනනීය බලශක්ති සම්පත් සංවර්ධන සැලැස්ම 2025-2030" අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇති අතර අමාත්‍ය මණ්ඩලය විසින් 2026.02.02 දින එය අනුමත කර ඇත. අංක 2479/52 හා 2026.03.11 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ එය පළ කර ඇත.

(ii) "පුනර්ජනනීය බලශක්ති සම්පත් සංවර්ධන සැලැස්ම 2025-2030" යටතේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති අනාගත ව්‍යාපෘති පිළිබඳ විස්තර පහත දැක්වේ.

**බලශක්ති උද්‍යාන ව්‍යාපෘති සංවර්ධන කාලසීමාව**

**දැනට ක්‍රියාත්මක බලශක්ති උද්‍යාන ව්‍යාපෘති**

වගුව 0.1: දැනට ඉදිකිරීම් අදියරේ පවතින ව්‍යාපෘති සම්බන්ධ විස්තර

| ව්‍යාපෘති විස්තර | | | | යෝජිත කොමිෂන් වර්ෂය |
|---|---|---|---|---|
| කලාපය | ව්‍යාපෘතියේ නම | වර්ගය | ධාරිතාව (මෙ.වො) | |
| දකුණු | සියඹලාණ්ඩුව | භූමිය මත සූර්යය | 100 | 2026 |
| උතුරු (මන්නාරම උප කලාපය) | මන්නාරම (අදියර 1) | සුළඟ | 50 | 2026 |

වගුව 0.2: දැනට සංවර්ධනය වෙමින් පවතින ව්‍යාපෘති සම්බන්ධ විස්තර

| ව්‍යාපෘති විස්තර | | | | අපේක්ෂිත කොමිෂන් වර්ෂය |
|---|---|---|---|---|
| කලාපය | ව්‍යාපෘතියේ නම | වර්ගය | ධාරිතාව (මෙ.වොට්) | |
| උතුර(කිලිනොච්චි උප කලාපය) | මුල්ලිකුලම් I සහ II | සුළඟ | 100 | 2028 |
| | වේරවිල් | සුළඟ | 204 | 2028 |
| | කරච්චි (කණ්ඩවලෙයි) | සුළඟ | 128 | 2029 |
| උතුරු (මන්නාරම උප කලාපය) | මන්තායි බටහිර | සුළඟ | 300 | 2030 |

[ගරු අනුර කරුණාතිලක මහතා]

**සැලසුම් කර ඇති බලශක්ති උද්‍යාන විස්තර**

**ව්‍යාපෘති සංවර්ධන කාල සීමාව තුළ දී (2030 අවසන් වන තෙක්) සැලසුම් අදියරේ පවතින ව්‍යාපෘති මෙහි ඇතුළත් කර ඇත. එහි විස්තර පහත පරිදි වේ.**

වගුව 0.3: සැලසුම්කර අදියරේ පවතින භූමිය මත සූර්යය ව්‍යාපෘති සම්බන්ධ විස්තර

| ව්‍යාපෘති විස්තර | | | | අපේක්ෂිත කොමිෂන් වර්ෂය |
|---|---|---|---|---|
| කලාපය | ව්‍යාපෘතියේ නම | වර්ගය | ධාරිතාව (මෙ.වොට්) | |
| උතුර (කිලිනොච්චි උප කලාපය) | කිලිනොච්චි I | භූමිය මත සූර්යය | 50 | 2029 |
| | සිස්ටම් එල් | භූමිය මත සූර්යය | 100 | 2029 |
| ඊසානදිග | සාම්පූර් අදියර I | භූමිය මත සූර්යය | 50 | 2028 |
| | සාම්පූර් අදියර II | භූමිය මත සූර්යය | 70 | 2030 |
| | ත්‍රිකුණාමලය I | භූමිය මත සූර්යය | 100 | 2030 |
| | ත්‍රිකුණාමලය II | භූමිය මත සූර්යය | 100 | 2030 |
| නැගෙනහිර | වාලච්චේනයි | භූමිය මත සූර්යය | 100 | 2028 |
| වයඹ | කොට්ටුකච්චිය | භූමිය මත සූර්යය | 80 | 2029 |

වගුව 0.4: සැලසුම්කර අදියරේ පවතින සුළං ව්‍යාපෘති සම්බන්ධ විස්තර

| ව්‍යාපෘති විස්තර | | | | අපේක්ෂිත කොමිෂන් වර්ෂය |
|---|---|---|---|---|
| කලාපය | ව්‍යාපෘතියේ නම | වර්ගය | ධාරිතාව (මෙ.වොට්) | |
| උතුර (කිලිනොච්චි උප කලාපය) | පූනරින් | සුළඟ | 234 | 2030 |
| උතුරු (මන්නාරම උප කලාපය) | මන්නාරම අදියර II | සුළඟ | 250 | 2027 |
| වයඹ | කල්පිටිය | සුළඟ | 120 | 2028 |

වගුව 0.5: සැලසුම්කර අදියරේ පවතින පාවෙන සූර්යය උද්‍යාන ව්‍යාපෘති සම්බන්ධ විස්තර

| ව්‍යාපෘති විස්තර | | | | අපේක්ෂිත කොමිෂන් වර්ෂය |
|---|---|---|---|---|
| කලාපය | ව්‍යාපෘතියේ නම | වර්ගය | ධාරිතාව (මෙ.වොට්) | |
| දකුණු | රිදියගම සූර්ය බලාගාරය | පාවෙන සූර්ය | 50 | 2029 |
| වයඹ | දැදුරු ඔය | පාවෙන සූර්ය | 100 | 2029 |
| | මීගමුව කලපුව | පාවෙන සූර්ය | 50 | 2030 |
| නැගෙනහිර | ඉරක්කමම් | පාවෙන සූර්ය | 50 | 2030 |
| | අම්බලන් ඔය | පාවෙන සූර්ය | 50 | 2030 |
| උතුරු මැද | මාදුරු ඔය | පාවෙන සූර්ය | 50 | 2030 |
| | | | | |
| මධ්‍යම | රන්දෙණිගල | පාවෙන සූර්ය | 70 | 2030 |
| | මොරගහකන්ද | පාවෙන සූර්ය | 100 | 2030 |
| | කාසල්රී | පාවෙන සූර්ය | 50 | 2030 |

***සටහන: ඉහත ව්‍යාපෘති වර්ෂය සැලසුම් කළ පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා, පහත සඳහන් සම්ප්‍රේෂණ යටිතල පහසුකම් සංවර්ධනයන් අවශ්‍ය වේ: වවුනියාව 220 kV සංවර්ධනය; මුලින් 220 kV හි ක්‍රියාත්මක වූ වවුනියාව හරහා උතුරු එකතු කරන්නා වූ නව හබරණ 400 kV සම්ප්‍රේෂණ මාර්ගය; 220 kV මන්නාරම - වවුනියාව සම්ප්‍රේෂණ මාර්ගයේ ප්‍රතිසංනායකරණය ; නව හබරණ - කප්පල්තුරෙයි 220 kV සම්ප්‍රේෂණ මාර්ගය; සහ 100 MW / 400 MWh බැටරි බලශක්ති ගබඩා පද්ධතියක් (BESS) සංවර්ධනය කිරීම.***

***අනුමත කරන ආයතනවල කොන්දේසි අනුව ඉහත ව්‍යාපෘතිවල ධාරිතාව වෙනස් විය හැකිය.***

(ආ) අදාළ නොවේ.

**ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, මම හිතන විධියට, දැන් වහල මත සූර්ය පැනල සවි කරන ලියාපදිංචි ආයතන - solar panel companies - 459කට වැඩි සංඛ්‍යාවක් තිබෙනවා. මේ වෙනකොට ලංකා විදුලිබල මණ්ඩලය විසින් මේ ව්‍යාපාරිකයන්ට ගෙවිය යුතු මුදල් ගෙවලා නැහැ. මාස දෙකතුනකින් ගෙවලා නැහැ. ගරු ඇමතිතුමනි, ඒ හේතුවෙන් සමහර ව්‍යාපාර වසා දමන තත්ත්වයට ඇවිල්ලා තිබෙනවා; ඒ අයගේ loans ගෙවාගන්න බැරිවෙලා තිබෙනවා. මේ තත්ත්වය තුළ අපේ රටේ මේ ආයතනවල වැඩ කරන සේවකයින්ට රක්ෂා නැති වන තත්ත්වයකුත් ඇති වෙමින් තිබෙනවා, ගරු ඇමතිතුමනි. විශේෂයෙන් මම අහන්න කැමැතියි, මේ අයට ගෙවන්න තිබෙන මුදල් ගෙවන්න බැරි හේතුව වශයෙන් විෂයභාර ඇමතිතුමා විධියට ඔබතුමා හඳුනාගෙන තිබෙන්නේ මොකක්ද කියලා. අඩුම වශයෙන් අපට ඒක පැහැදිලි කරගන්න පුළුවන්ද?

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා සඳහන් කළා වාගේ ජනවාරි මාසයේ ඉඳලා මැයි මාසය වෙනකල් පුනර්ජනනීය බලාගාර සඳහා මුදල් ගෙවීමක් තිබෙනවා. ඉන් කොටසක් මේ වෙනකොට ගෙවලා තිබෙනවා. මෙතැන විදුලි බලය සඳහා වන සහනාධාර ලෙස දැන් අපට රුපියල් බිලියන 15ක් භාණ්ඩාගාරයෙන් ලැබී තිබෙනවා, කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ඇතිව. අපි ඒ මුදල අරගෙන ඉතිරි හිඟ මුදල ගෙවීම සඳහා දැන් කටයුතු කරමින් සිටිනවා. එතකොට මාසයක වාගේ කාලයක් ඇතුළත ඒ හිඟ මුදල් සම්පූර්ණයෙන් ගෙවන්න අපිට පුළුවන්කම ලැබෙයි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු කිංස් නෙල්සන් මන්ත්‍රීතුමනි, දෙවැනි අතුරු ප්‍රශ්නයක් තිබෙනවා නම් අහන්න.

**ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාට අවස්ථාව දෙනවා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ solar energy සම්බන්ධ ආයතන 1,650කට අධික ප්‍රමාණයක් ලංකාව පුරා තිබෙනවා. ඒ වාගේම, ඒවායින් ආයතන 600කට වැඩිය වැසී ගිහින් තිබෙනවා. ඒත් එක්කම ඉංජිනේරු සහ තාක්ෂණ නිලධාරින්ගේ, ඒ කියන්නේ, විදුලි ඉංජිනේරුවන් 1,150කගේ, සහාය ඉංජිනේරුවන් 1,300කගේ, accountantsලා 1,150කගේ, විදුලි කාර්මිකයන් 24,200කගේ, සෝලා කාර්මිකයන් 389කගේ රැකියා ඇතුළුව සෘජු රැකියා ලක්ෂයක් හා වක්‍ර රැකියා ලක්ෂ හතරක් නැති වෙලා තිබෙනවා. අධ්‍යක්ෂකවරු 2,000කට වැඩිය මේ ක්‍රමවේදය තුළ හිටියා. ඇත්ත වශයෙන්ම තමුන්නාන්සේලා කියනවා, ප්‍රාථමික ශේෂය උතුරා ගලා යයි, ගලා, ගලා යයි කියලා. හැබැයි, මේ කොම්පැනි 390කට ජනවාරි මාසයේ ඉඳලා රුපියල් බිලියන 20කට වැඩි ප්‍රමාණයක් ගෙවන්න තිබෙනවා.

ඒ එක්කම තවත් කාරණයක් තිබෙනවා. ඔබතුමන්ලාගේ ආණ්ඩුව ආවාට පස්සේ, රුපියල් 37ට තිබුණු සූර්ය පද්ධතිවලට ගෙවන විදුලි ඒකකයක මිල රුපියල් 27ට අඩු කළා. ඊට පස්සේ, රුපියල් 27ට තිබුණු එක රුපියල් 18කට අඩු කළා. දැන්

තමුන්නාන්සේලා කථා කරනවා, 2030දී විදුලි බලය සියයට 70ක් පුනර්ජනනීය බලශක්තියෙන් ගේන්න. දැන් මෙච්චර කොම්පැනි සංඛ්‍යාවක්, - කොම්පැනි 1,650කින් 600 ගණනක් - වැසී ගොස් තිබෙනවා. තමුන්නාන්සේලාගෙන් මම අහන්න කැමැතියි, 2030දී මේ ඉලක්කයට යන්නේ කොහොමද කියන එක. මොකද අද තමුන්නාන්සේලා කරලා තිබෙන්නේ, - *[බාධා කිරීමක්]* එහා පැත්තේ වරදකාරයා හිනා වෙවී ඉන්නවා; හිකි හිකි ගගා ඉන්නවා. *[බාධා කිරීමක්]* අධි චෝදනා ගොනු කරලා, - *[බාධා කිරීමක්]* ඉන්න, ඉන්න, ප්‍රශ්නය අහනකම්. කලබල වෙන්න එපා. ශිෂ්ට සම්පන්න වෙන්න. *[බාධා කිරීම්]* ඊයේ ජනාධිපතිතුමාත් කිව්වා. ඔය බලන්න. *[බාධා කිරීම්]* Photo එකක් ගන්න, මේගොල්ලෝ ශිෂ්ට සම්පන්නව ඉන්නවාද කියලා බලන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Dayasiri Jayasekara, you may ask your Supplementary Question.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම අහන්න හැදුවේ, - *[බාධා කිරීම්]* වටේ යන්නේ නැහැ. වටේ යන්න වෙනවා මේගොල්ලෝ කරන වැඩවලට. වටේ යන්න වෙලා තිබෙනවා, පුනර්ජනනීය බලශක්තිය හදන මිනිස්සුන්ට. *[බාධා කිරීම්]* ඉන්න, point එකට එන්න දෙන්නේම නැහැ නේ. මම කිව්වේ මේකයි. පුනර්ජනනීය බලශක්තිය පාවිච්චි කරනවා වෙනුවට දැන් ඔබතුමන්ලාට කරන්න වෙලා තිබෙන්නේ මොකක්ද? මම මේ කියන්නේ ගරු ඇමතිතුමාගේ ප්‍රශ්නයක් නොවෙයි. ඔබතුමා ඒකට සම්බන්ධ නැහැ. නමුත්, අද සිද්ධ වෙලා තිබෙන දෙය තමයි, අපට coalවලින් ගන්න තිබෙන ප්‍රයෝජනය ගන්න විධියක් නැති වීම. බාල ගල්අඟුරු ගෙනැල්ලා, - *[බාධා කිරීම්]* එහා පැත්තේ ඒ යාළුවා ඉඳගෙන ඉන්නවා. නැව් 30ක්ම ගිලලා ඉවරෙටම ඉවරයි. අද දවසකට මෙගාවොට් 200 ගාණේ ගන්න බැහැ, ඒකක ප්‍රමාණය ගත්තාම. ඒකට දැන් ඩීසල් ගේන්න වෙලා. ඔබතුමාට නොවෙයි මම මේ කියන්නේ. මේ බර දරන්නේ කවුද? පුනර්ජනනීය බලශක්තිය දියුණු කරන්න, ඔබතුමාට එහා පැත්තේ ඉන්න යාළුවා කාපු එක හදන්න ඔබතුමාගේ වැඩ පිළිවෙළ මොකක්ද කියලා මම අහන්න කැමැතියි.

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)
කෝ, ප්‍රශ්නය? *[බාධා කිරීම්]* එකක්, ඔබතුමා අහන ප්‍රශ්නයේ සංඛ්‍යාලේඛන වැරදියි. මෙගාවොට් 200 ගාණක් ඩීසල්වලින් ගන්නවා කියන එක සම්පූර්ණයෙන් වැරදියි. කථා කරනවා නම් දත්ත මත ඉඳගෙන කථා කරමු. ඒ දත්ත හරියට ඉදිරිපත් කරන්න, මම එතකොට පැහැදිලි කරන්නම් ඒක එහෙම නොවෙන්නේ කොහොමද කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම විනාඩියක් අරගෙන මේක පැහැදිලි කරන්නම්. දැනට සාමාන්‍යයෙන් වහල මත සෝලා සහ ground-mounted solar panels ගත්තාම පුනර්ජනනීය බලශක්තිය අරගෙන විතරක් ප්‍රමාණවත් වෙන්නේ නැහැ. ඒකට අදාළ තාක්ෂණික කරුණු ගණනාවක් තිබෙනවා. System එක ස්ථාවරව පවත්වාගෙන යාම සඳහා අපි කටයුතු කරන්න ඕනෑ. ඔබතුමා අද දවසේ සභාවේ රැඳී ඉන්නවා නම්, අද ශ්‍රී ලංකා විදුලිබල පනත යටතේ ගෙනෙන නියමය ගැන විවාදයේදී මම ඒක පැහැදිලි කරන්නම්. උදාහරණයක් විධියට, වහල මත සෝලා 2,450ක් තිබෙනවා කියලා හිතමු.. හැබැයි සමහර දවස්වලට, උදාහරණයක් හැටියට ගත්තොත් පසුගිය වෙසක් පොහොය දවසේ අවශ්‍යතාව, ඉල්ලුම මෙගාවොට් 600 දක්වා අඩු වුණා. ඒ වාගේ වෙලාවට අපට සිද්ධ වෙනවා negative feeders, ඉල්ලුම අඩු සැපයුම වැඩි feeders කපා හැරලා පද්ධතියේ ස්ථායීතාව පවත්වාගෙන යන්න. වහල මත හෝ වෙනත් ක්‍රම සඳහා සෝලා ගැන කථා කළාට ඒකට අවශ්‍ය වන අනෙකුත් යටිතල පහසුකම්, පද්ධතියේ ස්ථායීතාව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය අනෙකුත් යටිතල පහසුකම් වර්ධනය කරන්නේ නැතිව, ඒ වාගේම grid availability එක ගැන හිතන්නේ නැතිව සෝලා ගැන විතරක් කථා කරන්න බැහැ. දැන් අපි කරන්නේ අන්න ඒ යටිතල පහසුකම් හදාගෙන යන එක. අපි දන්නවා ඊටත් වඩා වැඩි ප්‍රමාණයක් සෝලා තිබෙන බව. අපි ඒ ටික ඉතාම ඉක්මනින් පද්ධතියට ඇතුළත් කර ගැනීම සඳහා කටයුතු කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Question No. 7 - 1217/2025 - (1), the Hon. S.M. Marikkar. - *[Not in the Chamber.]*

Question No. 8 - 1634/2025 - (1), the Hon. Chamara Sampath Dasanayake. - *[Not in the Chamber.]*

## සී/ස සීනෝර් පදනම පිහිටුවීම: අරමුණ සහ කාර්යභාරය
## வ/ப சீனோர் மன்றத்தைத் தாபித்தல்: நோக்கமும் பணிப்பொறுப்பும்
## ESTABLISHMENT OF CEY-NOR FOUNDATION LIMITED: PURPOSE AND FUNCTIONS

1937/2026

**9. ගරු අජිත් ගිහාන් මහතා**
(மாண்புமிகு அஜித் கிஹான்)
(The Hon. Ajith Gihan)
ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) සී/ස සීනෝර් පදනම ස්ථාපිත කිරීමේ අරමුණ හා එහි කාර්යභාරය කවරේද;

(ii) එම පදනම විසින් පසුගිය පාලන කාලය තුළ ප්‍රමිතියෙන් යුතු දැල් හා බෝට්ටු නිෂ්පාදනය කිරීම, සාගර නිෂ්පාදන විකිණීම සහ අපනයනය කිරීම සිදු කර තිබේද;

(iii) එසේ නම්, එම කටයුතු සිදු කර ඇති ආකාරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) පසුගිය පාලන කාලය තුළ පදනමේ කාර්යභාරය බිඳ වැටී තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා හේතු කවරේද;

(iii) පදනමේ මූල්‍ය වංචා සිදුවී තිබේද;

(iv) සී/ස සීනෝර් පදනම සංවර්ධනය කිරීම සඳහා වැඩ පිළිවෙළක් තිබේද;

(v) එසේ නම්, එම වැඩ පිළිවෙළ කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

[ගරු අජිත් ගිහාන් මහතා]

கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) வரையறுக்கப்பட்ட சீனோர் மன்றத்தை தாபித்ததன் நோக்கமும் அதன் பணிப்பொறுப்புகளும் யாவை என்பதையும்;

(ii) கடந்த ஆட்சிக் காலத்தின்போது மேற்படி மன்றத்தால் தரம்வாய்ந்த வலைகள் மற்றும் படகுகளை உற்பத்தி செய்தல், கடல்சார் உற்பத்திகளை விற்பனை செய்தல் மற்றும் ஏற்றுமதி செய்தல் போன்ற பணிகள் மேற்கொள்ளப்பட்டனவா என்பதையும்;

(iii) ஆமெனில், அப்பணிகளை மேற்கொண்ட விதம் யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) கடந்த ஆட்சிக் காலத்தில் மன்றத்தின் பணிப்பொறுப்புகள் வீழ்ச்சியடைந்தனவா என்பதையும்;

(ii) ஆமெனில், அதற்கான காரணங்கள் யாவை என்பதையும்;

(iii) மேற்படி மன்றத்தில் நிதி மோசடிகள் இடம்பெற்றுள்ளனவா என்பதையும்;

(iv) வரையறுக்கப்பட்ட சீனோர் மன்றத்தை அபிவிருத்தி செய்வதற்கான வேலைத்திட்டம் ஒன்று உள்ளதா என்பதையும்;

(v) ஆமெனில், அவ்வேலைத்திட்டம் யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Fisheries, Aquatic and Ocean Resources:

(a) Will he inform this House -

(i) the purpose of establishing the Cey-Nor Foundation Limited and its functions;

(ii) whether the said Foundation has manufactured quality nets and boats, sold and exported ocean products during the previous administration; and

(iii) if so, the manner in which those activities have been carried out?

(b) Will he inform this House -

(i) whether the functions of the Foundation were impaired during the previous administration;

(ii) if so, the reasons for the said impairment;

(iii) whether any financial fraud has occurred in the Foundation;

(iv) whether there is a plan for the development of the Cey-Nor Foundation Limited; and

(v) if so, the programme for the development of the Foundation?

(c) If not, why?

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා (ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා)**

(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர் - கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சர்)

(The Hon. Ramalingam Chandrasekar - Minister of Fisheries, Aquatic and Ocean Resources)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இந்த வினாவுக்கான விடை பின்வருமாறு:

(அ) (i) சீனோர் மன்றம் 1967ஆம் ஆண்டு உள்ளூர் மீனவர் சமூகத்தின் கல்வி, சமூக மற்றும் பொருளாதார நலன்களை மேம்படுத்தும் நோக்கத்துடன், நோர்வே நாட்டைச் சேர்ந்த ஓர் அரசுசாரா அமைப்பின் ஆதரவுடன் இலாப நோக்கமற்ற நிறுவனமாக நிறுவப்பட்டது. விசேடமாக, பொது மக்களினதும் மீனவர்களினதும் நலன்களை மேம்படுத்தவே இது உருவாக்கப்பட்டது. பின்னர், 1987ஆம் ஆண்டின் 23ஆம் இலக்கம் கொண்ட, அரசுக் கூட்டுத்தாபனங்கள் அல்லது அரசுடைமையிலுள்ள வணிக நிறுவனங்களை பொது நிறுவனங்களாக மாற்றும் சட்டத்தின் பிரகாரம், 1990ஆம் ஆண்டு சனவரி மாதம் 17ஆம் திகதி, சீனோர் வரையறுக்கப்பட்ட நிறுவனத்தின் தொழில்களை பொறுப்பேற்றுத் தொடர்வதற்காக, சீனோர் மன்றம் ஒரு பொது வரையறுக்கப்பட்ட பொறுப்புடைய நிறுவனமாக இணைக்கப்பட்டது.

**முக்கிய பணிகள்:**

- கடற்றொழில் மற்றும் நீர் உயிரின வளர்ப்புத் துறையின் அபிவிருத்திக்குத் தேவையான கப்பல்கள், படகுகள், உபகரணங்கள் மற்றும் தொடர்புடைய பிற பொருட்களை உற்பத்தி செய்தல், பழுதுபார்த்தல் மற்றும் வழங்குதல்.
- கடற்றொழில் துறையுடன் தொடர்புடைய இயந்திரங்கள், வள்ளங்கள், வலைகள் உள்ளிட்ட அனைத்து உபகரணங்களையும் உற்பத்தி செய்கின்ற செயற்பாடுகளும் முன்னெடுக்கப்பட்டு வருகின்றன.
- மீன்பிடி மற்றும் நீர் உயிரின வளர்ப்பு உற்பத்திகளின் பதப்படுத்தல், மதிப்புக் கூட்டல், சந்தைப்படுத்தல் மற்றும் ஏற்றுமதியை ஊக்குவித்தல்.

இவ்வாறு, சீனோர் நிறுவனத்தின் அனைத்து நடவடிக்கைகளும் இதுநாள் வரைக்கும் மீனவர்களுடைய நலன்களை முன்னிறுத்தியே முன்னெடுக்கப்பட்டு வருகின்றன.

(ii) ஆம்.

(iii)

| | 2019 | 2020 | 2021 | 2022 | 2023 | 2024 | 2025 |
|---|---|---|---|---|---|---|---|
| நார் உற்பத்திகள் | 6,052 | 1,988 | 2,370 | 1,692 | 1,684 | 3,772 | 474 |
| தோணிகள் மற்றும் படகுகள் | 763 | 156 | 659 | 307 | 222 | 500 | 150 |
| வருமானம் (ரூபாய் மில்லியன்) | 84 | 43.5 | 74.4 | 91.62 | 46.5 | 220.4 | 140.2 |

2019 முதல் 2025 வரையான காலப்பகுதியில் எடுக்கப்பட்ட பல்வேறு நடவடிக்கைகளால் இப்பொழுது இந்நிறுவனம் கணிசமான முன்னேற்றத்தை நோக்கி நகர்ந்திருக்கின்றது.

(ஆ) (i) ஆம்.

(ii) படகுகள் உற்பத்திக்குத் தேவையான மூலப்பொருட்களை நேரடியாக வழங்குவதற்கான நடவடிக்கையில் இருந்து, அவற்றைக் கொள்முதல் செய்கின்ற நடவடிக்கையில் இருந்து, உள்ளூர் உற்பத்திகளை ஊக்குவிக்கின்ற நடவடிக்கையில் இருந்து, அனைத்து நடவடிக்கைகளையும் உள்ளடக்கியதாகப் பல்வேறு நடவடிக்கைகள் முன்னெடுக்கப்படுகின்றன.

(iii) சீ-னோர் உணவகத்தை ஒரு வெளித் தரப்பினருக்கு மாற்றியது தொடர்பான வழக்குகள் தற்போது உச்ச நீதிமன்றத்தில் விசாரிக்கப்பட்டு வருகின்றன. குறிப்பிட்ட அந்தச் சொத்து, அதன் தற்போதைய சந்தை மதிப்பைவிட கணிசமாகக் குறைந்த விலைக்கு ஒரு வெளித் தரப்பிரனருக்கு வழங்கப்பட்டதாகக் குற்றம் சாட்டப்பட்டுள்ளது.

(iv) ஆம்.

(v) புதிய அரசாங்கத்தின்கீழ், நிறுவனத்தின் நீண்டகாலப் பேண்தகு வளர்ச்சியையும் நிதி நிலைத்தன்மையையும் உறுதிசெய்யும் நோக்கில் ஒரு வேலைத்திட்டம் நடைமுறைப்படுத்தப்பட்டு வருகிறது.

சீ-னோர் நிறுவனம் என்பது கடந்த காலங்களில் முற்றுமுழுதாகச் செயலிழந்து போயிருந்த நிறுவனம், நட்டத்தில் இயங்கிய நிறுவனம், ஊழியர்களுக்குச் சம்பளத்தைக்கூட வழங்க முடியாத நிலையில் இருந்த நிறுவனம் என்றெல்லாம் கூறப்பட்டது. இன்றைக்கு இந்த நிறுவனம் ஊழியர்களுக்கு அனைத்துச் சேவைகளையும் செய்கின்ற அதேவேளை, ஊழியர்களின் EPF, ETF தொடர்பான பிரச்சினையையும் முற்றாகத் தீர்த்திருக்கின்றது. அதுமாத்திரமல்ல, இழுத்து மூடிவிட்டு தனியாருக்குத் தாரைவார்ப்பதற்கு இருந்த இந்த நிறுவனத்தை, இன்று அரசாங்கம் முற்றுமுழுதாக தனது கையிலெடுத்து, புதிய படகுகளை உற்பத்தி செய்வதற்கும், அந்தப் படகுகளை வெளிநாடுகளுக்கு ஏற்றுமதி செய்வதற்கும், அதன்மூலமாக வெளிநாட்டு வருவாயைப் பெற்றுக்கொள்வதற்குமான நடவடிக்கைகளை எடுத்திருக்கின்றது. அதுமாத்திரமல்ல, கடந்த 'தித்வா' புயலின்பொழுது, சீ-னோர் நிறுவனத்துக்கு மாத்திரம் நாங்கள் பெருந்தொகை பணத்தை ஒதுக்கீடு செய்தோம். அதாவது, 'தித்வா' புயலால் பாதிக்கப்பட்ட மீனவர்களின் வலைகள், வள்ளங்கள், படகுகள் என அனைத்தையும் சீரமைப்பதற்காக 11.4 பில்லியன் ரூபாயை ஒதுக்கீடு செய்திருக்கின்றோம் என்பதை இந்த இடத்தில் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

(இ) ஏற்புடையதன்று.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இந்த வினாவுடன் தொடர்புடைய விரிவான விடையை நான் சபாபீடத்துக்குச் ***சமர்ப்பிக்கின்றேன்.**

**ගරු අජිත් ගිහාන් මහතා**
(மாண்புமிகு அஜித் கிஹான்)
(The Hon. Ajith Gihan)
ගරු අමාත්‍යතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු අමාත්‍යතුමනි, ඔබතුමාගේ ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශය යටතේ ධීවර සහ ජලජ සම්පත් දෙපාර්තමේන්තුව, ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව, ලංකා ධීවර නීතිගත සංස්ථාව, ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය, NARA ආයතනය, සී/ස සීනෝර් පදනම, නෝර්ත් සී ලිමිටඩ් ආදි වශයෙන් වගකිව යුතු ආයතන බොහොමයක් තිබෙනවා. ගරු අමාත්‍යතුමනි, ඔබතුමා පැහැදිලි කළා, ඒවා අතරින් සී/ස සීනෝර් පදනමේ වගකීම් ගැන. එයට ලොකු වගකීමක් පැවරී තිබෙනවා.

ගරු අමාත්‍යතුමනි, අපේ රටේ ප්‍රමිතියෙන් යුතුව දැල් නිෂ්පාදනය කරන ආයතනයක් විධියට තිබුණේ සී/ස සීනෝර් පදනමයි. නමුත්, පසුගිය කාලය පුරා ධීවරයන් මිල දී ගත්තු දැල් මුහුදට දාලා මාස දෙකක් තුනක් යද්දී ඉරෙන්න පටන් ගත්තා. එම දැල් මකුළු දැල් වාගේ තත්ත්වයට පත් වෙලා තිබුණා. ඒවායේ ප්‍රමිතිය බාල වුණේ කෙසේද? ඒක එක ප්‍රශ්නයක්. වගකිව යුතු ආයතනයක් වන එම ආයතනයෙන් ධීවර ජනතාව බලාපොරොත්තු වන්නේ ප්‍රමිතියෙන් යුතු හොඳ දැල් ආම්පන්න ලබා ගැනීමයි.

ගරු අමාත්‍යතුමනි, ඔබතුමා පැහැදිලි කළා, බෝට්ටු නිෂ්පාදනය, අපනයනය, පවත්වාගෙන යෑම සහ සංවර්ධනය කිරීම යනාදි කටයුතු කිසිවක් පසුගිය කාලයේ සිදු වෙලා නැහැ කියලා. හැබැයි, ඔබතුමා සඳහන් කළා වාගේ සී/ස සීනෝර් පදනම, නෝර්ත් සී ලිමිටඩ් එක දැන් යම් ස්ථාවරයකට ඇවිත් තිබෙනවා. "දිට්වා" සුළි කුණාටුවෙනුත් ධීවර ක්ෂේත්‍රයට විශාල හානියක් සිදු වුණා; විශේෂයෙන්ම පුත්තලම දිස්ත්‍රික්කයේ ධීවර ජනතාවට විශාල හානියක් සිදු වුණා. ඒ ධීවරයන්ගේ දැල් බොහොමයක් මුහුදට ගහගෙන ගිහින් තිබුණා වාගේම එම ප්‍රදේශ විනාශ වුණා, බෝට්ටු කැඩුණා, ඔරු කැඩුණා, තෙප්පම් කැඩුණා. ප්‍රමිතියෙන් යුතු බෝට්ටු දැල් ආම්පන්න හදලා ධීවර ජනතාවට ඉතා ඉක්මනින් ලබා දෙන්න මේ ආයතනය සූදානම්ද කියා මම අහනවා.

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர்)
(The Hon. Ramalingam Chandrasekar)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු අජිත් ගිහාන් මන්ත්‍රීතුමා අහපු අතුරු ප්‍රශ්නයට උත්තරය මේකයි. ඇත්තටම ප්‍රමිතියෙන් යුතු දැල් ආම්පන්න සියල්ලම ලබා දීමට දැනටමත් අපි කටයුතු කරමින් ඉන්නවා. ඉදිරියේදී එය තවත් හොඳ වෙයි කියන එක මට විශ්වාසයි. ඒක, එකක්.

දෙවැනි කාරණය මේකයි. ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශය යටතේ මේ ආයතනය පමණක් නොව, තවත් විවිධ ආයතන තිබෙනවා. මෙම ප්‍රශ්නයට අදාළ සී/ස සීනෝර් පදනම ගත්තාම, පසුගිය කාලයේදී එම ආයතනය සම්පූර්ණයෙන් කඩා වට්ටලායි තිබුණේ. ඒකේ තිබෙන සම්පත් ටික විනාශ කරලා තිබුණේ. ඒ විනාශ වෙච්ච ආයතනය තමයි ගොඩ නඟන්න සිද්ධ

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා]

වෙලා තිබුණේ. විශේෂයෙන්ම 1963දී නෝර්වේ රජයයි, ලංකාවේ රජයයි එකතු වෙලා පටන් ගත්ත සීනෝර් ආයතනය ඒ කාලයේ විශාල වෙනසකට තුඩු වන හොඳ කර්මාන්තශාලාවක් බවට පරිවර්තනය වෙලා තිබුණා. නමුත්, මෑත කාලයේදී මේක සම්පූර්ණයෙන් කඩා වැටිලා තිබුණා. කොච්චර කඩා වැටිලා තිබුණා ද කියනවා නම්, එහි සේවකයන්ට පඩි ගෙවා ගන්න, සේවකයන්ගේ EPF, ETF පවා ගෙවා ගන්න බැරි තත්ත්වයක් උදා වෙලා තිබුණා. මෑත කාලයේ තමයි ඒවා විසඳා ගන්න පුළුවන් වුණේ. එපමණක් නොවෙයි, මේ මොහොත වනවිට යාපනයේ, කරෙයිනගර්වල yard එකක් තිබෙනවා. දැනට ඒ boat yard එකේ වැඩ පටන් අරගෙන තිබෙනවා. එහි විශාල බෝට්ටු නිෂ්පාදනය කරනවා. මට්ටක්කුලියේ තිබෙන boat yard එක ගත්තාම, විදේශ රටවලට යැවීම සඳහාම අඩි 55ක් දිග බෝට්ටු නිෂ්පාදනය කරනවා. එම නිසා මම විශ්වාස කරනවා, ඉදිරියේදී මේක ගුණාත්මක පැත්තෙන් හොඳ තත්ත්වයකට එයි කියලා.

පසුගිය කාලයේ විශේෂයෙන්ම "දිට්වා" සුළි කුණාටුව නිසා හානියට පත් වුණු බෝට්ටු ගණනාවකට පමණක් නොවෙයි, රුපියල් බිලියන 11.4ක් මේ කටයුතුවලට වෙන් කර තිබුණා. විශේෂයෙන්ම "දිට්වා" සුළි කුණාටුව නිසා හානියට පත් වෙච්ච බෝට්ටු, දැල්, ආම්පන්න සියල්ලම ලබා දීමට අපි කටයුතු කර තිබුණා. ඒ සියල්ලම අපේ සීනෝර් ආයතනය හරහා තමයි කළේ. එම නිසා ඉදිරියේදී සීනෝර් ආයතනය දැවැන්ත ආයතනයක් බවට පරිවර්තනය කිරීමේ හැකියාව අපේ රජයට තිබෙනවා කියන එක මම මේ වෙලාවේ කියන්න ඕනෑ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Ajith Gihan, raise your second Supplementary Question.

**ගරු අජිත් ගිහාන් මහතා**
(மாண்புமிகு அஜித் கிஹான்)
(The Hon. Ajith Gihan)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ගරු අමාත්‍යතුමාගෙන් අවස්ථාව ඉල්ලනවා, මේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්න. මේ වනකොට පුත්තලම දිස්ත්‍රික්කයේ, කල්පිටිය ප්‍රදේශයේ ගැටලුවක් ඇති වෙලා තිබෙනවා. ධීවර ජනතාව නොසන්සුන්තාවට පත් වෙලා තිබෙනවා. Indian bottom trawlers මේ ප්‍රදේශයට ඇවිල්ලා මුහුදු පතුල විනාශ කරලා, ධීවර ආම්පන්නවලට හානි කරමින් - විනාශ කරමින් - යනවා. ඇත්තටම ඒ ජනතාව අපට කථා කරලා කියනවා, මේක නවත්වන්න, මේ සම්බන්ධව කටයුතු කරන්න කියලා. ගරු අමාත්‍යතුමනි, මේ විනාශය නවත්වන්නේ කොහොමද, ජනතාවට ඔවුන්ගේ ධීවර කටයුතු කරගෙන යන්න අවස්ථාව හදන්නේ කොහොමද, මේ ප්‍රශ්නවලට උත්තර ලබා දීමට කටයුතු කරන්නේ කොහොමද කියලා මම ඔබතුමාගෙන් දැනගන්න කැමැතියි.

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர்)
(The Hon. Ramalingam Chandrasekar)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, கௌரவ அஜித் கிஹான் அவர்களால் கேட்கப்பட்ட இந்தக் கேள்வி மிகவும் முக்கியமானதொரு கேள்வியாகும். கற்பிட்டி பிரதேசத்தில் ஓர் ஆர்ப்பாட்டம் இடம்பெற்றிருந்தது எங்கள் எல்லோருக்கும் தெரியும். எங்களுடனான கலந்துரையாடலின் பிறகு, அந்த ஆர்ப்பாட்டம் முடிவுக்கு வந்திருக்கின்றது. அந்த ஆர்ப்பாட்டத்துக்குக் காரணம் வேறெதுவுமல்ல, இந்திய ரோலர்கள் மீண்டும் இலங்கைக் கடற்பரப்புக்குள் வர ஆரம்பித்திருப்பதுதான். கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இந்திய ரோலர்கள்மூலம் எங்களுடைய கடல் வளம் சூறையாடப்படுகின்றது. அதனைத் தடுக்க வேண்டும் என்பதில் மாற்றுக் கருத்துக்கு இடமில்லை. இதனால் கூடுதலாகப் பாதிக்கப்படுவது வட, கிழக்கில் இருக்கின்ற மீனவர்களாகும். வட, கிழக்கிலுள்ள மீனவர்கள் 30 வருடங்களுக்கும் மேலாக இடம்பெற்ற யுத்தத்தால் பல்வேறு இன்னல்களைச் சந்தித்தவர்கள். இன்றைக்கு அவர்கள் அந்த இன்னல்களில் இருந்து மீள்கின்ற நடவடிக்கைகளில் ஈடுபட்டு வருகின்றார்கள்.

யாழ்ப்பாண மாவட்டத்தை எடுத்துக்கொண்டால், அங்கு 25 சதவீதத்துக்கும் அதிகமானவர்கள் மீனவர்களாவர். அந்த மீனவர்களுடைய வாழ்க்கையில் பாதிப்பை ஏற்படுத்தக்கூடிய வகையிலான செயற்பாடுகளை தமிழ் நாட்டில் இருக்கின்ற ஒருசில மீனவர்கள் முன்னெடுத்து வருகின்றார்கள். இந்தப் பிரச்சினையை நாங்கள் இராஜதந்திர மட்டத்திலான பேச்சுவார்த்தைகள் மூலம் அணுகவுள்ளோம். அதற்கு மேலதிகமாக, எங்களுடைய கடற்படையைப் பலப்படுத்தி, அதற்குத் தேவையான உபகரணங்கள், படகுகளை வழங்கி, இதனைத் தடுப்பதற்கு ஏதுவான நடவடிக்கைகளை நிச்சயமாக எடுப்போம் என்ற உறுதிமொழியைப் பாதிக்கப்பட்டு இருக்கின்ற அனைத்து மீனவர்களுக்கும் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Question No. 10 - 2042/2026 - (1), the Hon. Lieutenant Commander (Rtd.) Prageeth Madhuranga . - *[Not in the Chamber.]*

Second Round.

## 2015 සිට බිත්තර ආනයනය: විස්තර
### 2015இலிருந்து முட்டை இறக்குமதி: விபரம்
### IMPORT OF EGGS SINCE 2015: DETAILS

193/2024

**1. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා වෙනුවට)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு நலின் பண்டார ஜயமஹ சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. Nalin Bandara Jayamaha)

වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා මෙරටට බිත්තර ආනයනය කර තිබේද;

(ii) එසේ නම්, එම කාලය තුළ ආනයනය කළ බිත්තර ප්‍රමාණය සහ ඒ සඳහා වැය කළ මුදල් ප්‍රමාණය වාර්ෂිකව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) බිත්තර මිල ස්ථාවර මට්ටමක පවත්වාගෙන යෑම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2015ஆம் ஆண்டிலிருந்து இதுவரை, இந்நாட்டுக்கு முட்டை இறக்குமதி செய்யப்பட்டுள்ளதா என்பதையும்;

(ii) அவ்வாறாயின், அக்காலப்பகுதியினுள் இறக்குமதி செய்யப்பட்ட முட்டைகளின் அளவும், அதற்கெனச் செலவிட்ட பணத்தொகையின் அளவும் ஆண்டு வாரியாக வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(iii) முட்டை விலையை நிலையாகப் பேணுவதற்கு எடுக்கப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Trade, Commerce, Food Security and Co-operative Development:

(a) Will he inform this House -

(i) whether eggs have been imported into this country up to now since the year 2015;

(ii) if so, the quantity of eggs imported during that period and the amount of money spent on it in each year, separately; and

(iii) the measures that have been taken to maintain the price of eggs at a stable level?

(b) If not, why?

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

** සභාමේසය මත තබන ලද පිළිතුර:*
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ඔව්. 2023 සහ 2024 වර්ෂයන්හිදී මෙරටට බිත්තර ආනයනය කර ඇත.

(ii)

| ආනයනය කළ බිත්තර පිළිබඳ තොරතුරු (2015- 2026 අප්‍රේල් දක්වා) | | |
|---|---|---|
| වර්ෂය | බිත්තර ප්‍රමාණය (මිලියන) | වැය කළ මුදල (රුපියල් මිලියන) |
| 2015 | - | - |
| 2016 | - | - |
| 2017 | - | - |
| 2018 | - | - |
| 2019 | - | - |
| 2020 | - | - |
| 2021 | - | - |
| 2022 | - | - |
| 2023 | 168.53 | 5,376.25 |
| 2024 | 56.2 | 1,602.63 |
| 2025 | - | - |
| 2026 (අප්‍රේල් දක්වා) | - | - |

(iii) ඉල්ලුම සහ සැපයුම අනුව වෙළඳපොළ බිත්තර මිල උච්චාවචනය වේ. එබැවින්, ඉල්ලුමට සරිලන සැපයුමක් දේශීය නිෂ්පාදනය තුළින් සැපයීම සඳහා නිෂ්පාදනය ප්‍රශස්ත මට්ටමක පවත්වා ගැනීමට අවශ්‍ය මව් සතුන් හා අත්‍යවශ්‍ය සත්ත්ව ආහාර අමුද්‍රව්‍ය ආනයනය ආදී කටයුතු පහසුකරණය සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සහ කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයේ කාර්යභාරයක් ලෙස සිදුකරනු ලබයි. ඒ අනුව බිත්තර නිෂ්පාදනය ස්ථාවර මට්ටමක පවත්වාගෙන යාම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග පහත පරිදි වේ.

- සෑම වසරකම අවසන් කාර්තුව තුළ ඉදිරි වසරේදී ආනයනය කිරීමට අපේක්ෂිත මව් සතුන් සංඛ්‍යාව හා සැලසුම් අභිජනන ගොවිපළ මඟින් ගෙන්වාගෙන ඒ අනුව ඉදිරි වසර සඳහා නිෂ්පාදනය පුරෝකථනයත් සිදුකර ප්‍රශස්ත නිෂ්පාදනයක් සඳහා අවශ්‍ය මව් සතුන් සංඛ්‍යාවක් ආනයනයවන බව තහවුරු කර ගැනීම හා ආනයනය පහසුකරණය සිදු කරනු ලැබේ.

- ඉහත වාර්තා පදනම් කොටගෙන ඉදිරි වර්ෂය සඳහා අවශ්‍ය කුකුළු ආහාර ප්‍රමාණය ඇස්තමේන්තු කරනු ලැබේ. ඒ අනුව කුකුළු ආහාර නිෂ්පාදනය සඳහා අවශ්‍ය නියමිත ප්‍රමිතිගත සත්ත්ව ආහාර අමුද්‍රව්‍ය ආනයනය පහසුකරණයද සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මඟින් සිදු කරනු ලබයි. එයට අමතරව ආනයන සීමා පනවා ඇති සත්ත්ව ආහාර අමුද්‍රව්‍යවල (උදා - බඩඉරිඟු) අවශ්‍යතාව ගණනය කර එය දේශීය නිෂ්පාදනය සමඟ සසඳා බලා, ආනයනය කිරීමට අවශ්‍ය වන ප්‍රමාණය නිර්ණය කර වාර්තා කිරීමත්, ආනයන අනුමැතිය ලැබුණු පසු අවශ්‍ය ආනයන බලපත්‍ර ලබාදීම තුළින් ආනයන පහසුකරණය කිරීම ද සිදු කෙරේ.

- බීජ රක්කනාගාර හා අභිජනන ගොවිපළවල බෝවන රෝග පැතිරීම වැළැක්වීමත්, ජෛව ආරක්ෂණ විධිවිධාන නිසි ලෙස පවත්වාගෙන යන බවට තහවුරු කිරීම සඳහා දෙපාර්තමේන්තු නිලධාරීන් මඟින් එම පරිශ්‍රයන් ආවේක්ෂණය කරනු ලබයි.

- ක්ෂේත්‍ර සමීක්ෂණ මඟින් ගොවිපළ ගැටලු හඳුනා ගැනීම සිදු කරනු ලබන අතර, එම සමීක්ෂණ ප්‍රතිඵල අනුව නිෂ්පාදන ඵලදායිතාව ඉහළ නැංවීම, නිෂ්පාදන මිල පහළට ගෙන ඒම, රෝග පැතිරීම අවම කිරීම ආදී කටයුතු සඳහා අවශ්‍ය තාක්ෂණික සහයෝගය ලබා දීම සිදු කරයි.

(ආ) අදාළ නොවේ.

## වී අලෙවි මණ්ඩලය මඟින් වී මිලදී ගැනීම: නිර්ණායක

## நெல் சந்தைப்படுத்தல் சபையால் நெல் கொள்வனவு: பின்பற்றப்படும் அளவுகோல்கள்

## PURCHASE OF PADDY BY PADDY MARKETING BOARD: CRITERIA

656/2025

**5. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු රෝහණ බණ්ඩාර මහතා වෙනුවට)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு ரோஹண பண்டார சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. Rohana Bandara)

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1)

(අ) (i) වී මිලදී ගැනීමේදී වී අලෙවි මණ්ඩලය විසින් පසුගිය මහ කන්නයේදී සලකා බලන ලද නිර්ණායක හා නීති රීති කවරේද;

(ii) එම නිර්ණායක හා නීති රීති සම්බන්ධයෙන් ගොවි සංවිධාන එතරම් කැමැත්තක් නොදැක්වූ බව දන්නේද;

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

(iii) එසේ නම්, එම නිර්ණායක හා නීති රීති ඉදිරි කන්නවලට අදාළව සමාලෝචනය කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) நெல் கொள்வனவின்போது நெல் சந்தைப்படுத்தல் சபை கடந்த பெரும் போகத்தில் பின்பற்றிய அளவுகோல்கள் மற்றும் சட்ட விதிகள் யாவை என்பதையும்;

(ii) மேற்படி அளவுகோல்கள் மற்றும் சட்ட விதிகள் தொடர்பாக விவசாய அமைப்புகள் கணிசமான விருப்பத்தைக் கொண்டிருக்கவில்லை என்பதை அறிவாரா என்பதையும்;

(iii) ஆமெனில், மேற்படி அளவுகோல்கள் மற்றும் சட்ட விதிகளை அடுத்த போகங்களின்போது மீளாய்வு செய்வதற்கு மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he inform this House -

(i) the criteria, rules and regularities that were considered by the Paddy Marketing Board during the last Maha season when purchasing paddy;

(ii) whether he is aware that the farmers' organizations were not so pleased with the said criteria, rules and regularities; and

(iii) if so, the measures that will be taken to review the said criteria, and regularities for the coming seasons?

(b) If not, why?

**ගරු නාමල් කරුණාරත්න මහතා (කෘෂිකර්ම සහ පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நாமல் கருணாரத்ன - கமத்தொழில் மற்றும் கால்நடை வளங்கள் பிரதி அமைச்சர்)
(The Hon. Namal Karunaratne - Deputy Minister of Agriculture and Livestock)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

** සභාමේසය මත තබන ලද පිළිතුර:*
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) 2025/26 මහ කන්නය තුළ පහත සඳහන් අනුමත ප්‍රමිතියෙන් යුතු වී තොග පමණක් වී අලෙවි මණ්ඩලය විසින් ගබඩාවලට භාරගනු ලැබේ.

| | |
|---|---|
| උපරිම තෙතමනය ප්‍රතිශතය | 14% |
| උපරිම අපද්‍රව්‍ය ප්‍රතිශතය | 1% |
| උපරිම වර්ග මිශ්‍රණය | 6% |
| උපරිම බොල් ප්‍රමාණය (පරිමාව අනුව) | 9% |

දුර්වර්ණ ඇට (මඩි)වලින් තොර විය යුතුය.

කෘමීන්ගෙන් හානි වූ ඇට කෘමි බිත්තර සහ කෘමීන්ගේ ජීවන චක්‍ර අවස්ථාවලින් තොර විය යුතුය.

- එක් ගොවි මහතෙකුගෙන් එක් තොරතුරු පත්‍රිකාවක් මඟින් මිලදී ගත හැකි ප්‍රමාණය කිලෝග්‍රෑම් 2,500කි. කෙසේ නමුත් අවශ්‍ය පහසුකම් සපයා ගැනීමේ ගැටලුවක් නොමැති නම් ප්‍රාදේශීය කළමනාකරුගේ එකඟතාව මත එක් ගොවියෙකුගෙන් මිලදී ගන්නා ප්‍රමාණය කිලෝග්‍රෑම් 5,000ක් දක්වා වැඩි කර ගැනීමේ හැකියාව තිබුණි.

(ii) නොදනී.

(iii) වී අලෙවි මණ්ඩලය විසින් වී මිලදී ගැනීම ව්‍යාපාරික අරමුණකින් සිදු නොකරන අතර ආරක්ෂිත වී තොගයක් පවත්වා ගැනීම සඳහා සිදු කරයි. ඒ අනුව ආරක්ෂිතව ගබඩා කිරීමට හැකිවන පරිදි නිර්ණායක තීරණය කර ඇත.

(ආ) අදාළ නොවේ.

## මාර්ග අංක 155 සහ 140 හි පෞද්ගලික බස් රථ සේවාව: ඇනහිටීම

## வழித்தட இலக்கம் 155 மற்றும் 140 மீதான தனியார் பேருந்துச் சேவை: செயலிழப்பு

## PRIVATE BUS TRANSPORT SERVICE ON ROUTE NOS. 155 AND 140: SUSPENSION

1217/2025

**7. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු එස්.එම්. මරික්කාර් මහතා වෙනුවට)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு எஸ்.எம். மரிக்கார் சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. S. M.Marikkar)
ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මාර්ග අංක 155 (මට්ටක්කුලිය-ගල්කිස්ස) සහ මාර්ග අංක 140 (කොල්ලුපිටිය-වැල්ලම්පිටිය) යන මාර්ගවල පෞද්ගලික බස්රථ ධාවනය මේ වනවිට සම්පූර්ණයෙන්ම නැවතී ඇති බව දන්නේද;

(ii) මෙම මාර්ගවල ගමන් ගන්නා මගී ජනතාවගේ ප්‍රවාහන පහසුකම් සඳහා මේ වනවිට විකල්ප ක්‍රමයක් සකස් කර තිබේද;

(iii) එසේ නම්, එම ක්‍රමය කවරේද;

(iv) කොළඹ මහා නගර සීමාව තුළ පොදු ප්‍රවාහන සේවය ඉහළ නැංවීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) வழித்தட இலக்கம் 155 (மட்டக்குளி-கல்கிசை) மற்றும் வழித்தட இலக்கம் 140 (கொள்ளுப்பிட்டி -வெல்லம்பிட்டி) ஆகிய வீதிகளின் தனியார் பேருந்து சேவைகள் தற்போது முற்றிலுமாக நிறுத்தப்பட்டுள்ளதை அவர் அறிவாரா என்பதையும்;

(ii) இந்த வீதிகளில் பயணிக்கும் பயணிகளின் போக்குவரத்து வசதி கருதி மாற்றுப் போக்குவரத்து வழிமுறை தயார்செய்யப்பட்டுள்ளதா என்பதையும்;

(iii) ஆமெனில், அந்த வழிமுறை யாது என்பதையும்;

(iv) கொழும்பு மாநகர சபை எல்லைக்குள் பொதுப் போக்குவரத்துச் சேவையை மேம்படுத்துவதற்காக மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Transport, Highways and Urban Development:

(a) Will he inform this House -

(i) whether he is aware that the operation of private buses on Route No. 155 (Mattakkuliya - Mount Lavinia) and Route No. 140 (Kollupitiya - Wellampitiya) has been completely stopped at present;

(ii) whether an alternative arrangement has been prepared in order to provide transport facilities to the passengers travelling on the said routes;

(iii) if so, the nature of such arrangement; and

(iv) the steps that will be taken to improve the public transport services within the Colombo Metropolitan Area?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා (ප්‍රවාහන සහ මහාමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) பிரசன்ன குணசேன - போக்குவரத்து மற்றும் நெடுஞ்சாலைகள் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Prasanna Gunasena - Deputy Minister of Transport and Highways)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

** සභාමේසය මත තබන ලද පිළිතුර:*
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) කොරෝනා වසංගත තත්ත්වයෙන් පසු කාලසීමාවේදී මෙම සේවාව ධාවන කටයුතු සම්පූර්ණයෙන්ම අඩාල වූ අතර, බස් සේවාව යථාවත් කිරීමට වරින් වර උත්සාහ ගෙන ඇත.

ඒ අනුව කාලසටහන් අවශ්‍යතාව සපුරාලීමට අවශ්‍ය බස්රථ යෙදවීම සඳහා මගී සේවා අවසරපත්‍ර නිකුත් කිරීමට පහත අවස්ථාවන්වලදී ටෙන්ඩර් කැඳවා තිබුණ ද මගී සේවා අවසරපත්‍ර ලබා ගැනීම සඳහා බස් රථ ධාවකයින් ඉදිරිපත් වීම ඉතා අවම තත්ත්වයක පැවතුණි.

2014 වර්ෂය වන විට බස් රථ 24ක් ධාවනය වූ මාර්ගයකි. 2020 වර්ෂය වනවිට බස් රථ සංඛ්‍යාව 08 දක්වා අඩු වී තිබුණි. පසු කාලයේදී වැල්ලම්පිටිය බස් නැවතුම් ස්ථානය වෙනත් කටයුතු සඳහා යොදවා ගැනීමත්, ත්‍රිරෝද රථ රියදුරන්, වෙළඳසැල් හිමියන් හා නගරවාසීන් බස්රථ සේවකයන්ට හා අධිකාරියේ වේලා සටහන් නිලධාරින්ට සිදු කළ අයුතු බලපෑම් නිසා බස්රථ පරිපාලනය ගිලිහී සේවක විනය පිරිහීමත් සේවාවේ අනාර්ථිකභාවයන් හේතුවෙන් බස්රථ ධාවනය මේ වනවිට සම්පූර්ණයෙන්ම නැවතී ඇත.

යළි බස්රථ යෙදවීමට මගී සේවා අවසරපත්‍ර නිකුත් කිරීම සඳහා පහත සඳහන් අවස්ථාවලදී ටෙන්ඩර් කැඳවා තිබුණ ද මගී සේවා අවසරපත්‍ර ලබා ගැනීම සඳහා ධාවකයින් ඉදිරිපත්ව ඇත. (පසුබිම් වාර්තා - 01*)

(ii) විකල්ප ක්‍රමයක් සකස් කර ඇත.

(iii) මාර්ග අංක 155 සොයිසාපුර - මට්ටක්කුලිය පොදු මගී ප්‍රවාහන සේවය සපයා ගත් මගීන් මාර්ග අංක 145 මට්ටක්කුලිය - සීමා මාලකය හා මාර්ග අංක 178 මට්ටක්කුලිය - නාරාහේන්පිට සේවාවන් මඟින් තම ප්‍රවාහන අවශ්‍යතා සපුරාගනු ලබයි.

මාර්ග අංක 140 කොල්ලුපිටිය-වැල්ලම්පිටිය පොදු මගී ප්‍රවාහන සේවය සපයාගත් මගීන් මාර්ග අංක 175 කොහිලවත්ත - කොල්ලුපිටිය සේවාව, මාර්ග අංක 164 සල්මල් උයන - පුරහල සහ මාර්ග අංක 166 අංගොඩ - කොම්පඤ්ඤවීදිය මඟින් තම ප්‍රවාහන අවශ්‍යතාවන් සපුරා ගනු ලබයි.

(iv) 1. බස් ප්‍රවාහන සේවා සහ යටිතල පහසුකම් සංවර්ධනය

- ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය (SLTB): පිටකොටුව මධ්‍යම බස් නැවතුම්පොළ ප්‍රතිසංස්කරණය කිරීම.
- ජාතික ගමනාගමන කොමිෂන් සභාව (NTC) පිටකොටුව ප්‍රවාහන පර්යන්තය ඉදිකිරීම (Construction of Pettah Advance Transport Terminal) - බැස්ටියන් මාවත බස් පර්යන්තය නවීකරණය.
- මෙට්‍රෝ විද්‍යුත් බස් (EV Buses) සංවර්ධන ව්‍යාපෘති (2027)
- 'ක්ලීන් ශ්‍රී ලංකා' ව්‍යාපෘතිය යටතේ ආබාධ සහිත පුද්ගලයන් සඳහා පහසුකම් සහිත, වායුසමනය කරන ලද, පත්ල පහත් (Low floor) නව බස් රථ 10ක් මාකුඹුර බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය කේන්ද්‍ර කරගනිමින් ධාවනයට යෙදවීම.

2. දුම්රිය ප්‍රවාහන සේවා නවීකරණය සහ ව්‍යාප්තිය (SLR & CSRP)

- ස්වයංක්‍රීය බලවේග කට්ටල (Self-Powered Coaches) සහිත කෙටි දිගින් යුත් (වායුසමනය කළ) දෙපසටම ධාවනය කළ හැකි දුම්රිය කට්ටල 20ක් මිලදී ගැනීමට යෝජිතය.
- කොළඹ නාගරික තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය (CSRP)
- කැලණිවැලි (KV) දුම්රිය මාර්ගය: මරදාන සිට අවිස්සාවේල්ල දක්වා (කිලෝමීටර 65) දුම්රිය මාර්ගය ඉදිකිරීම.
- මරදාන සිට රඹුක්කන දක්වා ප්‍රධාන දුම්රිය මාර්ගය ඉදිකිරීම.
- මරදාන සිට කළුතර දකුණ දක්වා මුහුදුබඩ දුම්රිය මාර්ගය (කිලෝමීටර 50) ඉදිකිරීම.
- කොළඹ කොටුව දුම්රිය ස්ථානය ප්‍රතිසංස්කරණය කිරීම.

(ආ) අදාළ නොවේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Question No. 08 - 1634/2025 - (1), the Hon.Chamara Sampath Dasanayake.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු චාමර සම්පත් දසනායක මහතා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආරක්ෂක අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Question No. 10 - 2042/2026 - (1), the Hon. Lieutenant Commander (Rtd.) Prageeth Madhuranga.

**ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා**
(மாண்புமிகு தர்மப்ரிய விஜேசிங்ஹ)
(The Hon. Darmapriya Wijesinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු ලුතිනන් කොමාණ්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආරක්ෂක අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, Questions under Standing Order No. 27(2). The Hon. Ravi Karunanayake.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### ශ්‍රීලන්කන් ගුවන් සේවය සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග
### ஸ்ரீலங்கன் விமான சேவை தொடர்பான எதிர்கால நடவடிக்கைகள்
### FUTURE MEASURES IN RELATION TO SRILANKAN AIRLINES

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

(අ) ශ්‍රීලන්කන් ගුවන් සේවය සම්බන්ධයෙන් 2026.04.03 දින ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ පැවති නඩු කටයුතුවලදී, රජය වෙනුවෙන් පෙනී සිටි නීතිපතිවරයා ප්‍රකාශ කර සිටියේ ශ්‍රීලන්කන් ගුවන් සේවය තවදුරටත් රජය යටතේම පවතින බවත්, එය පෞද්ගලීකරණය නොකරන බවත්ය.

(ආ) ඉන් අනතුරුව, රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණවලට අදාළව ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ රජය ඇති කරගෙන තිබෙන එකඟතාවලට අනුකූලව, ශ්‍රීලන්කන් ගුවන් සේවය ප්‍රතිව්‍යුහගතකිරීම, වාණිජකරණය කිරීම, උපායමාර්ගික හවුල්කාරිත්වය ඇති කිරීම, පෞද්ගලීකරණය කිරීම හෝ වෙනත් ආකාරයකින් පෞද්ගලික අංශයේ දායකත්වය ලබා ගැනීම සඳහා වූ ප්‍රතිපත්තියක් රජය විසින් අනුගමනය කර තිබේද?

(ඇ) කැබිනට් මණ්ඩලය විසින් එවැනි ප්‍රතිව්‍යුහගත කිරීමේ උපාය මාර්ගයක් අනුමත කර තිබේද? එමෙන්ම එවැනි ප්‍රතිව්‍යුහගත කිරීමක් ක්‍රියාත්මක කිරීම හෝ ඒ පිළිබඳව උපදෙස් දීම සඳහා හාන්ස් විජයසූරිය මහතා සහ කමිටුවක් වෙත වගකීම් පවරා තිබේද? එසේ නම්, එම කමිටුවේ සේවා නියම - Terms of Reference - මොනවාද?

(ඈ) ශ්‍රීලන්කන් ගුවන් සේවය වර්තමානය වනවිට එකිනෙකට වෙනස් වාණිජ ලක්ෂණ, වත්කම් පදනම්, ලාභදායීත්ව පැතිකඩ සහ ආයෝජන විභවතාවන්ගෙන් යුත්, එනම් ගුවන් යානා මෙහෙයුම් - Airline Operations, බිම් මෙහෙයුම් සේවා - Ground Handling Services - සහ ආහාර සැපයුම් සේවා - Catering Services - යනුවෙන් පැහැදිලි ව්‍යාපාරික අංශ තුනකින් සමන්විත වන බව රජය පිළිගන්නේද?

e) Has the Government obtained separate financial, operational and asset valuations for Airline Operations, Ground Handling Services and Catering Services and if so, will such valuations be tabled before Parliament?

We are looking at three different commercial entities rather than embodying them into one and making it one monolithic institution.

f) Has the Government considered restructuring, commercialization, a strategic investment, a public-private partnership or privatization by treating Airline Operations, Ground Handling Services and Catering Services as separate business entities in a manner similar to reforms previously undertaken in regard to the Sri Lanka Telecom, the CEB in the electricity sector through separation of generation, transmission and distribution functions and the petroleum sector through the separation of distinct operational segments, which you all are pursuing at this particular moment?

So, it is not something unusual, but something that is being pursued by your Government.

g) Is it a fact that the Ground Handling and Catering businesses have historically been monopolistic as Government-owned "cash cows", generating profits and possessing substantial standalone commercial value independent of airline operations and if so, what measures have been taken to ensure that such value is not diminished, transferred or undervalued through any restructuring exercise?

h) Will the Government table before Parliament the complete restructuring strategy, together with all relevant valuations, transaction structures and recommendations prior to the implementation of any commercialization, strategic partnership, privatization or divestiture involving SriLankan Airlines or any of its subsidiaries?

As you know, now, there is a new Chairman, Mr. Arandara, who is very knowledgeable. Ensure that such a team would be able to bring up something spectacular, not for the sake of disposing the airline or as an IMF requirement, but as a nation-building exercise, which would help the institution, even if it is a loss-leader, to bring revenue into this country.

Thank you, Sir.

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පිළිතුර සකස් කිරීම සඳහා වාර්තා පරිශීලනය කරලා තවත් කරුණු ගණනාවක් එකතු කරගන්න ඕනෑ. එම නිසා ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා විසින් ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ලද ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The next Question under Standing Order No. 27(2) to be raised by the Hon. Amirthanathan Adaikkalanathan.

## II

## මන්නාරම මහ රෝහල සඳහා CT Scan යන්ත්‍රයක් ලබාදීම

## மன்னார் பொது வைத்தியசாலைக்கு CT Scan இயந்திரம் வழங்கல்

## PROVISION OF CT SCANNER FOR GENERAL HOSPITAL, MANNAR

**ගරු අමිර්තනාදන් අඩෛක්කලනාදන් මහතා**
(மாண்புமிகு அமிர்தநாதன் அடைக்கலநாதன்)
(The Hon. Amirthanathan Adaikkalanathan)
நன்றி, கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே! மன்னார் மாவட்ட பொது வைத்தியசாலையில் நிலவும் கடுமையான உட்கட்டமைப்பு பற்றாக்குறை மற்றும் அதனால் அங்குள்ள பல்லாயிரக்கணக்கான பொதுமக்கள் நாளாந்தம் எதிர்கொள்ளும் உயிர் ஆபத்துகள் குறித்து நிலையியற் கட்டளை 27(2)இன்கீழ் கேள்விகளை எழுப்புவதனூடாக இந்தச் சபையில் சுகாதார அமைச்சரின் கவனத்தை அது தொடர்பில் ஈர்க்க விரும்புகின்றேன்.

மன்னார் மாவட்ட பொது வைத்தியசாலையானது, அந்த மாவட்டத்தில் வாழும் மக்களுக்கும் அதனைச் சுற்றியுள்ள பின்தங்கிய கிராமப்புற மக்களுக்கும் அத்தியாவசிய மற்றும் அவசர சிகிச்சைகளை வழங்கும் ஒரேயொரு மூன்றாம் நிலை சுகாதார நிறுவனமாகும். எனினும், இந்த முதன்மை வைத்தியசாலையில் இன்றுவரை ஒரு CT scan இயந்திரம் இல்லை என்பது மிகவும் துரதிருஷ்டவசமானது. இதன் காரணமாக:

1. மாதாந்தம் 100 முதல் 125 நோயாளிகள் அவசர தேவைகளுக்காகவும் விபத்துக்களின்போது தலையில் ஏற்படும் பாதிப்புகளைக் கண்டறியவும் யாழ்ப்பாணம் போதனா வைத்தியசாலை, வவுனியா மற்றும் கிளிநொச்சி பொது வைத்தியசாலைகளுக்கு ambulanceமூலம் அனுப்பப்படுகின்றனர்.
2. இதனால் அவசர சிகிச்சை தேவைப்படும் நோயாளிகளுக்குச் சரியான நேரத்தில் நோயறிதல் செய்ய முடியாமல் போவதோடு, நீண்ட தூரப் பயணங்களால் பல உயிர்கள் வழியிலேயே பிரியும் ஆபத்துகளும் தொடர்கின்றன.
3. நோயாளிகளை வெளிமாவட்டங்களுக்கு மாற்றுவதால், மன்னார் மாவட்டத்தின் ambulance சேவைகள் கடுமையாகப் பாதிக்கப்பட்டு, ஏனைய அவசர நோயாளர் போக்குவரத்துகளும் முடக்கப்படுகின்றன.
4. ஏழை எளிய மக்கள் தங்களது குடும்பத்தினருடன் வெளிமாவட்டங்களுக்குச் சென்று, தங்கி நின்று சிகிச்சை பெறுவதால் பெரும் பொருளாதார மற்றும் சமூகச் சுமைகளை எதிர்கொள்கின்றனர்.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இங்கு மிக முக்கியமான விடயம் என்னவென்றால், மன்னார் பொது வைத்தியசாலையில் இதற்கான புதிய CT scan கட்டிடம் ஏற்கனவே முழுமையாகக் கட்டி முடிக்கப்பட்டு தயாராக உள்ளது. அத்துடன், இந்த இயந்திரத்தை இயக்குவதற்கும் அறிக்கைகளை வழங்குவதற்கும் ஆலோசகர்கள் இருவர் - கதிரியக்க நிபுணர்கள் - தற்போது அங்கு நியமிக்கப்பட்டு கடமையில் உள்ளனர். அனைத்து உட்கட்டமைப்புகளும் இருந்தும், இயந்திரம் இல்லாத காரணத்தால் அந்த நிபுணர்களின் சேவைகளும் அங்கு வீணடிக்கப்படுகின்றன.

மேலும், 24.04.2025 அன்று கௌரவ சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சர் (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ அவர்கள் மன்னார் மாவட்டத்துக்கு உத்தியோகபூர்வ விஜயமொன்றை மேற்கொண்டிருந்தபோது, 2026ஆம் ஆண்டில் மன்னார் வைத்தியசாலைக்கு கண்டிப்பாக CT scan இயந்திரம் வழங்கப்படுமென உறுதியளித்திருந்தார். அரசாங்கம் வழங்கிய வாக்குறுதி ஏன் இன்னும் நிறைவேற்றப்படவில்லை? இதனை அடிப்படையாகக் கொண்டு, கௌரவ சுகாதார அமைச்சரிடம் நான் பின்வரும் கேள்விகளுக்குத் தெளிவான பதில்களைக் கோருகின்றேன்.

(அ) மன்னார் மாவட்டப் பொது வைத்தியசாலைக்கு CT scan இயந்திரம் ஒன்றைக் கொள்வனவு செய்வதற்காக மதிப்பிடப்பட்டுள்ள ரூபாய் 250 மில்லியன் நிதியை, 2026ஆம் ஆண்டுக்கான நிதி ஒதுக்கீட்டில் வழங்குவதற்கு அமைச்சரவை நடவடிக்கை எடுத்துள்ளதா? இல்லையெனில், அதற்கான காரணங்கள் யாவை?

(ஆ) கௌரவ சுகாதார அமைச்சர் அவர்கள் 2025 ஏப்பிரலில் மன்னார் மண்ணில் வைத்து மக்களுக்கு வழங்கிய வாக்குறுதி, 2026ஆம் ஆண்டின் இந்தக் காலாண்டுக்குள் ஏன் இன்னும் நிறைவேற்றப்படவில்லை?

(இ) மன்னார் மாவட்ட மக்களின் உயிர்ப் பாதுகாப்பை உறுதி செய்யும் பொருட்டு, எத்திகதிக்குள் இந்த CT scan இயந்திரம் அங்கு கொண்டுவரப்பட்டு, மக்களின் பயன்பாட்டுக்கு ஒப்படைக்கப்படும் என்பதை இந்தச் சபைக்கு அமைச்சர் திட்டவட்டமாக அறிவிப்பாரா?

நன்றி!

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු අමිර්තනාදන් අඩෛක්කලනාදන් මන්ත්‍රීතුමා ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ලද ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. (Dr.) Archchuna, what is your point of Order?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඊයේ Privilege Question එකක් භාර දුන්නා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. (Dr.) Archchuna, you handed it over to me in my office yesterday afternoon. I wish to inform you that I have carefully studied the contents of the Question of Privilege you submitted. This issue refers to concerned allegations relating to statements and conduct said to have taken place in the Chamber of the House at yesterday's Sitting.

As you have requested that the matter be treated as a Question of Privilege and be referred to the Committee on Ethics and Privileges, it is necessary that the relevant facts be established before any decision is made whether it is a Question of Privilege. I wish to inform you that, accordingly, I have directed the Question of Privilege to the Secretary-General's Office. As you also told me verbally, we will have to study the audio and video recordings relating to the incident and carefully examine the matter before a decision is made on whether the matter should be permitted to proceed as a Question of Privilege. Therefore, I wish to inform you, Hon. (Dr.) Archchuna, that the relevant audio and video recordings relating to this incident are carefully being examined, and you will be informed of the decision at the earliest.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. (Dr.) Archchuna?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, let me present it; it only runs into half a page and would take only 30 seconds.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
No, Hon. Member, I cannot allow that. You also informed me that we will have to go through the audio and video recordings and then take it up. So, as you said, I will take my time and go through those.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Okay, Sir, no problem. Thank you.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Dayasiri Jayasekara, what is your point of Order?

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම වරප්‍රසාද ප්‍රශ්නයක් යොමු කරලා තිබුණා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes. Hon. Member, that was -

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
Sir, could you give me 30 seconds please?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Okay.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක් කිසි විටෙක - කවදාවත් - Parliamentary Business Committee එකට ආලා නැහැ. ස්ථාවර නියෝග යටතේ අහපු වරප්‍රසාද ප්‍රශ්නයක් ලංකා ඉතිහාසයේ පළමු වතාවට තමයි මේ විධියට Parliamentary Business Committee එකට යොමු කර තිබෙන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සාමාන්‍යයෙන් කරන්නේ කථානායකතුමා කෙළින්ම ලේකම් මණ්ඩලයෙන් අදහස් අරගෙන එක්කෝ එය reject කරන එක, එක්කෝ එය ඉදිරිපත් කරන්න අවස්ථාව දෙන එක. දැන් අපිට වරප්‍රසාද ප්‍රශ්නයක් අහන්න, ඒක Parliamentary Business Committee එකට යොමු කරන්න සිද්ධ වෙලා තිබෙනවා. මේ රටේ අධිකරණ විනිශ්චයකාරවරුන්ගේ ප්‍රශ්නයක් සම්බන්ධයෙන් දිගින් දිගටම ප්‍රශ්න ගණනාවක් මතු වෙලා තිබෙන වෙලාවක්, මේක. ඒ වාගේම, මහෙස්ත්‍රාත්වරුන්ගේ පත්කිරීමේ ඉඳලා අනෙක් පත්කිරීම් දක්වාත් විශාල අර්බුදයක් තිබෙන වෙලාවක්. මට මේක ගැන කථා කරන්න ඉඩක් දෙන්නේ නැහැ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Dayasiri Jayasekara, you had been informed previously by the Hon. Speaker, while he was in the Chair, that it will be discussed at the Committee on Parliamentary Business. I cannot go back on that.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

But, the problem is, you cannot take it up at the Committee on Parliamentary Business; the decision should be taken by the Speaker, not by anyone else.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Dayasiri Jayasekara, you should have raised it at that moment, if that was the case. You know what the outcome was and that is it.

Next, the Ministerial Statement to be made by the Hon. (Dr.) Hiniduma Sunil Senevi, Minister of Buddhasasana, Religious and Cultural Affairs in reply to the Question under Standing Order No. 27(2) raised by the Hon. (Dr.) M.L.A.M. Hizbullah on 10th June, 2026.

## හජ් වන්දනාකරුවන් මුහුණ දුන් දුෂ්කරතා: බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගේ ප්‍රකාශය
## 'ஹஜ்' யாத்திரிகர்கள் எதிர்கொண்ட சிரமங்கள்: புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சரினது கூற்று
## HARDSHIPS FACED BY HAJJ PILGRIMS: STATEMENT BY MINISTER OF BUDDHASASANA, RELIGIOUS AND CULTURAL AFFAIRS

**ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා (බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) ஹினிதும சுனில் செனெவி - புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Dr.) Hiniduma Sunil Senevi - Minister of Buddhasasana, Religious and Cultural Affairs)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2026.06.10වන දින ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා ස්ථාවර නියෝග 27 (2) යටතේ අසන ලද ප්‍රශ්නයට මා පිළිතුරු ලබා දෙනවා. ගරු මන්ත්‍රීතුමා මේ යටතේ ප්‍රශ්න තුනක් යොමු කරලා තිබෙනවා.

එතුමා අසන ලද පළමු ප්‍රශ්නයට පිළිතුර වන්නේ, පිළිගන්නේ නැත යන්නයි. නමුත්, වැඩිමනත් පැහැදිලි කිරීමක් කරන්නට මා කැමැතියි.

ඔබ සියලුදෙනාම දන්නවා, හජ් වන්දනාව කියන්නේ ඉස්ලාම් ධර්මයේ මූලික වගකීම් පහෙන් එකක් බව. මෙය ලොව පුරා මුස්ලිම් ජනතාව විසින් ඉටු කරනු ලබන ප්‍රධානම ආගමික වතාවත්වලින් එකක්. සවුදි අරාබි රාජධානියේ ශුද්ධ වූ මක්කා නගරයේ තමයි මෙය පැවැත්වෙන්නේ. ලොව පුරා වාසය කරන මිලියන ගණනක් මුස්ලිම් බැතිමතුන් මෙම වන්දනාව සඳහා සහභාගි වන අතර, වන්දනාවේ ස්වභාවය හා වන්දනාකරුවන් විශාල සංඛ්‍යාව හේතුවෙන් යම් යම් ශාරීරික, පාරිසරික හා සංවිධානමය අභියෝග ඇති වීම වළක්වන්නට බැහැ. ඒ තත්ත්වය, ඒ බැතිමතුන් සියලුදෙනා වටහා ගෙන ඉන්න තත්ත්වයක්. ඒ නිසා ඒ වැදගත් ආගමික වගකීම ඉටු කිරීමේදී එවැනි දුෂ්කරතාවලට ඉවසීමෙන් හා කැපවීමෙන් මුහුණ දීම වන්දනාකරුවන් සාමාන්‍යයෙන් අපේක්ෂා කරන දෙයක්.

එමෙන්ම ඉස්ලාම් ආගමට අනුව හජ් වන්දනාව අනිවාර්ය වන්නේ ආර්ථික වශයෙන් හා ශාරීරිකව හැකියාවක් තිබෙන, ප්‍රශස්ත සෞඛ්‍යයක් තිබෙන බැතිමතුන්ටයි. එම වගකීම ඉටු කිරීම සඳහා ඔවුන් ශාරීරිකව හා මානසිකව සුදුසු සහ ශක්තිමත් තත්ත්වයක සිටිය යුතුයි. මෙම වතාවත් සිදු කරනු ලබන්නේ ලොව විවිධ රටවලින් පැමිණෙන මිලියන ගණනක වන්දනාකරුවන් සමඟ එකතු වෙලා නිසා තදබදය, පාරිසරික තත්ත්වය හා ඇතැම් පහසුකම් භාවිතයේ අපහසුතා වැනි තත්ත්වයන්ට මුහුණ දීමට සිදු වීම හජ් වන්දනාවේ ස්වාභාවික ලක්ෂණයක් කියලා සාමාන්‍යයෙන් පිළිගැනෙනවා.

හජ් වන්දනාවේ ප්‍රධාන ස්ථාන වන්නේ මිනා, අරෆා සහ මුස්තලිෆා ය. මේ කරුණු ප්‍රසිද්ධයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම ස්ථානවල පරිපාලනය සහ එහි යටිතල පහසුකම් සම්බන්ධ සියලු තීරණ සවුදි අරාබියේ හජ් හා උම්රා අමාත්‍යාංශය මඟින් ගනු ලබන අතර, එම තීරණවලට සහ ප්‍රමිතීන්ට අනුව සේවා පහසුකම් ක්‍රියාත්මක කරන්නේ සවුදි අරාබි සේවා නියෝජිත ආයතනයයි.

ඇත්තටම පසුගිය වසරේ මමත්, නියෝජ්‍ය අමාත්‍යතුමාත් සවුදි අරාබියට ගිහිල්ලා service providersලා සියලුදෙනාට consulate එකට ආරාධනා කරලා, interview කරලා සුදුසු ප්‍රශස්තම උදවිය තමයි සම්බන්ධ කරගත්තේ. සවුදි අරාබියේ හජ් සහ උම්රා අමාත්‍යතුමා සමඟ මා පෞද්ගලිකව ද්විපාර්ශ්විකව සාකච්ඡා කරලා පුළුවන් තරම් පහසුකම් ඉල්ලා, එම පහසුකම් හදලා තමයි ඇත්තටම තිබුණේ.

සවුදි අරාබියේ හජ් හා උම්රා අමාත්‍යාංශය විසින් ප්‍රකාශයට පත් කරන ලද සංඛ්‍යාලේඛන අනුව 2026 වර්ෂයේදී හජ් වන්දනාව ඉටු කිරීම සඳහා වන්දනාකරුවන් 1,707,301ක් - ආසන්න වශයෙන් මිලියන 1.7ක් - සහභාගි වුණා. මිනා නගරය සීමිත ප්‍රදේශයක් තුළ පිහිටා තිබෙන නිසා මෙම වන්දනාකරුවන් සඳහා එකවර නවාතැන් පහසුකම් සහ සනීපාරක්ෂක පහසුකම් සපයාගත යුත්තේ එම ප්‍රදේශය තුළම වන බැවින් - මේක මිනා ප්‍රදේශය සම්බන්ධව තිබෙන අභියෝගයක් - මෙම වන්දනාකරුවන් සඳහා වැසිකිළි පහසුකම් වෙනුවෙන් සපයනු ලැබුවේ වැසිකිළි 17,000ක් පමණි. මෙම සනීපාරක්ෂක පහසුකම් ලෝකයේ සියලු රටවලින් පැමිණෙන වන්දනාකරුවන්ට අදාළව ක්‍රියාත්මක වන පොදු සැලැස්මට අනුව භාවිත කරන්න තමයි ඉඩ දීලා තිබෙන්නේ. එම හේතු මත මිනා හි සැලකිය යුතු අභියෝග මතුවීම වළක්වන්නට බැහැ.

සවුදි අරාබියේ හජ් සහ උම්රා අමාත්‍යාංශයට අනුව, එක් එක් කණ්ඩායම්වලට service categories තිබෙන බව අපි දන්නවා. මිනා කඳවුරුවල එක් හාජිවරයෙකු වෙනුවෙන් වෙන් කළ යුතු අවම ඉඩ ප්‍රමාණය තීරණය වනවා. 2026 වර්ෂයේ අතිරේක ඉඩ ප්‍රමාණයක් සහ වැඩිදියුණු කළ පහසුකම් යන නාමයෙන් වැඩි ගාස්තුවක් අය කරලා නැහැ. මුදල් සම්බන්ධයෙන් සහ අය කිරීම් සම්බන්ධයෙන් අපි ඉතා හොඳ තත්ත්වයක් ඇති කරගත්තා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අය කරන සමස්ත මුදලෙනුත් ලක්ෂ තුනක්, තුනහමාරක් වාගේ අඩු මුදලක් තමයි මෙවර අය කළේ, travel agentsලා පවා. මම හිතන විධියට ඒවා ඉතා හොඳ ලක්ෂණ.

[ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා]

2025 වර්ෂයේ B කාණ්ඩ සේවා සඳහා ගෙවනු ලැබූ මුදලට වඩා මෙවර අඩුවෙන් ගාස්තු ගෙව්වා. 2026 වර්ෂයේ මිනාහි එක් හාජිවරයෙකු වෙනුවෙන් වැඩි ඉඩ ප්‍රමාණයක් වෙන් කරන ලද අතර, ඉතා පහසු සෝෆා ඇඳන් ලබා දුන්නා. තවද, හාජිවරුන් 2,910ක් සඳහා වැසිකිළි 36ක් සහ හාජිවරුන් 590ක් සඳහා වෙනම වැසිකිළි 8ක පහසුකම් සැලසුවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ටිකක් කෙටි කරමින් වුවත්, මා මෙම පිළිතුර ලබා දිය යුතුයි.

සවුදි අරාබියේ හජ් හා උම්රා අමාත්‍යාංශයේ නීති රීතිවලට අනුව, 2026 හජ් වන්දනා කටයුතු සඳහා මුනාසිම්වරුන්, ඒ කියන්නේ නියෝජිතයින් හයදෙනෙකු පත් කරන්න පියවර ගත්තා. ඔවුන් 2026 වර්ෂයේ ලියාපදිංචි හජ් නියෝජිත ආයතන 93 නියෝජනය කරමින්, හජ් සහ උම්රා කමිටුව සමඟ එක්ව සියලු සම්බන්ධීකරණ කටයුතු සිදු කරනු ලැබුවා, ගරු මන්ත්‍රීතුමනි. 2026 හජ් වන්දනා කටයුතු සම්බන්ධව තීන්දු තීරණ ගැනීමේදී ඔවුන් සමඟ සාකච්ඡා කර උපදෙස් ද ලබා දුන්නා. ඒ අනුව, මෙවර හජ් වන්දනාවට අදාළ සියලු කටයුතු වඩාත් විනිවිදභාවයකින් යුතුව සංවිධානය කරන්නට ඇත්තටම අපට හැකි වුණා.

මේ සම්බන්ධයෙන් ස්වාධීන පරීක්ෂණයක් පැවැත්වීම සඳහා ගෙන ඇති පියවර මොනවාද කියා ගරු මන්ත්‍රීතුමා ඊළඟ ප්‍රශ්නයෙන් විමසා තිබෙනවා. ඉහත සඳහන් කරුණුවලින් 2026 හජ් වන්දනාව සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති චෝදනාවලට කරුණු පැහැදිලි කර තිබෙනවා.

තවද, සවුදි අරාබි රජයේ රෙගුලාසිවලට අනුව, ලියාපදිංචි ආයතන 93ක් නියෝජනය කරමින් මුනාසිම්වරුන් 6දෙනෙකු හජ් සහ උම්රා කමිටුව සමඟ එක්ව මෙම කටයුතු සියල්ල ඉටු කරන ලදී. සියලු තීරණ මෙම මුනාසිම්වරුන් 6දෙනා සමඟ සාකච්ඡා කර උපරිම විනිවිදභාවයකින් යුතුව ගෙන ඇති බැවින්, මේ පිළිබඳව තවත් ස්වාධීන පරීක්ෂණයක් පැවැත්වීමේ අවශ්‍යතාවක් අප දකින්නේ නැහැ. නමුත්, මුළු ගමන පිළිබඳ සවිස්තරාත්මක වාර්තාවක් මං ඉල්ලා සිටියා. හජ් කමිටුව සවිස්තරාත්මක වාර්තාවක් අපට සපයා තිබෙනවා. එම වාර්තාව ඔබතුමන්ලාගේ පරිහරණයට අපට දෙන්න පුළුවන්. මම හිතන විධියට, ඔබතුමා අදහස් කරන අතිරේක විමර්ශන කියන කාරණාවලට සියලු පිළිතුරු මේ වාර්තාව තුළ තිබෙනවා. මෙම වාර්තාව මම **සභාගත*** කරනවා.

ගරු මන්ත්‍රීතුමා ඊළඟට විමසනවා, අනාගතයේදී මෙවැනි ගැටලු ඇති නොවන්න ගන්නා ක්‍රියාමාර්ග මොනවාද කියා. හැම වර්ෂයකම හජ් කමිටුව විසින් හජ් මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් විමර්ශන වාර්තාවක් සකස් කරනු ලබන අතර, එහිදී මෙහෙයුම් කාලය තුළ පැන නඟින ගැටලු, අත්දැකීම් සහ වැඩිදියුණු කළ යුතු ක්ෂේත්‍ර හඳුනාගෙන, ක්‍රමානුකූලව සමාලෝචනය කරනවා.

2026 වර්ෂයේ හජ් වන්දනාකරුවන් සඳහා සනීපාරක්ෂක වැසිකිළි පහසුකම් ප්‍රමාණවත් නොවූ බවට ඉදිරිපත් කර ඇති චෝදනාව - මෙය තමයි වැඩිපුරම නැඟුණු චෝදනාව - සම්බන්ධයෙන් අදාළ බලධාරීන්ගේ අවධානය යොමු කර තිබෙනවා. මිනා, අරෆා යන ස්ථානවල යටිතල පහසුකම් සම්බන්ධයෙන් ඇති වූ ගැටලු සම්බන්ධ පැමිණිලි හා යෝජනා ශ්‍රී ලංකා හජ් හා උම්රා කමිටුව මඟින් සවුදි අරාබියේ හජ් හා උම්රා අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත. ඊට අදාළ ලේඛනය ඇමුණුම වශයෙන් **සභාගත*** කරමි.

සෑම වර්ෂයකම අදාළ වර්ෂයේදී හජ් වන්දනා කටයුතුවලට අදාළ ක්‍රියාදාම පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා සවුදි අරාබියේ හජ් හා උම්රා අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකාවේ හජ් දූත කණ්ඩායමට ආරාධනාවක් කරනු ලබන අතර, එම අවස්ථාවේදී ශ්‍රී ලංකාවේ දූත පිරිස මෙවැනි ගැටලු සම්බන්ධයෙන් ගනු ලබන ඉදිරි ක්‍රියාමාර්ග සාකච්ඡා කර අනාගතයේදී ගැටලු ඇතිවීම අවම කරනු ලබයි. මෙවර ඇති වූ තත්ත්වය ගැන අපට ආයෙත් විමසන්න පුළුවන්. ඒ සම්බන්ධව පැහැදිලි කරලා, අවධාරණය කරලා ඒ කටයුතු කරන්න අප බලාපොරොත්තු වනවා.

තවද, හජ් වන්දනාකරුවන් සඳහා පිටත්වීමට පෙර දැනුවත් කිරීමේ වැඩසටහන් ශක්තිමත් කිරීම, - මේවා අපට තවදුරටත් කරන්න පුළුවන් දේවල් - හජ් මෙහෙයුම් කාලය තුළ ක්ෂේත්‍ර නිලධාරීන්ගේ අධීක්ෂණය වැඩිදියුණු කිරීම සහ වන්දනාකරුවන් හා අදාළ බලධාරීන් අතර සන්නිවේදනය තවත් හොඳින් ඉෂ්ට කරලා, ශක්තිමත් කරලා ගැටලු අවම කර ගන්න බලාපොරොත්තු වනවා, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා**
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)
பதிலளித்தமைக்கு கௌரவ அமைச்சர் அவர்களுக்கு நன்றிகளைத் தெரிவித்துக் கொள்கின்றேன்.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இம்முறை ஹஜ் பயணத்தின்போது எந்தவொரு குறையும் ஏற்படவில்லை, அப்பயணம் மிகவும் திருப்தியாக அமைந்திருந்ததென Hajj Committee தனக்கு அறிக்கை சமர்ப்பித்திருப்பதால் அது தொடர்பில் ஆராய்வதற்குக் குழுவொன்று நியமிக்கப்படத் தேவையில்லையென கௌரவ அமைச்சர் அவர்கள் தன்னுடைய பதிலில் குறிப்பிட்டிருந்தார். மினாவிலும் முஸ்தலிபாவிலும் நூற்றுக்கணக்கான ஹஜ்ஜாஜிகள் toiletக்கும் சாப்பாட்டுக்கும் தேநீருக்கும் வரிசையில் நின்றதை நாங்கள் social mediaமூலம் நேரடியாகப் பார்த்தோம். கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இதை நீங்களும் அறிவீர்கள்; முழு நாடும் அறியும்! கட்டுநாயக்க விமான நிலையத்தில் ஹஜ்ஜாஜிகள் வந்திறங்கியவுடன், மேற்குறித்த இடங்களில் ஏற்பட்ட சிரமங்கள் பற்றி நேரடியாக social mediaமூலம் தெரிவித்தார்கள். அதாவது, toiletக்குப் போவதற்கும், சாப்பாட்டுக்கும் பல மணித்தியாலங்கள் வரிசையில் நிற்கவேண்டி இருந்ததால், தங்களால் சரியாக வணக்க வழிபாடுகளில் ஈடுபட முடியவில்லை என விமான நிலையத்தில் வைத்து ஹாஜிகள் பலர் சொன்னார்கள்.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, it should only be a clarification on the Hon. Minister's Statement.

**ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා**
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)
I will wind up, Sir,

கௌரவ அமைச்சர் அவர்களே, ஹாஜிகள் விமான நிலையத்தில் வந்திறங்கியவுடன் பொய் சொல்ல வேண்டிய அவசியம் கிடையாது; அவர்கள் பொய் சொல்வதும் இல்லை. இவ்விடயங்கள் தொடர்பில் ஆராய்வதற்கு நீங்கள் Hajj Committeeக்கு வெளியில் உள்ளவர்களைக் கொண்டு ஒரு குழுவை நியமித்து, இந்த ஹாஜிகள் மினாவிலும் முஸ்தலிபாவிலும் நடந்ததாகச் சொல்கின்ற விடயங்கள்

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

பொய்யா என்பதை ஆராய வேண்டும். மக்காவுக்குச் சென்றிருந்த ஒரு வைத்தியர் அங்கு சென்றிருந்தார். அவருக்கு loose motion ஏற்பட்டது. அவர் ஒரு மணித்தியாலம் queueஇல் நின்று toiletக்குப் போய்விட்டு, திரும்பவும் queueஇல் நின்று toiletக்குப் போய் இப்படியே -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, it should only be a clarification on the Hon. Minister's Statement.

**ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා**
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)
இது நாடு முழுவதும் அறிந்த ஒரு பிரச்சினை! முழு நாட்டு முஸ்லிம்களுக்கும் தெரிந்த ஒரு பிரச்சினை! கௌரவ அமைச்சர் அவர்களே, நாங்கள் உங்களை மதிக்கின்றோம்; உங்களுக்கு மிகவும் மரியாதை கொடுக்கின்றோம். உங்களுடைய காலத்தில் இந்தப் பிரச்சினைக்குத் தீர்வு காணப்படும் என்ற நம்பிக்கை எனக்கும் இந்த நாட்டிலுள்ள முஸ்லிம்களுக்கும் இருக்கின்றது. அதில் எந்த மாற்றுக் கருத்தும் கிடையாது. கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் சொன்ன பதிலானது, முஸ்லிம் சமூகத்தின் மத்தியில் உங்களைப் பற்றியும் இந்த அரசாங்கத்தைப் பற்றியும் தவறானதோர் அபிப்பிராயத்தை ஏற்படுத்தும். நான் அரசாங்கத்தை விமர்சித்துப் பேசவில்லை. உண்மையிலேயே இது நடந்த விஷயம்; ஆயிரக்கணக்கான ஹாஜிகள் வெளியிட்ட விஷயம். இப்படி நடக்கவே இல்லையென்று Hajj Committee ஓர் அறிக்கையைத் தருமாகவிருந்தால், அதைவிட மோசமான செயலொன்று இருக்க முடியாது. கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் சுயாதீனமான ஒரு குழுவை நியமித்து, உண்மையிலேயே இப்படி நடந்ததா, இல்லையா என்பதை ஆராய்ந்து பார்க்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

**ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹினிதும சுனில் செனெவி)
(The Hon. (Dr.) Hiniduma Sunil Senevi)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු කරුණ පැහැදිලියි. මම වහාම මේ කොටස ඒකට එකතු කරන්න ඕනෑ. කිසිදු අඩුපාඩුවක් සිදු වුණේ නැහැ කියන එක නොවෙයි මම අදහස් කළේ. ඒක වහාම මම නිවැරදි කළ යුතුයි. මා අදහස් කළේ මේකයි. මට ලැබුණු තොරතුරු අනුව මම ඇත්තටම මේගොල්ලන් රැස් කරලා ඒ සම්බන්ධයෙන් සාකච්ඡා කළා. එබඳු අඩුපාඩුකම් සිදු වෙලා තිබෙන්න පුළුවන්. මේකේ පසුබිම ගැනයි මම මේ කිව්වේ. සාමාන්‍යයෙන් ඒ අඩුපාඩුකම් පිරිස වැඩි වීම නිසාම හැම දාම සිද්ධ වෙන දෙයක්. නමුත්, ඉතාම පෙර දැක්මෙන් යුතුව කටයුතු කරලා, වන්දනාකරුවන්ට තමන්ගේ ජීවිතේ උතුම් වන්දනාව හරියට කර ගැනීමට ඉඩකඩ ලබා දීම රජයක් හැටියට අපේ වගකීමක් වෙනවා. ඒ පිළිබඳව තමයි මගේත්, ගරු මුනීර් මුලාෆර් නියෝජ්‍ය අමාත්‍යතුමාගේත් අවධානය යොමු වෙලා තිබෙන්නේ.

ගරු මන්ත්‍රීතුමනි, මම ඔබතුමාට කිව්වේ පූර්ණ වාර්තාවක් දීලා තිබෙනවා කියලායි. එම වාර්තාවේ සඳහන් වෙනවා, ඔය කියපු විස්තර සියල්ල. ඒ ප්‍රශ්නය විසඳන්න හජ් කමිටුව ගත්ත ක්‍රියාමාර්ග සියල්ලත් එහි සඳහන් වෙනවා. ඒවා ප්‍රමාණවත් නොවීම පිළිගන්න පුළුවන්. මොකද, අපි මේක තවදුරටත් හොඳින් ඉටු කරන්න ඕනෑ. ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ කෙනෙකුට අපහසුතාවක් දැනිලා තිබෙනවා නම් ඒ සියලු දේවල් ගැන අපි කනගාටු වෙනවා. ඒවා විසඳා ගන්න ගත්ත ක්‍රියාමාර්ග රාශියක් පිළිබඳවත් කරුණු මට ඔබතුමාට ඉදිරිපත් කරන්න පුළුවන්. උදාහරණයක් හැටියට ගත්තොත්, මේ ගෙවන්න තිබෙන විශාල මුදල ගැන කථාවක් හදාගෙන යනවා, ණය මුදලක් දීලා මේ අපහසුතාවෙන් ඔවුන් මුදා ගන්නේ කොහොමද කියලා. රුපියල් ලක්ෂ ගණනක් වැනි විශාල මුදලක් මේ වෙනුවෙන් වැය වෙනවා. ඒ මුදල අඩු කර ගන්න වැයම් කරලා අපි මේ සැරේ ඒ මුදල අඩු කරගෙනත් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි සියලුදෙනාම මේ කාරණයත් තේරුම් ගන්න ඕනෑ. ඉන්දියාවේ ලක්ෂ සංඛ්‍යාත පිරිසක් මේ ගමනට සහභාගි වෙනවා. නමුත්, travel agentsලා ඉතාම අඩු ප්‍රමාණයක් තමයි ඒක handle කරන්නේ. අපේ රටේ 3,500ක විතර ජනතාවක් තමයි මේ ගමනට සම්බන්ධ වෙන්නේ. නමුත්, ඒ වෙනුවෙන් travel agentsලා 93ක් සම්බන්ධ වෙනවා. එකිනෙකාට නඩුහබ දමාගෙන, ඉතා විනාශකාරී වෙලා තිබුණු තත්ත්වයක් තමයි මම පිළිවෙළට පත් කරගෙන, ක්‍රමානුකූලව දැන් ගැටලු විසඳා ගෙන යන්නේ. ඔබතුමා ඇතුළු ඔබතුමන්ලාගේ සමාජයේ සියලුදෙනා අප කෙරෙහි විශ්වාසය තබා තිබෙන බව මම දන්නවා. ඒ වෙනුවෙන් මම සියලුදෙනාටම ස්තුතිවන්ත වෙනවා.

මම කියන්නේ මේකයි. මේ කමිටුවෙන් ලැබිලා තිබෙන වාර්තාව ප්‍රමාණවත් නොවෙනවා නම් ගරු නියෝජ්‍ය ඇමතිතුමාගේ මූලිකත්වයෙන් නැවත විමර්ශනයක් කරන්න පුළුවන්. එතුමාත් ප්‍රායෝගිකව මේ වන්දනා ගමනට සම්බන්ධ වුණා. මෙහි තිබෙන සියලු අඩුපාඩු හදා ගන්න අපේ උත්සාහයක් තිබෙන බව මම මුස්ලිම් සමාජයට ප්‍රකාශ කරන්නට කැමැතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Members, this is an announcement from the Chair. I wish to inform this House that a Meeting of the Committee on Parliamentary Business will be held at 12.00 noon today, 26th of June, 2026, in Committee Room No. 02. All Members of the Committee are kindly requested to be present at the Meeting.

Notice of Motions at the Commencement of Public Business.

## පාර්ලිමේන්තුවේ රැස්වීම්
### பாராளுமன்ற அமர்வு
### SITTINGS OF THE PARLIAMENT

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු සභානායකතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.00 සිට අ.භා. 5.30 දක්වා ද විය යුතු ය. අ.භා. 2.30ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8(5) ක්‍රියාත්මක විය යුතු ය. අ.භා. 5.30ට කථානායකවරයා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Public Business. Item No. 01 in today's Order Paper - Order under the Sri Lanka Electricity Act - to be moved by the Hon. Anura Karunathilaka.

## ශ්‍රී ලංකා විදුලිබල පනත: නියමය
## இலங்கை மின்சாரச் சட்டம்: கட்டளை
## SRI LANKA ELECTRICITY ACT: ORDER

**ගරු අනුර කරුණාතිලක මහතා (වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ බලශක්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு அனுர கருணாதிலக்க - துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் வலுசக்தி அமைச்சரும்)
(The Hon. Anura Karunathilaka - Minister of Ports and Civil Aviation and Minister of Energy)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "2024 අංක 36 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 1(2) වගන්තිය යටතේ එවකට බලශක්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2026 මාර්තු 05 දිනැති අංක 2478/41 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2026.06.09 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.
>
> (අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The first speaker from the Government side, the Hon. Arkam Ilyas. Hon. Deputy Minister, you have 13 minutes.

[පූ.භා. 11.11]

**ගරු අර්කම් ඉල්යාස් මහතා (බලශක්ති නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அர்கம் இல்யாஸ் - வலுசக்தி பிரதி அமைச்சர்)
(The Hon. Arkam Ilyas - Deputy Minister of Power)

මට මේ අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

අද අපට සාකච්ඡා කිරීමට නියමිතව තිබෙන්නේ ශ්‍රී ලංකා විදුලිබල පනත යටතේ ඉදිරිපත් කර ඇති නියමය පිළිබඳවයි. බලශක්ති අමාත්‍යවරයා විසින් 2024 අංක 36 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත අනුව ක්‍රියාත්මක වීමේ දිනය ලෙස 2026 මාර්තු 09වන දින ප්‍රකාශයට පත් කර තිබෙනවා.

අපේ රජය යටතේ කරපු වැදගත්ම කටයුත්තක් ලෙස ලංකා විදුලිබල මණ්ඩලය ප්‍රතිව්‍යුහගතකරණය කිරීම අපි සලකනවා. ලංකා විදුලිබල මණ්ඩලය සම්පූර්ණයෙන්ම රජය යටතේ පවතින සමාගම් 6ක් ලෙස පසුගිය මාර්තු 09වැනි දින ඉඳලා වැඩ ආරම්භ කළා. අපි විශාල වැඩ කොටසක් ඒ දවසේ ඉඳලා කරගෙන යනවා. ඒ සඳහා වූ සාකච්ඡාව තමයි අද දවසේ යෙදිලා තිබෙන්නේ. පසුගිය ආණ්ඩු යටතේ සමාගම් 12ක් තිබුණු අතර, එයිනුත් සමාගම් 2ක් හැර අනෙක් සමාගම් 10ම සියයට සියයක්ම රජය යටතේ පවතින සමාගම් නොවන විධියට තමයි සැලසුම් කර තිබුණේ. අපේ රජය යටතේ ඒක සමාගම් 6ක් දක්වා අඩු කරලා, ඒ සියලු සමාගම් සියයට සියයක්ම රජය යටතේ පවතින, භාණ්ඩාගාරය යටතේ පවතින සමාගම් බවට පත් කරලා, අපි ප්‍රතිව්‍යුහගතකරණය කරන්න පටන් ගත්තා. ඒකත් එක්කම අපට ලොකු වැඩ කොටසක් 2026 මාර්තු 09වැනි දා ඉඳලා පටන් ගන්න පුළුවන් වුණා. විශේෂයෙන්ම අපේ අධ්‍යක්ෂ මණ්ඩල 6ක් එකතු වෙලා ඉන්නවා. ඒගොල්ලන් එක්ක එකතු වෙලා අපි විශාල වැඩ කොටසක් කළා. එතැනදී කලින් යෝජනා වෙලා තිබුණු ආකාරයට අනිවාර්ය විශ්‍රාම යාමේ ක්‍රමය වෙනුවට අපි ස්වේච්ඡා විශ්‍රාම යාමේ ක්‍රමයක් හඳුන්වා දුන්නා.

ඒ වාගේම විධායක ශ්‍රේණි සහ විධායක නොවන ශ්‍රේණිවල අය විශ්‍රාම යාමේදී ලබා දෙන වන්දි මුදල slabs දෙකකටයි තිබුණේ, රුපියල් ලක්ෂ 50ක් සහ රුපියල් ලක්ෂ 25ක් වශයෙන්. මෙහිදී විධායක සහ විධායක නොවන සියලු දෙනාටම රුපියල් ලක්ෂ 50ක් දක්වා ලබා ගැනීමේ අවස්ථාව අපි සලසා දුන්නා. ඒ වාගේම, ලංකා විදුලිබල මණ්ඩලයේ එවකට හිටපු සියලු සේවකයන්ගේ වැටුප් හෝ නීත්‍යනුකූල වරප්‍රසාද එකක්වත් කප්පාදු නොවන ආකාරයට මේ ප්‍රතිසංස්කරණ කරන්න අපට හැකියාව ලැබුණා. විශේෂයෙන්ම මෙය ක්‍රියාත්මක වීමේ දිනය ප්‍රකාශ කිරීමෙන් පසු සමාගම් හරහා ඉතා සුමටව මේ පරිවර්තනය කර ගන්න හැකියාව අපට මේ අවස්ථාව වෙනකොට ලැබිලා තිබෙනවා. විශේෂයෙන්ම මාර්තු ඉඳලා ජූනි වෙනකම් ඒ කටයුතු අපි සිදු කර තිබෙනවා. අධ්‍යක්ෂ මණ්ඩලය වාගේම විදුලිබල මණ්ඩලයේ දැන් සමාගම්වල ඉන්න සේවකයනුත් එකතු වෙලා ඉතා විශාල වැඩ කොටසක් මේ දවස්වල කරගෙන යනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ලංකා විදුලිබල මණ්ඩලයේ ප්‍රතිව්‍යුහගතකරණයත් එක්කම ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගිය 1,900කට ආසන්න පිරිසකට වන්දි පිරිනැමීමේ කර්තව්‍යයක් තිබුණා. ඒ අයට රුපියල් බිලියන 8.5ක වාගේ මුදලක් ගෙවීමට තිබුණා. ජනාධිපතිතුමා ඒකට මැදිහත් වෙලා, අපේ සමාගම්වලට බරක් නොවන විධියට ඒ වාගේම විදුලි බිලට බරක් නොවන විධියට එයින් විශාල ප්‍රමාණයක් භාණ්ඩාගාරයෙන් ලබා දීම නිසා 1,900කට ආසන්න ඒ සියලුම සේවකයන්ට වන්දි මුදල් ලබා දෙන්න අපට පුළුවන් වුණා. ඉතින් ඒකත් ජයග්‍රහණයක් කියලා අපි හිතනවා. විශේෂයෙන්ම විදුලි බිලට බරක් නොවන විධියට ඒ අදාළ මුදල් භාණ්ඩාගාරය හරහා ලබා දීම මඟින් අපට විශාල වාසියකුත් ලබා ගන්න පුළුවන් වුණා. ඒ සියලුම සේවකයන්ට ලබා දිය යුතු වන්දි මුදල් ලබා දෙන්න දැනටත් අපට පුළුවන් වෙලා තිබෙනවා.

මේ ප්‍රතිව්‍යුහගතකරණයත් එක්ක තවමත් ඉතුරු වෙලා තිබෙන වැඩ කොටස් කිහිපයක් තිබෙනවා. ඒ සම්බන්ධවත් අපි මේ දවස්වල කඩිනමින් කටයුතු කරගෙන යනවා. විශේෂයෙන්ම සමාගම් අතර හා සමාගම් ඇතුළේ transfer process එක සම්බන්ධව ගත්තොත්, ඒ අදාළ සේවකයන් විශාල පිරිසකගේ ඉල්ලීම් තිබෙනවා. යම්කිසි පිරිසකගේ ඉල්ලීම් අනුමත වෙලාත් තිබෙනවා. තවත් පිරිසකගේ දුක්ගැනවිලි - grievances - ගැන බලන්නත් තිබෙනවා. ඒ සඳහාත් අපි ප්‍රතිව්‍යුහගත කිරීමේ කාර්යාංශය හරහා සහ අමාත්‍යාංශය හරහා මැදිහත් වෙලා, අදාළ කමිටු එක්ක සාකච්ඡා කරමින් පවතිනවා. අපි අනිවාර්යයෙන් බලාපොරොත්තු වෙනවා, පුළුවන් තරම් ඉක්මනින් ඒ කටයුතු අවසන් කරන්න. ඒ වාගේම ස්වේච්ඡා විශ්‍රාම ගැනීම් සහ අනෙකුත් කාරණා නිසා පුරප්පාඩු විශාල ප්‍රමාණයක් ඇති වෙලා තිබෙනවා. ඒ වාගේම අලුත් අධ්‍යක්ෂ මණ්ඩල පත් කිරීම එක්කත් තවත් පුරප්පාඩු විශාල ප්‍රමාණයක් ඇති වෙලා තිබෙනවා. ඒ HR policies ටික දැන් අපි හදලා අවසන් කරලා තිබෙන්නේ. ඒ HR policiesවලට අදාළව අපේ cadre එකත් revise කරගෙන, අදාළ බඳවා ගැනීම් කරන්න තිබෙනවා. ඒ වාගේම අපේ අවසන් පැවරුම් වැඩසටහන - final transfer plan එක - අවසන් කර ගන්න තිබෙනවා. ඒ ඔක්කෝටම අපට වසරක කාලයක් හම්බ වෙනවා. ඒ වසරක කාලය ඇතුළත අවසන් කර ගැනීමට තිබෙන සම්පූර්ණ කර්තව්‍ය සම්බන්ධයෙන් අපි දැනටත් කටයුතු ආරම්භ කරලා තිබෙනවා. ඒ අනුව සේවකයන්ගේ අඩුපාඩු සපුරනවා වාගේම පාරිභෝගිකයන්ටත් ගුණාත්මක සහ අඛණ්ඩ සේවාවක් ලබා දීමේ වැඩ කටයුත්ත අපි මේ වන විට සාර්ථකව කරගෙන යමින් පවතින බව තමයි ප්‍රකාශ කරන්න තිබෙන්නේ.

මේ ප්‍රතිසංස්කරණ තුළින් අපට හැකි වෙලා තිබෙනවා, අදාළ සමාගම් හරහා විදුලි ක්ෂේත්‍රයේ ක්‍රියාකාරකම් ඉතා ළඟින් අධ්‍යයනය කිරීමට. ඉස්සර ජනනය, සම්ප්‍රේෂණය, බෙදා හැරීම, පද්ධති පාලනය වාගේ සියලුම දේවල් එකම තැනකින් තමයි

පාලනය වුණේ. නමුත් අපට දැන් ඒවා වෙන වෙනම monitor කිරීමේ පහසුකම ලැබී තිබෙනවා. ඒ නිසා ඇත්තටම අපට ගොඩක් පහසුවක් වෙලා තිබෙනවා, විදුලිබල ක්ෂේත්‍රය පිළිබඳව තීරණ ගැනීමේදී. ඒ තීරණ ලෙහෙසියෙන්ම ගන්න පුළුවන් වෙලා තිබෙනවා. ඒ වාගේම ව්‍යාපෘති සැලසුම් කිරීම, අධීක්ෂණය වැනි සියලු දේවල්ද ඉක්මනින් සහ කාර්යක්ෂමව කර ගන්න ඒ හරහා අවස්ථාව ලැබී තිබෙනවා. ඒ වාගේම මූල්‍ය තත්ත්වයන් පිළිබඳව වඩාත් නිවැරදි තොරතුරු ලබා ගැනීමට හැකි වීම මඟින් ඉතාම කාර්යක්ෂමව ක්ෂේත්‍රයේ වැඩකටයුතු කර ගැනීමට අපට ලොකු තල්ලුවක් ලැබී තිබෙනවා. අපි දන්නවා, විදුලිබල මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය පිළිබඳව දැන ගැනීම ඉස්සර අපට ඉතා අසීරු කාර්යයක් වෙලා තිබුණා. එක එක තැන්වල accounts තිබුණා. ඒ වාගේ ගොඩක් ප්‍රශ්න තිබුණා. ඉතින් සම්පූර්ණයෙන් නොවුණත් මේ වන විට අපි ඒවා එකින් එක විසඳමින් පවතිනවා. දැන් අපට ලෙහෙසි වෙලා තිබෙනවා, ඒ පිළිබඳව අදාළ කරුණු ලබා ගන්න.

මෙහිදී වැදගත්ම කාරණය මේකයි. අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේත් තිබෙනවා වාගේම පරිසර සම්මුතීන් හරහාත් අපි පොරොන්දු වෙලා තිබෙනවා, 2030 වන විට සියයට 70ක් renewable energyවලට යනවා, 2050 වන විට සම්පූර්ණයෙන්ම carbon neutral වෙනවා කියලා. අපි බලාපොරොත්තු වෙනවා, ඒ targets අපට ඉතාම ලෙහෙසියෙන් ජය ගන්න පුළුවන් වෙයි කියලා. මොකද, 2025 අවුරුද්ද ගත්තොත්, මෙගාවොට් 1,000කට ඉතාම ආසන්න ප්‍රමාණයක් සෝලා හරහා පමණක් අපේ පද්ධතියට එකතු වෙලා තිබෙනවා. අපි බලාපොරොත්තු වෙනවා, 2026 අවුරුද්දේදීත් මෙගාවොට් 1,000කට ආසන්න ප්‍රමාණයක් සූර්ය බලයෙන් අපේ පද්ධතියට එකතු වෙයි කියලා.

මන්නාරම ප්‍රදේශයේ මෙගාවොට් 500ක project එකක් අපි ඇවිල්ලා නතර කළා වාගේ ලොකු චෝදනාවක් දිගින් දිගටම අපට තිබුණා. නමුත් මම කියන්න සතුටුයි, අද වන විට අපි මෙගාවොට් 300ක වාගේ ප්‍රමාණයක් නිෂ්පාදනය කරන්න අවශ්‍ය වැඩ කටයුතු එක එක මට්ටම්වලින් ආරම්භ කරලායි තිබෙන්නේ, මුල්ලිකුලම්වල මෙගාවොට් 100ක්, මන්නාරම මෙගාවොට් 50ක්, කොන්ඩච්චිවල මෙගාවොට් 150ක් වශයෙන්. අර කියාපු මෙගාවොට් 500න් මෙගාවොට් 300ක් නිෂ්පාදනය කිරීමේ වැඩකටයුතු අද වන විට අපි ආරම්භ කර තිබෙනවා. මේකේ highlight වෙන්න ඕනෑ point එක තමයි එදා ඒකකය ඩොලර් සත 8කට - රුපියල් 25කට වඩා වැඩි මුදලකට - දෙන්න තීරණය කරපු projects අපට රුපියල් 12කටත් වඩා අඩු මුදලකට අද දෙන්න පුළුවන් වෙලා තිබෙනවා. ඉතින් රජයේ මුදල්, මහ ජනතාවගේ මුදල්, අපේ foreign remittance ඉතුරු කර ගන්නා ගමන් ඒ projects ටිකත් රට ඇතුළට ගන්න අපට මේ අවුරුදු එකහමාරක වාගේ කාලයක් ඇතුළතදී පුළුවන් වුණා. අපි හිතනවා ඒක විශාල ජයග්‍රහණයක් කියලා. විශේෂයෙන් wind සඳහා වූ projects ටික අපට ගන්න පුළුවන් වෙච්ච එක විශාල ජයග්‍රහණයක්. ඒකෙන් අපේ ජනන පද්ධතියට ලොකු වාසියක් ලබා ගන්න පුළුවන් වෙලා තිබෙනවා.

අපි දන්නවා, දහවල් කාලයේ අපේ සූර්ය විදුලි බල උත්පාදනය වැඩි බව. නමුත් අපට ඒක ගබඩා කරලා පාවිච්චි කර ගන්න පුළුවන් විධියේ storage system එකක් තිබුණේ නැහැ. ඉතින් අපේ ආණ්ඩුව යටතේ අපි අද වෙනකොට ඒ battery systems ලංකාවට ගෙනැල්ලා තිබෙනවා. අද වෙනකොට මෙගාවොට් 160ක battery capacity එකක් install වෙන ගමන් තිබෙන්නේ. ඊට අමතරව අපි කොළොන්නාව ප්‍රදේශයේ මෙගාවොට් 100ක ධාරිතාවක් සහිත බැටරි බලශක්ති ගබඩා පද්ධතියක් ඉදිකිරීමට ටෙන්ඩරය කැඳවා තිබෙනවා. ඒ වාගේම අපි බලාපොරොත්තු වෙනවා, මෙගාවොට් 250කට අදාළ ටෙන්ඩරය මේ සතියේ හෝ ලබන සතියේ float කරන්න. ඒ වාගේම existing solar power plants තිබෙන අයට ලොකු ප්‍රශ්නයක් මතුවෙලා තිබෙනවා. මොකද, ඉල්ලුම අඩු දවස්වලට solar power කප්පාදු කරන්න වෙනවා. ඒ නිසා අපි solar power plants තිබෙන අයටත් battery system එකක් propose කරලා තිබෙනවා. අපි හිතනවා, Battery Energy Storage System එකෙන් ලොකු වාසියක් ගන්න පුළුවන් වෙයි කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රටේ සාමාන්‍යයෙන් දවසකට ගිගාවොට් පැය 5ක විතර ප්‍රමාණයක් ඩීසල්වලින් නිපදවනවා කියලා තමයි කියන්නේ. ඒක අඩු වැඩි වෙන්න පුළුවන්. ඒ ගිගාවොට් පැය 5ක විදුලිය නිපදවීමට තමයි අපට වැඩිම මුදලක් වැය වෙන්නේ. අද වෙනකොට ඒකකයකට රුපියල් 100කට වැඩි මුදලක් වැය වෙනවා. ඒක බැටරිවලින් replace කිරීම තමයි අපේ target එක. අපි විදුලි ජනන සමාගම සහ පද්ධති control සමාගමත් එක්ක සාකච්ඡා කරලා ලබන වසරට අදාළව කෙටි කාලීන ඉලක්කයක් විධියට මෙගාවොට් 1,100කට ආසන්න ප්‍රමාණයක බැටරි පද්ධති ලංකාවට ගෙනෙන්න සැලසුම් කර තිබෙනවා. අපට ලබන අවුරුද්ද වෙනකොට මේ ටික ගෙනෙන්න පුළුවන් වුණොත්, විශේෂයෙන්ම මැදපෙරදිග යුද තත්ත්වය නිසා ඇතිවුණු අර්බුදවලට, වැස්ස නැති කාලවලදී ඇතිවෙන අර්බුදවලට මේ ගිගාවොට් පැය 5කට අදාළ බැටරි ප්‍රමාණයෙන් විසඳුමක් ලබා ගන්න පුළුවන් වෙයි. මෙගාවොට් 1,100ක ප්‍රමාණය පැය 4කට බැලුවොත් මෙගාවොට් පැය 4,500කට ආසන්න ප්‍රමාණයක් අපට හම්බ වෙනවා. ඒක replace කරගන්න පුළුවන් වුණොත් අපේ විදුලි ජනන වියදම අඩු වෙනවා. අනෙක් පැත්තෙන් foreign remittances ක්ෂය වෙන එක ගොඩක් අඩු වෙනවා. ඒ වාගේම අපට විදුලිබල සුරක්ෂිතතාව පිළිබඳවත් ලොකු වගකීමක් ගන්න පුළුවන් වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපට තිබුණු තවත් විශාල ප්‍රශ්නයක් තමයි renewable energy potential එක. Energy එක කොච්චර තිබුණත් තිබෙන තැනින් අවශ්‍ය තැන්වලට ලබා ගැනීමට අපහසුතාවක් තිබුණා. සම්ප්‍රේෂණ පද්ධති සම්බන්ධව ගත්තාම අරවා ඕනෑ, මේවා ඕනෑ, ගොඩක් දේවල් ඕනෑ කියලා හැමදාම කථා කළා. නමුත් ඒක මහ පොළොවේ යථාර්ථයක් කර ගැනීමට නොහැකි වුණු ප්‍රශ්නය නිසා ඒ කටයුත්ත ගොඩක් පරක්කු වුණා. අපි ඒ පිළිබඳව ලොකු අවධානයක් යොමු කර තිබෙනවා, උතුරු පළාතෙන්, නැඟෙනහිර පළාතෙන්, හම්බන්තොට සහ මොනරාගල වැනි දිස්ත්‍රික්කවලින් ජනනය කරන පුනර්ජනනීය විදුලිබලය අරගෙන එන්නේ කොහොමද කියන එක සම්බන්ධයෙන්. ඒකට අපි ලංකාවේ ප්‍රථම වතාවට 400 kV විදුලි සම්ප්‍රේෂණ පද්ධතියක් කිළිනොච්චි සිට හබරණ දක්වා හදන්න සැලසුම් කරලා තිබෙනවා. මේ අවුරුද්ද ඇතුළත එහි වැඩකටයුතු ආරම්භ කරන්න අපි සූදානම් වෙලා තිබෙනවා.

ඊළඟට, සාම්පූර් සිට කප්පල්තුරේ දක්වා, කප්පල්තුරේ සිට හබරණ දක්වා, වාරියපොළ සිට පුත්තලම දක්වා, මොනරාගල සිට හම්බන්තොට දක්වා වාගේ 220 kV වන මහා පරිමාණයේ විදුලි සම්ප්‍රේෂණ පද්ධති විශාල ප්‍රමාණයක් මේ වසර කිහිපයේදී ලංකාව තුළ ස්ථාපනය කිරීමට අවශ්‍ය කටයුතු අපි දැනටමත් සූදානම් කර තිබෙනවා. ඒ සම්බන්ධයෙන් පවතින සාකච්ඡා බොහෝ දුරට අවසන් මට්ටමේයි පවතින්නේ. ලබන අවුරුද්දේ මේවා ටෙන්ඩර් කළොත් අපි බලාපොරොත්තු වෙනවා, අවුරුද්දක් හෝ අවුරුදු දෙකක් ඇතුළත ලංකාව තුළ සම්ප්‍රේෂණ පද්ධති ස්ථාපනය කරන්න. එතකොට අපට පුළුවන් වෙනවා, renewable energy capacity එක සම්පූර්ණයෙන්ම capture කරගෙන, renewable energy targets ටික පුළුවන් තරම් ඉක්මනට කරගන්න. ඒකට විදුලිබල පනතේ additional transmission licensees හරහා ලොකු තල්ලුවක් ලැබිලා තිබෙනවා. ඒ කියන්නේ, private investors හරහාත් අපට මේකට අවස්ථාව ලබා ගන්න පුළුවන්වෙලා තිබෙනවා. ඒ වාගේම අපි රජයේ ප්‍රතිපාදන විශාල ප්‍රමාණයක් ලබා ගන්න උත්සාහ කරනවා. අපිට ඒක ලැබෙනවා. ඒ වාගේම World Bank, ADB, AIIB වැනි මූල්‍ය ආයතනත් හැම වෙලාවේම අපට ආයෝජනය කරන්න එකතු කරගන්න බලාපොරොත්තුවෙන් ඉන්නවා. ගොඩක් වෙලාවට ඒගොල්ලන් අපට ධනාත්මක ප්‍රතිචාර ලබා දීලා තිබෙනවා, මෙය කරගන්න

[ගරු අර්කම් ඉල්යාස් මහතා]

පුළුවන් මට්ටමට කථා කරගන්න. ඉතින් අපි හිතනවා, මේ සම්ප්‍රේෂණ පද්ධති, මේ විදුලිය ජනනය කිරීමේ ව්‍යාපෘති එක්ක අපේ රටට විශාල වැඩ කොටසක් කරගන්න පුළුවන් වෙයි කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊළඟ ප්‍රශ්නය තමයි අපේ රට ඇතුළේ තිබෙන usage pattern එක; විදුලි බලයේ usage pattern එක. ඒ usage pattern එක අපි වෙනස් කරගන්නම ඕනෑ. අද වෙනකොට අපේ රටේ day peak එකට වඩා night peak එක තමයි යම්කිසි ප්‍රමාණයකට වැඩිවෙලා තිබෙන්නේ. දියුණු වන රටක ඒ වාගේම කර්මාන්ත තිබෙනවා නම්, අපේ රට දුවනවා නම් මෙය day peak එකට ගන්න ඕනෑ. ඒකට කර්මාන්ත පැත්තෙනුත් තල්ලුවක් දෙන්න ඕනෑ. ඒ වාගේම අපට තවත් ප්‍රශ්නයක් ඇතිවෙලා තිබෙනවා. අපට night peak එකේදී වැඩියෙන්ම පාවිච්චි කරන්න වෙලා තිබෙන්නේ, පොසිල ඉන්ධනවලින් ජනනය කරන විදුලිය. ඒ නිසා අපි මේ දවස්වල සාකච්ඡා කරමින් පවතිනවා, ඉතා ආකර්ෂණීය time-of-use tariff rates ටිකක් ලබා දෙන්න. ඒකත් එක්ක අපට අවශ්‍ය වන තවත් වැදගත් දෙයක් තමයි, smart meters. ඒ smart meter ව්‍යාපෘතිය පටන්ගන්න අපි දැනටමත් සැලසුම් කර තිබෙනවා. *[බාධා කිරීමක්]* අපි ව්‍යාපෘතියට අදාළ අධ්‍යයන කටයුතුවල දැනට නිරත වෙලා සිටිනවා, time-of-use tariff rates ගේන්න ඕනෑ කොහොමද කියන එක සම්බන්ධයෙන්. ඒ සම්බන්ධයෙන් ප්‍රශ්න ටිකක් තිබෙනවා. ඒ ප්‍රශ්න ටිකත් විසඳාගෙන පුළුවන් තරම් ඉක්මනට මේක ගේන්න තමයි අපි උත්සාහ කරන්නේ. *[බාධා කිරීමක්]* ඔබතුමා කියපු එක මට තේරුණේ නැහැ, ගරු මන්ත්‍රීතුමා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ඒ වෙලාවේ පාවිච්චි කරලා ඒක grid එකට විකුණලා, රෑ පාවිච්චි කළොත් ඒ දෙක set off කරන්න බැහැ.

**ගරු අර්කම් ඉල්යාස් මහතා**
(மாண்புமிகு அர்கம் இல்யாஸ்)
(The Hon. Arkam Ilyas)

Time-of-use tariff එක අප කොහොමද දෙන්නේ කියන එක ගැන තමයි දැන් සාකච්ඡා වෙන්නේ. ඒ කියන්නේ, සියලු පාර්ශ්වවලට. විශේෂයෙන්ම renewables පාවිච්චි කරන අයට, ඒ වාගේම දහවල් වැඩියෙන් පාවිච්චි කරන අයට time-of-use tariff එක දීලා වැඩකුත් නැහැ. ගෘහස්ත පාරිභෝගිකයන්ට ඒක දෙමු කියන යෝජනාව තමයි බොහෝ දුරට දැනට කරලා තිබෙන්නේ. කොහොමද ඒක දෙන්න ඕනෑ කියන එක ගැන අපි දැනට අධ්‍යයනයක ඉන්නවා. මොකද, විදුලිබල මණ්ඩලයේ ආදායම අඩු වෙන්නත් බැහැ; ජනන වියදම අඩු වෙන්නත් ඕනෑ; පාරිභෝගිකයන්ට එහි බරක් එන්නත් බැහැ. මේ තුනම සලකා තමයි අපි මේක කරන්න බලාපොරොත්තු වෙන්නේ.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

CEB එකේ ආදායම ගැන විතරක් සැලකුවොත් හරිම අසාධාරණයි.

**ගරු අර්කම් ඉල්යාස් මහතා**
(மாண்புமிகு அர்கம் இல்யாஸ்)
(The Hon. Arkam Ilyas)

ඒක තමයි මම කිව්වේ, පාරිභෝගිකයන්ට බලපෑමක් වෙන්නත් බැහැ කියලා. පාරිභෝගිකයන්ට තමන් අද ගන්නා මිලට වඩා අඩුවෙන් විදුලිය ලබා ගන්න පුළුවන් ක්‍රමයකුත් හදන්න ඕනෑ. ඒ අවශ්‍යතා තුනම ඉෂ්ට කරන්න තමයි අපි plan කරගෙන ඉන්නේ. ඒ නිසා තමයි තවම අධ්‍යයන කටයුතු කරමින් ඉන්නවා කියලා කිව්වේ. තවම finalize කරලා නැහැ. අපට ඒකට අත්‍යවශ්‍ය දෙයක් තමයි smart meters. *[බාධා කිරීමක්]* ගරු මන්ත්‍රීතුමනි, ඒකට තමයි අපි smart meter project එක දැන් පටන් ගන්න හදන්නේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

You may continue with your speech, Hon. Deputy Minister.

**ගරු අර්කම් ඉල්යාස් මහතා**
(மாண்புமிகு அர்கம் இல்யாஸ்)
(The Hon. Arkam Ilyas)

විශේෂයෙන්ම ගෘහස්ත පරිභෝජනය ඒකක 180ට වැඩි අය ආසන්න වශයෙන් ලක්ෂ 3 - 4 පිරිසක් ලංකාව තුළ ඉන්නවා. ඒ සියලු අය වෙනුවෙන් අපේ විදුලිබල මණ්ඩලය හරහා smart meter project එක implement කරන්න අපි ලැහැස්ති කරගෙන ඉන්නවා. ගරු රවී කරුණානායක මැතිතුමනි, එතැනදී අපි තව යෝජනාවකුත් සලකා බලමින් යනවා. ඒ තමයි, domestic scale එකේ batteries භාවිත කරන අය entertain කරන්නේ කොහොමද කියන එක. ඒක කරන්නේ කොහොමද කියලා සලකා බලමින් යනවා. *[බාධා කිරීමක්]* මේ ඔක්කෝම අධ්‍යයනය කරන්න ඕනෑ. මොකද, අපේ විදුලි ක්ෂේත්‍රය බිඳ වැටෙන්නත් බැහැ; පාරිභෝගිකයන්ට වාසියක් වෙන්නත් ඕනෑ. අපි ඒ කාරණා ගැන අධ්‍යයනයක ඉන්නවා. ඉතින් අපි හිතනවා, ඒ අධ්‍යයනයත් එක්ක එන results අනුව අප ඒ batteries භාවිතය entertain කරන්නේ කොහොමද කියලා තීරණය කරන්න අපට පුළුවන් වෙයි කියලා. අපි හිතනවා, ඉදිරියේදී ඒකත් අපේ රට තුළ විශාල පිම්මක් බවට පත් වෙයි කියලා. *[බාධා කිරීමක්]* නැහැ, අතිරික්තයකට වඩා- *[බාධා කිරීමක්]* අපි සේවකයන් පිළිබඳවත් බලනවා; පාරිභෝගිකයන් පිළිබඳවත් බලනවා; ආයතනය පිළිබඳවත් බලනවා. ඉතින් අපි ඒක සම්පූර්ණයෙන්,- *[බාධා කිරීමක්]* 28,000ක් දැනට නැහැ. ඒ ගණන දැන් 22,000කට වාගේ අඩු වෙලායි තිබෙන්නේ; 6,000ක් විතර අඩු වෙලායි තිබෙන්නේ.

අපි ඉහතින් කියපු දේවල් ටික කරලායි තිබෙන්නේ. විදුලිබල ක්ෂේත්‍රයේ අපට stakeholdersලා විශාල ප්‍රමාණයක් ඉන්නවා. පාර්ශ්ව විධියට ගත්තොත්, customersලා ඉන්නවා; සේවකයන් ඉන්නවා; ආයතනය තිබෙනවා. ඒ සියලු පාර්ශ්ව - ඒ පාර්ශ්ව තුනම - බේරාගෙන තමයි අපට මේ වැඩේ කරන්න වෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි තවත් වැදගත් වැඩක් පසුගිය සතියේ පටන් ගත්තා. විශේෂයෙන්ම 2025දී අපේ රට තුළට විදුලි බලයෙන් ක්‍රියා කරන රථ - EVs - විශාල ප්‍රමාණයක් ආවා. ඉතින් අපි බලාපොරොත්තු වෙනවා, ඒක අපේ fleet එකෙන් සියයට 5ක ප්‍රමාණයකටවත් ගේන්න. ඒක ගෙනැල්ලා විතරක් වැඩක් නැහැ, ඒගොල්ලන් ඒක charge කරන්නේ රාත්‍රි කාලයේ නම්. ඉතින් ඒගොල්ලන්ට අවශ්‍ය infrastructure develop කරන්න පුළුවන් වන විධියට UNDP එකත් එක්ක එකතු වෙලා project එකක් පටන් අරගෙන තිබෙනවා. විශේෂයෙන්ම ඉන්ධන පිරවුම්හල්, supermarkets, ඒ වාගේම car parking spaces, office spaces, hospitals ආදියට, ඒ කියන්නේ දහවල් කාලයේ වැඩිපුර වාහන නවත්වා තිබෙන තැන්වලට infrastructure වැඩිපුර ලබා දීලා, ඒ infrastructureවලින් දහවල් කාලයට මේ කියන EV charging points අරගෙන යන එකත් වැඩසටහනක් විධියට කරගෙන යන්න අපි කටයුතු කර තිබෙනවා. ඉතින් අපි හිතනවා, ඒකෙන් ආසන්න වශයෙන් - අඩුම ගණනේ - මෙගාවොට් 100ක, 200කවත් peak එකක් දහවලට shift කර ගන්න අපට පුළුවන් වුණොත්, ඒ හේතුවෙනුත් පොසිල ඉන්ධන දහනය කිරීමේ අවශ්‍යතාව අඩු වෙනවා කියලා. ඉතින් මෙන්න මේ කියන projects ටික පොළොවේ පැළ කර ගන්න තමයි අපි මේ දවස්වල ගොඩක් උත්සාහ කරන්නේ.

ඒ වාගේම අපට තවත් ප්‍රශ්නයක් තිබුණා. ඒ තමයි, පසුගිය ආණ්ඩුවලින් දිගින් දිගටම solar energyවලට අවස්ථාව දුන්නා. අපි ඒක වැරැදියි කියන්නේ නැහැ. ඇත්තටම ඒක අපට වටිනවා. ඒත් ඒ solar panels monitor කරන method එක හදලා තිබුණේ නැහැ. ආසන්න වශයෙන් 2,500කට වඩා solar panels තිබෙනවා. විශේෂයෙන්ම නිවාඩු දවස්වලට අපට ප්‍රශ්නයක් ඇති වෙනවා. මොකද, අවශ්‍යතාවට වඩා වැඩි ප්‍රමාණයක් supply එක එනවා. ඉතින් පසුගිය වෙසක් දවසේත් අපට සිද්ධ වුණා, feeders 120ක් විතර off කරන්න. මොකද, අපට බලා ගන්න විදියක් නැහැ, කොච්චර ප්‍රමාණයක් එනවාද කියන එක. ඉතින් නිකම් හරි system එක collapse වුණොත් සම්පූර්ණ blackout එකකට රට යනවා. ඉතින් ඒක අපට ලොකු ප්‍රශ්නයක් වෙලා තිබුණා. අපි ඒකට කඩිනම් ව්‍යාපෘතියක් ගෙනැල්ලා තිබෙනවා. ආසන්න වශයෙන් 2,000ත් 2,200ත් අතර වාගේ customersලා ප්‍රමාණයක් ඉන්නවා, විශේෂයෙන්ම කිලෝ වොට්100ට වඩා වැඩි rooftop solar panels තිබෙන. ඒගොල්ලන් වෙනුවෙන් modem එකක් සවි කරන ව්‍යාපෘතිය අපි ගෙනැල්ලා තිබෙනවා, ඒ වාගේ හදිසි අවස්ථාවකදී අපට remotely ඒක off කර ගන්න පුළුවන් වන විදියට. එතකොට feeders off කරලා රට පුරා තැන් තැන්වල විදුලිය විසන්ධි කිරීමේ අවශ්‍යතාව අපට නැති වෙනවා. ඉතින් අපි හිතනවා, ඒක දෙසැම්බර් වෙනකොට අවසන් කර ගන්න අපට පුළුවන් වෙයි කියලා. ඒ unit එක සවි කළාට පස්සේ කිලෝ වොට් 100ට වඩා වැඩියෙන් rooftop solar - සූර්ය විදුලි - panels තිබෙන අපේ පාරිභෝගිකයන් සම්බන්ධවත් මේ control එක ලබා ගන්න අපට පුළුවන් වෙනවා. අපි හිතනවා, මේක ලබන අවුරුද්දට පෙර කර ගන්න පුළුවන් වෙයි කියලා. ලංකාවේ දැනට rooftop solar තිබෙන පාරිභෝගිකයන්ගෙන් මේ අවස්ථාවේදී අපට විශේෂ ඉල්ලීමකුත් කරන්න තිබෙනවා. පොසොන් පෝය දවස එළඹෙනවා. ඒ ආසන්න දවස් කිහිපයට අදාළව, එනම් ජුනි මස 27වන දා සිට 29වන දා දක්වා දැනට අපි විශේෂයෙන් සැලසුමක් සකස් කර තිබෙනවා. කිලෝවොට් 300ට වඩා වැඩියෙන් rooftop solar තිබෙන අයට ඒ දවස් තුනෙහි තමන්ගේ system එක off කර ගන්න කියලා අපි කාරුණික ඉල්ලා සිටිනවා. මොකද, අපේ system එක collapse වෙන්න නොදී තබා ගන්න ඕනෑ. එතකොට අපට පුළුවන් වෙනවා, අපේ system එකට පසුගිය වෙසක් දවසේ වෙච්ච සිද්ධිය නොවෙන විදියට වැඩේ කරගෙන යන්න. ඒ සඳහා වූ සහායත් අපට ලබා දෙන්න. අපි පොරොන්දු වෙනවා පුළුවන් තරම් ඉක්මනට, එනම් මේ දෙසැම්බර් වෙනකොට මේ units - modems - 2,000 install කරලා control එක අපේ අතට ගන්න. එහෙම කළාට පසුව එහි වැඩ කටයුතු ඒ දවස්වලට අදාළව කර ගෙන යන්න අපට පුළුවන් වෙයි කියා අපි හිතනවා. මේ වැඩ කටයුතු ටික තමයි කරන්න යන්නේ.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, පොඩි පැහැදිලි කර ගැනීමක් අවශ්‍යයි.

**ගරු අර්කම් ඉල්යාස් මහතා**
(மாண்புமிகு அர்கம் இல்யாஸ்)
(The Hon. Arkam Ilyas)
ඔව්, කමක් නැහැ. කියන්න.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, modems සවි කළාම ඒ control එක NSOගේ අතට එනවාද? එය NSOගේ අතට ආවාම, පාරිභෝගිකයාගේ විදුලිය විසන්ධි කරන්න NSOට බලයක් තිබෙනවාද?

**ගරු අර්කම් ඉල්යාස් මහතා**
(மாண்புமிகு அர்கம் இல்யாஸ்)
(The Hon. Arkam Ilyas)
අපේ විදුලිබල මණ්ඩලයේ පළමු අවශ්‍යතාව තමයි අඛණ්ඩව විදුලිය සපයන එක. මේක හැම දාම කරනවා වාගේ විදුලිය විසන්ධි කිරීමක් නොවෙයි. සමහර දවස් තිබෙනවා - විශේෂයෙන්ම නිවාඩු දවස් තිබෙනවා - අපේ system එකට අවශ්‍ය ප්‍රමාණයට වඩා විදුලිය එන. ඒ දවස්වලට system එක control කිරීම සඳහා පමණයි මේක කරන්නේ. එහෙම නැතුව, ඒගොල්ලන් සම්පූර්ණයෙන් control කරනවා කියන එකක් ගැන නොවෙයි අපි සඳහන් කරන්නේ.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
තවත් පොඩි පැහැදිලි කර ගැනීමක් අවශ්‍යයි, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Deputy Minister, do you consent to ask that question?

**ගරු අර්කම් ඉල්යාස් මහතා**
(மாண்புமிகு அர்கம் இல்யாஸ்)
(The Hon. Arkam Ilyas)
ඔව්.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Okay. The Hon. (Dr.) Harsha de Silva.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
Thank you, Sir.

එතකොට Regulatorගේ බලපෑම මොකක්ද? ඔබතුමාට පුළුවන්ද තීරණය කරන්න, කොහේ කොහේද විදුලිය විසන්ධි කරන්නේ කියලා? ඒකේ priority කොහොමද adjust කරන්නේ?

**ගරු අර්කම් ඉල්යාස් මහතා**
(மாண்புமிகு அர்கம் இல்யாஸ்)
(The Hon. Arkam Ilyas)
Regulator විදියට ඉන්නේ මහජන උපයෝගිතා කොමිසමයි. ඒගොල්ලන්ගේ ගැසට් එකක තිබෙන ප්‍රතිපාදන අනුව තමයි අපි කටයුතු කරන්නේ. මම ඒක ඔබතුමාට ලැබෙන්න සලස්වන්නම්. ඒ ප්‍රතිපාදන අනුව තමයි එය කරන්නේ. මොකද, system stability එක number one. System stability එකෙන් පසුව තමයි අපට අනික් ඒවා කරන්න පුළුවන් වන්නේ. ඔබතුමාත් දන්නවා, පසුගිය වෙසක් පෝය දවසේ ඇත්තටම මොකක්ද සිද්ධ වුණේ කියලා. ඒ නිසයි අපි දැනුත් පාරිභෝගිකයන්ගෙන් ඉල්ලීමක් කළේ. ඔබතුමන්ලාගේ ආණ්ඩුව කාලයේ, විශේෂයෙන් 2016න් පසුව "සූර්යබල සංග්‍රාමය" කියලා එකක් ගෙනැල්ලා අසීමිතව අවස්ථාව ලබා දුන්නා. එහෙම දෙන එක නොවෙයි ප්‍රශ්නය. ඒක control කර ගන්න එකයි වැදගත්. අපට අවශ්‍යතාවට වඩා වැඩියෙන් ආවොත් මොකක්ද කරන්නේ? System එක collapse වෙනවා නේ. ඉතින් එහෙම නොවෙන්න කටයුතු කරන්න ඕනෑ. ඒ ගැනත් සලකා තමයි අපට කටයුතු කරගෙන යන්න වෙලා තිබෙන්නේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි,-

**ගරු අර්කම් ඉල්යාස් මහතා**
(மாண்புமிகு அர்கம் இல்யாஸ்)
(The Hon. Arkam Ilyas)
ගරු මන්ත්‍රීතුමා, මම කථාව අවසන් කරලා ඉන්නම්.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Arkam Ilyas, your time is up.

**ගරු අර්කම් ඉල්යාස් මහතා**
(மாண்புமிகு அர்கம் இல்யாஸ்)
(The Hon. Arkam Ilyas)
මම කථාව අවසන් කරන්නම්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. *[බාධා කිරීමක්]*

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු නියෝජ්‍ය ඇමතිතුමා, පසු ගිය කාලයේ එය ගෙනාපු නිසා තමයි-

**ගරු අර්කම් ඉල්යාස් මහතා**
(மாண்புமிகு அர்கம் இல்யாஸ்)
(The Hon. Arkam Ilyas)
ඒක ගෙනාපු එකට අපි අනිවාර්යයෙන් ඔබතුමන්ලාට ස්තුතිවන්ත වෙනවා. මා කියන්නේ, ඒකේ controllability එකත් අපට අත්‍යවශ්‍යයි කියන එකයි.

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)
අතරමැදදී බාධා කරන්න එපා.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
මම එතුමාගෙන් අහලා තමයි ප්‍රශ්නය ඇහුවේ.

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)
එතුමා කථාව කරගෙන යද්දී බාධා කරන්න එපා කියලායි මා කියන්නේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Anyway, the Hon. Deputy Minister consented to ask that question.

**ගරු අර්කම් ඉල්යාස් මහතා**
(மாண்புமிகு அர்கம் இல்யாஸ்)
(The Hon. Arkam Ilyas)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම දැන් කථාව අවසන් කරන්නම්.

මෙහිදී අපේ අවශ්‍යතාව වෙලා තිබෙන්නේ, ඒ වාගේම අපට විශේෂයෙන් කියන්න අවශ්‍ය වෙලා තිබෙන්නේ, අපේ විදුලිබල මණ්ඩලය ප්‍රතිව්‍යුහගතකරණයත් එක්ක අපේ රටේ විදුලිබල ක්ෂේත්‍රයේ විශාල,- *[බාධා කිරීමක්]*

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,- *[බාධා කිරීමක්]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Minister?

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)
එතුමාගේ කථාව අවසානයේදී ඔබතුමන්ලා නිශ්චිත ප්‍රශ්නයක් අහනවා නම්, එතුමා ඒකට උත්තර දෙයි. ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමනි, මා කියන්නේ ඔබතුමාගේ කාරණය ගැන විතරක් නොවෙයි. ගරු මන්ත්‍රීතුමන්ලා දෙදෙනාටම නිසි ගෞරවය සහිතවයි මම මේක කියන්නේ. කථාව කරගෙන යනකොට දිගින් දිගටම බාධා කළොත් එතුමාගේ අදහස පරිදි ගලාගෙන යන ප්‍රකාශනයක් කරන්න බැරි වෙනවා. ඒකයි මා මතු කරන කාරණය.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
මට පොඩ්ඩක් අවස්ථාව දෙන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Okay, Hon. (Dr.) Harsha de Silva. Shall we not go for a debate on this issue?

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ගරු ඇමතිතුමනි, පාර්ලිමේන්තුවේ සම්ප්‍රදායයක් තිබෙනවා. ඒක අද ඔබතුමන්ලාගේ ආණ්ඩුවට වෙනස් කරන්න බැහැ. මට ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් ප්‍රශ්නයක් අහන්න පුළුවන්ද කියලා මම විමසීමක් කළා. එතුමා "ඔව්" කිව්වා. මම එතුමාට ස්තුති කරලා තමයි ප්‍රශ්නය ඇහුවේ. මම බාධා කළේ නැහැ. ඒ නිසා මේ සම්ප්‍රදායය කඩන්න එපා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Arkam Ilyas, would you wind up now? I think it is time for you to wind up.

**ගරු අර්කම් ඉල්යාස් මහතා**
(மாண்புமிகு அர்கம் இல்யாஸ்)
(The Hon. Arkam Ilyas)
මම ඇත්තටම ප්‍රකාශ කරන්න හැදුවේ මේකයි. විශේෂයෙන්ම අපේ විදුලිබල මණ්ඩලය ප්‍රතිව්‍යුහගතකරණය හරහා අපට මෙන්න මේ කියපු වැඩ ටික ඔක්කොම කරන්න පහසුවක් ලැබිලා

තිබෙනවා. ඒ වාගේම, අපට හොඳ අධ්‍යක්ෂ මණ්ඩලයක් ලැබිලා තිබෙනවා. ඒත් එක්කම, හොඳ සේවකයන් පිරිසක් ඉන්නවා. ඒ වාගේම, අපි අපේ රටේ මහ ජනතාවටත් වග කියනවා; අපේ විදුලිබල ක්ෂේත්‍රයටත් වග කියනවා. මේ ප්‍රතිව්‍යුහගතකරණය හරහා මේ කටයුතු ඉක්මනින් කර ගන්න අපට අවස්ථාව ලැබිලා තිබෙනවා කියා අපි හිතනවා. අපි මහ ජනතාවට පොරොන්දු වෙනවා, හොඳ, අඛණ්ඩ වාගේම ලාභදායි විදුලි ක්ෂේත්‍රයක් ඉතාම ඉක්මනින් ලබා ගන්න පුළුවන් අවස්ථාව සලසා දෙනවා කියලා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Dayasiri Jayasekara. The Floor is yours for 12 minutes.

Order, please! Will an Hon. Member propose the Hon. Sanjeewa Ranasingha to the Chair?

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා (කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා)**
(மாண்புமிகு கே.டீ. லால் காந்த - கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சர்)
(The Hon. K.D. Lal Kantha - Minister of Agriculture, Livestock, Land and Irrigation)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "ගරු සංජීව රණසිංහ මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සංජීව රණසිංහ මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சஞ்ஜீவ ரணசிங்ஹ அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair, and THE HON. SANJEEWA RANASINGHA took the Chair.*

[පූ.භා. 11.33]

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ විවාදයට එකතුවීමට අවස්ථාව ලැබීම ගැන විශේෂයෙන්ම සතුටු වෙනවා. මම කථා කරන්න කැමැතියි, පුනර්ජනනීය බලශක්තිය ගැන. තමුන්නාන්සේලාගේ විශාල වැඩ පිළිවෙළක් බවට පත් වෙලා තිබුණේ, 2030 වෙනකොට පුනර්ජනනීය බලශක්තිය සියයට 70කට ගෙනියන්න. අද වෙනකොට වහලය මත සවි කළ සූර්ය බලශක්තියෙන් මෙගාවොට් 2,700ක් ලැබෙනවා. 150,000ක විතර පිරිසක් තමන්ගේ වහල මත ඒවා හදා ගෙන තිබෙනවා. ඒ තුළ මෙගාවොට් 400කට වැඩි ප්‍රමාණයක් තිබෙනවා. ඇත්තටම දැන් ඇති වෙලා තිබෙන තත්ත්වය තමයි, මේ ක්‍රියාදාමය තුළ මාසයකට දින 5ක් ඒ මුළු system එකම ක්‍රියාවිරහිත කරනවා. අපට පණිවුඩ එවනවා, දැන් වසා දමන්න කියලා. ඒ ක්‍රියාදාමය තමයි අපට ප්‍රධාන ගැටලුව බවට පත් වෙලා තිබුණේ. එත් එක්කම, මේ පුනර්ජනනීය බලශක්තිය හදපු, solar panels හදපු අයට ජනවාරි ඉඳලා ආණ්ඩුව රුපියල් බිලියන 20ක් ගෙවන්න තිබෙනවා. එතකොට ඒ අය කොහේමද තමන්ගේ ක්‍රියාදාමය ඉදිරියට ගෙනියන්නේ? මොකද, සමහර අය ඒවාට ලීසිං පහසුකම් අරගෙන තිබෙනවා. සමහර අය කෙළින්ම ණය අරගෙන තිබෙනවා. රුපියල් බිලියන 20ක්, කෝටි 2,000කට අධික ප්‍රමාණයක් මීට සම්බන්ධ 350කට අධික පිරිසක් අතර බෙදන්න තිබෙනවා. ඒක දැන් ආණ්ඩුව මාස හයකට වැඩිය පරක්කු කරලා තිබෙනවා.

ඊළඟට, මෙගාවොට් 50 බැටරි සඳහා ටෙන්ඩර් කැඳවීම ප්‍රමාද වෙලා තිබෙනවා. ඒ වාගේම, මෙගාවොට් 350 බැටරි සඳහා ටෙන්ඩර් කැඳවීම ප්‍රමාද වෙලා තිබෙනවා. ඒ වාගේම, මෙගාවොට් 160 පද්ධති සැකසීමේ ප්‍රගතිය මොකක්ද කියලා විශේෂයෙන්ම ඇමතිතුමා මෙතැන ඉන්න නිසා මම අහන්න කැමැතියි. ඒ වාගේම මේවාට යම් සහනයක් දෙනවා කිව්වා. මේකේ main HS code category එකට VAT එක සියයට 18ක් ගහනවා. Duty එක සියයට 27ක් ගහනවා. ඒ තුළ කොහොමද මේ රටේ පුනර්ජනනීය බලශක්තිය නිෂ්පාදනය කරන අය ශක්තිමත් කරන්නේ? ඒ නිසා අපි ගරු ඇමතිතුමාගෙන් විශේෂ ඉල්ලීමක් කරනවා. කරුණාකරලා මේ සියයට 18 VAT එක එක්කෝ ඉවත් කරන්න, එහෙම නැත්නම් අඩු කරන්න. සියයට 27ක් ගහන duty එක අඩු කරලා මේ අයට යම් සහනයක් දෙන්න. මොකද, තමුන්නාන්සේලා ගහලා තිබෙන්නේ "Sunny days - smart nights" කියලා. හැබැයි, sunny days නැහැ, smart nights නැහැ. තව ටික දවසක් යනකොට sunny daysවල කරන්ට් එක off කරන්න වෙයි. ලීසිං ගෙවා ගන්න බැරිව smart nights නැති තත්ත්වයකට තමයි අවසානයේදී පත් වෙන්නේ. අන්තිමට nightmare එකක් වෙන්නේ. ඇත්ත වශයෙන්ම තමුන්නාන්සේලා මේ ආණ්ඩුව ගන්න කොට සූර්ය බලශක්ති ඒකකයකට ගෙවන ගණන රුපියල් 37ට තිබුණේ. Solar power ඉතාම හොඳ තැනකට තල්ලු වෙලා තිබුණා. හැබැයි, තමුන්නාන්සේලා මොකද කළේ? ඒක සම්පූර්ණයෙන්ම අකර්මන්‍ය කෙරුවා. ඒකකය රුපියල් 27ට අඩු කළා. ඊළඟට, රුපියල් 18ට අඩු කළා.*[බාධා කිරීමක්]* දැන් කුටු කුටු ගාන්න එපා. රුපියල් 27 ඉඳලා රුපියල් 18ට අඩු කළා. ඒක පිළිගන්නවා නේ. *[බාධා කිරීමක්]* නැත්තේ මොකද? පිළිගන්නේ නැතුව ඔහොම ඉන්න පුළුවන්, ඉතින්.

ඒ වාගේම, මේ පුනර්ජනනීය බලශක්තිය නිෂ්පාදනය කරන අය ජනාධිපතිතුමා හමු වෙන්න, 29 වතාවක් ජනාධිපති ලේකම් කාර්යාලයෙන් ඉල්ලා තිබෙනවා. ජනාධිපතිතුමා හමු වෙලා අපට මේ ප්‍රශ්නය කියන්න ඕනෑ කියලා. Phone එකට answer කරන්නේ නැහැ නේ. ඇමතිවරු phone එකට answer කරන්නේ නැහැ. සමහර අය මට කියලා තිබෙනවා, "මචං call එකක් ගන්න බැරි වුණාම, පොඩි message එකක් තියපං කියලා". අපි එහෙම නොවෙයි. අපි ඕනෑම වෙලාවක රෑ 11ට, 12ට හරි phone එකට answer කළා. මේ ඇමතිවරු එක්කෙනෙක්වත් phone එකට answer කරන්නේ නැහැ. ජනාධිපතිතුමා answer කරන්නේම නැහැ. ජනාධිපතිතුමා ඉස්සර රෑට මාත් එකක් පැයක් දෙකක් කථා කරනවා, ලාල්කාන්ත ඇමතිතුමා. දැන් ඒ කථා නැහැ. තරහා වෙලාද මම දන්නේ නැහැ, ඒක වෙනම කාරණයක්. නමුත්, answer කරන්න ඕනෑ. එහෙමයි අපි වැඩ කළේ. ඉස්සර රනිල් වික්‍රමසිංහ මහත්මයාට, මෛත්‍රීපාල සිරිසේන මහත්මයාට, මහින්ද රාජපක්ෂ මහත්මයාට කථා කළාම, පැය භාගයකට පස්සේ හරි call එකක් දෙනවා. අපි මේ විහිළු කරන්න කථා කරන්නේ නැහැ නේ. අපි වැදගත් ප්‍රශ්න ගැන කථා කරන්නේ.

දැන් ඇමතිතුමා ඉන්න නිසා මම කියන්න කැමැතියි, ගිය සතියේ වුණු සිද්ධියක්. මේ අලුතින් හදලා තිබෙන company එකෙන් රුපියල් 3,000ක විදුලි බිල ගෙවා ගන්න බැරිව ඉන්න අහිංසක අම්මලාගේ ගෙවල්වලට කරන්ට් කපන මණ්ඩලේ කට්ටිය ගිහිල්ලා කියනවා, "කපන්නේ නැහැ, රුපියල් 800ක් ගෙවලා ඔයා වැඩේ කර ගන්න" කියලා. එක්කෝ කපලා ඉවර කරන්න ඕනෑ. කපන්නේ නැතුව රුපියල් 800ක් ගන්නේ ඇයි? ඒක තමයි ප්‍රශ්නය. ඒ වාගේම ඒ අහිංසක අම්මලා ළඟ චූටි phone එකක් තිබෙන්නේ. ඒකට විදුලි බිල එනවා, සමහර වෙලාවට

[ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා]

ඒකට කියවා ගන්න බැහැ, ඒක බල බලා ඉන්නේ නැහැ. ඒ අහිංසක මිනිස්සුන්ට එන message එක කියවා ගන්න බැහැ. එහෙම අහිංසක, දුප්පත් මිනිස්සු ලක්ෂ ගණනක් ගම්වල ඉන්නවා. මම ඔබතුමාගෙන් ඉල්ලනවා ඒ සඳහා යම්කිසි වැඩ පිළිවෙළක් හදන්න කියලා.

ඊයේ ජනාධිපතිතුමා මේ සභාවට ඇවිල්ලා විනාඩි 42ක් කථා කළා, මාස 5කට පස්සේ. ගිය මාර්තු 5වෙනි දායින් පස්සේ තමයි එතුමා - මාස 5කට පස්සේ - පාර්ලිමේන්තුවට ආවේ. මම දන්නේ නැහැ කවුරු හරි කියලා තිබෙනවාද කියලා එන්න එපා කියලා. කෙසේ වෙතත්, එතුමා ඇවිල්ලා හරි විහිළු කථාවක් කිව්වා. මොකක්ද එතුමා කියන්නේ? එතුමා කියනවා මේ කියන සියලුදෙනා විපක්ෂයේ සතුරන් කියලා. කවුද සතුරන්? රවී සෙනෙවිරත්න සතුරෙක්, ශානි අබේසේකර සතුරෙක්, ආනන්ද විජේපාල සතුරෙක්, දිලීප පීරිස් සතුරෙක්, රංග දිසානායක සතුරෙක්. නමුත් අපට ඒ කිසිකෙනෙක් සතුරෝ නොවෙයි, මතක තියා ගන්න. ගරු ජනාධිපතිතුමනි, අපි ඉල්ලා සිටිනවා ඕවා කියනකොට හරියට කියන්න කියලා. මොකක්ද ඔයාලා කියන්නේ කියලා හිස් පුටුවලින් අහනවාට වඩා කරුණාකරලා නම් කරලා කියන්න. එතකොට අපි කියන්නම් කවුද ඒකට සම්බන්ධ වෙලා තිබෙන්නේ කියලා. අපි කියන්නේ මේකයි. ඒ අපේ සතුරෝ නොවෙයි. තමුන්නාන්සේලා මොකද කළේ? තමුන්නාන්සේලා ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලනය කළ අය ගෙනැල්ලා මේ රටේ පොලීසියට ඇතුළු කළා. ලංකා ඉතිහාසයේ කවුද එහෙම කළේ? ශානි අබේසේකර ශ්‍රේෂ්ඨාධිකරණයට දුන්නු දිවුරුම් පෙත්සම මම කියවන්නම්. එහි මෙසේ සඳහන් වෙනවා:

> "We state that presently we are engaged in active politics and are members of the Retired Police Collective of the National People's Power (NPP) political party."

එයා කියනවා මම ජාතික ජන බලවේගයේ ක්‍රියාකාරී සාමාජිකයෙක් - full-timer කෙනෙක් - කියලා. තමුන්නාන්සේලා full-timer කෙනෙක් ගෙනැල්ලා CID එකේ Director කරනවා. අපි කියන්නේ ඒකයි වැරදියි. එහෙම නැතිව අපට එයත් එක්ක සතුරුකමක් නැහැ. එයා ජේවීපීකාරයෙක්. ජේවීපීකාරයෙක් CID එකේ Director කළේ කවුද මේ රටේ? රවී සෙනෙවිරත්නට කියන්නෙත් මේ කථාවම තමයි. ඉතිහාසයේ කවුද ජේවීපීකාරයෙක් අමාත්‍යාංශයක ලේකම් කෙනෙක් කළේ? මොනවාද මේ කරන්නේ? අපි ඒ අයට සතුරු නැහැ. ජනාධිපතිතුමනි, කලබල වෙන්න එපා, අපි සතුරු නැහැ. මේ ක්‍රියාදාමය තුළ තමුන්නාන්සේලා හොරු අල්ලනවා නම් අපි සියයට 200ක් කැමැතියි. අපිටත් ඕනෑ හොරු ටික අල්ලලා ඇතුළට දාන්න තමයි. හැබැයි, ඒක කරන්න ක්‍රමයක් තිබෙනවා. ජේවීපීකාරයෝ ටිකක් අමාත්‍යාංශවලට රිංගවලා, ඒ මිනිස්සු ලවා කටඋත්තර හදලා, සුරංගනා කථා හදලා, තිර පිටපත් ලියලා මිනිස්සු අරගෙන ගිහිල්ලා පොලිස් කූඩුවලට දානකොට ඒකට විරුද්ධව අපි කථා කරනවා තමයි. එහෙම නැත්නම් මොකක්ද අපි කරන්නේ?

ආනන්ද විජේපාල මැතිතුමා ගැන එහෙම ප්‍රශ්නයක් අපට නැහැ. හැබැයි ආනන්ද විජේපාල මහත්තයා මන්ත්‍රී විධියට ඉන්නකොට ජනාධිපතිතුමාගේත් ලේකම් විධියට වැඩ කරලා. ඒකම කළා කියලා සුගීශ්වර සේනාධීරව අරගෙන ගිහින් හිරේ දැම්මා. නමුත් ආනන්ද විජේපාල මහත්තයා ඉන්නවා පොලිස් ඇමති වෙලා. ඒක මාර කථාවක් නේ. එහෙම නම් එතුමාටත් ඒ නීතියම තිබෙන්න ඕනෑ. එහෙම එකක් නැහැ නේ.

රංග දිසානායක මහත්තයා එක්ක අපි කිසිදු තරහක් නැහැ. එතුමා විනිශ්චයකාරවරයකු විධියට වැඩ කළ කෙනෙක්. එතුමාට අපේ ගෞරවය තිබෙනවා. හැබැයි නන්දන ගුණතිලක මහත්තයා කිව්වා එයා ජනතා විමුක්ති පෙරමුණේ නීති කමිටුවේ හිටියා කියලා. කවුරුත් ඒකට අභියෝග කරන්න ආවේ නැහැ. එහෙම නම් එතුමා ගිහිල්ලා නඩුවක් දාන්න ඕනෑ නේ, නන්දන ගුණතිලකට විරුද්ධව. දැන් නන්දන ගුණතිලක මැරිලා. හැබැයි එතුමා හින්දා නිහාල් සිසිර කුමාර කියලා මහත්තයෙක් බෙල්ලේ වැල දා ගත්තා, ඔහුට බලපෑම් කරලා කටඋත්තර ගත්ත නිසා.

ඊළඟට කපිල චන්ද්‍රසේන මහත්තයා බෙල්ලේ වැල දා ගත්තා. මේවා මරණාසන්න ප්‍රකාශ. ඔහු කියනවා, වැරදි අය පාවිච්චි කරලා පොලිස් අත්අඩංගුවේ ඉන්න අය බේරාගත්තාය කියලා මේ අය කියනවා කියලා. එහෙම වුණේ නැහැ. ඇත්ත වශයෙන්ම ඒ මුස්ලිම් සහෝදරවරු දෙන්නා ඇවිල්ලා හිටියේ නැහැ. වෙන දෙන්නෙක් ගිහිල්ලා තමයි ඇප දුන්නේ. හැබැයි මහෙස්ත්‍රාත්වරයාට කියනවා, මෙයා හොරට ඇප අරගෙන තිබෙන්නේ ඒ නිසා කරුණාකරලා තීරණයක් ගන්න කියලා. මහෙස්ත්‍රාත්වරයා මොකද කරන්නේ? නඩුව අසා අවසාන වනතුරු ඔහු හිර බාරයේ තියන්න කියනවා. මාස 3ක් හිරේ ඉඳලා ආපු මිනිහෙක් කල්පනා කරනවා, මම නඩුව ඉවර වෙනකම් හිරේ ඉන්නවාද, නැත්නම් බෙල්ලේ වැල දා ගන්නවාද කියලා. කවුද මේවා කරන්නේ? මේ රටේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීමේ කොමිෂන් සභාව.

ඊයේ වුණ වැඩේ බලන්න. ඒක කරලා තමයි ජනාධිපතිතුමා ෆුල් වුන් එකේ මේ සභාවට ඇවිල්ලා කෑ ගැහුවේ. ඊයේ ගත්තා දෙන්නෙක්. මොකද්ද ඒක? Extraterritorial jurisdiction එකක්. මොකද්ද වෙලා තිබෙන්නේ? මම ඒක ගැන ඕනෑවට වඩා කථා කරන්නේ නැහැ. ඒක කරගෙන යන්න. නමුත් ඒ සිද්ධිය වෙලා තිබෙන්නේ ඩුබායිවල. එහේ වුණු සිද්ධියකට මෙහේ ඇවිල්ලා සාක්ෂියක් අරගෙන අල්ලාගෙන ගියා. කමක් නැහැ, ප්‍රශ්නයක් නැහැ. ඒවා කරලා ඇවිල්ලා ඔය වාගේ කථා ගොඩක් මේ සභාවට කිව්වා. පිල්ලෙයාන් මහ මොළකරු කිව්වා, අරයා මහ මොළකරු, මෙයා මහ මොළකරු කිව්වා. අන්තිමට මහ මොළකරුවෙක් සොයා ගන්න නැහැ, දැන් වෙන එක්කෙනෙක් අල්ලාගෙන ඉන්නවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් පමණයි තිබෙන්නේ .

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
නැහැ, මට විනාඩි දොළහක් වෙන් වෙලා තිබුණා නේ. ඔබතුමා පොඩ්ඩක් බලන්න.

අපි ලසන්ත වික්‍රමතුංග මහත්මයා වෙනුවෙන් කථා කරපු අය. අපි එතුමාගේ මිනිය කරේ තියාගෙන පාරේ ගිය අය. එම ඝාතකයා අල්ලනවාට අපි විරුද්ධ වනවාද? ඊළඟට කීත් නොයාර්, උපාලි තෙන්නකෝන්, පෝද්දල ජයන්ත වෙනුවෙන් අපි කථා කරලා තිබෙනවා. අපි සාධාරණත්වය වෙනුවෙන් දිගින් දිගටම කථා කරපු අය. "සිරස" ආයතනය ගිනි තබපු වෙලාවේ මම එතැනට ගියා. මම යනකොට පාන්දර දෙකහමාරයි. "සියත" ආයතනයට ගැහුව වෙලාවේත් අපි ගියා. ඒ සිදුවීම් ගැන දැන ගත්තාම, අපි ඒ ස්ථානවලට ගිහිල්ලා බලපු අය. අපි ඒවාට විරුද්ධයි. අපි කියන්නේ, ඒවා කළ අය අල්ලන්න කියලා. එහෙම නැතුව නිකම් එක එක්කෙනාව ගෙනැල්ලා හිරේ දාන එක නොවෙයි කළ යුත්තේ. LankaeNews එක ගිනි තබපු වෙලාවේත් අපි එතැනට ගියා. අපි පාන්දර ගිහින් කථා කළේ. අපි ඒ හැම අවස්ථාවකම ඒ

ස්ථානවලට ගියා. දැන් මේ සෙංකෝලය උස්සපු එක අශිෂ්ටයිලු. අපි සෙංකෝලය උස්සන්න ගියේ නැහැ. සභා ගර්භය මැදට එන්න අපට හේතුවක් තිබුණා. ස්ථාවර නියෝග 19 යටතේ යෝජනාවක් ඉදිරිපත් කරලා, මන්ත්‍රීවරු විසිදෙනෙක් නැඟිට්ටාම

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

විවාදයට අවස්ථාව දෙන්නේ නැත්නම්, එතුමා වැඩ කරන්නේ පැලවත්තට ඕනෑ විධියට නම්, සභානායක මෙතැන ඉඳගෙන අත වනනකොට ඒ අනුව කටයුතු කරනවා නම්, අපිටත් එහෙම කරන්න සිද්ධ වෙනවා. අපි සභා ගර්භය මැදට ගිහිල්ලා සෙංකෝලය අල්ලන්න ගියේ නැහැ. ඒ සම්බන්ධව තිබෙන නීතිය අපි දන්නවා. අශිෂ්ටව වැඩ කළේ තමුන්නාන්සේලා.

පාර්ලිමේන්තුවට බෝම්බ ගහපු අය දැන් ඇවිල්ලා කියනවා, ඒ කරපු වැඩේ අශිෂ්ටයිලු. ඒ කාලයේ පාර්ලිමේන්තුවට බෝම්බ ගැහුවා නේ. ඒ අවස්ථාවේ කීර්ති අබේවික්‍රම මහත්මයා මැරුණා. ලලිත් ඇතුලත්මුදලි මැතිතුමාගේ ඉතාම වැදගත් අවයව අයින් කරන්න සිදු වුණා. එහෙමයි එදා කටයුතු කළේ. පාර්ලිමේන්තුවට බෝම්බ ගහපු අය දැන් ඇවිල්ලා කියනවා, මේ වැඩේ අශිෂ්ටයිලු. අපි මොකක්වත් කළේ නැහැ. අපි උද්ඝෝෂණය කළේ වෙන හේතුවක් නිසා නොවෙයි. අපි සභා ගර්භයේදී මිරිස් කුඩුවලින් ගැහුවෙත් නැහැ; mike කඩන්න ගියෙත් නැහැ; කථානායකතුමාගේ පුටුව කඩන්න ගියෙත් නැහැ. අපි එහෙම මුකුත් කළේ නැහැ. අපි සාධාරණ සහ ශිෂ්ට විධියට කටයුතු කළා. 2022දී පාර්ලිමේන්තුව ගිනි තියන්න කථා කළ කට්ටිය තමයි දැන් මෙහෙම කථා කරන්නේ. දැන් මෙතැන ඉන්නවා, ගරු ලාල් කාන්ත ඇමතිතුමා. එතුමා ප්‍රසිද්ධියේ කිව්වා, "දැන් අල්ලන්න තිබෙන්නේ පාර්ලිමේන්තුව. වරෙල්ලා පාර්ලිමේන්තුව ගිනි තියන්න" කියලා. පාර්ලිමේන්තුව ගිනි තියන්න කථා කළ අය ශිෂ්ටයි; අපි අශිෂ්ටයි. මාර වැඩක් නේ. කරුණාකරලා තමුන්නාන්සේලා ඒ ගැන කථා කරන්න.

අධිකරණයට අද ඇති වෙලා තිබෙන තර්ජනය මොකක්ද?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩියක් දෙන්න. විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමනි, පුළුවන් නම් මට විනාඩි තුන හතරක් දෙන්න.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂයේ කාලයෙන් විනාඩි 3ක් මෙතුමාට ලබා දෙන්න.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
අධිකරණය සම්බන්ධයෙන් මම මේ කාරණය කියන්න කැමැතියි. බලන්න, අභියාචනාධිකරණයේ ඉන්න ඕනෑ විනිසුරුවරු ගණන 20ක්. ශ්‍රේෂ්ඨාධිකරණයේ ඉන්න ඕනෑ, විනිසුරුවරු 17දෙනෙක්. දැන් ඉන්නේ කීදෙනාද? ශ්‍රේෂ්ඨාධිකරණයේ 17දෙනාගෙන් දැන් ඉන්නේ කීදෙනාද? ඉතාම ටික දෙනායි. අභියාචනාධිකරණයේ පුරප්පාඩු 6ක් තිබෙනවා. විනිසුරු අහ්සන් රාසික් මරික්කාර් මැතිතුමා විශ්‍රාම ගියේ 2025 අප්‍රේල් මාසයේ. විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා 2025.06.16 දින විශ්‍රාම ගියේ. විනිසුරු මොහොමඩ් ලෆාර් තාහීර් මැතිතුමා 2025.06.18 දින විශ්‍රාම ගියේ. විනිසුරු සියනාත් කරලියැද්ද මැතිතුමා 2025 නොවැම්බර් 12වන දා විශ්‍රාම ගියේ. විනිසුරු ධම්මික ගනේපොල මැතිතුමා 2027 මැයි 15වන දා විශ්‍රාම යන්න තිබුණේ. එතුමන්ලාට ශ්‍රේෂ්ඨාධිකරණයේ ලැබෙන්න තිබුණු උසස්වීම් එකක්වත් දෙන්නේ නැතුව ඒ අයව ගෙදර යැව්වා. එය සාධාරණ ද අසාධාරණද? මට කියන්න.

ඊළඟට, ශ්‍රේෂ්ඨාධිකරණයේ තත්ත්වය මොකක්ද? ශිෂ්ට සම්පන්න රටක, ශිෂ්ට සම්පන්න වැඩ පිළිවෙළක් හදනවා නම් කරන්න ඕනෑ මොකක්ද? අගවිනිසුරු ජයන්ත ජයසූරිය මැතිතුමා විශ්‍රාම ගියේ, 2024 ඔක්තෝබර් 10වන දා. පුරප්පාඩුව ඇති වෙලා අවුරුද්දයි මාස අටක් වනවා. හැබැයි, ශ්‍රේෂ්ඨාධිකරණයට පත් කරන්නේ නැතුව ඉන්නවා. ඊළඟට, ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු ගාමිණී අමරසේකර මැතිතුමා. එතුමා 2025 ජූනි 20වන දා විශ්‍රාම ගියේ. පුරප්පාඩුව ඇති වෙලා හරියටම අවුරුද්දයි. ඒ විනිශ්චයකාරතුමාත් විශ්‍රාම ගියා. හැබැයි, ශ්‍රේෂ්ඨාධිකරණයට විනිශ්චයකාරවරු පත් කරන්නේ නැහැ. අගවිනිසුරු මුර්දු ප්‍රනාන්දු මැතිනිය 2025 ජූලි 27වන දා විශ්‍රාම ගියා. දැන් අවුරුද්දකට ආසන්නයි. ඊළඟට, තුරෙයිරාජා මැතිතුමා 2026 මාර්තු 19වන දා විශ්‍රාම ගියේ. විනිසුරු ප්‍රියන්ත ප්‍රනාන්දු මැතිතුමා මැයි 08වන දා විශ්‍රාම ගියේ. ඊළඟට විනිසුරු කුමුදුණී වික්‍රමසිංහ මැතිනිය අප්‍රේල් 03වන දා තමයි විශ්‍රාම ගියේ. ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරුවරු 17දෙනෙක් ඉන්න ඕනෑ, දැන් ඉන්නේ 12දෙනායි. 5ක් පුරප්පාඩුයි. එතකොට benches හදන්නේ කොහොමද? මෙතැන තමයි ප්‍රශ්නය තිබෙන්නේ. ඉළ ඇදෙන මාර කථාවක් නේ කියන්නේ. කියනවා, කථා කළාලු අග්‍ර විනිශ්චයකාරතුමාත් එක්ක. එතුමා කිව්වාලු, මහෙස්ත්‍රාත්වරුන්ව ගන්න කල් ශ්‍රේෂ්ඨාධිකරණයට පත් කරන්නේ නැහැ කියලා. ඒක ඉළ ඇදෙන කථාවක් නේ. මහෙස්ත්‍රාත්වරු පත් කරන කල් ශ්‍රේෂ්ඨාධිකරණයට පත් කරන්නත් බැහැලු, අභියාචනාධිකරණයට පත් කරන්නත් බැහැලු. මොකක්ද මේ කථාව? මේ ජනාධිපතිතුමා ආවේ මේවා කරන්නද?

මම කියන්න කැමැතියි, මහෙස්ත්‍රාත්වරු බඳවා ගැනීම සම්බන්ධව තිබුණු ක්‍රියාවලිය ගැන. කලින් වෘත්තීය පළපුරුද්ද අවුරුදු හතරක් ලෙසයි තිබුණේ. ඒක අවුරුදු තුන කරනවා. මහෙස්ත්‍රාත්වරු බඳවා ගැනීමේදී වෘත්තීය පළපුරුද්ද අවුරුදු තුන දක්වා අඩු කළේ කාව බඳවා ගන්න ද? ඊළඟට දානවා අලුත්ම සුදුසුකමක්. ඒ තමයි, ශ්‍රේෂ්ඨාධිකරණයේ හෝ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන් ළඟ research officer කෙනෙක් විධියට වැඩ කරනවා නම් එය තව සුදුසුකමක් කියලා. මේ මහෙස්ත්‍රාත්වරුන් බඳවා ගන්නා අවස්ථාවේදී ඉන්න research officer කවුද? කාගේ පුතාද ඉන්නේ, කාගේ දුව ද ඉන්නේ? විශ්‍රාම ගිය ආණ්ඩුකාරවරුන්ගේ පුත්තු, දූලා ඒ ලැයිස්තුවේ නැද්ද? ඒක තමයි කාරණය. දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? 65ක් ගන්න දැම්මාම, 50ක් ගන්න තමයි සල්ලි දෙන්නේ. දැන් මොකද වෙලා තිබෙන්නේ? දැන් කියනවා, 35යි දෙන්නේ කියලා. කරුණාකරලා මේ වාගේ දේවල් කරන්න එපා. අධිකරණ සේවා කොමිෂන් සභාව හරියට ක්‍රියාත්මක වුණා නම් මේවා කරන්න දෙන්නේ නැහැ. යසන්ත කෝදාගොඩ මැතිතුමාව ඇතුළට ගත්තේ නැහැ. ගත්තේ නැතිව මොකද කළේ? Criterion එක හැදුවා, තමන්ට ඕනෑ විධියට. හදලා දමා ගත්තා. අද මේක තමයි සිද්ධ කරන්නේ. අපි මේවා ගැන මෙතැන කථා කරන්නේ නැතිව කොහේද කථා කරන්නේ, කවුද කථා කරන්නේ? අපි මේවාට භය නැහැ. මතක තබා ගන්න, මේවා තුළ -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමා. කථාව අවසන් කරන්න.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මට තව විනාඩියක් දෙන්න.

තමුන්නාන්සේලා උත්සාහ කරනවා, විනිශ්වයකාරවරුන් විශ්‍රාම යාමේ වයස අවුරුදු 63 සීමාවේ තිබෙන එක අවුරුදු 65 කරන්නත්, වයස අවුරුදු 65 සීමාවේ තිබෙන එක අවුරුදු 67 කරන්නත්. මතක තබා ගන්න, පද්මන් සූරසේන මැතිතුමා ගැන අපි හොඳට දන්නවා. අපි එතුමාට බොහොම ගරු කරනවා. ඔය වාගේ සෙල්ලමක් කළා. කවුද? මෛත්‍රීපාල සිරිසේන මහත්මයා. මොකක්ද කළේ? පද්මන් සූරසේන මහත්මයාව අභියාචනාධිකරණයේ සභාපති කළා. මොකද කළේ?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මට තව තත්පර කිහිපයක් දෙන්න.

එතුමාව අභියාචනාධිකරණයේ සභාපති කළා. මොකද වුණේ? 2018දී දුන්නා, තීන්දුවක්. මෛත්‍රීපාල සිරිසේන මහත්මයා,-

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
එතුමාට තව මිනිත්තුවක කාලයක් ලබා දෙනවා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
අන්තිමට මොකද වුණේ? මෛත්‍රීපාල සිරිසේන මහත්මයා 2018දී තිබුණු ආණ්ඩුව පෙරළලා ඔහු කැමැති අයව අගමැති කළා, වැඩේට. මොකද කළේ? පද්මන් සූරසේන මහත්මයාව අභියාචනාධිකරණයේ සභාපති කරලා, "මට තීන්දුව නියමෙට ලැබෙයි" කියලා බලාගෙන හිටියා. තීන්දුව දුන්නා, ඔක්කොම කට්ටිය කෙළින්ම ගෙදර. *Quo warranto* එකෙන් දිනුවා. ඊළඟට මොකද වුණේ? ඊළඟට, එතැනින් නතර වුණේ නැහැ. ශ්‍රේෂ්ඨාධිකරණයට ගියා. ශ්‍රේෂ්ඨාධිකරණයේ පද්මන් සූරසේන මැතිතුමා ඉස්සරහම විභාග වුණා, මෛත්‍රීපාල සිරිසේන මහත්මයාට ජනාධිපති ධුරයෙන් විශ්‍රාම යාමෙන් අනතුරුව නිවසක් භාවිත කිරීමට ඉඩ ලබා දීම සම්බන්ධයෙන් වන නඩුව. ඒ නඩු තීන්දුවත් දුන්නා, ගෙදරිනුත් එළියට පලයන් කියලා. මේ, තමන්ව අභියාචනාධිකරණයේ සභාපති කරපු මනුස්සයාට දුන්නු වැඩේ. මතක තබා ගන්න, -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමා.

මීළඟට, ගරු රවීන්ද්‍ර බණ්ඩාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් තිබෙනවා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මට විනාඩියක් දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා කියන්න ඕනෑ.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
දයාසිරි ජයසේකර මැතිතුමාට තව විනාඩියක කාලයක් ලබා දෙනවා.

**ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரவீந்திர பண்டார)
(The Hon. Ravindra Bandara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවස ඉතා වැදගත් දවසක්. විශේෂයෙන්ම අද,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
විපක්ෂයෙන් කාලය ලබා දීලා තිබෙනවා. ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා කථා කරන්න.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඔව්, ඒක තමයි. මට කථා කරන්න දෙන්න. ඔබතුමා වටපිට බලන්න එපා.

මේක තමයි සිද්ධ වෙමින් තිබෙන්නේ. තමුන්නාන්සේලා වයස අවුරුදු 65ක කාලය අවුරුදු 67 කරලා, - *[බාධා කිරීමක්]* පද්මන් සූරසේන මැතිතුමා කෙළින් වැඩ කරයි, භය වෙන්න එපා. හම්බ වෙයි හරියටම. තමුන්නාන්සේලා බලාගෙන ඉන්න, " ආ, 67 කළා නේ. මෙයා අපි කැමැති ඒවා කරයි" කියලා. බලාගෙන ඉන්න, එහෙම කරන්නේ නැහැ. එතුමා එහෙම කෙනෙකු නොවෙයි.

අද මොකද වෙලා තිබෙන්නේ? එක්ස්ප්‍රස් පර්ල් නෞකා අනතුර සම්බන්ධයෙන් වූ වන්දිය US Dollars 1 billion. පස්දෙනෙකු හිටියා, ඒ විනිසුරු මඬුල්ලේ. වෙනස් මතයක හිටපු තුන්දෙනෙකු තමයි judgment එක දුන්නේ. ලංකාවට US Dollars 1 billion නැති වුණා. රුපියල් කෝටි 34,000ක්. Judgment එකෙන් රුපියල් කෝටි 34,000ක වන්දියක්. රවී කරුණානායක මහත්මයාගේ වහලා තිබුණු නඩුව ඇරලා කිව්වා, "පහළට යවනවා; මහාධිකරණයට යවනවා, වහාම අහලා අවසන් කරන්න" කියලා. මේවා ගැන මෙතැන තමයි අපිට කථා කරන්න තිබෙන්නේ. මොකද, පොඩි මිනිස්සුන්ටත්, ලොකු මිනිස්සුන්ටත් හැම කෙනෙකුටම සාධාරණය වෙන්න ඕනෑ. අපි කියන්නේ එච්චරයි. අපි නීතිඥවරු විධියට බොහොම අවංකව ඒකට ගරු කරනවා. අපි ඒ විනිශ්වයකාරවරුන්ට ගරු කරනවා. හැබැයි, කවුරු වුණත් වැරදි දෙයක් කරනවා නම්, ඒකට ඇඟුම්කන් දෙන්න අපි සූදානම් නැහැ. ශිෂ්ට අශිෂ්ටභාවය ගැන ජනාධිපතිතුමාට මෙතැන ඇවිල්ලා කථා කරන්න බැහැ කියලායි මම නම් හිතන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
එතුමාට තව විනාඩියක් ලබා දෙනවා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
තමුන්නාන්සේලාගේ මන්ත්‍රීවරුන්ට, ඇමතිවරුවන්ට අද මොකද වෙලා තිබෙන්නේ? කන්ටේනර් 323 මුදා හැරීමේ සිද්ධියට ජනාධිපතිතුමා වග කියන්න ඕනෑ, බිමල් රත්නායක වග කියන්න ඕනෑ, නියෝජ්‍ය ඇමති රුවන් වග කියන්න ඕනෑ. ඒගොල්ලන් ගෙනැල්ලා ප්‍රශ්න කරන්න ඕනෑ කිව්වාම මොකද කරන්නේ? කමිටුව ඇතුළේ ඡන්දයක් තියලා අපිව පැත්තකට විසි කරලා ඒක අත්හැරලා දමනවා.

ඊළඟට තිබෙනවා, ගල් අඟුරු හොරකම. කුමාර ජයකොඩි මහත්මයාට අධිචෝදනා ගොනු කරලා තිබෙන්නේ. ඔබලා මුකුත් කළේ නැද්ද, විනය ක්‍රියාමාර්ග ගත්තේ නැද්ද කියලා ජනාධිපතිතුමා ඊයේ ඇහුවා. අනෙක් පැත්තට ගිහිල්ලා බලන්න. අර පැත්තට හැරිලා වම් පැත්ත බැලුවා නම් කුමාර ජයකොඩි මහත්මයා ඉන්නවා. විනය ක්‍රියාමාර්ග තියා මොකක්වත් කරලා නැහැ. ආනන්ද විජේපාලට කිසිම ක්‍රියාමාර්ගයක් අරගෙන නැහැ. සමහර මන්ත්‍රීවරු මිනිස්සුන්ට ගහලා, කිසිම ක්‍රියාමාර්ගයක් අරගෙන නැහැ. එහෙම කථා කරපු අය අශිෂ්ටත්වය ගැන, -

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු කුමාර ජයකොඩි මන්ත්‍රීතුමා.

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
ඔහොම කථා කරන්න බැහැ නේ, ගරු මන්ත්‍රීතුමා. දෙවතාවක්ම මගේ නම සඳහන් කළා. ගල් අඟුරු සම්බන්ධ සිදුවීමට මට අධිචෝදනා භාර දීලා තිබෙන්නේ කොහේද? නොදන්න දේවල් නොකියා ඉන්න. *[බාධා කිරීම්]* කට වාචාලකම තිබුණාට මෙතැන කියවන්න එපා. *[බාධා කිරීම්]* මම අභියෝග කරනවා. බොරු කියන්න එපා. *[බාධා කිරීම්]* හැම එකටම පැන පැන දෙන්න හදන්න එපා. *[බාධා කිරීම්]* බොරුව සමාජගත කරන්න එපා. මොකක් කියලා හිතාගෙනද, මෙතැනට ආවේ? *[බාධා කිරීම්]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා, - *[බාධා කිරීම්]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
කලබල වෙන්න එපා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමා. අලුතින් කාලය ගන්න වෙනවා, අවශ්‍ය නම්.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මම කථා කරලා ඉවර නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
විනාඩිය අවසන්, ගරු මන්ත්‍රීතුමා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඒක තීරණය කරන්නේ අපි. අපේ වෙලාව අපි ගන්නේ. අපේ වෙලාව තීරණය කරන්නේ අපි. ඔබතුමා කොහොමද ඒක තීරණය කරන්නේ?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
වෙලාව දෙන්න ඕනෑ, විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඉතින් දුන්නා නේ. ඒක තමයි කියන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමනි, ඔබතුමා වෙලාව දෙන්න.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
තමුන්නාන්සේලා පැය දෙක තුන කථා කරනවා, මෙතැන. *[බාධා කිරීමක්]* තමුන්නාන්සේලාගේ ආණ්ඩුව යටතේ ගල් අඟුරු පිළිබඳ ප්‍රශ්නය ඉදිරියට ගෙනෙන්නේ නැහැ. අපේ ආණ්ඩුවක් යටතේ අපි ගල් අඟුරු පිළිබඳ ප්‍රශ්නය ගෙනෙන්නම්. ඔය තිබෙන්නේ ඊට කලින් කරපු හොරකම. ඒ කියන්නේ, පොහොර සංස්ථාවේ කළ හොරකම. දැන් ශිෂ්ට අශිෂ්ටභාවය ගැන කථා කරන්නේ, ඒ අයට තමුන්නාන්සේලා කරලා තිබෙන්නේ මොකක්ද කියලා මට කියන්න. තමුන්නාන්සේව අපහසුතාවට පත් කරන්න හොඳ නැති නිසා මම මේ කථාව නවත්වනවා. *[බාධා කිරීමක්]*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
මෙතුමාට වෙලාව දෙන්න.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට වෙලාව තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
වෙලාව දෙන්න ඕනෑය කියලායි මම කියන්නේ.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
වෙලාව දෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
වෙලාව දෙන්න ඕනෑ, ගරු මන්ත්‍රීතුමා. එහෙම නැතුව බැහැ නේ.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
වෙලාව දෙනවා. එහෙම තමයි. *[බාධා කිරීමක්]* ඒක නේ, ඔබතුමා දන්නේ නැහැ නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
හරි, හරි, දන්නවා. දෙන්න ඕනෑ බව දන්නවා. *[බාධා කිරීමක්]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
දන්නේ නැති හින්දා නේන්නම්, - *[බාධා කිරීමක්]* වෙලාව ඔතැන දෙන්නේ නැහැ. ඔතැන සඳහන් කරනවා, විනාඩි දහයයි කියලා. ඕනෑ නම් අපට තව විනාඩියක්, දෙකක්, තුනක් - *[බාධා කිරීමක්]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා නැඟිටලා ඒක කියන්න ඕනෑ.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
එතුමා නැඟිටලා කී වතාවක් කිව්වාද? *[බාධා කිරීම්]* ඔබතුමා අනික් පැත්ත බලාගෙන ඉන්නවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
විනාඩියයි දුන්නේ. විනාඩියෙන් කථාව අවසන් කරන්න කියලා තමයි කිව්වේ.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඔබතුමා අපට ඉඩ දෙන්නේ නැද්ද? මම අපේ අනෙක් කථිකයන්ගේ වෙලාව ගන්නේ නැහැ.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ඔබතුමාට ඕනෑ නම් වෙලාව ගන්න, ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා. *[බාධා කිරීම්]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මම කියන්නේ මේකයි. *[බාධා කිරීම්]* ඉන්න, ඉන්න. කලබල වෙන්න එපා. *[බාධා කිරීම්]* කලබල වෙන්න එපා. පොඩ්ඩක් ඉන්න. මට කථා කරන්න දෙන්න. මගේ වෙලාව දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමනි, අවසාන වශයෙන් මෙතුමාට කොච්චර කාලයක් ලබා දෙනවාද?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
තව විනාඩියක් දෙනවා, මදි වුණොත් තවත් විනාඩියක් දෙනවා. *[බාධා කිරීම්]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
හරි, හරි. මම කියන්නම්. *[බාධා කිරීම්]* මේ කථාවත් එක්ක මම තව කථාවක් කියන්න ඕනෑ. *[බාධා කිරීම්]*

**ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා**
(மாண்புமிகு தர்மப்ரிய விஜேசிங்ஹ)
(The Hon. Darmapriya Wijesinghe)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා**
(மாண்புமிகு தர்மப்ரிய விஜேசிங்ஹ)
(The Hon. Darmapriya Wijesinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කථාව අවසන් වුණාට පසුව විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා විධියට ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමාට කියන්න බැහැ, වෙලාව දෙනවා කියලා. *[බාධා කිරීම්]* ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමනි, ඔබතුමා වෙලාව දුන්නේ, මෙතුමා මෙතැන කථාව අවසන් කළාට පසුවයි. *[බාධා කිරීම්]* ඒ නිසා ඔබතුමාගෙයි වැරැද්ද. දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාගේ නොවෙයි, ඔබතුමාගෙයි වැරැද්ද. *[බාධා කිරීම්]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා. *[බාධා කිරීම්]*

**ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා**
(மாண்புமிகு தர்மப்ரிய விஜேசிங்ஹ)
(The Hon. Darmapriya Wijesinghe)
නැහැ, නැහැ. ඔය ක්‍රමය වැරදියි. *[බාධා කිරීම්]*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
වැරදි වෙන්නේ කොහොමද? අපි දුන්නේ අපට වෙන් කර තිබෙන කාලයෙන්. ආණ්ඩුවට වෙන් කර තිබෙන කාලයෙන් දුන්නේ නැහැ අපි. *[බාධා කිරීම්]*

**ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා**
(மாண்புமிகு தர்மப்ரிய விஜேசிங்ஹ)
(The Hon. Darmapriya Wijesinghe)
කථාව අවසන් කරලා තිබුණේ. *[බාධා කිරීම්]*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
අවසන් කළේ නැහැ. *[බාධා කිරීම්]* අවසන් කළේ නැහැ. *[බාධා කිරීම්]* අවසන් කළේ නැහැ.

**ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා**
(மாண்புமிகு தர்மப்ரிய விஜேசிங்ஹ)
(The Hon. Darmapriya Wijesinghe)
අවසන් කළා. [බාධා කිරීම්]

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ඔබතුමාට ඕනෑ දෙය නොවෙයි, අපි කරන්නේ. *[බාධා කිරීම්]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, කාලය අවසන් වුණා. *[බාධා කිරීම්]* නැවත කාලය ලබා දිය යුතුයි, කථා කරනවා නම්. *[බාධා කිරීම්]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මට අවස්ථාව දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මට ඉඩ දෙන්න. එතකොට ඉවර නේ, මේ වැඩේ.

මම අවසාන වශයෙන් කථා කරන්නේ උසස් පෙළ විභාගයට මුහුණ දෙන අපේ දරුවෝ ගැනයි. ඒ දරුවෝ දවස ගණනේ කථා කරනවා. මම අගමැතිතුමිය එක්කත් මේ ගැන කථා කළා. අගමැතිතුමිය මෙතැන ඉන්න නිසා මම කියන්න කැමැතියි, පළමු වතාවට මෙවර විභාගය ලියන ළමයින්ට 2024 වසරේ ඉඳලා ප්‍රායෝගිකව ලැබී තිබෙන්නේ දින 330ක් බව. මාස තුනකට වැඩි කාලයක් ඒ ළමයින්ට අහිමි වෙලා. මම ඔබතුමියගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා, මේ ගැන හිතන්න කියලා.

දෙවනුව මා කියන්න කැමැතියි, අවසන් පාසල් වාරය දින නවයකට සීමා වෙලා තිබෙන බව. ඔබතුමිය උත්සාහ කරනවා, වෙලාවට විභාග පවත්වන්න. මම දන්නවා, ඒක. මම ඒකට ගරු කරනවා. නමුත් මේ ගැනත් හිතන්න. ඊළඟට, second shy, third shy ලියන දරුවන්ට මාස හතරකටත් අඩු කාලයක්, ඒ කියන්නේ දින 130ක පමණ කාලයක් තමයි තිබෙන්නේ. සාමාන්‍යයෙන් නම් මාස 10ක කාලයක් ඒගොල්ලන්ට තිබෙන්න ඕනෑ.

ගරු අගමැතිතුමියනි, "දිට්වා" සුළි කුණාටුව මාතර හෝ ගාල්ල දිස්ත්‍රික්ක හැර අනෙක් හැම දිස්ත්‍රික්කයටම බලපෑවා. ඒ නිසා විශාල විනාශයක් වුණා. ඒ නිසා අපි ගරු අගමැතිතුමියගෙන් යම් ඉල්ලීමක් කරනවා. අපි එදා මේ සම්බන්ධව කථා කරනකොටත් ඔබතුමිය මට කිව්වා, "බලන්නකෝ මටත් බණිනවා, තමුන්නාන්සේලාත් බණිනවා, අරවා කියලා බණිනවා, මේවා කියලා බණිනවා. නමුත් කරන්න දෙයක් නැහැ. මම මේක හරියට කරන්න ඕනෑ" කියලා. ඒක මම පිළිගන්නවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ලබා දුන් විනාඩි දෙක අවසන්.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මම ඔබතුමියගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා, නැවතත් හිතා බලා මේ අය වෙනුවෙන් සාධාරණයක් ඉෂ්ට කරන්න කියලා. ඒ අනුව ඒ දරුවන්ට තව මාස දෙකක්වත් ලබා දීමට කටයුතු කරන්න කියා ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රවීන්ද්‍ර බණ්ඩාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 11.57]

**ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரவீந்திர பண்டார)
(The Hon. Ravindra Bandara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවස ඉතාම වටිනා දවසක්. 1882 ජූනි 26වැනි දා, ඒ කියන්නේ අද වාගේ දවසක තමයි එස්.එස්. හෙලියොස් කියන ජර්මානු නෞකාව ලංකාවට ආවේ. ඒකෙන් තමයි ශ්‍රී ලාංකිකයින් පළමුවෙන්ම විදුලි ආලෝකයක් දැක්කේ. ඒ නිසා අද දවස "ජාතික බලශක්ති දිනය" කියලා හඳුන්වනවා. බලශක්ති දිනය ලෙස හඳුන්වන අද දිනයේදී මට කථා කරන්න ලැබීම භාග්‍යයක් ලෙස මා සලකනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ තිබෙනවා, "පොහොසත් රටක්-ලස්සන ජීවිතයක්" කියන එක. බලශක්ති ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ගත්තාම අපි දන්නවා, ලංකාව බලශක්ති කේන්ද්‍රස්ථානයක් වෙන්නේ කොහොමද කියලා. ලංකාව බලශක්ති කේන්ද්‍රස්ථානයක් වෙන්න නම් ගත යුතු තීන්දු තීරණ තමයි අපි රජයක් විධියට මේ දවස්වල ගන්නේ. මට කලින් කථා කළ මන්ත්‍රීතුමාට මම ආරාධනා කරනවා, මම මේ කියන කාරණා හොඳින් අහගෙන ඉන්න කියලා. මොකද, ඒ කියපු බොරු එකින් එක ගෙන මම පැහැදිලි කරනවා. බුද්ධියක් තිබෙනවා නම් ඒවා ඔළුවෙන් අහගෙන ඉන්න.

අපේ රටේ සුළං විභවයෙන් විතරක් විදුලිය මෙගාවොට් 56,000ක් නිපදවනවා. අපට ඕනෑ වන්නේ 5,000ක් පමණ. නමුත් මෙගාවොට් 56,000ක් නිපදවනවා. අපි හිතනවා, පොසිල ඉන්ධන තිබෙන රටවල් තමයි පොහොසත් රටවල් කියලා. නමුත් අනාගතයේ ගෙනෙන්නේ පිරිසිදු ඉන්ධනවල යුගයයි. ඒ පිරිසිදු ඉන්ධනවල යුගයේදී ලෝකයේ වැඩිම වටිනාකම් තිබෙන රට තමයි ශ්‍රී ලංකාව. මම කිව්වා, අපේ සුළං විදුලියේ තිබෙන ශක්‍යතාව ගැන. නමුත් සුළඟේ තිබෙන තත්ත්වය අනුව මොහොතින් මොහොතට සුළඟ වෙනස් වෙනවා. ඒ නිසා ඒ වෙනස්වීමට ඔරොත්තු දෙන විධියට, ඒකට ගැළපෙන විධියට systems හැදෙන්න ඕනෑ. ලෝකයේ හොඳම wind energy potential එකක් තිබෙන කලාප විධියට මන්නාරම් බොක්ක, ඒ වාගේම පූනරීන් කලාපය හඳුනාගෙන තිබෙනවා. සුළං විදුලිය ගැන කථා කරනකොටත් අපි අතීතයට යනවා නේ. ඒගොල්ලන් අදානි සමාගම හරහා ඩොලර් ශත 8.25කට, රුපියල්වලින් ගත්තොත් රුපියල් 25කට ගන්න හදපු විදුලිය ඒකකයක් දැන්

[ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා]

ඩොලර් ශත 4.65ට, ඒ කියන්නේ රුපියල් 12ක, 13ක වාගේ මුදලකට ගන්නවා. ඒවා ඇහෙනවාද දන්නේ නැහැ. අන්න තිබෙනවා, ජනතාවට ඒකේ වාසිය ලබා දෙන විධිය. දැනටමත් 300 megawatts පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති ක්‍රියාත්මක කෙරෙමින් පවතිනවා. අපි ඔබතුමන්ලාගේ 500 megawatts පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘතිය අතහැරියේ ඇයි? ඒකෙන් සියයට 50ක ලාභයක් තිබෙනවා කියලා ඒ දවස්වලත් මෙතැන එක එක බයිලා ගැහුවා. නමුත් දැන් වැඩේ කෙරෙනවා. ඒ විධියේ විභවයක් සුළංවලින් තිබෙනවා.

ඊළඟට, සුළං විදුලිය ගැන වාගේම solar energy ගැනත් කථා කළා නේ. Solar energy ගැන කථා කරනකොට සූර්ය බල සංග්‍රාම අරවා මේවා කළා. සූර්ය බල සංග්‍රාමයෙන් ලැබෙන විදුලිය ප්‍රමාණය හොඳයි. හැබැයි ඒක අන්තිම අවිධිමත්. දැන් මන්ත්‍රීතුමෙක් ඒ ගැන කථා කළා. ලජ්ජයි. එතුමා අහනවා, සූර්ය බලශක්තියෙන් නිපදවන විදුලිය ඒකකයක් සඳහා අත්සන් කරපු රුපියල් 38ක මුදල අඩු කළේ ඇයි කියලා. එය අත්සන් කළේ අවුරුදු 20කට. ඒක හදිසි අවස්ථාවකදී ගන්න ඕනෑ නම් අවුරුද්දකට, දෙකකට අත්සන් කරන්න ඕනෑ. නමුත් අත්සන් කරලා තිබෙන්නේ අවුරුදු 20කට. අපි මේ සඳහා මහජනතාවගෙන් අය කරනවා, රුපියල් 5, 9, 20, 28. දැන් එතුමා කියනවා, සූර්ය බලශක්තියෙන් නිපදවන විදුලිය ඒකකයක් සඳහා අත්සන් කරපු රුපියල් 38 කියන ගණන අඩු කරන්න එපා, අවුරුදු 20කට ඒ මිල දෙන්න කියලා. ඔන්න, ඒගොල්ලන්ගේ සැලසුම්. ඒ වාගේම සූර්ය විදුලි සංග්‍රාම කරද්දි දිවා කාලයේ තිබෙන ඒ සූර්ය විදුලිය රට ගන්න සැලසුම් තිබුණාද? ඒගොල්ලන්ගේ කාලයේ BESS කළාද, pumped storage කළාද, green hydrogen ගැන හිතුවාද? මොකුත් නැහැ. අපි හිතුවා, කරන්න හිටියා, ඕවා කරන්න හිටපු දේවල් කියලා කියනවා. ඕවා සීයාත් කරන්න හිටපු දේවල් කියලාත් කියයි. ඒ වුණාට ඒගොල්ලන් ප්‍රායෝගික තලයේ කිසිම දෙයක් කළේ නැහැ. අපි ඒ සියල්ල ගැන කථා කරනවා, ඒවා ප්‍රායෝගික තලයට ගෙනෙමින්. දැන් BESS එක ප්‍රායෝගිකව ක්‍රියාත්මක වනවා, smart meters ප්‍රායෝගිකව ක්‍රියාත්මක වනවා, pumped storage ප්‍රායෝගිකව ක්‍රියාත්මක වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් සතියකට, දෙකකට ඉස්සෙල්ලා Green Hydrogen Policy එකට කැබිනට් මණ්ඩල අනුමැතිය ලැබෙනවා ඔබතුමාත් දකින්න ඇති. මොකක්ද, green hydrogen කියන්නේ? Green Hydrogen තමයි අනාගතයේ බලශක්තිය නිපදවන ප්‍රධාන ඉන්ධනය බවට පත්වන්නේ. ඒක ලෝකයේ තිබෙන පිරිසිදුම ඉන්ධනය. ඒකට අවශ්‍ය සියලු විභව අපේ රටේ තිබෙනවා. සූර්ය විදුලිය කියන්නේ අපේ රටේ අපේ දේ. ඒ වාගේම ජලය, සුළඟ වැනි විභව සියල්ල අපට තිබෙනවා. ඒ සියල්ල තිබෙනකොට අපට පුළුවන්, ඒ සියල්ල යොදාගෙන green hydrogen නිපදවන්න. Green hydrogen නිපදවූවොත් එක පැත්තකින් ඒක ඉන්ධනයක් ලෙස යොදාගන්න පුළුවන්. අපි දන්නවා, අනෙක් පැත්තෙන් ඒ තුළ අපේ පරිසරය දූෂණය වෙන්න හේතුවක් වන කාබන්ඩයොක්සයිඩ් සම්පූර්ණයෙන් එළියට යනවා කියලා. *[බාධා කිරීමක්]* යන්න එපා, ගරු මන්ත්‍රීතුමනි. මට උත්තර දෙන්න තිබෙනවා. අර කියපු මෝඩ කථා ඔක්කෝටම මම උත්තර දෙනවා. මම හිතුවේ ඇත්තටම හරක් කටාද කියලායි. හරක් කටා ඉන්නේ එළියේ නොවෙයි මෙතැන කියලා තමයි අපි දැක්කේ, කියපු සමහර කථාවලින්. ඒ නිසා හරක් කටාලාගෙන් ඉල්ලා සිටිනවා, පොඩ්ඩක් තව අහගෙන ඉන්න කියලා. මම කියන්න ගියේ ඒකයි.

අන්න එහෙම කිසිම සැලසුමක් නැතුව තමයි එදා කටයුතු කළේ. දහවල් කාලයේ තිබෙන සූර්ය විදුලිය රට ගන්න නම් බැටරි පද්ධති අවශ්‍ය වනවා. නමුත් ඒ බැටරි පද්ධති ගන්න එදා සැලසුම් කළේ නැහැ. ඒ වාගේම තමයි දැන් system එක unstable වෙනවා. වෙසක් දවසේ වෙච්ච සිද්ධිය, අරවා මේවා ඔක්කෝම වුණේ system එක අවිධිමත් හින්දා. අවිධිමත් දේවල් තමයි කළේ. ඒ කටයුතු දැන් විධිමත් කරනකොට ඒකට සහාය දෙන්න. BESS එක ගත්තොත්, දැනටමත් 40 megawatt-hour BESS 16ක් install කරගෙන යනවා. එතකොට megawatt-hour 640යි. One thousand megawatt-hour BESS එකකුත් ක්‍රියාත්මක වෙමින් යනවා. ඒ සියල්ල වෙමින් පවතිනවා. එතකොට තමයි රට සූර්ය විදුලිය ගන්න පුළුවන් වෙන්නේ. ඒ වාගේම සුළං විදුලියත් තිබෙනවා. දැන් ඒ සියල්ල යොදාගන්න පුළුවන්.

අපි දන්නවා, සූර්ය විදුලිය ගත්තාම, අපේ තිබෙන system inertia එක අපට හදාගන්න අමාරුයි කියලා. මොකද, කැරකෙන මැෂින් නැති නිසා. සුළං විදුලිය ගත්තාම, ටර්බයින කැරකුණාට ඒකේ වෙනස් වන වේගයක් තිබෙන්නේ. එතකොට විදුලි ජනනයේදී තිබෙන unstable බව නැති කරන්න නම් අපට system inertia ඕනෑ වනවා. ඒවා ගැන හිතලාවත් තිබුණේ නැහැ. ඒවාට කිසි දෙයක් කරලා තිබුණේත් නැහැ. නමුත් ඒ සියල්ල දැන් සිදු වනවා.

අනෙක් කාරණය මෙයයි. සූර්ය බලයෙන් කොච්චර විදුලිය ප්‍රමාණයක් ජනනය වනවාද කියන එක control room එකට පෙනෙන්නේ නැහැ නේ. ඒක බලාගන්න තමයි system එක smart වෙන්න ඕනෑ. ඒ වාගේම smart meters එන්න ඕනෑ. අපේ නියෝජ්‍ය ඇමතිතුමා ඒ ගැන පැහැදිලි කළා. අපි ඒකටත් අත දීලා තිබෙන්නේ. ලබන අවුරුද්ද ඇතුළේ ඒක වෙනවා. ඒවා එන්නේ ණය අරගෙන නොවෙයි, අපේ මුදල්වලින්. ඒ වාගේම පාරිභෝගිකයාගෙන් අය කරගන්නේ නැතුව තමයි ඕක වෙන්නේ. ඒවා ගැන කියනකොට රිදෙයි. නමුත් ඒවා ගැන කියන්න ඕනෑ. සූර්ය විදුලිය, අරක මේක කියලා ඒකත් තනිකර මාෆියාවක් කරගත්තා. සුළං විදුලියත් එහෙමයි. ඒකයි, ඒගොල්ලන් රුපියල් 25ට ගත්ත සුළං විදුලිය ඒකකයක් අපි රුපියල් 13ට ගන්නේ. සූර්ය විදුලිය හින්දා අපි system එක සම්පූර්ණයෙන් සමතුලිත තත්ත්වයට පත් කළා. ඒ වාගේම සූර්ය විදුලිය විශාල ප්‍රමාණයක් විදුලිබල පද්ධතියට දුන්නා කියනවා නේ. අපි දැන් ඒක අධෛර්යවත් කරනවා කියනවා නේ. ලංකා ඉතිහාසයේ වැඩිම rooftop solar නිපදවපු අවුරුද්ද තමයි පසුගිය 2025 අවුරුද්ද. ඒකත් හොඳට අහගෙන ඉන්න. ඒ නිසා ඒ සියලු දේවල් දැන් ලස්සනට වනවා. කලබල වෙලා තිබෙන්නේ මෙන්න මේ නිසා. දැන් හොරු අල්ලන වැඩෙත් ක්‍රියාත්මක වනවා නේ. ඒකත් අපේ ජන වරම අනුව වෙන දෙයක්.

එතකොට තමයි ඒගොල්ලන් කියන්නේ පොඩ්ඩක් හරි වෙනස් වෙන්න ඕනෑ කියලා. ඇත්තටම මම අද කනගාටු වෙන්නේ මේකයි. මම වැදගත් මහත්මයෙක් කියලා හිතාගෙන හිටපු මහත්මයෙකුත් අද වෙන්දේසියක් වාගේ විනාඩියක් ගන්න, විනාඩියක් ගන්න කිව්වා. ඒකට හේතුව තමයි, ඊයේ ඔය සුදු ඇඳගෙන ඉන්න ගොඩක් මහත්වරු කළු වුණු එක. ඒගොල්ලන් පාතාලයත් එක්ක තිබෙන ගනුදෙනු, මත්ද්‍රව්‍යයත් එක්ක තිබෙන ගනුදෙනු හඬපට එක්ක හෙළි වුණා. ඒගොල්ලන්ගේ සංවිධායකවරු, කෘත්‍යාධිකාරි මණ්ඩලයේ හිටපු අය ඒවාට සම්බන්ධයි. ඔබතුමන්ලා ඔහොම වාඩි වෙලා ඉන්නකොට අපට ලජ්ජයි කියන එකත් අපි කියන්න ඕනෑ.

මෙතැන ශිෂ්ටත්වය සහ අශිෂ්ටත්වය ගැන කියනවා. අර හරක් කටක් වාගේ තියාගෙන ඉන්නේ. එළියෙත් ඉන්නවා, සමහර විට මෙහෙත් ඉන්නවා ඇති. මහ පාර මැදදී අල්ලා ගත්තා, ඒක හරි නැහැ කියලා කිව්වා නේ. අපරාධකාරයෝ අල්ලන්න ඕනෑ එහෙම තමයි. එතුමාම කිව්වා නේ, ලබන සතිය වෙනකොට ඩොලර් එක රුපියල් 450 වෙනවා කියලා. එතුමා සභාවෙන් එළියේ ඉඳගෙන හරි මේවා අහගෙන ඇති. ජනාධිපතිතුමාට calls දෙනවාලු, answer කරන්නේ නැහැලු. කවුද ඔබතුමා? කවුද ඔබතුමා? ඔබතුමාගේ calls answer කරන්න කවුද ඔබතුමා? කියන කථා බලන්නකෝ. සමහර වෙලාවට අපට පොඩි විනෝදයක් ගන්න මේ වාගේ මෝඩ කථා කියන මනුස්සයෙකුගේ callsවලට answer කරන්න පුළුවන්.

ඊළඟට කියනවා, සෙංකෝලය උස්සන්න ගියේ නැහැලු. ඔයගොල්ලන් සෙංකෝලය උස්සන්න ගියා. හැබැයි, සෙංකෝලය උස්සන්න බැරි වුණා. අපි කවදත් බොහොම ශිෂ්ට සම්පන්න විධියට ඉන්නවා. අපි දන්නවා, මිරිස් කුඩු සිද්ධියට, මයික් කඩපු ඒවාට සම්බන්ධ ඒ පිරිස තමයි තවම ඉන්නේ කියලා. ඔයගොල්ලන්ට එක දශමයකින් හෝ වෙනස් වෙන්න පොඩි හෝ වුවමනාවක් නැහැ. ඒ නිසා ඔයගොල්ලන්ට කවදාවත් වෙනස් වෙන්නත් බැහැ. ඔයගොල්ලන්ට ආයෙත් බලය කියන එක හීනයක් විතරයි. ඒකට ළං වෙන්නවත් බැහැ. මොකද, ඔයගොල්ලන් වෙනස් වෙන්නේ නැහැ, ඔය විධියම තමයි.

ගල් අඟුරු සිද්ධිය ගැන කිව්වා. අපේ හිටපු විෂය භාර ඇමතිතුමා ධුරයෙන් අයින් වෙලා විමර්ශනවලට ඉඩ දුන්නා. අපි දන්නවා, ගල් අඟුරු සිද්ධියට සම්බන්ධ හොරු කවුද කියන එක හෙළි වන බව. අපි දැක්කා නේ, නිකම් "ඩීල්දාස්" වාගේ නම් තිබෙනවා. සැබෑ ඩීල් මොනවාද කියලා දැන් එළියේ පෙනෙනවා. ඒ වාගේම තමයි ඩීල් රණවකලා ඉන්නවා. ඉස්සරහට මේ ගල් අඟුරු හොරකම් ගැන තොරතුරු එනවා. අපේ ආණ්ඩු කාලය තුළ එක රුපියලක, එක ඩොලරයක හොරකමක් වෙන්නේ නැහැ කියන්න අපි දන්නවා. මොකද, අපි ඒ දේවල් අධ්‍යයනය කරනවා. අපි ඒ ගැන හොයනවා. ඒ විධියට අපි ඒ ගැන හොයන නිසා තමයි ඔය මහා කලබලය ඇති වෙලා තිබෙන්නේ.

රටක් විධියට අපි ඉස්සරහට යද්දි සූර්ය විදුලිය හරහා green hydrogen එනකොට අපේ රට ලෝකයේ තිබෙන පොහොසත්, ලස්සන රට බවට පත් වෙනවා. ඒකට අපට green hydrogen උදවු වෙනවා. ඒ සඳහා තමයි කැබිනට් මණ්ඩලයේ අනුමැතිය හම්බ වුණේ. Green hydrogen ලැබෙනකොට අපි කාබන් විමෝචනයෙන් තොරව හයිඩ්‍රජන් නිපදවනවා. ඒකත් එක්ක වායුගෝලයේ තිබෙන නයිට්‍රජන් එක් කරලා අපි green ammonia හදනවා. ඒකට තමයි සැලසුම් කරන්නේ. අපි දන්නවා, green ammonia හැදුවොත් අපේ රටේ පොහොර ප්‍රශ්නය විසඳෙන බව. අපේ රටින් වැඩිම විදේශ විනිමයක් එළියට යන්නේ මොකටද? පොසිල ඉන්ධන ගෙනෙන්න. ඊළඟට වැඩිම විදේශ විනිමයක් වැය වෙන්නේ පොහොර ගෙනෙන්න. ලංකාවට පොහොර ගෙනෙන්න ඕනෑ නැහැ. ලංකාවේ පොහොර නිෂ්පාදනය කරලා අපනයනය කරන්න පුළුවන්, ඒ green ammonia හරහා. එහෙම තමයි සැලසුම් සහගත රජයක් කටයුතු කරන්නේ. එහෙම සැලසුම් සහගතව කටයුතු කරනකොට කුමන්ත්‍රණකාරිව, මෙලෝ අදහසක් නැතිව, කිසි දැනුමක් නැතිව අඳුරේ අතපත ගාලා සූර්ය විදුලිය දුන්නා, සුළං විදුලිය දුන්නා, ඒවා දුන්නේ වැඩි ගාණට කියනවා. ඒ අයට රිදෙනවා. ඒ නිසා අපි මේ රටේ ජනතාවට කියනවා, සියලු දේ පිළිවෙළට සිදු වන බව. හොරු අල්ලන එක ගැන, සාපරාධී බලහත්කාරකම් ගැන චෝදනා තිබුණා. ඒවාට නීතිය ක්‍රියාත්මක වෙනවා.

දැන් අධිකරණය ගැන කියනවා. ජනාධිපතිතුමා ඊයේ අධිකරණය සම්බන්ධයෙන් පවතින ගැටලුව ගැන පැහැදිලි කළා. ගාණට වෙලාවට ඒ වැඩේ වෙනවා. පහළ මහෙස්ත්‍රාත් අධිකරණවල පුරප්පාඩු ටික පිරවෙන්න ඕනෑ. ඊට පස්සේ අභියාචනාධිකරණයට ඒ ටික අදාළ වෙන්න ඕනෑ. එහෙම තමයි පිළිවෙළට යන්නේ. ඒ විතරක් නොවෙයි, hospitalsවල, අධ්‍යාපන අමාත්‍යාංශයේ පුරප්පාඩු තිබුණා වාගේම ඉස්කෝලවල විදුහල්පතිවරුන්ගේත් පුරප්පාඩු තිබුණා. ඒ පුරප්පාඩු සියල්ල ලස්සනට, පිළිවෙළට පිරෙනවා. කලින් වාගේ, මන්ත්‍රීතුමාගේ ලියුමට, ඇමතිතුමාගේ ලියුමට ඒවා සිදු වෙන්නේ නැහැ.

අනෙක් කාරණය මේකයි. අපි කිසිම විධියකින් අධිකරණයට දේශපාලනිකව මැදිහත් වෙන්නේ නැහැ. අපි කැමැති දේ නොවෙයි එතැන වෙන්නේ. ඒ නිසා මතක තබා ගන්න, ඒ සියලු කාරණා වෙනවාය කියන එක.

අවසාන වශයෙන්, මම අද දවසේ ප්‍රධාන මාතෘකාව වන බලශක්තිය ගැන කථා කරන්න ඕනෑ. ඒගොල්ලන්ට ගොඩක් රිදිලා තිබෙන නිසා තමයි ඒවා කියන්නේ. ඔයගොල්ලන් හිතපුවත් නැති තව එක දෙයක් තිබෙනවා. දැන් කියයි, අපි හිතුවා, අපිත් කරන්න ගියා කියලා. ඔබතුමන්ලා අවුරුදු 76ක් හිටියා නේද? එහෙනම් ඒවා කරන්න එපායැ.

අපි දන්නවා, විශේෂයෙන්ම අපේ උතුරු, නැඟෙනහිර තිබෙන සූර්ය විදුලිය, සුළං විදුලිය අපේ grid එකට ගන්න ඕනෑ, ඒක පද්ධතියට එකතු කරන්න ඕනෑ කියලා. එහාට මෙහාට, අදානිට, අරයාට මෙයාට දෙනකොට ඒ ගැන හිතුවාද? දැන් ඒකටත් අපි අත ගහලා තිබෙනවා. Mannar coastal belt එක ලෝකයේ තිබෙන හොඳම එකක්. එහි යෝජිත 400kV transmission line එක ජාතික විදුලිබල පද්ධතියට එකතු කරන්න ඕනෑ. ණය අරගෙන නොවෙයි, භාණ්ඩාගාරයේ තිබෙන සල්ලිවලින් ඒක කරනවා. ඒ නිසා මතක තබා ගන්න, ඉදිරියේදී තව සුළං ව්‍යාපෘති එන බව. ඒ සියලු සුළං ව්‍යාපෘති ඉදිරියේදී ක්‍රියාත්මක වෙනවා.

ඊළඟ කාරණය මේකයි. දැන් විදුලි බිල ගැන කියනවා නේ. කලින් හිටපු මහත්තයා කිව්වේ, අවුරුදු 20ක් දෙන්න රුපියල් 38ට දෙන්නම්, විදුලි බිල අඩු කරන්නම් කියලා. අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනය තුළ තිබෙනවා, විදුලි බිල තුනෙන් එකක් අඩු කරනවා කියලා. ඉතාම පැහැදිලිව ජනතාවට අපි කියනවා, ඒක අප කරනවාය කියලා. හැබැයි, ඒ අය ඇති කරපු system එක තුළ අපට ඒක කරන්න බැහැ.

ඔයගොල්ලන්ගේ කාලයේ හැම දාම තිබුණේ හදිසි මිලදී ගැනීම්. අන්න ඒ හදිසි මිලදී ගැනීම් නැති කිරීම තමයි අපි මේ බැටරි පද්ධතිය තුළින් බලාපොරොත්තු වෙන්නේ. අපේ බලාපොරොත්තුව තමයි, ඩීසල්වලින්, නැප්තාවලින් රෑට ජනනය කරන විදුලිය, දිවා කාලයේ ලැබෙන සූර්ය බලය, සුළං බලය යොදා ගෙන සිදු කිරීම. අනාගතයේදී ඩීසල් පුච්චලා විදුලිය නිෂ්පාදනය කරන්නේ නැහැ. අන්න එහෙම අපි සැලසුම් සහගත වෙන්න ඕනෑ.

ඊළඟට, time-of-use tariff ගැන කිව්වා. ඒ වාගේම real-time monitoring කියන ඒ සියල්ල smart metres හරහා සිදු වෙනවා. එතකොට තමන්ගේ විදුලි බිල ගැන වුණත් විනිවිදභාවයක් තිබෙනවා. එතකොට ජනතාව දන්නවා, මේක නිවැරදි විදුලි බිල කියලා. ඒ වාගේම real-time ඒ පුද්ගලයාට බලන්න පුළුවන්. එතකොට ඒක time-of-use tariff එකට යනවා. දැන් අහනවා, ඒක time-of-use tariff එකට යනවාද, එනවාද කියලා. එහෙම ඇහුවාට ඒකට අදාළ සැලසුම් දශමයකින්වත් ඉදිරියට අරගෙන තිබුණේ නැහැ. හැබැයි, මම එක දෙයක් සම්බන්ධයෙන් ස්තුතිවන්ත වෙනවා. පසුගිය කාලවල සූර්ය විදුලිය සම්බන්ධයෙන් කරපු දේ අපි කරනවා. හැබැයි, ජනතාව ගැන හිතන්නේ නැතිව පසුගිය කාලයේ මේක සම්පූර්ණයෙන් වාණිජකරණය කරලා, අවුල් ජාලයක් බවට පත් කරලා තිබුණේ. ඒ අවුල් ජාලය ලිහාගෙන දැන් බොහොම ලස්සනට ඒ කටයුතු ටික කරගෙන යනවා.

ඒ වාගේම pumped-storage power plants ගැනත් මම කියන්න ඕනෑ. මහ ඔය ආශ්‍රිත pumped-storage power plant එකේ ධාරිතාව මෙගාවොට් 600යි. ඒ pumped-storage power plant එකෙන් කෙරෙන්නෙත් මේකයි. සූර්ය විදුලිය තිබෙනවා. ඊට පසුව රෝද කරකවලා ජල විදුලිය ලෙස රෑට විදුලිය නිපදවනවා. එක පැත්තකින් system inertia එක එනවා. විශ්වාසය ඇති වෙනවා. ඔන්න ඔය සියල්ල සිදු වනකොට අපේ රටට ආයෝජකයන් එනවා. අපේ රට ආයෝජන සඳහා විවෘත කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரவீந்திர பண்டார)
(The Hon. Ravindra Bandara)
මට තව තත්පර කීපයක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඊගොල්ලන් කරන්න හදපු විදුලිබල මණ්ඩලය කෑලි 12කට කඩලා, සේවකයින් 12,500ක් අයින් කරන එක අපි කළේ නැහැ. අපි සේවකයන් ගැන හිතුවා.

අනෙක් කාරණය මේකයි. අපි ඊගොල්ලන් වාගේ මේක පෞද්ගලික අංශයට දීලා ඒ විධියට කටයුතු කළේත් නැහැ. ඒක රජය සතු සමාගමක් බවට පත් කළා. ඉතින්, මේ ටික ලස්සනට කරගෙන යනකොට කලබල වෙනවා. ඒ කලබල වීම පිළිබඳව අපට තේරුම් ගන්න පුළුවන්. අපි මේ රටේ ජනතාවට ඉතාම පැහැදිලිව කියනවා, විදුලිබල ක්ෂේත්‍රයේ විප්ලවයක් එනවා, smart metre විප්ලවය එනවා, සූර්යබල විප්ලවය එනවා, සුළං බල විප්ලවය එනවා, BESS විප්ලවය එනවා, ඒ සියල්ල මේ රජය යටතේ සිද්ධ වෙනවාය කියලා. මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සිවඥානම් ශ්‍රීතරන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[பி.ப. 12.11]

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் நடைபெறுகின்ற இலங்கை மின்சாரச் சட்டத்தின் கீழான கட்டளை தொடர்பான விவாதத்தில் கலந்துகொண்டு உரையாற்றுவதையிட்டு மகிழ்ச்சி அடைகின்றேன்.

இயற்கையின் வழியில் மின்சாரத்தைப் பெற்றும், ஏற்கனவே இருக்கின்ற நீர் மின்சாரத்தின் ஊடாகவும் நாட்டின் மின்சாரத் தேவையைப் பூர்த்திசெய்வதற்கான முயற்சிகள் மேற்கொள்ளப்படுகின்றன. இருந்தாலும், இப்பொழுதும்கூட சில இடங்களில் இயந்திரங்கள் மூலமாக மின்சாரம் வழங்குகின்ற செயற்றிட்டங்கள் நாட்டில் நடைபெற்றுக்கொண்டுதான் இருக்கின்றன. எரிபொருள் தட்டுப்பாடு ஒருபுறம் இருக்க, இயற்கை ரீதியாகக் கிடைக்கின்ற மின்சாரத்தின் தாக்கமும் தரவுகளும் குறைவு என்பதை நாங்கள் இந்த இடத்தில் புரிந்துகொள்ள வேண்டும். இதனைவிட, solar power, wind powerமூலம் மின்சாரத்தை உற்பத்தி செய்வதற்கான பல செயற்றிட்டங்கள் நாட்டில் முன்னெடுக்கப்படுகின்றன. அண்மையில் மன்னார் மாவட்டத்தில் இது தொடர்பில் மிகப் பெரியளவிலான போராட்டங்கள் நடைபெற்று, அது மாண்புமிகு சனாதிபதி வரைக்கும் கொண்டுசெல்லப்பட்டு, ஒரு முடிவுக்குக் கொண்டுவரப்பட்டு இருக்கின்றது.

கிளிநொச்சி மாவட்டத்தின் மேற்குப் பகுதியிலுள்ள கிராஞ்சி, வலைப்பாடு, வேரவில் போன்ற கிராமங்களை உள்ளடக்கிய பகுதியானது, தனியான ஒரு தீவுப் பகுதிபோல காட்சியளிக்கின்ற இடமாகும். மழைபெய்து வெள்ளம் வந்தால் அந்த இடத்துக்குப் போக்குவரத்துச் செய்ய முடியாது. அந்தளவுக்கு அங்கு போக்குவரத்துக்கான பாதைகள்கூட இல்லை. கிராஞ்சி கிராமம் என்பது, முழுக்க முழுக்க தென்னந்தோட்டங்களுக்குப் பெயர்போன ஓர் இடமாகும். மக்கள் அந்தக் காலத்தில் அங்கு குடியேறி, இன்றுவரை தென்னந்தோப்புக்களை உருவாக்கி வாழ்ந்து வருகின்றனர். கிளிநொச்சி மண்ணின் மிக முக்கியத்துவம் வாய்ந்த தனியான ஒரு கிராம அலுவலர் பிரிவுதான் கிராஞ்சி. இந்தக் கிராஞ்சியின் தெற்குப் பகுதியிலுள்ள கிட்டத்தட்ட 2,000 ஏக்கரில் காற்றாலைகள் மூலம் மின்சாரத்தைப் பெறுவதற்கு அரசாங்கம் முயற்சிக்கிறது என்ற அடிப்படையில், இவ்வளவு காலமும் நட்டு, வளர்த்துப் பயன்பெறுகின்ற இந்த நேரத்தில், அந்தப் பிரதேசங்களில் இருக்கின்ற 100 குடும்பங்களுடைய 4,000க்கும் மேற்பட்ட தென்னம்பிள்ளைகள் அழிக்கப் படுகின்றன. அங்குள்ள தென்னம்பிள்ளைகளை அழித்துத்தான் காற்றாலைகளை உருவாக்க வேண்டுமா? அந்த மக்கள் தொடர்ந்து போராட்டங்களை முன்னெடுத்தார்கள்; பல கடிதங்களை சனாதிபதிக்கு எழுதியிருக்கிறார்கள்; அரசாங்க அதிபருக்கு எழுதியிருக்கிறார்கள். ஆனால், இதுவரை அவர்களுக்கான ஒரு நல்ல செய்தி இந்த அரசாங்கத்தால் சொல்லப்படவில்லை என்பதுதான் துரதிருஷ்டவசமானது.

ஆகவே, கிராஞ்சி, வேரவில், வலைப்பாடு பகுதிகளில் வாழுகின்ற மக்களுடைய கோரிக்கைக்கு, குறிப்பாக கிராஞ்சி கிராம மக்களுடைய கோரிக்கைக்கு அரசாங்கம் செவிசாய்க்க வேண்டும். அந்த இடத்தில் காற்றாலைகளை அமைப்பதைத் தவிர்க்க வேண்டும். வேறு பல திறந்த வெளிகள், தரிசு நிலங்கள் அந்தப் பகுதிகளில் உண்டு. அவ்வாறான பிரதேசங்களைத் தெரிவுசெய்து, காற்றாலைகள் அமைப்பதை அவர்கள் எதிர்க்கவில்லை. நீண்ட நெடுங்காலமாக அவர்கள் தங்களுடைய உடல் உழைப்பால் உருவாக்கிய தென்னந் தோட்டங்களை அழித்து, அந்த இடங்களில் காற்றாலைகளை அமைக்க முனைவதும், அதனூடாக மின்சாரம் உற்பத்தி செய்ய முனைவதும், பல குடும்பங்களை அங்கிருந்து இடம்பெயர்க்கப் பண்ணுவதும் மிகவும் மோசமானது. அது மனித குலத்துக்கு ஏற்படுத்துகின்ற மிகப் பெரிய குந்தகமாகும். தற்பொழுது, இங்கு வலுசக்தி அமைச்சர் அவர்கள் இருக்கின்றார். தயவுசெய்து, இந்த விடயத்தைக் கருத்தில் எடுங்கள்! இன்றைய நாள் அதற்கு மிகப் பொருத்தமான ஒரு நாளும்கூட. கிராஞ்சியில் அமைக்கப்பட இருக்கின்ற காற்றாலை மின் உற்பத்தித் திட்டத்தை உடனடியாக நிறுத்தி, அதனை வேறொரு பிரதேசத்துக்கு - தரிசு நிலங்கள் அல்லது காற்று வரக்கூடிய வேறு வெளிகளுக்கு - மாற்றுமாறு நான் விநயமாக இந்த இடத்தில் கேட்டுக் கொள்கின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, அண்மையில் கிளிநொச்சி மற்றும் மட்டக்களப்பு மாவட்ட விவசாயிகள் சில போராட்டங்களை முன்னெடுத்திருந்தார்கள். ஓர் ஏக்கர் நிலத்தில் நெல் உற்பத்தி செய்வதற்கு, நிலம் பண்படுத்தல், 70 கிலோகிராம் விதை நெல் கொள்வனவு, களைநாசினிகள் 2 தடவை தெளித்தல், இரசாயன உரங்கள் 4 தடவை இடல், பூச்சிநாசினிகள் 2 தடவை இடல், வாய்க்கால் வரம்பு, வயல்துப்புரவு ஆள்கூலி, விதைப்பு உரமிடல் ஆள்கூலி 5 தடவை, நாசினிகள் விசிறிய ஆள்கூலி 4 தடவை, வரிப் பணங்கள், அறுவடை இயந்திரக் கூலி, அறுவடை ஆள்கூலி, பொதியிடல், நெல் அறுவடை ஏற்றிய வாகனக் கூலி, நீர் பாய்ச்சல் ஆள்கூலி, நெல் உலர்த்தல், வயல் குத்தகை, வங்கி அல்லது வர்த்தக நிலைய மூலதன வட்டி உட்பட சகல

கூலியாள் உபசரணை என்பவற்றுக்கு மொத்தமாக 212,700 ரூபாய் செலவாகின்றது. விவசாயிகள் ஓர் ஏக்கரில் அறுவடை செய்கின்ற நெல்லின் அளவு 1,750 கிலோகிராம். இதனை 120 ரூபாய்படி, 210,000 ரூபாய்க்குத்தான் அவர்கள் விற்கக்கூடியதாக இருக்கின்றது. அவர்களுக்கு மேலதிகமாக 2,700 ரூபாய் செலவு ஏற்படுகின்றது.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, விவசாயத்தின் முதுகெலும்பு நெல் உற்பத்தியாகும். ஒரு கிலோகிராம் நெல் உற்பத்தி செய்ய 121.50 சதம் செலவாகின்றது. தற்போது ஒரு கிலோகிராம் நெல்லுக்கான கொள்விலையாக 120 ரூபாயை அரசாங்கம் நிர்ணயித்து இருக்கிறது. எனவே, ஒரு கிலோகிராம் நெல்லுக்கு 135 ரூபாயை உத்தரவாத விலையாக அரசு நிர்ணயித்துத் தர வேண்டுமென இந்த விவசாயிகள் கோரிக்கை முன்வைக்கிறார்கள். மேலும், 2026 சிறுபோக நெல் அறுவடை இன்னும் இரு வாரங்களில் ஆரம்பமாக உள்ளதால், நெல் சந்தைப்படுத்தல் சபைமூலம் நெல் கொள்வனவு செய்ய அரசு ஆவன செய்ய வேண்டுமெனவும், கிளிநொச்சியில் நெல் சந்தைப்படுத்தல் சபையின் நெல் களஞ்சியங்கள் நிரம்பிய நிலையில் உள்ளதால் சிறுபோக நெல் கொள்வனவுக்கு வசதியாக களஞ்சியங்களை வெற்றாக்க அரசு ஆவன செய்ய வேண்டுமெனவும், தனியார் நெல் விலையை வீழ்ச்சி அடையச் செய்யும் முறைமைகளைக் கட்டுப்படுத்த உடன் உரிய நடவடிக்கைகளை எடுக்க வேண்டுமெனவும் கோரி, இரணைமடு கமக்காரர் அமைப்புக்களின் சம்மேளனத்தின் தலைவர் மு.சிவமோகன், செயலாளர் ச. சுகந்தன் மற்றும் பொருளாளர் ப.சந்திரபாலா ஆகியோர் கையொப்பமிட்ட கடிதத்தை சனாதிபதிக்கு அனுப்பியிருக்கிறார்கள். கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, அந்தக் கடிதத்தின் பிரதியை நான் சபாபீடத்துக்குச் ***சமர்ப்பிக்கின்றேன்**.

கௌரவ அமைச்சர் அவர்களே, இந்த நாட்டின் முதுகெலும்பாக இருப்பது விவசாயத்துறை ஆகும். விவசாயம் தொடர்பான நடவடிக்கைகளை நீங்கள் சரியாகப் புரிந்துகொள்வீர்களென நினைக்கின்றேன். இங்கு கௌரவ பிரதம அமைச்சர் அவர்களும் இருக்கின்ற சூழலில், நீங்கள் ஒன்றைக் கற்றுக் கொள்ளுங்கள்! இந்த நாடு பொருளாதாரத்தில் பின்னுக்குச் செல்கின்றதெனச் சொல்கிறோம். இப்பொழுதும் வெளிநாட்டுக் கடன்களை நம்பி நீங்கள் இருக்கிறீர்கள். வெளிநாட்டுக் கடன் இல்லாவிட்டால் இலங்கை இயங்க முடியாது. பெருந்தோட்ட உற்பத்திகள் வீழ்ச்சியடைந்து கொண்டு இருக்கின்றன. அதேபோல், நெல் உற்பத்தியும் பின்னோக்கித் தள்ளப்பட்டுக்கொண்டு இருக்கிறது. நெல்லுக்கான சரியான உத்தரவாத விலை வழங்கப்படுவதில்லை. யாழ்ப்பாணத்தில் வெங்காயம் அல்லது ஏனைய மரக்கறி உற்பத்திகள் நடைபெறுகின்றபொழுது, நீங்கள் அவற்றை இறக்குமதி செய்கின்றீர்கள். நெல் அறுவடை செய்யப்படுகின்றபொழுது, அரிசியை இறக்குமதி செய்கின்றீர்கள். இவையெல்லாம் இந்த நாட்டின் பொருளாதாரத்துக்கு மிகப் பெரியளவிலான தாக்கத்தை ஏற்படுத்துகின்றது.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, දැන් කථාව අවසන් කරන්න. කාලය පිළිබඳ ගැටලුවක් තිබෙනවා.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)
நான் முடிக்கிறேன்.

இந்த நாட்டின் பொருளாதாரம் வளர்வதற்கு விவசாயிகளுடைய உற்பத்தியிலும், அவர்களுடைய பொருளாதார வளத்திலும் அதிக கரிசனை கொள்ளுமாறு இந்த உயர்ந்த சபையினூடாக விநயமாகக் கேட்டு, எனது உரையை நிறைவு செய்கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු චන්දන සූරියආරච්චි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 12.18]

**ගරු චන්දන සූරියආරච්චි මහතා**
(மாண்புமிகு சந்தன சூரியஆரச்சி)
(The Hon. Chandana Sooriyaarachchi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශ්‍රී ලංකා විදුලිබල පනත යටතේ ඉදිරිපත් කර තිබෙන නියමය ගැන තමයි අද සාකච්ඡා කරන්නේ. මීට කලින් රනිල් වික්‍රමසිංහ සහ කංචන විජේසේකර හිටපු රාජපක්ෂ මහත්වරුන්ගේ ආණ්ඩුව විදුලිබල මණ්ඩලය සමාගම් 12කට කඩලා ඊට අදාළ කරන පනතක් 2024 ජූලි මාසයේ පාර්ලිමේන්තුවේ සම්මත කරගෙන තිබුණා. ජාතික ජන බලවේගය ආණ්ඩුව බලයට පත් වුණාට පස්සේ, ඒ අපේ රටේ විදුලිබල හා බලශක්ති ක්ෂේත්‍රය පිළිබඳව පැවැති අවදානම, කංචන විජේසේකර විදුලිබල ඇමතිවරයා හිටපු රනිල්- රාජපක්ෂ ආණ්ඩුව අපේ රටේ විදුලිබල පද්ධතියට සහ අපේ රටේ බලශක්තියට ඇති කරපු ඒ අවදානම, ඒ අනතුර වළක්වා ගැනීම සඳහා කටයුතු කළා. වත්මන් ආණ්ඩුව - ජාතික ජන බලවේගයේ ආණ්ඩුව - විධියට අපි විශේෂ තීන්දු තීරණ අරගෙන, අපේ රටේ විදුලිබල හා බලශක්ති ක්ෂේත්‍රය ආරක්ෂා කරන්න, විදුලි පාරිභෝගිකයින් ආරක්ෂා කරන්න, අපේ රටේ විදුලිබල මණ්ඩලයේ ඉන්න 26,000කට ආසන්න සේවක පිරිසත් ආරක්ෂා කරමින් ඒ අදාළ පනත සංශෝධනය කරලා, පාර්ලිමේන්තුවේ සම්මත කර ගත්තා. අද ඉදිරිපත් කර තිබෙන නියමය අනුව ඒ අදාළ කරන, යළි අනුමත කර ගැනීමේ ක්‍රියාවලියක් මේකේ ඉතිරි වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊයේ මේ පාර්ලිමේන්තුවේත්, රටේත් විශේෂ මාතෘකාවක් බවට පත් වුණා, මෙන්න මේ කාරණය. ඒ තමයි, සමගි ජන බලවේගයේ කෘත්‍යාධිකාරී මණ්ඩල සභික, ඒ වාගේම හොරණ ආසනයේ සංවිධායක වරිත් අබේසිංහ මහත්මා, ඒ වාගේම අපේ රටේ හිටපු අධිකරණ අමාත්‍යවරයෙකු වන විජයදාස රාජපක්ෂ මහත්තයාගේ නීතිඥ පුත්‍ර රත්නය සහ තවත් කණ්ඩායමක් එකතු වෙලා නඳුන් චින්තක කියන තැනැත්තා නොමරා ඉන්න නම් ලක්ෂ 5,000ක ඩීල් එකක් කරන්න ගිය සිද්ධියක් පිළිබඳව. මේවා අපිට ඇහෙනකොට, "අපි හිටියේ මෙහෙම රාජ්‍යයකද?" කියලා ඇඟ හිරි වැටෙනවා. අධිකරණ ඇමතිවරයා, පොලිස්පතිවරයා, හිටපු ජනාධිපති ලේකම් සමන් ඒකනායක යන මේ කාගෙත් නම් කථා වෙනවා ඒ දුරකථන සංවාදය ඇතුළේ. අපේ රටේ පොලිස්පතිවරයා කප්පම් ගන්නවා කියලා ඒ සංවාදයේ සාකච්ඡා වෙනවා නම් මොකක්ද, අපේ රටට වෙලා තිබුණු දේ? වරිත්ගෙන් අහනවා, "දේශබන්දුට දීපු ලක්ෂ 500 ගැන ඔයා හැර වෙනත් කවුරු හරි දන්නවාද?" කියලා. වරිත් උත්තර දෙනවා, "ඔව්. හැබැයි, එයාත් දේශබන්දුගෙත්, මගෙත් දෙන්නාගේම යාළුවෙක්. බය වෙන්න දෙයක් නැහැ" කියලා. මෙහෙම රාජ්‍යයක් තිබුණේ. ඒගොල්ලෝ එක තොටිල්ලේ ඉඳලා

[ගරු චන්දන සූරියආරච්චි මහතා]

තමයි මේ රටේ මිනිස් ඝාතන කළේ, කොල්ලකෑවේ, කප්පම් ගත්තේ, මේ අපරාධ කළේ. ඒවා කළේ එක කණ්ඩායමක් විධියට. පාර්ලිමේන්තුව ඇතුළේ එක එක පක්ෂවලට බෙදිලා හිටියාට, මේ රටේ ජනතාව මුළා කරන්න එක එක පක්ෂවලට බෙදිලා හිටියාට අපරාධ කළේ එකට එකතු වෙලා; වංචා, දූෂණ, නාස්ති කළේ එකට එකතු වෙලා. ඒක තමයි ඇත්ත. අද ඒ තොටිල්ල හෙළවී තිබෙනවා. අද ඒ තොටිල්ල හෙළවෙනකොට මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා වරප්‍රසාදවලට මුවා වෙලා විගඩම් නටනවා.

ඊයේ මේ පාර්ලිමේන්තුවේදී ගරු ජනාධිපති අනුර දිසානායක සහෝදරයා කිව්වා වාගේ මොන තරම් ප්‍රශ්න නිර්මාණය කරන්න උත්සාහ කළත් මේ රටේ ජනතාව ජාතික ජන බලවේගයට ජන වරම නිර්මාණය කරද්දී ඒ ජන වරම තුළ තැබූ විශ්වාසයක් තිබෙනවා, බලාපොරොත්තුවක් තිබෙනවා. ඒ නිසා නීතියේ විධානය, ආධිපත්‍යය ආරක්ෂා කරන එක, ඒ වාගේම වංචාවෙන්, දූෂණයෙන්, නාස්තියෙන් තොර රටක් නිර්මාණය කරන එක, අපේ රටේ දූ දරුවන්ට, තරුණ තරුණියන්ට විෂ මත්ද්‍රව්‍ය සහ සංවිධානාත්මක අපරාධවල ග්‍රහණවලින් තොරව නිදහසේ ජීවත් වෙන්න පුළුවන් රටක් නිර්මාණය කිරීම ආදී ඒ බලාපොරොත්තු, සැලසුම් කිසිවක් ආපිට හැරෙන්නේ නැහැ, වෙනස් වෙන්නේ නැහැ. ඒ නිසා පාර්ලිමේන්තු වරප්‍රසාද පාවිච්චි කරලා මොන තරම් දේවල් කියන්න උත්සාහ කළත්, ජාතික ජන බලවේගයේ ආණ්ඩුව ජනතාව කෙරෙහි දැඩි විශ්වාසයෙන්, ජනතාව මත විශ්වාසය තබමින්, ජනතාව අපේක්ෂා කරන ඒ පාලනය සහ අනාගතය නිර්මාණය කරන්න කටයුතු කරනවා කියන එක අපි ඉතා පැහැදිලිව කිව යුතුයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපි කථා කරන්නේ ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩල පනත යටතේ ගෙනෙන නියමය ගැනයි. කංචන විජේසේකර හිටපු විදුලිබල අමාත්‍යවරයා, රනිල් වික්‍රමසිංහ -රාජපක්ෂ ආණ්ඩුව මේ පනත ගෙනාවේ සමාගම් 12කට විදුලිබල මණ්ඩලය කඩලා, වෙන් කරලා. ලංකා විදුලිබල මණ්ඩලයේ සේවකයන් 26,000කට ආසන්න සංඛ්‍යාවක් ඉන්නවා. ඒ 26,000ක් වූ සේවකයන් 12,000ක් දක්වා අඩු කරන්න ඒගොල්ලෝ සැලසුම් කර තිබුණා. 2024 සැප්තැම්බර් 21වැනි දා තමයි ජනාධිපතිවරණය තිබුණේ. 2024 සැප්තැම්බර් 18වැනි දා අමාත්‍ය මණ්ඩලය අනුමත කරනවා, ලංකා විදුලිබල මණ්ඩලයේ සේවකයන් 12,000ක් දක්වා අඩු කිරීම. ඒ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව සහ ඊට අදාළ සංදේශය මා සතුව තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ අවස්ථාවේදී එය **සභාගත*** කරනවා.

මට කියන්න ඕනෑකම තිබෙන්නේ මේකයි. අපේ රටේ බලශක්ති ක්ෂේත්‍රය කියන්නේ ප්‍රධාන වශයෙන්ම විදුලි බලය සහ ඉන්ධනයි. එදා පැවැති ආණ්ඩු මේ බලශක්ති ක්ෂේත්‍ර දෙකම අර්බුදයට ලක් කළා; පෞද්ගලීකරණය කළා; සේවකයන්ගේ අයිතිවාසිකම් කප්පාදු කළා. ජාතික ජන බලවේගය ආණ්ඩුව 2024 සැප්තැම්බර් මාසයේ නිර්මාණය නොවුණා නම්, ගරු ජනාධිපති අනුර දිසානායක සහෝදරයා ජනාධිපතිවරයා බවට පත් නොවුණා නම්, අද වන විට අපේ රටේ බලශක්ති ක්ෂේත්‍රය ඇතුළු විදුලිබල මණ්ඩලය දැවැන්ත අර්බුදයකට යනවා; රජය සතුව තිබෙන ඒ වුවමනාව විනාශ වෙලා යනවා; ලංකා විදුලිබල මණ්ඩලය පෞද්ගලික අංශය අතට ගිහිල්ලා අපේ රටේ බලශක්ති ක්ෂේත්‍රය දැඩි අවදානමකට ලක් වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එදා ලංකා විදුලිබල මණ්ඩලයට වෙන්න ගිය ඒ විනාශය, ඒ අපරාධය, ඒ අවදානම තමයි ජාතික ජන බලවේගය ආණ්ඩුව නව පනත් කෙටුම්පතක් ගෙනැවිත් නතර කරලා, බලශක්තියත් ආරක්ෂා කරගෙන, විදුලිබල මණ්ඩලයේ සේවකයනුත් ආරක්ෂා කරගෙන මේ ගමන ඉදිරියට යන්නේ. මේ සියල්ල නිවැරදි වැඩ පිළිවෙළක් හරහා අද කරන්න පුළුවන්කම ලැබිලා තිබෙන්නේ ඒ නිසායි.

අපි මේ කාරණයත් කියන්න ඕනෑ. එදා ගෙනාපු පනත තුළ සමාගම් 12ක් නිර්මාණය කර තිබුණා. එම සමාගම් 12න් එක සමාගමක් ජනන සමාගමයි. ඒ ජනන සමාගමෙන් ජලාශවලට අයිති සමාගම විතරයි රජය සතු වෙනවා කියලා කියා තිබුණේ. හැබැයි, සූර්ය බලයෙන්, සුළං බලයෙන් නිර්මාණය කරන විදුලි බලය ජනනයට අදාළ සමාගම් තුනම කාටද අයිති කියලා ඒ පනතේ සඳහන් වෙලා තිබුණේ නැහැ. ඒ වාගේම, ජාතික පද්ධති කළමනාකරණ සමාගම රජයට අයිතියි. ඉතිරි සමාගම් 12ම එදා රජයට අයිති නොවන ආකාරයට තමයි පනත සකස් කරලා තිබුණේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නමුත් අපේ රජය යටතේ ඒ සමාගම් 12 වෙනුවට සමාගම් 6ක් නිර්මාණය කරලා, බලපත්‍රලාභී සමාගම් 4ට ඒ සේවකයන් පිරිස ස්ථානගත කරලා, සේවකයන්ගේ අයිතිවාසිකම් රැකලා, සමාගමේ වැඩ පිළිවෙළත් මේ වනකොට නීත්‍යනුකූලව කරගෙන යන්න පුළුවන්කම ලැබිලා තිබෙනවා.

මම මේ කාරණය විශේෂයෙන්ම කිව යුතුයි. එදා 26,000ක් පමණ හිටපු සේවකයන් 12,000 දක්වා අඩු කළ යුතුයි කියලා එවකට හිටපු ආණ්ඩුව අමාත්‍ය මණ්ඩල අනුමැතියක් ලබාගෙන තිබුණා. ඒ වාගේම, VRS ක්‍රමයක් යෝජනා කරලා තිබුණා. ඒ යටතේ සේවකයන්ට ඒගොල්ලන් දෙන්න සැලසුම් කරලා තිබුණේ විශේෂයෙන්ම ඉහළ මට්ටමට රුපියල් ලක්ෂ 50කුත්, මධ්‍යම මට්ටමට රුපියල් ලක්ෂ 36කුත්, පහළම සේවකයන්ට රුපියල් ලක්ෂ 26කුත් වශයෙන්. හැබැයි, ජාතික ජන බලවේගය ආණ්ඩුව යටතේ අපේ ගරු බලශක්ති අමාත්‍යතුමා, නියෝජ්‍ය අමාත්‍යතුමා, විදුලිබල මණ්ඩලයේ සියලුදෙනා ඇතුළු ඒ සමාගම් එකතු වෙලා සාකච්ඡා කරලා, තීරණය කරලා, ඒ VRS එක හරහා රුපියල් ලක්ෂ 26ක් අරගෙන ගෙදර යන්න හිටපු සේවකයන්ට රුපියල් ලක්ෂ 50ක හිමිකමක් ලබා දීලා තිබෙනවා. රනිල්-කංචන පනත යටතේ එදා සේවකයන් 14,000ක් ගෙදර යවන්න සැලසුම් කරලා තිබුණා. නමුත් අපි කියන්න කැමැතියි, අප ගෙන ආ පනත යටතේ අද එහි සේවකයන් රැකිලා තිබෙන බව. VRS හරහා සේවකයන් 1,898යි ගියේ. ඒ යන සේවකයාටත් ඉහළම වටිනාකමක් ලබා දෙන්න වත්මන් ආණ්ඩුවට පුළුවන්කම ලැබිලා තිබෙනවා.

ඒ වාගේම, අපි විශේෂයෙන්ම මේ කාරණයත් කිව යුතුව තිබෙනවා. මෙහිදී නව සමාගමක් විධියට විශ්‍රාම වැටුප් අරමුදලත්, EPF එකත් එකතු කරලා සමාගමක් හදලා තිබෙනවා. ඒ සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයට සේවකයන් 4දෙනෙකු නියෝජනය වන පරිදි Director Board එක සකස් කරලා, සේවක අයිතිවාසිකම් ආරක්ෂා කරන්න, සුරක්ෂිත කරන්න අවශ්‍ය පියවර ගනිමින් තිබෙනවා. ඒ වාගේම, 2023 වර්ෂයේ නොගෙවූ වෛද්‍ය ආධාර මුදල් සේවකයන්ට ලබා දෙන්නත් මේ වන කොට පුළුවන් වෙලා තිබෙනවා. ඒ වාගේම, තිබිච්ච වැටුප් විෂමතාව 2024 වර්ෂයේදී නිවැරදි කරලා, ඒ නව වැටුප් පරිවර්තනය තුළ VRS එකත්, ඒකට අදාළ වටිනාකමත් නිර්මාණය කරන්න පුළුවන්කම ලැබී තිබෙනවා. මේ වන විටත් ලංකා විදුලිබල මණ්ඩලයේ සාමූහික ගිවිසුම් සකස් කරලා, ඒවා අවසන් අදියරට ගෙනැල්ලා සේවකයන්ගේ අයිතිවාසිකම් ශක්තිමත් කරන්න, ආරක්ෂා කරන්න අවශ්‍ය පියවර ගනිමින් තිබෙනවා. වසර 7ක් තිස්සේ ලබා

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

නොදුන් ස්ථාන මාරු ක්‍රියාත්මක කරන්න අවශ්‍ය වැඩ පිළිවෙළ මේ වන කොට සකස් කර තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා මම කිව යුතුයි, රනිල්-කංචන-රාජපක්ෂ ආණ්ඩුවේ ප්‍රතිඵලයක් මත එදා විනාශ වෙන්න ගිය, අනතුරට ලක් වෙන්න ගිය ලංකා විදුලිබල මණ්ඩලය යළි රැකගෙන, ශක්තිමත් කරලා, නිවැරදි කළමනාකරණයක් තුළ සේවක අයිතිවාසිකම්ද ආරක්ෂා කරලා, විදුලිබල මණ්ඩලයේ දැන් තිබෙන සමාගම් 6 සියයට සියයක්ම රාජ්‍ය සමාගම් බවට පත් කරන්න ජාතික ජන බලවේගය ආණ්ඩුවට හැකියාව ලැබුණු බව. ඒ මේ රටේ ජනතාව ලබා දීපු ජන වරම නිසයි කියන එක අපි පැහැදිලිව කිව යුතුයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන වශයෙන් මේ කාරණයත් සඳහන් කරන්න ඕනෑ. අපි බලයට එනකොට කිව්වා, විදුලි බිල තුනෙන් එකක් දක්වා අඩු කරනවා කියලා. ඔව්, අපට සැලැස්මක් තිබෙනවා, පැහැදිලි වැඩ පිළිවෙළක් තිබෙනවා. ඒ නිසා තමයි වත්මන් ආණ්ඩුව පුනර්ජනනීය බලශක්තිය පිළිබඳ සැලසුම් සකස් කරලා දැනටමත් මෙගාවොට් 300ක් පුනර්ජනනීය බලශක්තිය මඟින් විදුලිය නිෂ්පාදනය කරන්න අවශ්‍ය වැඩ පිළිවෙළ සකස් කරලා තිබෙන්නේ. ආදරණීය ජනතාවනි, විදුලි බිල අඩු කරන්න පුළුන්කම තිබෙන්නේ විදුලි ඒකකයක් නිෂ්පාදනය කරන්න යන පිරිවැය අඩු කර ගන්න ප්‍රමාණයටයි. ඒ අනුව තමයි විදුලි ඒකකයක් නිෂ්පාදනය කරන්න යන පිරිවැය අඩු කිරීම සඳහා වන සැලසුම් සහගත වැඩ පිළිවෙළක් දැන් ක්‍රියාත්මක කරගෙන යන්නේ. ඒ අනුව තමයි අපි පැහැදිලි කරලා තිබෙන්නේ 2030 වන කොට විදුලි පාරිභෝගිකයන්ගේ විදුලි බිල සියයට 70කින් අඩු කරන්න අදාළ කරන සැලසුම් ප්‍රායෝගිකව මහ පොළොවේ ක්‍රියාත්මක වෙනවා කියලා. මේ පාර්ලිමේන්තුවට ඇවිත් උදේ වරුවේ කෑකෝ ගහන විපක්ෂයේ ඇතැම් මන්ත්‍රීවරුන් මේ රට පාලනය කරද්දී මේ රටේ බලශක්තිය ආරක්ෂා කරන්න අවශ්‍ය අනාගත සැලසුම් හදන්න නොවෙයි කටයුතු කළේ. ඒවා බිඳ වට්ටන්න, ඒවායින් කීයක් හරි කොමිස් ගහගන්න අවශ්‍ය පියවර තමයි ඒගොල්ලෝ ගත්තේ. නමුත් අපි මේ වෙලාවේ මේ රටේ විදුලිබල ශක්තිය රාජ්‍ය සමාගම් යටතේ ආරක්ෂා කරමින්, නිසි වැඩ පිළිවෙළක් තුළ විදුලි පාරිභෝගිකයනුත්, විදුලි සේවකයනුත් ආරක්ෂා කරමින් දැවැන්ත වැඩ පිළිවෙළක් ඉදිරියට කරගෙන යනවා කියන කාරණාව සඳහන් කරමින්, කාලය ලබා දීම පිළිබඳව ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Order, please! දිවා ආහාර විවේකය සඳහා ගරු සභාවේ කටයුතු පස්වරු 1.00 දක්වා අත්හිටුවනවා.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.00ට නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියගේ [ගරු හේමාලි වීරසේකර මහත්මිය] සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.***

*அதன்படி, அமர்வு பி.ப. 1.00 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டும் தொடங்கிற்று. குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர] தலைமை வகித்தார்கள்.*

*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed, DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA] in the Chair.*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

විපක්ෂ නායක ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.00]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපේ රටේ මූල්‍ය පද්ධතිය, මූල්‍ය ස්ථායීකරණය යන කරුණු කාරණා පිළිබඳව අදහස් කිහිපයක් ඉදිරිපත් කරන්න මා අදහස් කරනවා. මා නැවතත් ප්‍රකාශ කරන්න කැමැතියි, අපේ රටින් ගෙවන්න තිබුණු ණය වාරිකයක්, ඩොලර් ලක්ෂ 25ක ණය වාරිකයක් අතුරුදහන් වුණා, වංචනික ලෙස රටට අහිමි වුණා කියලා. ඒ බර දරන්න වෙන්නේ අපේ රටේ බදු ගෙවන්නන්ට. නමුත් ඒ කරුණ පිළිබඳව වැඩියමක් තොරතුරු ආගිය අතක් නැහැ. ඒ නිසා ඒ මූල්‍ය අපරාධය පිළිබඳව පාර්ලිමේන්තුවට විධිමත් වාර්තාවක් ඉදිරිපත් කිරීම රජයේ යුතුකමක් බව මා මේ අවස්ථාවේදී කියන්න කැමැතියි.

රජය මූල්‍ය අපරාධ ක්‍රියාත්මක කරනවා පමණක් නොවෙයි, අපේ මූල්‍ය පද්ධතිය තුළත්, මූල්‍ය ආයතන පද්ධතිය තුළත් දිගින් දිගටම මූල්‍ය වංචා, මූල්‍ය අක්‍රමිකතා සිද්ධ වෙලා, මේ රටේ අහිංසක තැන්පත්කරුවන් බරපතළ ලෙස වින්දිතයන් බවට පත් වෙලා තිබෙනවා. මම උදාහරණ දෙකක් ඉදිරිපත් කරන්නට කැමැතියි. ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි මූල්‍ය ආයතනයක් වූ Central Investments and Finance PLC-CIFL- ඒකේ බලපත්‍රය අහෝසි කරන තාක්කල් තැන්පත්කරුවන් 4,200කට ආසන්න සංඛ්‍යාවක් ජීවිත කාලය පුරාවට එකතු කර ගත්ත මුදල්වලින් තමයි ඒ ආයතනය නඩත්තු වුණේ. ඒ ආයතනය බංකොලොත්වීමත් සමඟ අදියර දෙකකින් රුපියල් ලක්ෂ 5ක් සහ රුපියල් ලක්ෂ 6ක් වශයෙන් යම් මුදල් ගෙවීමක් සිද්ධ වෙලා තිබෙනවා. හැබැයි, ඈවර කිරීමේ ක්‍රියාවලිය තුළ ඒ තැන්පත්කරුවන්ට අත්වෙලා තිබෙන්නේ ඉතාම ඛේදනීය ඉරණමක්. මොකද, ඒ ඈවර කිරීමේ ක්‍රියාවලිය තුළ මුදල් ගෙවීමේදී ඒ තැන්පත්කරුවන්ට ලබා දීලා තිබෙන්නේ, අවසාන අවස්ථාව. පළමුවෙන්ම ඈවරකරුගේ වියදම්, දෙවනුව මහ බැංකුවට අය විය යුතු මුදල්, තෙවනුව ඒ ආයතනයේ අනෙක් අයගේ බැඳීම් සඳහා අවස්ථාව ලබා දීමෙන් පසුව තමයි තැන්පත්කරුවන්ට අවස්ථාව ලබා දීලා තිබෙන්නේ. මේ පිළිබඳව විනිවිදභාවයෙන් කථා කරනවා නම්, මේ චක්‍රලේඛය නිකුත් කිරීම පිළිබඳව ඇත්ත වශයෙන්ම අපේත් වගකීමක් තිබෙනවා. ඒ නිසා මම රජයෙන් ඉල්ලීමක් කරනවා, ඒ තැන්පත්කරුවන්ට මුල් තැන ලබා දෙන පරිදි අලුත් චක්‍රලේඛයක් නිකුත් කරන්න කියලා. ඒක ඇත්ත වශයෙන්ම CIFL එකේ තැන්පත්කරුවන් 4,200ක් වෙනුවෙන් ඉටු විය යුතු යුතුකමක් බව මම කියන්න කැමැතියි. ජීවිතය පුරාවට කළ ඉතිරිකිරීම්, තැන්පත් කළ විශ්‍රාම වැටුප් මුදල් යනාදියෙන් තමයි ඒ අය - විශේෂයෙන්ම ජ්‍යෙෂ්ඨ පුරවැසියන් - යම් කිසි ආදායමක් ලබා ගත්තේ. ඒ නිසා මම කාරුණිකව රජයෙන් ඉල්ලීමක් කරනවා, ඒ ගැසට් පත්‍රය වෙනස් කරලා, තැන්පත්කරුවන්ට මුල් තැන ලබා දෙන පරිදි අලුත් ගැසට් පත්‍රයක් නිකුත් කරන්න කියලා. ඒක කරන්න අමාරු නම්, ඒ තැන්පත්කරුවන්ගේ ඉතිරි - හිඟ - මුදල් සම්බන්ධයෙන්, තැන්පතු සහ පොලී ආදායම් සම්බන්ධයෙන් යම් කිසි සාධාරණයක් ඉෂ්ට කිරීම සඳහා විශේෂ සහන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම වැදගත් බවත් මම මේ අවස්ථාවේදී කියන්න කැමැතියි.

CIFLහි තැන්පත්කරුවන් 4,200ක් අගතියට පත් වුණා සේම, මේ මොහොත වන විට Nation Lanka Finance PLCහි තැන්පත්කරුවන් 1,000කට වැඩි පිරිසක් ජීවිත කාලය පුරාවට උපයාගත් මුදල් අහිමිවීම හේතුවෙන් දැඩි අසරණභාවයකට පත් වෙලා තිබෙනවා. 2020 වසර අවසානයේදී Nation Lanka

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

Finance PLC එක Sinhaputhra Finance PLC සමඟ ඒකාබද්ධ වෙලා, ඉන්පසු Nation Lanka Finance PLCහි විධායක නිලධාරි ලෙස චන්දික වීරකෝන් මහතා පත්වෙලා, ඉන් අනතුරුව 2022 වසර අවසානයේදී Nation Lanka Finance PLC එක Kanrich Finance Limited සමඟ ඒකාබද්ධ වෙලා තිබෙනවා. එහි විශේෂත්වය තමයි Nation Lanka Finance PLC එකේත්, Sinhaputhra Finance PLC එකේත් අධ්‍යක්ෂ තනතුරු එක කණ්ඩායමක් විසින් හොබවා තිබීම. විශේෂයෙන්ම Nation Lanka Finance PLC තැන්පත්කරුවන්ගේ ගිණුම් පොරොන්දු පත්‍ර හරහා Singhe Capital Investment Limited එකට හුවමාරු කිරීමක් සිදු වෙලා තිබෙනවා. නමුත් Singhe Capital Investment Limited එක පිහිටුවා තිබෙන බව සඳහන් ලිපිනයේ එහෙම ආයතනයක්වත් නැහැ. Nation Lanka Finance PLCහි වාර්ෂික වාර්තාවල Singhe Capital Investment Limited කියන ආයතනය සඳහන් වුවත්, ඒ කියන තැන එහෙම ආයතනයක් නැහැ. 2022 අගෝස්තු 30වැනි දා වෙනකොට Nation Lanka Finance PLC එකට තැන්පතු ලබාගැනීම තහනම් කරලා තිබුණා. මහ බැංකුවෙන් එසේ තහනමක් යොදා තිබියදීත් අලුතින් marketeersලා දමලා බැංකු ගිණුම්, ඉතිරි කිරීමේ ගිණුම් - මූල්‍ය තැන්පතු - ලබා ගැනීමේ ක්‍රියාවලිය දියත්වෙලා තිබෙනවා. දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? දැන් තැන්පත්කරුවන්ගේ මුදල් නැහැ. ඒ අයට හිමි විය යුතු පොලියත් නැහැ, ඒ අය තැන්පත් කරපු මුදලත් නැහැ, ප්‍රාග්ධන මුදලත් නැහැ. වංචනික ක්‍රියාවක් සිදුවෙලා තිබෙනවා. ඒ සිදුවීම තුළ තැන්පත්කරුවන් 38දෙනෙකු විසින් මීගමුව පොලිසිය වෙත කරන ලද පැමිණිල්ලක් අනුව අධිකරණ ක්‍රියාමාර්ගයකට යොමු වෙලා තිබෙනවා. ඒ අනුව අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂවරුන් සහ ප්‍රවර්ධන නිලධාරින් කිහිපදෙනෙකුට විදේශ ගමන් තහනමකුත් පනවා තිබෙනවා. එසේ සිදුවුණත් වගකිව යුතු පුද්ගලයන්ට එරෙහිව ගතයුතු නීතිමය ක්‍රියාමාර්ගය ඉතා සෙමින්, ඉබි ගමනින් තමයි ක්‍රියාත්මක වෙන්නේ.

මේක මේ මූල්‍ය ආයතනයේ බිඳ වැටීමක් පමණක් නොවෙයි. පැහැදිලිවම මෙතැන මූල්‍ය අපරාධයක් - financial fraud එකක් - සිදු කරලා තිබෙනවා, විවිධ බලගතු පිරිස් එකට එකතු වෙලා. ඒ පිළිබඳ සත්‍යය, නම් ගම් සහිතව ඉදිරියේදී හෙළිදරව් කරන්න අපි බලාපොරොත්තු වෙනවා. එතෙක් අපි රජයෙන් ඉල්ලීමක් කරනවා, Nation Lanka Finance PLC නිසා අගතියට පත් වුණු දහසකට වැඩි තැන්පත්කරුවන්ගේ තැන්පතුවලට, පොලී ආදායම්වලට සාධාරණයක් ඉෂ්ට සිද්ධ කරමින් ඒ තැන්පත්කරුවන්ගේ මුදල් හොරාකාපු අධ්‍යක්ෂ මණ්ඩලයටත්, ගිණුම් ප්‍රවර්ධන නිලධාරින්ට සහ එයට වගකිව යුතු සියලුදෙනාටම එරෙහිව නීතිමය කටයුතු ක්‍රියාත්මක කරන්න කියලා. එය, රජයේ වගකීමක් සහ යුතුකමක් බව ප්‍රකාශ කරන්න කැමැතියි. Nation Lanka Finance PLCහි තැන්පත්කරුවන්ටත්, Central Investments and Finance PLCහි තැන්පත්කරුවන්ටත් සාධාරණත්වය ඉෂ්ට සිද්ධ කරන්න කියලා මම රජයෙන් කාරුණිකව ඉල්ලා සිටිනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු ශාන්ත පද්ම කුමාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.08]

**ගරු ශාන්ත පද්ම කුමාර සුබසිංහ මහතා**
(மாண்புமிகு ஷாந்த பத்ம குமார சுபசிங்ஹ)
(The Hon. Shantha Pathma Kumara Subasingha)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට පෙර කථා කළේ විපක්ෂ නායකතුමා. අද විවාදයේ මාතෘකාව වුණේ නම්, ශ්‍රී ලංකා විදුලිබල පනතට සංශෝධන ගෙන ඒම. නමුත් එතුමා ඒ සම්බන්ධයෙන් වචනයක්වත් කථා කළේ නැහැ.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

වැරදි දත්තයක් කවලා තමයි මේ විවාදයේදී අදහස් දැක්වූයේ, අමතක වෙලා.

හිටපු බලශක්ති ඇමති ගරු කුමාර ජයකොඩි ඇමතිතුමා, නියෝජ්‍ය ඇමතිතුමා සහ ඒ අමාත්‍යාංශයේ නිලධාරින් සියලු දෙනාටම මේ වෙලාවේ අපේ ස්තුතිය පුද කරනවා. ඒකට හේතුව මොකක්ද? රනිල්-කංචන ආණ්ඩුවෙන් විදුලිබල මණ්ඩලය කෑලි 12කට කඩලා, පෞද්ගලීකරණය කරලා, 26,000ක් පමණ වුණු සේවකයන් 12,000ට අඩු කරලා 14,000ක් දොට්ට දමන්න තමයි හිටියේ. හැබැයි, හිටපු බලශක්ති ඇමති ගරු කුමාර ජයකොඩි මැතිතුමා ඇතුළු අපේ කණ්ඩායම - අපේ ආණ්ඩුව - එසේ නොකර ඒ සංශෝධනය වෙනුවට නව සංශෝධනයක් එක් කරමින් ඒ සේවකයන් 26,000 දෙනාම රැකගෙන, ලංකා විදුලිබල මණ්ඩලය කෑලි 12කට කඩලා විකුණන්නේ නැතිව, විදුලි ජනනය, සම්ප්‍රේෂණය, බෙදා හැරීම, පද්ධති පාලනය වශයෙන් රජයේ ආයතන 6කට ප්‍රතිව්‍යුහගත කළා. ඒ හරහා එක පැත්තකින් විදුලිබල මණ්ඩලය රැක ගත්තා. අනෙක් පැත්තෙන් විදුලිබල මණ්ඩලයේ හිටපු සේවකයන්ගේ අයිතිවාසිකම් පමණක් නොවෙයි ඔවුන්ගේ රැකියාවත් ආරක්ෂා කළා. ඒ සම්බන්ධයෙන් අපි ස්තුතිවන්ත වෙනවා, අපේ ආණ්ඩුවට වාගේම හිටපු බලශක්ති ඇමතිතුමාට.

ඒ විතරක් නොවෙයි. ඉතා සොච්චම් වන්දියක් දීලා තමයි සේවකයන් 14,000ක් දොට්ට දමන්න හිටියේ, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. හැබැයි, අපේ ප්‍රතිව්‍යුහගත කිරීම ඇතුළේ 1,898යි කැමැත්තෙන් ඉල්ලා අස්වුණේ. රුපියල් ලක්ෂ 50කට වඩා වැඩි වන්දියක් ලබාගෙන තමයි ඔවුන් VRS ක්‍රමයට සේවයෙන් ඉවත් වුණේ. ඒ නිසා සේවක සුරක්ෂිතතාව සිද්ධ වුණා. ඒ විතරක් නොවෙයි. මේ ප්‍රතිව්‍යුහගතකරණය ඇතුළේ අපට ඉතාම කාර්යක්ෂම සේවාවක් ලැබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපි ආවාට ගියාට ආණ්ඩුවක් කරනවා නොවෙයි. දැන් විපක්ෂයෙන් කිව්වා අපි ආධුනිකයි ආණ්ඩු කරලා නැහැ කියලා. ඔව්, අපි ඒක පිළිගන්නවා. අපි විතරක් නොවෙයි මුළු රටම, මුළු ලෝකයම දන්නවා අපි ආණ්ඩු කරලා නැහැ කියලා.

හැබැයි, අපි ආධුනික වුණාට අපි ඉතාම විද්‍යාත්මක ක්‍රමයට තමයි මේ සියල්ල සැලසුම් කරන්නේ. ඒ විද්‍යාත්මක සැලසුම් ක්‍රමය ඇතුළේ තමයි ආයතන 06කට ප්‍රතිව්‍යුහගත කරලා මේ ක්‍රියාවලිය අපි මනාව ක්‍රියාත්මක කරමින් ඉන්නේ. ඒ මොකක් නිසාද? අපේ අරමුණ තමයි 2030 වෙනකොට බලශක්ති උත්පාදනයෙන් සියයට 70ක විදුලිය පුනර්ජනනීය බලශක්තියෙන් උත්පාදනය කිරීම. ඒ කියන්නේ 2030 වෙනකොට සූර්ය, සුළං, ජල ආදී පුනර්ජනනීය බලශක්තියෙන් තමයි විදුලි උත්පාදනයෙන් සියයට 70ක් උත්පාදනය කරන්ට අපි බලාපොරොත්තු වන්නේ. ඒකට අවශ්‍ය යටිතල පහසුකම්ද, මානව සම්පත්ද, ඒ සියලු ප්‍රතිපාදන ලබා දෙමින් අපි ඒ වෙනුවෙන් කටයුතු කරමින් ඉන්නවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද කථා කරන මේ මොහොතේත් අන්න වරායට ගෙනැල්ලා තිබෙනවා, සූර්ය බලයෙන් උත්පාදනය කරන අතිරික්ත විදුලිය ගබඩා කිරීම

සඳහා අවශ්‍ය බැටරි පද්ධති 7ක්. අද දවසේත්, මේ වෙනකොටත් ඒවා වරායට ඇවිල්ලා තිබෙනවා. එහෙමයි අපි මේ ක්‍රියාවලිය ඉතාම විද්‍යාත්මක ක්‍රමයට සිද්ධ කරන්නේ.

ඒ විතරක් නොවෙයි. ඒකක 180ට වැඩියෙන් විදුලිය පරිභෝජනය කරන සෑම නිවසකටම ADB අරමුදල් පාවිච්චි කරලා රජය හරහා smart meters ලබා දෙන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒ smart meters ලබාදීම ඇතුළේ ඒ සේවාව කාර්යක්ෂම වෙනවා. අපට මේ මොහොතේ තිබෙන බරපතළ ප්‍රශ්නය තමයි විදුලි උත්පාදනය අඩු වැඩි වෙනකොට එය කළමනාකරණය කිරීමේ යම් යම් අපහසුතා තිබෙන එක. හැබැයි, ඒ smart meters පද්ධතිය නිසා අපට ඒවාත් කාර්යක්ෂම කරන්න පුළුවන්. එවැනි ප්‍රශ්නවලටත් උත්තරයක් ලැබෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. ඒ නිසා units 180ට වැඩියෙන් භාවිත කරන සෑම නිවසකටම smart meters ලබා දෙන්න අපි බලාපොරොත්තු වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, විපක්ෂයේ අපූරු යෝජනා තිබෙනවා. අද උදෑසනත් දෙයක් කිව්වා. මම එතුමාගේ නම කියන්නේ නැහැ, මේක ඇතුළේ වැළලෙන්න හදන නිසා. ඒ මන්ත්‍රීතුමා කියනවා, වහල මත සවි කරන සූර්ය පැනල වලින් උත්පාදනය කරන විදුලි ඒකකවලට වැඩි මුදලක් දෙන්න ඕනෑ ලු. අපි ඇවිල්ලා ඒ ගණන අඩු කළා ලු. රුපියල් 30 ගණන්වලට තිබ්බ එක රුපියල් 24ට අඩු කළා ලු; රුපියල් 19ට අඩු කළා ලු. ඒ එක්කම එතුමා කියනවා, විදුලි බිල අඩු කරන්න ලු. මාර සූත්‍රයක් නේ. ඔය මහා ප්‍රාඥයෝ මේ ගරු සභාවේ කියන්න කෝ, වැඩියෙන් විදුලි ඒකකයක් මිලදී අරගෙන අඩුවෙන් දෙන්නේ කොහොමද කියලා. ගමේ කථාවක් තිබෙනවා, "කුට්ටුවට ගන්නත් ඕනෑ, නේරංජනාව පන්නන්නත් ඕනෑ" කියලා. අන්න ඒ වාගේ කථාවක් තමයි මේ මහත්වරු කියන්නේ. සූර්ය බලයෙන් උත්පාදනය කරන විදුලි ඒකකවලට වැඩි මිලක් දෙන්නත් ඕනෑ, හැබැයි විදුලි බිල අඩු කරන්නත් ඕනෑ. නැහැ, එහෙම සූත්‍ර නැහැ.

සාමාන්‍ය පාරිභෝගිකයන්ට, කර්මාන්ත හිමියන්ට අඩුවට විදුලිය දෙන්න තමයි අපි මේ විද්‍යාත්මක සැලැස්ම කරගෙන යන්නේ. ඒක ඇතුළේ පුනර්ජනනීය බලශක්තියෙන් සියයට 70ක්, වර්ෂ 2030 වෙනකොට උත්පාදනය කරනකොට අන්න අපට විදුලි බිල අඩු කරන්න පුළුවන්. ඒ වාගේම අපතේ යන සූර්ය බලය ගබඩා කරලා නැවත ලබා දෙනකොට අන්න එතකොට අපට ඒක කරන්න පුළුවන්. අපේ ගරු ජනාධිපතිතුමාගේ විතරක් නොවෙයි අපේ ප්‍රතිපත්තිවලත් තිබුණා, තුනෙන් එකකින් විදුලි බිල අඩු කරනවා කියන කාරණය. ඔව්, මේ යන ක්‍රමයට ඊටත් වඩා අඩු කරන්න පුළුවන්, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. ඒ නිසා හරි පැහැදිලියි, අපි එවැනි විද්‍යාත්මක ක්‍රම අනුව කටයුතු කරමින් ඉන්නේ කියන කාරණය. ඉතාම කෙටි කාලයක් ඇතුළත විදුලි බිල අඩු කිරීම සඳහා අපි කටයුතු කරමින් ඉන්නවා.

බලශක්ති මිල සම්බන්ධයෙන් විපක්ෂය ඊයේත්, අදත් යම් චෝදනාවක් කළා. පෙට්‍රල්, ඩීසල්, භූමිතෙල් මිල අඩු කරන්න කිව්වා. ඊයේ ඉතාම සුළු කොටසක් උද්ඝෝෂණයකුත් කළා. ඒ ගොල්ලෝ කියන්නේ හරියට අර මැද පෙරදිග ටැප් එක අරපු ගමන් මෙහේට තෙල් ගලාගෙන එනවා වාගෙයි. එහේ වහපු ගමන් නවතිනවා, ඇරපු ගමන් මෙහාට එනවා වාගෙයි. ඒ ක්‍රියාවලිය ගැන නොදන්නවා නොවෙයි, මිනිස්සු අන්දනවා. මේ ඔස්තාර්ලා මේ වැඩේ දන්නවා. ක්‍රියාවලිය ගැන දැන දැනත් ජනතාව අන්දන්න, ටැප් එක ඇරපු ගමන් පෙට්‍රල් එනවා වාගේ කතන්දරයක් හදනවා. නැහැ, එහෙම නොවෙයි. යම් කාලයකට පෙර තමයි අපි තෙල් මිලදී ගත්තේ. අපි ගබඩා කළා. මොකක්ද, හේතුව? හෝමුස් වහලා නිසා කොයි වෙලාවේ අරියිද දන්නේ නැහැ. ට්‍රම්ප්ලා කොයි වෙලාවක ඒ තීන්දුව ගනියිද දන්නේ නැහැ. ඒ නිසා අපි නිවැරදි කළමනාකරණයක් ඇතුළේ ශ්‍රී ලංකාව තුළ ඉන්ධන අර්බුදයක් ඇති නොවෙන විධියට, භීතියක් ඇති නොවෙන විධියට අපට අවශ්‍ය ඉන්ධන ප්‍රමාණය කළමනාකරණය කළා. එහි ප්‍රතිඵලයක් විධියට බනිජ තෙල් මිල යම් ප්‍රමාණයකින් එකපාරට අඩු කරන්න බැහැ. හැබැයි, අපි මේ සභාවට විතරක් නොවෙයි ජනතාවටත් යම් සහතිකයක් දෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ජනතාවට තිබුණු අත්දැකීම තමයි යම් ආණ්ඩුවක් යම් භාණ්ඩයක හෝ සේවාවක මිල වැඩි කළොත් නැවත අඩු කරන්නේ නැහැ කියන එක. ඒ නිසා තමයි මේ සැක උපදවනකොට ජනතාවත් කලබල වෙන්නේ. නැහැ, අපේ ආණ්ඩුව වෙනස්. මේක ජනතාවාදී ආණ්ඩුවක්. සහතිකයි, වැඩි කරපු මිල අඩු කරනවා. ඒ අවස්ථාව එනවා. තව නොබෝ දිනකින් බනිජ තෙල් මිල අඩු කරනවා, සහතිකයි. එහෙම තමයි අපේ ආණ්ඩුව. එහෙම තමයි ජනතාවාදී ආණ්ඩුව. ඒකට තමයි මේ කටයුතු කරමින් ඉන්නේ, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

ගමේ කථාවක් තිබෙනවා, "එක ගලින් කුරුල්ලන් දෙන්නයි" කියලා. ඊයේ එක ගලයි ගැහුවේ. කුරුල්ලෝ දෙදෙනෙක් නොවෙයි, කුරුල්ලෝ ගණනාවක් අන්න සෙත්තපොච්චි වුණා. කවුද? එක්කෙනෙක් චරිත් අබේසිංහ. මට ඉදිරියෙන් විපක්ෂය පැත්තේ ඉන්න කළුතර දිස්ත්‍රික්කය නියෝජනය කරන ගරු මන්ත්‍රීතුමා හරි සතුටින් ඉන්නේ. ඇත්තටම එතුමන්ලා අත්දැකීම් සහිත, අවුරුදු ගණනාවක් තිස්සේ පාර්ලිමේන්තුවේ සිටින වැදගත්, උගත් ගරු මන්ත්‍රීවරු. හැබැයි, එතුමන්ලාටත් කෝචොක් කරමින් සජිත් මහත්මයාගේ කාන්‍යාධිකාරී මණ්ඩලයට අර මපට්ලා - චරිත් අබේසිංහ දමාගත්තා. අන්න, දැන් ඇතුළේ. තව රබිත රාජපක්ෂ, ඊට පසු දේශබන්දු, ටිරාන් අලස්. ඒ විතරක් නොවෙයි. අද ආරංචියක් ආවා, රබිත රාජපක්ෂයේ තාත්තා, අර විජේදාස බහුශ්‍රැත, එයාත් ඉන්නවා ලු. දැන් බලන්න, එක ගලයි ගැහුවේ, කුරුල්ලෝ ගොඩක්. දැන් මොකක්ද මේ වෙලා තිබෙන්නේ?

අපේ ගරු ජනාධිපතිතුමා ඊයේත් කිව්වා, දිගටම කියනවා අපරාධ රාජ්‍යයක් තිබුණේ කියලා. මේ හැම දෙයකටම, කුඩුවලටද, පාතාලයටද දේශපාලනය සම්බන්ධයි. ඒක හරියට ගහට පොත්තත්, පොත්තට ගහත් වාගේ අඛණ්ඩ, අභේද්‍යනීය සම්බන්ධයක්. දැන් ඒක හෙළිදරව් වෙනවා නේ. මේ මහත්වරු එකට ඉන්නේ. රටේ ජනතාවට පෙන්වනවා, "අපි වෙනමයි, අපි විශිෂ්ටයි, අපි සුවිශේෂයි" කියලා. නැහැ. චරිත් අබේසිංහ සජබයේ, රබිත රාජපක්ෂ පොහොට්ටුවේ. දැන් ඒ ඔක්කොම එකට බේරාගන්නවා හරක් කටා. ඇත්ත හරක් කටා නඳුන් චින්තක නොවෙයි. මෙන්න හරක් කටාලා! ඇත්ත හරක් කටාලා එළියට එනවා. රබිත රාජපක්ෂලා, විජයදාස රාජපක්ෂලා, දේශබන්දුලා. දේශබන්දු නොවෙයි, දේශ - වෙන එකක් කියන්න වෙන්නේ. දැන් හරි පැහැදිලියි. අපි විපක්ෂ නායකතුමාට දැන් කියනවා, "යන්නේ කොහෙද මල්ලේ පොල්" වාගේ කථා කියන්නේ නැතිව හරියට උත්තර දෙන්න.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

හෝ වෙන කවුරු හෝ කමක් නැහැ. වැරදි තොරතුරු නොවෙයි, නිවැරදි තොරතුරු අරගෙන හරියට කියන්න. ඒ නිසා අපි මේ රටේ ජනතාවට කියනවා, දැන් වැඩේ හරියට යනවා කියලා. Facebook එකේ තිබෙනවා, "මෙදා තමයි ගහපු කතිරේ" කියලා. මේක තමයි ලු කතිරේ. ඔව් නේ, වැඩේ හරියට යනවා. නාමල් රාජපක්ෂ මහත්මයා කියා තිබෙනවා මම දැක්කා, "ජනතාවට ඕනෑ අත් අඩංගුවට ගැනීම් ගැන ජනපතිගේ කථා නොවෙයි, බඩු මිල ඉහළ යෑමට උත්තර"යි කියලා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමාට නියමිත කාලය දැන් අවසන්, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු ශාන්ත පද්ම කුමාර සුබසිංහ මහතා**
(மாண்புமிகு ஷாந்த பத்ம குமார சுபசிங்ஹ)
(The Hon. Shantha Pathma Kumara Subasingha)
මට තව තත්පර 30ක් දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

ඔන්න, කතන්දරය. හදිසි වෙන්න එපා, කලබල වෙන්න එපා, නාමල්. ඔයා ළඟට එනකල් ඉන්න; නම අඬගහනකල් ඉන්න. ඔව්, ඔන්න ඕක තමයි ගරු ජනාධිපතිතුමා ඇතුළු අපේ මන්ත්‍රීවරු 159කට ඡන්ද ලැබුණු ඒ ජන වරමේ තිබෙන මහා පොදු සාධකය. අත් අඩංගුවට ගැනීම්, යුක්තිය ඉටු කිරීම්, වින්දිතයන්ට යුක්තිය ඉටු කිරීම්, මහා ජනතාවට යුක්තිය ඉටු කිරීම්. ඒක තමයි මේ කරමින් යන්නේ. ඒකට යම් කාලයක් ගියා. ඒකට අවශ්‍ය ආයතන පිහිටුවන්න ඕනෑ. ඊයෙත් ගරු ජනාධිපතිතුමා කිව්වා, මහාධිකරණ 7ක් අලුතින් ඇති කර තිබෙනවා කියලා. විනිසුරුවන් පත් කරනවා, ඒ අවශ්‍ය ප්‍රතිපාදන දෙනවා, මහාධිකරණ ඉදිකරනවා. ඒ විතරක් නොවෙයි. CID එකට අවශ්‍ය පහසුකම් ලබා දෙනවා. අන්න ඒ ක්‍රියාවලියත් එක්ක කෙමෙන් කෙමෙන් ඔයගොල්ලන් ළඟට එනවා. නම අඬගහනකල් ඉන්න, නාමල්. අපේ ජන වරමේ ප්‍රධාන කාර්යයක් තමයි මේ ඉෂ්ට කරමින් ඉන්නේ. ඒ නිසා ඉක්මනින් ළඟට එනවා. ඒකට කියන්න එපා, දේශපාලන පළිගැනීම් කියලා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේගොල්ලන් සතුටු වෙන්න ඕනෑ. මොකද, ජනාධිපතිතුමා ඇතුළු අපේ ආණ්ඩුව දේශපාලන පළිගැනීම් කරන්නේ නැහැ. එහෙම කළා නම් මේ ඔක්කෝම, මේ නඩයම එක්කෝ වැලිකඩ, එක්කෝ අඟුණුකොළේ. ඒ නිසා හරි පැහැදිලියි, අපි ඉතාම වේගයෙන් ක්‍රමානුකූලව මේ රට ගොඩනඟනවා. අපි පොහොසත් රටක් ලස්සන ජීවිතයක් උදා කිරීම වෙනුවෙන්, ජනතා බලාපොරොත්තු ඉෂ්ට කරමින් ඉන්නවාය කියන පණිවුඩය දෙමින්, මට මේ කාලය ලබා දීම පිළිබඳව ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියට ස්තුතිවන්ත වෙමින් නිහඬ වෙනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.20]

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මෙම පාර්ලිමේන්තුව තුළ අද සාකච්ඡාවට ලක් වන 2024 අංක 36 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත යටතේ වූ නියමය පිළිබඳව අපේ විවාදයක් නැහැ. එය අත්‍යවශ්‍ය පියවරක්. ඒ වාගේම අද වනතුරු මේ රටේ තිබෙන හැම මෙගාවොට් එකක්ම ඇති කළේ මීට කලින් පැවති රජයන් විසින්. කාලය ගතවෙත්ම රටේ අවශ්‍යතා සලකා බලා, රටේ අවශ්‍යතාවලට ගැළපෙන පරිදි පුනර්ජනනීය බලශක්තිය හෝ පොසිල ඉන්ධන මත වූ බලශක්තිය ලබා ගැනීම කොහොමත් ඒ පවතින රජයක වගකීම වනවා. හැබැයි, අදටත් අලුත් ප්‍රතිපත්තියක් මත, අලුත් වැඩ පිළිවෙළක් මත මේ රජයෙන් මෙගාවොට් එකක්වත් එකතු කරලා නැහැ. මීට කලින් පැවති රජයන් විසින් එකතු කරපු, මීට කලින් පැවති රජයන් විසින් සකස් කරපු, වැඩසටහන් අනුව එකතු කරපු දේවල් තමයි මේ රටේ ජනතාව අදත් භුක්ති විඳින්නේ. ඒ තුළ යහපත් දේවල් තිබෙනවා වාගේම අඩුපාඩුත් තිබෙනවා. ඒ අඩුපාඩු හදන එක ඔබතුමන්ලාගේ වගකීම.

ඒ වාගේම අපි මේ පිළිබඳ වගකීම් දරන කොට 2016.09.06වැනි දා සූර්ය බල සංග්‍රාමය හඳුන්වා දුන්නා. එවකට ජාතික විදුලිබල පද්ධතිය තුළ සූර්ය විදුලි බලය තිබුණේ මෙගාවොට් 32යි. එම ක්‍රියාදාමය තුළ අද වන විට සූර්ය විදුලි බලය මෙගාවොට් 3,000කට ආසන්න ප්‍රමාණයක් අපේ ජාතික විදුලිබල පද්ධතියේ තිබෙනවා. ඒ විතරක් නොවෙයි. අපේ රටේ සූර්ය විදුලි බලය නිෂ්පාදනය කරන විදුලි පාරිභෝගිකයන් 140,000ක් ඉන්නවා. මේ සියලු වැඩ පිළිවෙළ, මේ ප්‍රතිපත්ති සම්පාදනය කළේ මා වගකීම් දරපු රජය ඇතුළු කලින් පැවති රජයන් විසින්. ඒ වාගේම මන්නාරම ප්‍රදේශයේ මෙගාවොට් 100ක සුළං විදුලි බලාගාරයක් 2016දී අපි ආරම්භ කරලා, ඒක මුළු කලාපයේම තිබෙන ආදර්ශවත් විදුලි බලාගාරයක් බවට පත් කළා.

ඒ වාගේම බස්නාහිර පළාතේ සහ පොදුවේ ලංකාවේ තිබුණු කසළ කළමනාකරණය පිළිබඳ ප්‍රශ්නය විසඳාලීම සඳහා waste-to-energy power plant එකක් කෙරවලපිටියේ හදන්න මට පුළුවන්කම ලැබුණා. අදටත් කොළඹ නගරයේ සම්පූර්ණ කසළ ප්‍රමාණය දහනය කරන්නේ, ඒ වාගේම ගම්පහ සහ කළුතර දිස්ත්‍රික්කවල කසළවලින් සැලකිය යුතු ප්‍රමාණයක් දහනය කරලා විදුලිය උත්පාදනය කරන්නේ, මේ කෙරවලපිටිය waste-to-energy power plant එකෙන්. බොහෝදෙනෙක් මේක අගය කරන්නේ නැහැ, මේ ගැන දන්නේ නැහැ. ඉස්සර එහෙම කසළ ප්‍රශ්නයක් තිබුණා, දැන් එහෙම නැති බව පමණයි දන්නේ. ඒ වාගේම මොරගහකන්ද ජල විදුලි බලාගාරය තුළින් මෙගාවොට් 25ක් අලුතින් උත්පාදනය කරන්න අපට පුළුවන්කම ලැබුණා. එතකොට මේ රටේ පැවති හැම රජයක්ම ක්‍රමානුකූලව මේ රටේ විදුලිබල පද්ධතිය දියුණු කරගෙන ඇවිල්ලා තිබෙනවා.

දැන් අපි අලුත් අභියෝගයකට මුහුණ දීලා තිබෙනවා, විදුලි පද්ධතිය යථා තත්ත්වයට ගන්න, ඒ ප්‍රමිතිය ඇති කරන්න. ඒ සඳහා අවශ්‍ය නවීන තාක්ෂණය ගෙනැල්ලා අපේ පද්ධතිය Smart පද්ධතියක් බවට පත් කරලා, ඒ හරහා වැඩිපුර පුනර්ජනනීය බලශක්ති ප්‍රමාණයක් සුළං බලයෙන් සහ සූර්ය බලයෙන් පද්ධතියට එකතු කරලා, නිෂ්පාදන වියදම අඩු කරලා, වග කිව යුතු ආයතනයක් හැටියට සේවය කරන්න, හොඳ සේවයක් ලබා දෙන්න අපට යුතුකමක් තිබෙනවා. ඒ නිසා විපක්ෂය හැටියට අපි ඒ සඳහා සහයෝගය පළ කරන බව කියන්න ඕනෑ.

විදුලිබල මණ්ඩලය කොටස් කළ පමණින් පාරිභෝගිකයාට යහපතක් වෙන්නේ නැහැ. විදුලිබල මණ්ඩලය කොටස් හයකට කැඩුවා කියලාත් ඒක වෙන්නේ නැහැ. සියයට 100ක් රජයට අයිතිය තිබුණු, කලින් පැවති විශාල විදුලිබල මණ්ඩලය වෙනුවට දැන් විදුලිබල මණ්ඩලයේ කොටස් හයක් තිබෙනවා. එහෙම කළ පමණකින් විදුලිය ඒකකයක මිල අඩු වෙන්නේ නැහැ. එහෙම කළ පමණින් පාරිභෝගිකයාට යහපතක් වෙන්නේත් නැහැ. අනාගතයට අවශ්‍ය ආයෝජන ලබා ගන්න, පරිපාලනය ශක්තිමත් කරන්න නම් මේ ප්‍රතිසංස්කරණ වැඩ පිළිවෙළේ ඊළඟ පියවරට යා යුතුයි. අද රජය නියෝජනය කරන එක් මන්ත්‍රීවරයෙකුවත් ඒ ඊළඟ පියවර ගැන කියන්නේ නැහැ, ඒ දෙවන අදියර ගැන කියන්නේ නැහැ. ඒ වාගේම පෞද්ගලික ආයෝජන, දේශීය හා විදේශීය ආයෝජන ලබා ගැනීමේ ක්‍රම ගැන කථා කරන්නේ නැහැ. ඒ අවශ්‍ය ඩොලර් බිලියන 10ක් විතර වෙච්ච දැවැන්ත ආයෝජන ප්‍රමාණය ලංකාවේ විදුලිබල ක්ෂේත්‍රයට ලබා ගැනීමට නම්, අපි දෙවන අදියරකට යා යුතුයි. ඒ අනුව මේ ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය තුළ, ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය තුළ තවත් අදියරකට යෑම අනිවාර්ය පියවරක් වනවා. විපක්ෂය හැටියට ඒ සඳහාත් අපේ සහයෝගය ලබා දෙන්න සූදානම් කියන කාරණය මේ වෙලාවේ මම කියන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඊයේ බොහොම අවාසනාවන්ත දෙයක් වුණා. විපක්ෂ නායකතුමා මේ සභාවේ නැති වෙලාවේ මුතුමැණිකේ රත්වත්තේ කියන දිගාමඩුල්ල දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීතුමිය එතුමාට සාපරාධී චෝදනාවක් එල්ල කළා. ඒක බොහෝදෙනෙක් නිකම්

වාචාලකමට කරන සම්පූර්ණ අසත්‍ය චෝදනාවක්. ඒ තමයි විපක්ෂ නායකතුමාගේ සහෝදරිය හොර සල්ලි අච්චු ගැහුවා, ඇය බේරාගන්න විපක්ෂ නායකතුමා උදවු කළා කියන එක. ඒක අමූලික බොරුවක්. මා සතුව තිබෙනවා, කොළඹ මහාධිකරණයේ අංක HC/8378/16 නඩුවේ සහතික පිටපතක්. මේ නඩුවේ විත්තිකාරයා හික්කඩුව මහවිදානආරච්චිගේ ක්‍රිෂාන්ත රෝලින් මොඩස්ටන් පෙරේරා. ඒ නඩුවේ පළමුවෙනි සාක්ෂිකාරිය තමයි විපක්ෂ නායකතුමාගේ සහෝදරිය. ඒ නඩුවේ වින්දිතයා තමයි විපක්ෂ නායකතුමාගේ සහෝදරිය. මේ කියන තැනැත්තා ණයක් පියවීම සඳහා එතුමියට ගෙවපු මුදල තුළ ව්‍යාජ මුදල් නෝට්ටු තිබුණා. එතුමිය බැංකුවට ගිහිල්ලා ඒ මුදල් තැන්පත් කරන අවස්ථාවේදී බැංකුව ඒ මුදල් හඳුනාගත්තා, ඒ අනුව පරීක්ෂණ කරලා විත්තිකාරයා වශයෙන් ඒ ක්‍රිෂාන්ත රෝලින් මොඩස්ටන් පෙරේරා හඳුනාගත්තා. ඔහුට මහාධිකරණයේ නඩු පැවරුවා. ඔහු වරද පිළිගත්තා. ඔහුට දඬුවම් කළා. ඒ විතරක් නොවෙයි. රුපියල් ලක්ෂ 20ක ඒ හොර සල්ලි ප්‍රමාණයට ගැළපෙන මුදලක් වන්දි වශයෙන් ගෙවන්නත් නියම කළා. එතුමිය ඒ වන්දි මුදල ලබා ගත්තා.

එතකොට ඒක සම්පූර්ණ අසත්‍ය චෝදනාවක්. මම හිතන්නේ ඒ මන්ත්‍රීතුමිය නොදැනුවත්කමින් විය යුතුයි මෙය කියන්නේ. මේක වෙන අය කියපු දෙයක් වෙන්න ඕනෑ. මම එතුමියගෙන් ඉල්ලා සිටිනවා, කරුණාකරලා ඒක නිවැරදි කරන්න කියලා. එතුමියට ඒ පිළිබඳ ගැටලුවක් තිබෙනවා නම් ඒ සම්බන්ධ සම්පූර්ණ නඩු වාර්තාව මා සතුව තිබෙනවා, එය බලන්න පුළුවන්. එය නිවැරදි නොකළොත් එතුමියට විරුද්ධව අපට අනිවාර්යයෙන්ම වරප්‍රසාද කඩ කිරීමේ චෝදනාවක් ඉදිරිපත් කරන්න වනවා. ඒක අකමැත්තෙන් කරන්නේ. මොකද මම හිතන්නේ නැහැ, එතුමිය හිතා මතා ඒක කළා කියලා. නමුත් මම අවවාදයක් වශයෙන් එතුමියට මේක කියන්න ඕනෑ. එතුමියට සැකයක් තිබෙනවා නම් මා සතුව තිබෙන මේ සහතික පිටපත ලබා ගන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒ විතරක් නොවෙයි. ඊයේ ගරු ජනාධිපතිතුමා මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා පාර්ලිමේන්තුව තුළ ශිෂ්ට වෙන හැටි කිව්වා. ඔව්, එතුමාම කලින් කියලා තිබෙනවා, අපි කාලා බලලා නොවෙයි දේශපාලනය කරන මිනිස්සු තෝරා ගන්නේ කියලා. පාස්කු ප්‍රහාරයේ බෝම්බකරුවන්ගේ පියා ජනතා විමුක්ති පෙරමුණේ ජාතික ලැයිස්තුවේ සාමාජිකයෙක් වනකොට, තමන්ගේ පක්ෂයේ ප්‍රධානතම ආධාරකරුවෙක් සහ අරමුදල් සපයන්නෙක් වනකොට, එතුමා මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා කිව්වේ, අපි කාලා බලලා නොවෙයි මිනිස්සු තෝරා ගන්නේ, අපේ අය අතරත් වැරදි මිනිස්සු ඉන්නවා කියලායි. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපේ පක්ෂය ඇතුළේත් වැරදි කරපු කෙනෙක් ඉන්නවා නම් අපි ඒ අයට දඬුවම් කරනවා, ඒ අය අපේ පක්ෂයේ ක්‍රියාදාමවලින් ඉවත් කරනවා, ඒ අය පිළිබඳව විනය ක්‍රියාමාර්ග ගන්නවා.

හැබැයි, දැන් මේ සභාව තුළ කීදෙනෙක් මගේ ඇස් මානයේ ඉන්නවාද, අත්හිටවූ සිර දඬුවම් තිබෙන අය? අධිකරණ ඇමතිතුමනි, ඔබතුමන්ලාගේ පැත්තේ ඉස්සරහ පේළිවල දැනුත් ඉන්නවා. හතරවෙනි පේළියේ ඉන්නවා, අත්හිටවූ සිර දඬුවම් ලැබූ අය. *[බාධා කිරීමක්]* සමන්මලී ගුණසිංහ මන්ත්‍රීතුමියට සැකද? ඔබතුමියගේ පේළියේමයි ඉන්නේ, ඇඹිලිපිටිය මහාධිකරණයෙන් අත්හිටවූ සිර දඬුවම් ලැබූ කෙනෙක්. එම නඩුවේ සහතික පිටපතත් මා ළඟ තිබෙනවා. මම මොකුත් කියන්න යන්නේ නැහැ, එතුමා ගැන මට පෞද්ගලික ප්‍රශ්නයක් නැහැ. එතුමාගේ නායකයා ඊයේ මේ සභාවේ කියපු දේ නිසායි මම මේ කාරණය මතක් කළේ. කෙනෙකු අතින් වරදක් වෙන්න පුළුවන්, අඩු පාඩුවක් වෙන්න පුළුවන්, ඒ ගැන පශ්චාත්තාප වෙන්න පුළුවන්. උසාවියකින් වරදකරු වෙලා අත්හිටවූ සිර දඬුවමක් දුන්නාම යහපත් ලෙස ජීවත් වෙලා ඒක අකාමකා ගන්න තිබෙන අයිතිය මම පිළිගන්නවා. ඒ මන්ත්‍රීතුමා මට ඇහැට පෙනෙන මානයේ ඉන්නවා, මම එතුමාගේ නම කියන්නේ නැත්තේ එතුමාට කරන ගෞරවයක් විධියට. මොකද, එතුමා ක්‍රියාකාරීව මේ සභාවේ කටයුතු කරන නිසා. මේ ආණ්ඩුවේ ඇමතිකම් කරන කීදෙනෙකුට එය අදාළද? ගල්කිස්ස මහෙස්ත්‍රාත් අධිකරණයේ ප්‍රධාන නඩුවක් තිබෙනවා, අනුන්ගේ දේපළක් බදු දීම ගැන.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
හරි, මම අවසන් කරනවා.

ඒ නඩුව ඉදිරියට යන්නේ නැතිව, අධි චෝදනා ගොනු කරන්නේ නැතිව නීතිපති දෙපාර්තමේන්තුවේ රඳවාගෙන ඉන්නවා. හිටපු බලශක්ති ඇමතිතුමාට මම මොකුත්ම කියන්නේ නැහැ. මොකද, ඔබතුමාට නිර්දෝෂීභාවයේ පූර්ව නිගමනයේ අයිතිය තිබෙනවා.

නමුත් තමන්ගේ පක්ෂයේ ඉදිරි පෙළ නායකයෙක් අධිචෝදනා පත්‍රයක් ලැබුවාම පක්ෂ සාමාජිකත්වය අත්හිටුවන්න අවශ්‍ය නැද්ද? ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, යථාර්ථය මේකයි. තමන්ගේ කෙනෙකුට වනකොට එහෙම නැහැ, අනුන්ගේ කෙනෙකුට වනකොට එහෙම වෙනවා. එම නිසා අපි ජනාධිපතිතුමාට එක දෙයක් කියනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ලැබී ඇති කාලය අවසන්.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මට තව තත්පර කීපයක් දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. විපක්ෂයේ කාලය අපට තිබෙනවා. අද අපේ කථිකයන් දෙදෙනෙක් අඩුයි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. ඒ නිසා මම විනාඩි 5ක කාලයක් ගන්නවා.

මම ඉතාම වැදගත් දෙයක් කියන්න කැමතියි. අභියාචනාධිකරණයේ සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ - ඉහළ අධිකරණවල - පුරප්පාඩු පිරවීම පිළිබඳව ප්‍රශ්නයක් මතු වෙලා තිබෙනවා. එය අතිශයින්ම බරපතළ ප්‍රශ්නයක්. අභියාචනාධිකරණයේ දක්ෂ විනිශ්චයකාරවරුන්ට, පරිණත විනිශ්චයකාරවරුන්ට ශ්‍රේෂ්ඨාධිකරණයට පත්වීම් නොලබා විශ්‍රාම යෑමේ තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. විනිශ්චයකාරවරු එහෙම විශ්‍රාම ගියා. ගනේපොල විනිශ්චයකාරතුමාට ඒ තත්ත්වයට මුහුණ දෙන්න සිදු වුණා. ඉහළ අධිකරණවල vacancies අටක් තියාගෙන ඉන්නවා. එය බරපතළ ප්‍රශ්නයක් බව අපි නැවත නැවතත් කියා සිටියා. ඒක මහාධිකරණයටත් ප්‍රශ්නයක්. ඒක මහාධිකරණ විනිශ්චයකාරවරුන් මත තිබෙන පීඩනයක් කියලා අපි කිව්වා.

ඊයේ ගරු ජනාධිපතිතුමා මේ ගරු සභාවට කළ පැහැදිලි කිරීම මොකක්ද? එතුමා ගරු අග්‍ර විනිශ්චයකාරතුමාගෙන් වාර්තාවක් ගෙන්වා ගත්තා ලු. ඒ වාර්තාව කියෙව්වාම එතුමාට හිතුණා ලු,

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

ශ්‍රේෂ්ඨාධිකරණයට එම පත්වීම් කරන්න අවශ්‍ය නැහැ කියලා. ගරු ජනාධිපතිතුමනි, ඒක මොන නීතියක්ද, මොන ආචාර ධර්මයක්ද, මොන ශිෂ්ටකමක්ද? පුරප්පාඩු අටක් තිබෙනවා. ඒ සමහර පුරප්පාඩු ඇති වී මාස හයකට වැඩියි. එම පුරප්පාඩු පුරවන්නේ නැතුව තියාගෙන ඉන්න එක මොන ශීලාචාරකමක්ද? තමන්ගේ වෘත්තීය ජීවිතයේ වැඩි කාලයක් විනිශ්චයකාරකම කරලා අභියාචනාධිකරණයට යන්න, ශ්‍රේෂ්ඨාධිකරණයට යන්න බලාපොරොත්තු වුණු විනිශ්චයකාරවරුන්ගේ බලාපොරොත්තු කඩ කරලා, ඒ විනිශ්චයකාරවරු ඒ තනතුරුවලට පත් කිරීම ප්‍රමාද කරන එක මොන ශීලාචාරකමක්ද, මොන ශිෂ්ටත්වයක්ද? මගේ පරණ මිත්‍රයාට මට කියන්න තිබෙන්නේ එක දෙයයි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂ නායක කාර්යාලයෙන් වෙලාව නැහැ කියලා දන්වා තිබෙනවා. එම නිසා ඔබතුමා කථාව අවසන් කරන්න.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
හොඳයි.

ගරු ජනාධිපතිතුමනි, කියන්නා කෙසේ කීවත් අසන්නා සිහි බුද්ධියෙන් ඇසිය යුතුයි. ඔබතුමා තමයි පත්වීම් බලධාරියා. ඔබතුමා විසින් ඒ පුරප්පාඩු පිරවිය යුතුයි. ඔබතුමා ඒ පුරප්පාඩු පුරවන්නේ නැත්නම් ඒක අධිකරණය කෙරෙහි සම්පූර්ණයෙන්ම අසාධාරණ ලෙස බලපෑමක් වනවා. එය අයුක්තියක්, අසාධාරණයක් සහ අධිකරණයේ ස්වාධීනත්වයට පහර ගැසීමක් කියමින් මට මේ අවස්ථාව ලබා දීම වෙනුවෙන් ඔබතුමියටත් ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු නීතිඥ ගීතා හේරත් මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.32]

**ගරු නීතිඥ ගීතා හේරත් මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) கீதா ஹேரத்)
(The Hon. (Mrs.) Geetha Herath, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමියට ස්තුතියි.

ගත වුණු වසර එකහමාරක කාල සීමාව තුළ ආණ්ඩුවක් විධියට අපි ජනතා බලාපොරොත්තු ඉෂ්ට කිරීම සඳහා සාධනීය, තීරණාත්මක හා වැදගත් තීන්දු - තීරණ රැසක් අරගෙන තිබෙන බව විශේෂයෙන්ම කියන්න ඕනෑ. කඩා වට්ටපු ආර්ථිකයක් ගොඩගන්න සහ ආර්ථිකය ස්ථාවර මට්ටමක පවත්වාගෙන යන්න ආණ්ඩුවක් විධියට අපි ඒ සාධනීය තීරණ අරගෙන තිබෙනවා. අද කථා කරන ශ්‍රී ලංකා විදුලිබල පනත යටතේ නියමයට අදාළව ගත්තාමත් පෙනෙනවා, බලශක්ති ක්ෂේත්‍රයට අදාළවත් ඒ විධියට අපි වැදගත් සහ ජනතා හිතවාදී තීන්දු - තීරණ අරගෙන තිබෙන බව. ඇත්තටම මීට පෙර මෙම උත්තරීතර සභාව ආමන්ත්‍රණය කළ විපක්ෂයේ මන්ත්‍රීතුමාත් පිළිගත්තා, අද මේ ඉදිරිපත් කර තිබෙන නියමය පිළිබඳ විවාදයක් නැහැ කියලා. ඇත්තටම ඊට එරෙහි වෙන්න එතුමාට හැකියාවක් නැහැ. මොකද, ආණ්ඩුවක් විධියට අපි අරගෙන තිබෙන ක්‍රියාමාර්ගවල අඩුපාඩුවක් නොමැති නිසා.

ඒත් එක්කම එතුමා මතු කළ කාරණයක් ගැන මම කියන්න ඕනෑ. එතුමා කිව්වා, කලින් ආණ්ඩු පටන් ගත්ත වැඩ පිළිවෙළවල් තමයි අපි මේ ඉදිරියට කරගෙන යන්නේ කියලා. ඒ මතයට එකඟ වෙන්නේ නැතිව මම කියනවා, ඊට වඩා වෙනස් දේවල් අපි කරලා තිබෙනවාය කියන එක. ඒ ගැන කිව්වොත්, කලින් ආණ්ඩුව 2024 අංක 36 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත ගෙනැල්ලා තිබුණා. අපි ආණ්ඩුව විධියට ඇවිල්ලා, 2025 වසරේදී ඒකට සංශෝධනයක් ගෙනැල්ලා ඒ පනත වෙනස් කළා. මොකද, ඒ ආණ්ඩුව ක්‍රියාත්මක කරන්න ගිය විදුලිබල පනත ක්‍රියාත්මක කළා නම් මේ වනකොට ලංකා විදුලිබල මණ්ඩලයේ කටයුතු සමාගම් 12කට බෙදිලා පෞද්ගලීකරණය වීමක් සිද්ධ වෙනවා. කලින් ආණ්ඩුව ගත්ත ක්‍රියාමාර්ගයට වෙනස් ක්‍රමයක් අපි අනුගමනය කරමින් 2025 අංක 14 දරන ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත මඟින් සමාගම් 6කට ලංකා විදුලිබල මණ්ඩලයේ බලතල පවරා තිබෙනවා. එතුමා කිව්වා, දැන් විදුලිබල මණ්ඩල 6ක් තිබෙනවා කියලා. මම කියන්න ඕනෑ, මේක එකින් එකට විග්‍රහ කරන්න බැහැ කියන එක. මේ නව සංශෝධනයත් එක්ක මේ සමාගම් 6කට පවරා තිබෙන බලතල එකිනෙකට වෙනස්. අපි විදුලිබල මණ්ඩල 6ක් පිහිටුවා නැහැ. විදුලිබල මණ්ඩලයේ බලතල සමාගම් 6කට පවරා තිබෙනවා, එකිනෙකට වෙනස්ව. 2024 අංක 36 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 1වන වගන්තියෙහි (2)වන උපවගන්තිය යටතේ වන නියමයන් ක්‍රියාත්මක කළ යුතු නියමිත දිනය තමයි මේ ගැසට් කර තිබෙන්නේ. ඒ අනුව 2026 මාර්තු 09වන දිනය ක්‍රියාත්මක දිනය වශයෙන් නියම කර තිබෙනවා. ඊට අදාළව තමයි අද මේ විවාදය පැවැත්වෙන්නේ.

විදුලිබල ක්ෂේත්‍රය ගත්තාම, ජල විදුලිය තමයි අපේ රටේ ප්‍රධාන බලශක්ති උත්පාදන ප්‍රභවයක් විධියට තිබෙන්නේ. හැබැයි, එතැනින් එහාට ගිහිල්ලා පුනර්ජනනීය බලශක්තිය විධියට සුළං, සූර්ය වැනි බලශක්ති කෙරෙහි අවධානය යොමු වෙලා තිබෙනවා. ඒ වෙනුවෙන් ආණ්ඩුවක් විධියට අපිත් තව දිරිගැන්වීම් කරනවා. අපි විශේෂයෙන් කියන්න ඕනෑ, අදානි සමාගම කලින් ආණ්ඩු සමයේ යෝජනා කර තිබූ solar energy සම්බන්ධ ව්‍යාපෘතිය අප බලයට ආවට පස්සේ නවත්වා රජයේ වියදම් සියයට 50ක් ඉතුරු කර තිබෙනවාය කියන එක. ඒ වෙනුවට අපි විශේෂයෙන් මන්නාරම සුළං විදුලි බලාගාරයේ වැඩ මේ වනකොට ආරම්භ කර තිබෙනවා. එවැනි තත්ත්වයක් අපි ඇති කර තිබෙනවා. කලින් ආණ්ඩු ගත්ත ක්‍රියාමාර්ග නොවෙයි අපි ක්‍රියාත්මක කරගෙන යන්නේ. ඊට වඩා ආණ්ඩුවට එහෙම නැත්නම් විදුලිබල මණ්ඩලයට එහෙමත් නැත්නම් බලශක්ති ක්ෂේත්‍රයට දරන පිරිවැය අඩු වන ක්‍රම තමයි අපි හඳුන්වා දෙමින් ක්‍රියාත්මක කරමින් තිබෙන්නේ කියන කාරණය මම මේ සභාවට කියනවා.

මම මීට පෙර කිව්වා වාගේම කලින් කථා කළ මන්ත්‍රීතුමන්ලාත් ඒ ගැන පැහැදිලි කළා. හැබැයි, එතුමා විදුලිබල මණ්ඩල 6ක් ගැන කියපු නිසා මම ඒ කාරණය නැවතත් මතක් කරනවා. මොකද, 2025 අවුරුද්දේ ශ්‍රී ලංකා විදුලිබල පනත සංශෝධනය කරද්දී විශේෂයෙන්ම ආර්ථිකයට ගැළපෙන ආකාරයටත්, අනෙක් පැත්තෙන් විදුලිබල මණ්ඩලයේ සේවකයන්ගේ අයිතීන් ආරක්ෂා වන විධියටත්, එතැනින් එහාටත් ගිහිල්ලා විශේෂ වැදගත් කාණ්ඩය වන පාරිභෝගිකයන් අපහසුවට පත් නොවන විධියටත් තමයි අපි ඒ සංශෝධනය කරලා තිබෙන්නේ. එතනදී අදාළ ගැසට් පත්‍රය මඟින් මූලික පැවරුම් සැලැස්ම ප්‍රකාශයට පත් කිරීමත් එක්කම, නියමිත දිනය ප්‍රකාශයට පත් කිරීමත් එක්කම විදුලිබල මණ්ඩලයේ තිබෙන

වත්කම්, බැරකම් සියල්ල 2007 අංක 07 දරන සමාගම් පනත ප්‍රකාරව සමාගම් 6කට බෙදෙනවා. ඒ සමාගම්වලට බෙදෙන්නේ ජනනය, බෙදා හැරීම, පද්ධති පාලනය සහ සම්ප්‍රේෂණය. ඒ සඳහා සමාගම් 4ක් තිබෙනවා. විදුලිබල මණ්ඩල 6ක් නැහැ. ඒ සමාගම් 4 තමයි, Electricity Generation Lanka (Pvt.) Limited, Electricity Distribution Lanka (Pvt.) Limited, National System Operator (Pvt.) Limited සහ National Transmission Network Service Provider (Pvt.) Limited. අනෙක් සමාගම් දෙක තමයි, බලශක්ති ඒකාබද්ධ ව්‍යාපාර ලංකා (පුද්ගලික) සමාගම සහ ලංවිම සේවක අරමුදල් (පුද්ගලික) සමාගම. ඒ විධියට එකිනෙකට වෙනස් සමාගම් 6කට බලතල පැවරීමක් තමයි සිද්ධ වෙන්නේ.

විශේෂයෙන්ම මම කියන්න ඕනෑ කාරණයක් තිබෙනවා. කලිනුත් අපේ මන්ත්‍රීතුමන්ලා පැහැදිලි කළා, සේවකයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා වන විධියට තමයි මේ සමාගම් 6ට බලතල පවරා තිබෙන්නේ කියන එක. ඒ සේවකයන් ඉවත් කිරීමේදී වන්දි ලබා දෙනකොට විශේෂයෙන් විදුලි බිලට ඒක දැනෙන්නේ නැති විධියට - විදුලි බිලට ඒක එකතු කරන්නේ නැති විධියට - රාජ්‍ය භාණ්ඩාගාරයෙන් වන්දි ලබා දීම සිද්ධ කර තිබෙනවා. ඒක විශේෂයෙන්ම මම සඳහන් කරන්න ඕනෑ. මොකද, ජනතාවට පීඩාවක් වන විධියට අපි ඒ මුදල් විදුලි බිලට එකතු කරලා නැහැ. සේවකයන් 22,000ක පමණ සංඛ්‍යාවකට කැමැත්තෙන් සේවයෙන් ඉවත් වෙන්න අවස්ථාව දීලා තිබෙනවා. මේ සමාගම් 6ට අනෙක් සේවකයන් අනුයුක්ත කර තිබෙනවා.

ඒත් එක්කම මේ කාරණයත් මම විශේෂයෙන් කියන්න ඕනෑ. පදිංචි ස්ථාන අනුව සේවයට යෑමේ පහසුකම් ලබා දීම සඳහා ඒ සේවකයන්ට ඒ සමාගම් අතර ස්ථාන මාරුවීමේ හැකියාව සලකා බැලීම සඳහා කමිටුවක් පත් කරලා තිබෙනවා. මේ සමාගම්වලට බලතල පැවරීමේදී හැම අවස්ථාවකම සේවකයන්ට වාසිවන විධියට තමයි ඒ කටයුතු කරලා තිබෙන්නේ.

ඒත් එක්කම මම විශේෂයෙන්ම මේ කාරණයත් කියන්න ඕනෑ. දිවා කාලයේදී අපට විදුලිය අතිරික්තයක් තිබෙනවා. අපි ආණ්ඩු බලය ගන්න අවස්ථාව වනකොටත් ඒ විදුලිය ගබඩා කිරීම සඳහා පහසුකම් තිබුණේ නැහැ. ඒක නිසා අපට අඛණ්ඩව විදුලි බල සැපයුම පවත්වාගෙන යෑමේදී තාක්ෂණික දෝෂ තිබුණා. අපි ආණ්ඩුවක් විධියට ඒ ගැටලු හඳුනාගෙන විදුලිය ගබඩා කරන්න පුළුවන් විධියට මේ වනකොට ඊට අදාළ ක්‍රියාමාර්ග අරගෙන තිබෙනවා. විශේෂයෙන්ම මහා පරිමාණ බැටරි බලශක්ති ගබඩා පද්ධති ස්ථාපිත කිරීම සඳහා අපි කටයුතු කරලා තිබෙනවා. විශේෂයෙන්ම ඒ සඳහා රජයේ සහ විදේශ ආධාර, ණය ව්‍යාපෘති ක්‍රියාත්මක වෙනවා.

ආසියානු සංවර්ධන බැංකුවේ ණය පහසුකමක් යටතේ මේ වනවිට කොලොන්නාවේ බැටරි බලශක්ති ගබඩා පද්ධති ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරමින් පවතිනවා. ඒ වාගේම ආසියානු සංවර්ධන බැංකුවේ ප්‍රදානයක් යටතේ දකුණු කලාපීය බැටරි බලශක්ති ගබඩා පද්ධතියක් මේ වෙනකොට ස්ථාපිත කිරීමට යෝජනා කරමින් ඒ වෙනුවෙන් කටයුතු කරමින් තිබෙනවා. ඊට අමතරව දකුණු කොරියානු රජයේ ප්‍රදානයක් ලෙස මෙගාවොට් පැය 10ක ධාරිතාවෙන් යුත් බැටරි බලශක්ති ගබඩා පද්ධතියක් හම්බන්තොට ඉදිකරලා තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමියට නියමිත කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමියනි.

**ගරු නීතිඥ ගීතා හේරත් මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) கீதா ஹேரத்)
(The Hon. (Mrs.) Geetha Herath, Attorney-at-Law)
හොඳයි, මම ඉක්මනින් අවසන් කරනවා.

අපි ආණ්ඩුවක් විධියට පිට රටින් වියදම් දරලා ගෙනෙන ඩීසල්, ගල්අඟුරුවලින් නිෂ්පාදනය කරන බලශක්තියට අමතරව සූර්ය, සුළං වැනි අපේ රටේ තිබෙන ස්වාභාවික දේවල්වලින් පුනර්ජනනීය බලශක්තිය උත්පාදනය කිරීමට යොමු වෙලා තිබෙනවා. ඒ වාගේම ආණ්ඩුවක් විධියට විදුලිය බිල අඩු කර ගැනීම සඳහා කටයුතු කරමින්, ජනතාවට ඒ සහන ලබා දෙමින්, විදුලිබල හා බලශක්ති ක්ෂේත්‍රයේ ප්‍රගමනය වෙනුවෙන් අපි කටයුතු කරමින් ඉන්නවාය කියන කාරණය මතක් කරමින් මගේ කථාව අවසන් කරනවා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු චානක මාදුගොඩ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හතක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.42]

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි මට මේ අවස්ථාව ලබා දුන්නාට.

ශ්‍රී ලංකා විදුලිබල පනත යටතේ ඉදිරිපත් කරන නියමය විවාදයට ගන්නා මේ වේලාවේ මීට පෙර කථා කරපු ගරු මන්ත්‍රීතුමෙක් කිව්වා, ඉතාම කෙටි කාලයකින් විදුලිය බිල අඩු කරනවා කියලා. ඇත්තටම මේ රටේ ජනතාවගේ බලාපොරොත්තුවත් එයයි. මේ රටේ දේශපාලනඥයන්ගේ බලාපොරොත්තුවත් එයයි. හැබැයි, ඔබතුමන්ලාගේ ජනාධිපතිතුමා මැතිවරණ වේදිකාවේදීත් කිව්වා, ඉතාම කෙටි කාලයකින් විදුලි බිල අඩු කරනවා කියලා. හැබැයි, ඒ කෙටි කාලය තවම ඇවිල්ලා නැහැ කියන කාරණය තමයි අපට අද කියන්න වෙන්නේ. ඒ කෙටි කාලය ඉක්මනට එනවා නම් මේ රටේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන්ට ඒ වාගේම සාමාන්‍ය ජනතාවට විදුලිය බිලෙන් මේ විඳින පීඩනයෙන් මිදෙන්න හැකියාව තිබෙනවා. ඒ නිසා ඒ ප්‍රාර්ථනය ඇතුව මගේ කථාව ආරම්භ කරන්නම්.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද මේ මොහොත වනවිට මේ රටේ තිබෙන ඉතාම සංවේදී කරුණක් පිළිබඳව මම කථා කරන්න කැමැතියි. ලංකාවේ පොලීසිය ක්‍රියාත්මක කරන්නේ නීතිය හා සාමය පවත්වා ගැනීමේ ක්‍රියාවක්ද ද, නැත්නම් targets සම්පූර්ණ කිරීමේ ව්‍යාපාරයක්ද කියන කාරණය අපි අහන්න කැමැතියි. ඇත්තටම ඒ ගැන අහන්න හේතුව මෙකයි. විශේෂයෙන්ම අද අපි දකිනවා, ශ්‍රී ලංකා පොලීසියේ ස්ථානාධිපතිවරුන්ට ඉහළින් නියෝග ලැබී තිබෙනවා දවසට මෙන්න මේ ප්‍රමාණයෙන් සැක පිට අත්අඩංගුවට ගැනීම් සිදු කරන්න කියලා. ඒ නිසා අද වනවිට පොලීසියේ නිලධාරි මහත්ම මහත්මීන් අකැමැත්තෙන් වුණත් targets සම්පූර්ණ කරන්න අහිංසක ජනතාව අත්අඩංගුවට ගන්නවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද එහෙම අත්අඩංගුවට ගන්නේ කවුද? එහෙම ගන්නේ මේ රටේ ඉන්න සල්ලි තිබෙන

[ගරු චානක මාදුගොඩ මහතා]

මිනිස්සු නොවෙයි. එහෙම අත්අඩංගුවට ගන්නේ එදිනෙදා රැකියාවට යන කම්කරු මහත්මයෙක් වෙන්න පුළුවන්, පෙදරේරු මහත්මයෙක් වෙන්න පුළුවන්, වඩු කාර්මික මහත්මයෙක් වෙන්න පුළුවන්. එහෙමත් නැත්නම් දෛනිකව රැකියාවට යන ගෞරවනීය මනුස්සයෙක් පාරේ පයින් යනකොට, pushbike එකෙන් යනකොට, මෝටර් සයිකලයෙන් යනකොට එහෙම නැත්නම් බස් ස්ටෑන්ඩ් එකේ ඉන්නකොට, සැකපිට කියා අත්අඩංගුවට අරගෙන කුදලගෙන යන තැනට ශ්‍රී ලංකා පොලීසිය අද වනවිට කටයුතු කරමින් තිබෙනවා. කිසිම පූර්ව තොරතුරක් නැතුව, කිසිම සාක්ෂියක් නැතුව, සමහර විට ඔවුන්ගේ බාහිර පෙනුම අනුව ඒ කියන්නේ ඔවුන් ඇඳගෙන ඉන්න ඇඳුම නිසා වෙන්න පුළුවන්, කොණ්ඩය වවාගෙන ඉන්නා නිසා වෙන්න පුළුවන්, tattoo එකක් ගහපු නිසා වෙන්න පුළුවන්, කරාබුවක් දමාගෙන ඉන්නා නිසා වෙන්න පුළුවන් ඒ කුමන හෝ කරුණක් නිසා සැකපිට කියලා අත්අඩංගුවට ගන්නවා. මම අහන්න කැමැතියි, බාහිර පෙනුමෙන් අපරාධකරුවෙක් මනින්න පුළුවන්ද කියලා. අපි දන්නවා, සමහර අපරාධකරුවන් ටයි-කෝට් ගහගෙන තමයි අද අපරාධ කරන්නේ. ඉතින් කෙනෙකුගේ බාහිර පෙනුමෙන් අපරාධකරුවෙක් මනින්න පුළුවන්ද?

මේ හේතුව නිසා අද වනවිට මේ රටේ පහළම සිටින අහිංසක ග්‍රාමීය ජනතාව පීඩනයකට පත් වී තිබෙනවා. ඒ නිසා මම මේ අවස්ථාවේ ඉතා ගෞරවයෙන් ඉල්ලීමක් කරන්න කැමැතියි. සමහර විට වරදකරුවෙක් නොවුණු මනුස්සයෙක් පොලිස් ජීප් එකේ පටවා ගෙන කුදලගෙන යනකොට, සමාජය ඒ මනුස්සයා වරදකරුවෙක් කරලා ඉවරයි. නිදහස් වෙලා ආවත් සමාජය ඒ මනුස්සයා දකින්නේ වරදකරුවකු විධියටයි. ඒ නිසා මෙය සංවේදී කාරණයක් විධියට දකින්න කියා විශේෂයෙන්ම ආණ්ඩුවෙන් සහ ගරු ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටිනවා. ගරු ඇමතිතුමනි, මේ කාරණය දෙස සංවේදී විධියට බලා මේ අහිංසක මිනිසුන්ට තිබෙන පීඩාව ඉවත් කර දෙන්න කියා අපි ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, 2025 මාර්තු 08වැනි දා මම මේ සභාවේදී ගරු සුනිල් හඳුන්නෙත්ති කර්මාන්ත ඇමතිතුමාට ප්‍රශ්නයක් යොමු කළා. ඒ ප්‍රශ්නයෙන් ඇසුවේ, පුල්මුඩේ ලංකා ඛනිජ වැලි සමාගමේ සේවක මහත්ම මහත්මීන් ස්ථිර කරනවාද කියන කාරණයයි. මේ සභාවම සාක්ෂියි, පුල්මුඩේ ඛනිජ වැලි සමාගමේ සේවක මහත්ම මහත්මීන් ස්ථිර කරන්න කටයුතු කරනවා කියා එතුමා කියපු කාරණයට. එතුමා මේ සභාවේ සිටි සියලුදෙනා ඉදිරිපිට එසේ කිව්වා. හැබැයි, ජනාධිපතිතුමා නම් කියන්නේ පාර්ලිමේන්තුවේදී කියන ඒවා බොරු, එළියේ කියන ඒවා ඇත්ත කියලායි. නමුත් මම විශ්වාස කරනවා, සුනිල් හඳුන්නෙත්ති මැතිතුමා එහෙම හිතා නොවෙයි ඒ පොරොන්දුව දෙන්න ඇත්තේ කියලා. මේ අසාධාරණය නිසා ඒ සේවක මහත්ම මහත්මීන් 2025 මාර්තු 24වැනි දා සාමකාමී උද්ඝෝෂණයක් කළා. ඒ උද්ඝෝෂණය දවසේත් සභාපතිතුමාත්, ඇමතිතුමාත් පොරොන්දු වුණා, ඔවුන් ස්ථිර කරනවා කියලා. ඔවුන් අවුරුදු දෙකකට ආසන්න කාලයක් කිසිදු වැටුපක් ගන්නේ නැතුව ගෙවල්වලින් යැපෙමින් තමයි සේවය කළේ. නමුත් කනගාටුවට කරුණ වන්නේ අද ඔවුන් එසේ සිටියදී ගැසට් කර අයදුම් පත් කැඳවා පිටින් සේවකයන් බඳවා ගන්න හදනවා. ඒක වැරදියි. මොකද, අවුරුදු දෙකක පමණ කාලයක් එතැන වැඩ කරපු කම්කරු ජනතාව ඒ ඉන්නේ. ඔබ කම්කරුවන් වෙනුවෙන් හඬ නඟපු ආණ්ඩුවක්. ඒ නිසා අපි විශ්වාස කරනවා, සේවකයන් බාහිරින් බඳවා ගන්නා ඒ කටයුත්ත නවත්වා දැනට සිටින සේවකයන් ස්ථිර කර, ඒ අයගේ රැකියාවේ ගරුත්වය රකින්න ඔබ කටයුතු කරයි කියා. එසේ කරන්න කියා අපි ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඊයේ ගරු ජනාධිපතිතුමා ශිෂ්ටත්වය ගැන කථා කළා. එතුමා ශිෂ්ටත්වය ගැන කථා කරන්නේ මේ අශිෂ්ටත්වය අමතක කරමින්. එතුමා සඳහන් කළා, සෙංකෝලය ළඟට විපක්ෂයේ මන්ත්‍රීවරුන් ආවා, සෙංකෝලය ඔසවා ගෙන යන්න හැදුවා කියා. හැබැයි, එතුමාට අමතක වුණා, සෙංකෝලය ඔසවා ගෙන යන තැනට මන්ත්‍රීවරුන් පත් කළේ කවුද කියන කාරණය. මේ පාර්ලිමේන්තුවේ තිබෙන සම්ප්‍රදායයන්, ඉඩප්‍රස්තා මඟ හරිමින් කටයුතු කළ නිසා තමයි විපක්ෂයේ මන්ත්‍රීවරුන් සෙංකෝලය ළඟට ආවේ. පාර්ලිමේන්තුව ගිනි තියන්න කථා කරපු, පාර්ලිමේන්තුව වටලන්න කථා කරපු කණ්ඩායම දෙපැත්තේ තියාගෙන ජනාධිපතිතුමා අහනවා ශිෂ්ටත්වය ගැන. ජනාධිපතිතුමාට එහෙම අහන්න පුළුවන්ද, එහෙම ශිෂ්ටත්වයක් ගැන කථා කරන්න පුළුවන්ද කියන කාරණයත් අපි අහන්න කැමැතියි.

ජනාධිපතිතුමා වංචාව, දූෂණය පිළිබඳවත් සඳහන් කළා. අපිත් වංචාවට, දූෂණයට විරුද්ධයි. ඒ නිසා ඒවාට විරුද්ධව මේ ආණ්ඩුව කටයුතු කරනවා නම්, අපිත් අත් දෙකම ඔසවා ඊට කැමැත්ත ප්‍රකාශ කරනවා. හැබැයි, ජනාධිපතිතුමා වංචාව, දූෂණය ගැන කථා කරනකොට තමන් දෙසට හැරී තිබෙන ඇඟිලි දිහා බලාගෙන නොවෙයි කථා කළේ. හැම දාමත් මේ පාර්ලිමේන්තුව දෙවනත් කරමින් කථා කළ ඒ අතීතය ගැන පමණයි එතුමා සඳහන් කළේ. එතුමා ගල් අඟුරු වංචාව ගැන කථා කළාද, කන්ටේනර් පෙට්ටි 323 ගැන කථා කළාද, ටෙන්ඩර් මගඩි ගැන කථා කළාද? ඒ වාගේම අපි අහන්න කැමැතියි, භාණ්ඩාගාරය සතුව තිබුණු ඩොලර් මිලියන 2.5ක මුදලක් අස්ථානගතවීම සම්බන්ධයෙන් මේ ආණ්ඩුවට එල්ල වුණු චෝදනාව ඇතුළු අලුත් පන්නයේ වංචා ගැන එතුමා කථා කළාද කියන කාරණයත්. ඒවා අමතක කරමින් තමයි ජනාධිපතිතුමා කථා කළේ. ඒවා ගැනත් කථා කළා නම් හොඳයි.

ඒ වාගේම ජනාධිපතිතුමා කිව්වා, තමන්ගේ නිලධාරින්ට, ඇමතිවරුන්ට චෝදනා කරනවා කියාත්. කවුද ඒ නිලධාරින්? ශානි අබේසේකර මැතිතුමා කියන්නේ කවුද? එතුමා පාස්කු ප්‍රහාරය පිළිබඳ චෝදනා එල්ල වුණු නිලධාරියෙක්. එතුමා ගැන විපක්ෂයෙන් කථා නොකර කවුද කථා කරන්නේ? ඒ වාගේම මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමාට චෝදනා කරනවා කියලාත් කිව්වා. මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමා කියන්නේ කවුද? මේ රට තුළ අලුත් පන්නයේ හොරකම් කරන්න ඉඩ හැරපු ලේකම්වරයෙක්. ඒ නිසා එතුමා පිළිබඳව විපක්ෂය විධියට අපි කථා කළ යුතු නැද්ද? ඒ වාගේම ආනන්ද විජේපාල මැතිතුමා ගැන කථා කරනවා කියලාත් කිව්වා. ආනන්ද විජේපාල මැතිතුමා මේ රටේ ඉතාම වැරදි කටයුත්තක් කළා; ඉතාම නරක කටයුත්තක් කළා. උපපොලිස් පරීක්ෂකවරුන් 100දෙනෙක් බඳවා ගන්න නියම වී තිබියදී එක පැන් පහරින් ඔවුන්ගේ සිහිනය බිඳ දමපු ඇමතිවරයෙක් තමයි එතුමා. ඒ නිසා ඒ පිළිබඳව කථා කරන එක වැරැදිද කියන ප්‍රශ්නයත් අහමින් මා ඉතාම ගෞරවයෙන් තවත් කෙටි කාලයක් ඉල්ලා සිටිනවා, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ චක්‍රලේඛ 3/2025 යටතේ වන කරුණක් කියන්න.

ඊයේ ගරු චිත්‍රාල් ප්‍රනාන්දු මන්ත්‍රීතුමාත් මේ කරුණ මතක් කළා. අද බෝපේ-පෝද්දල සහ මගේ ආසනය වන අක්මීමන ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු දෙක පැවැත්වෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. ඒ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු දෙක පාර්ලිමේන්තු රැස්වීම පැවැත්වෙන අද දවසේ පවත්වන්න පුළුවන්ද කියා අපි අහනවා. දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු, ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු පැවැත්වීමට සියලු දිස්ත්‍රික් ලේකම්වරුන්ට, ප්‍රාදේශීය ලේකම්වරුන්ට යවපු ඒ චක්‍රලේඛයේ 6.3 යටතේ සඳහන්ව

තිබෙනවා, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු හෝ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු පැවැත්වීමේ දින තීරණය කිරීමේදී පාර්ලිමේන්තුවේ රැස්වීම්, පළාත් සභා රැස්වීම් පැවැත්වෙන දිනවල හෝ කාර්යාලයීය මහජන දිනවල එම රැස්වීම් නොපැවැත්විය යුතුයි කියලා. මම මේ ගරු සභාවේ අවධානය යොමු කරවන්න කැමැතියි, අද බෝපේ-පෝද්දල සහ අක්මීමන ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු දෙකට විපක්ෂයේ මන්ත්‍රීවරයෙකු විධියට මට යන්න තිබෙන අයිතිය නැති කර තිබෙන එක ගැන. ඒ පිළිබඳවත් ඔබතුමියගේ අවධානය යොමු කරන්න කියා ඉල්ලා සිටිමින්, මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙමින් නිහඬ වෙනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු කේ. ඉලංකුමාරන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 1.51]

**ගරු කේ. ඉලංකුමාරන් මහතා**
(மாண்புமிகு கே. இளங்குமரன்)
(The Hon. K. Ilankumaran)
கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இலங்கை மின்சாரச் சட்டத்தின் கீழான கட்டளை தொடர்பான விவாதத்தில் கலந்துகொள்வதையிட்டுப் பெருமகிழ்ச்சி அடைகின்றேன். உண்மையாகவே, இந்த மின்சாரச் சட்டத்தின்கீழ் கொண்டுவரப்பட்டுள்ள கட்டளைகளை மக்களின் நலனுக்கானவையாகவே நாங்கள் பார்க்கின்றோம். இந்த நாட்டின் ஆட்சிப் பொறுப்பை ஏற்ற எமது அரசாங்கம் - மாண்புமிகு ஜனாதிபதி அவர்களும் இந்த அரசாங்கத்தைச் சேர்ந்தவர்களும் - மின்சார சபை ஊழியர்களை எந்த வகையிலுமே பாதிக்காதவகையில் சிறந்த முறையில் அதன் மறுசீரமைப்புத் தொடர்பான விடயத்தை முகாமைத்துவம் செய்திருக்கின்றது என்பதை, நானும் இலங்கை மின்சார சபையின் ஓர் ஊழியர் என்றவகையில் தெரிவித்துக் கொள்ளுகின்றேன். ஏனென்றால், முன்னைய காலங்களில் 'மறுசீரமைப்பு' எனும்போது ஊழியர்கள் குழப்பமடைவார்கள். ஆனால், இந்த அரசாங்கம் மின்சார சபையின் ஊழியர்களைப் பாதிக்காதவகையில், அதன் கட்டமைப்புகளை 6 பிரிவுகளாகப் பிரித்து, அரசாங்கக் கட்டமைப்புக்கு உள்ளேயே அவற்றை வினைத்திறனாக இயங்கச் செய்வதற்கான நடவடிக்கைகளை மேற்கொண்டதன் ஊடாக இந்தத் திட்டத்தைச் சிறந்த முறையில் முன்னெடுக்கக்கூடியதாக இருந்தது. மின்சார சபையில் வேலை செய்கின்ற அனைத்து ஊழியர்களின் சம்மதத்துடனும்தான் இந்தத் திட்டத்தை நாங்கள் முன்னெடுத்திருந்தோம். அந்தவகையில், அந்தத் திட்டத்தை முன்னெடுத்தபோது, மின்சார சபையில் இருந்து வெளியேற விரும்பியவர்கள் சுய விருப்பத்துடன் வெளியேறியிருந்தார்கள். அவர்களுக்கான கொடுப்பனவுத் தொகையினையும்கூட இந்தக் காலச் சூழலுக்கு ஏற்றவகையில், அவர்களுக்குத் தேவையான வகையில் நாங்கள் அதிகரித்து வழங்கியிருக்கின்றோம். குறிப்பாக, EPF, ETF என்ற வகையில் வழங்கப்பட்ட 50 இலட்சத்துக்கும் அதிகமான தொகையுடன் ஒரு கோடிக்கு மேற்பட்ட தொகை அந்த ஊழியர்களுக்கு வழங்கப்பட்டிருக்கின்றது. அந்த ஊழியர்கள் சுய விருப்பத்துடன் வெளியேறியபோதும்கூட, அவர்களைப் பாதிக்காத வகையில், அவர்கள் இந்தச் சமுதாயத்தில் மீளவும் ஏதாவது ஓர் இயங்குநிலையைப் பெறுவதற்கு ஏற்றவகையில், அவர்களுடைய சம்மதத்துடன்தான் அந்த நடவடிக்கை மேற்கொள்ளப்பட்டிருந்தது. நானும் ஒரு மின்சார சபை ஊழியர் என்ற வகையில் அதை வரவேற்கின்ற அதேநேரம், கௌரவ அமைச்சர்கள் மற்றும் இந்த அரசாங்கத்திற்கு உண்மையாகவே நன்றி கூறுகின்றோம்.

இந்த மறுசீரமைப்புச் செயன்முறை என்பது எதிர்காலத் தூரநோக்கு அடிப்படையில்தான் செய்யப்பட்டதேயன்றி மக்களைப் பாதிப்பதற்காகச் செய்யப்படவில்லை. இந்த அரசாங்கமானது, 2030ஆம் ஆண்டளவில் மின்சாரத் துறை என்பது எவ்வாறு அமைய வேண்டும், அன்றைய காலத்தில் மின்சாரப் பாவனை எவ்வளவாக இருக்கும் என்ற கருத்துக் கணிப்புக்கு அமையத்தான் இதனை மேற்கொண்டிருக்கிறது. ஏனென்றால் 2030ஆம் ஆண்டளவில் நாங்கள் இந்தப் புதுப்பிக்கத்தக்க சக்திக்கு நகரவேண்டிய தேவை இருக்கின்றது. அந்தவகையில், எங்களுக்குத் தேவையான 70 வீதத்துக்கு அதிகமான மின் சக்தியைப் புதுப்பிக்கத்தக்க சக்தியினூடாகப் பெறுவதற்கான முயற்சியை நோக்கி நாங்கள் நகரவேண்டி இருக்கிறது. ஏனென்றால், இப்போது மின்சாரக் கார்கள் வந்திருக்கின்றன. எதிர்வரும் காலத்தில் புகையிரதங்களைக்கூட மின்சாரத்தில் இயக்குவதற்கான நடவடிக்கைகளை எங்களுடைய அரசாங்கம் எடுத்துக் கொண்டிருக்கின்றது. அதற்கேற்ற வகையில், அனைத்துத் துறைகளுக்கும் எவ்வாறு மின்சாரத்தைப் பாதிப்பில்லாமல், இடைத் தடங்கல் இல்லாமல் வழங்குவது என்பதை ஆராய்ந்து, அது தொடர்பாகக் கற்றறிந்த புத்திஜீவிகளின் கருத்துக் களையும் உள்ளடக்கி, புதிய திசையில் மின்சாரத் துறையை நகர்த்துவதற்குத்தான் நாங்கள் நினைத்திருக்கின்றோம்.

யாழ். மாவட்டத்தின் தீவுப் பகுதிகளில் இதுவரை காலமும் எரிபொருளைப் பயன்படுத்திப் பழைய மின்பிறப்பாக்கி இயந்திரங்களைக் கொண்டு பல சிரமங்களுக்கு மத்தியில்தான் ஊழியர்கள் மின்சாரத்தை வழங்கி வந்திருக்கிறார்கள். எங்களுடைய அரசாங்கம் நெடுந்தீவுப் பிரதேசத்துக்கு புதுப்பிக்கத்தக்க சக்தியினூடாகவும் அதேவேளை, solar power மற்றும் காற்றாலை ஊடாகவும் 400 'கிலோவாட்' மின்சாரத்தை வழங்குவதற்கு நடவடிக்கை எடுத்துவருகிறது. அதனடிப் படையில், சென்ற வாரம் கௌரவ அமைச்சர் அவர்கள் நெடுந்தீவு உட்பட அனைத்துத் தீவுப் பகுதிகளுக்கும் கள விஜயம் செய்து இதற்காக மேற்கொள்ளப்படும் நடவடிக்கைகளை அவதானித்திருக்கிறார். அதை வெகு சீக்கிரமாக இயக்குவதற்குத் தீர்மானித்திருக்கின்றோம். ஏனென்றால், நெடுந்தீவு, நயினாதீவு, அனலைதீவு ஆகிய 3 தீவுகளிலுமே -

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
Order, please! මේ අවස්ථාවේ කථානායක ගැලරියේ රැඳී සිටින, පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදයේ ආරාධනය පරිදි පැමිණ සිටින, ශ්‍රී ලංකාවේ පිහිටි විදේශීය රාජ්‍ය තාන්ත්‍රික දූත මණ්ඩල නියෝජනය කරන තානාපතිවරියන් මෙම සභාව විසින් සාදරයෙන් පිළිගන්නා බව ප්‍රකාශ කිරීමට කැමැත්තෙමි.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කථාව කරගෙන යන්න.

**ගරු කේ. ඉලංකුමාරන් මහතා**
(மாண்புமிகு கே. இளங்குமரன்)
(The Hon. K. Ilankumaran)
தீவுப் பகுதிகளில் இன்று எவ்வளவு மின்சாரம் பயன்படுத்தப்படுகின்றது, எதிர்வரும் காலத்தில் அதன் பாவனை எந்தளவுக்கு அதிகரிக்க வேண்டும் என்ற ஆராய்வின் அடிப்படையில், இப்போது 400 'கிலோவாட்' மின்சாரத்தை

[ගරු කේ. ඉලංකුමාරන් මහතා]

அங்குள்ள மக்கள் நுகர்கிறார்கள் என்பது கணிக்கப் பட்டிருக்கிறது. அதைப் புதுப்பிக்கத்தக்க சக்தியினூடாக 750 'கிலோவாட்' ஆக அதிகரித்து வழங்குவதற்கு எமது அரசாங்கம் தீர்மானித்து இருக்கிறது. அதேநேரம், நயினாதீவிற்கும் 750 'கிலோவாட்' மின்சாரத்தை வழங்கத் தீர்மானித்திருக்கிறோம். அதுபோல், அனலைதீவுப் பிரதேசத்துக்கும் 300 'கிலோவாட்' மின்சாரத்தை வழங்குவதற்குத் தீர்மானித்திருக்கிறோம். ஏனென்றால், எமது அரசாங்கம் மின்சார வழங்கல் தொடர் பாகச் சிறந்த முறையில் முகாமைத்துவம் செய்து, தடங்கல் அற்றவகையில் மின்சாரத்தை வழங்குவதற்கு ஒரு பொறிமுறையை ஏற்படுத்தியிருக்கிறது.

முன்னைய காலத்தில் ஒருசிலர், தமது அரசியல் நோக்கங் களுக்காகவும் அதனூடாகத் தாங்கள் பணம் சம்பாதிப்பதற்கும் வருமானம் ஈட்டுவதற்கும் புதுப்பிக்கத்தக்க சக்தி என்ற போர்வையில் சில நடவடிக்கைகளை மேற்கொண்டிருந் தார்கள். ஆனால், எமது அரசாங்கமானது சிறந்த விலைமனுக் கோரலின் அடிப்படையில் வெளிப்படைத் தன்மையுடன் மின்சாரத்தைக் கொள்வனவு செய்வதனூடாக அதன் செலவைக் குறைத்திருக்கிறோம்.

ஏனென்றால், மின்சாரத்தை வழங்குவதற்கு அதிகளவான போட்டித் தன்மை காணப்படுகிறது. அதன் காரணமாக அவர்கள் மின்சார சபைக்கு விலையைக் குறைத்து வழங்குவதற்குத் தீர்மானிப்பார்கள். அந்த வகையில், வெளிப்படைத் தன்மையுடன் செயற்படுவதன் ஊடாக, மின்சாரத்தைக் குறைந்த கட்டணத்தில் பெற்றுக் கொள்ளக் கூடிய ஒரு சந்தர்ப்பத்தை இந்த அரசாங்கம் ஏற்படுத்தி யிருக்கின்றது. இவ்வாறு குறைந்த விலையில் மின்சாரக் கட்டணத்தைப் பெறுகின்றபோதுதான், எதிர்வரும் காலத்தில் குறைந்த விலையில் மக்களுக்கு மின்சாரத்தை வழங்க முடியும். அதனால்தான் அந்தப் பொறிமுறையை ஏற்படுத்திக் கொண்டிருக்கிறோம்.

கிளிநொச்சி, பூநகரி ஆகிய பிரதேசங்களிலும்கூட, இயற்கை முறையில் காற்றாலைமூலம் மின்னுற்பத்தியைப் பெறுவதற்கு எமது அரசாங்கம் இப்போது நடவடிக்கை எடுத்து வருகின்றது. நாங்கள் அங்கு சென்று கள ஆய்வுகளைச் செய்து, அதற்கான பொறிமுறைத் தேர்வுகளின்மூலம் இடங்களைச் சரியான முறையில் இனங்கண்டுதான் இந்தத் திட்டத்தைச் செயற்படுத்தவிருக்கின்றோம். கௌரவ அமைச்சர் அவர்கள் கிளிநொச்சி மாவட்ட GA உடனும் மக்களுடனும் கலந்தா லோசித்ததன் அடிப்படையில்தான் இந்தத் திட்டங்களைச் செய்யவிருக்கின்றோம். ஒருசில அரசியல்வாதிகள் அரசியல் நோக்கத்துக்காக இந்த விடயத்தில் தலையிட்டு குழப்பகரமான போராட்டங்களை ஏற்படுத்துகின்றார்கள். எங்களுக்குத் தெரியும், பூநகரிப் பிரதேசத்தில் இது தொடர்பான போராட்டம் ஒன்று முன்னெடுக்கப்பட்டிருந்தது. அங்குள்ள கனிய வளங்களையும் மணலையும் அகழப் போகின்றார்கள் என்று வதந்திகளைக் கிளப்பி, அந்தப் போராட்டத்துக்கு மக்களை அணி திரட்டியிருந்தார்கள்.

இயற்கை முறையில் காற்றாலையூடாக மின்சாரத்தை உற்பத்தி செய்யும்போது சுற்றுச்சூழலுக்கு எந்த வகையிலும் பாரியளவு பாதிப்பு ஏற்படாது; பாதிப்பு குறைவாகவே இருக்கும். அங்கே 34 காற்றாலை நிலையங்களை அமைப் பதற்கு இடங்களைத் தெரிவு செய்திருக்கின்றோம். வயல் நிலம் எவ்வளவு, மக்களின் குடியிருப்பு நிலம் எவ்வளவு என்று தனித்தனியாக ஆராய்ந்து தகவலைத் திரட்டியிருக்கின்றோம். அவ்வாறு ஏதாவது பாதிப்பு ஏற்படுமாயின், அவர்களுக்கான நட்ட ஈட்டை அரசாங்கத்தால் பெற்றுக்கொடுக்கத் தீர்மானித்திருக்கின்றோம்; அதுபற்றி கலந்துரை யாடியிருக்கிறோம். ஒருசில இடங்களில் மரங்களை வெட்டாமல், அவற்றை விலக்கி நிறுவுவது பற்றி கலந்தாலோசித்திருக்கின்றோம். கௌரவ அமைச்சர் அவர்கள் அந்த இடத்துக்கு நேராக விஜயம் செய்து கள ஆய்வு செய்திருக்கிறார். அரசாங்கம் எதிர்வரும் காலத்தில் தூர நோக்குடன் செயற்படுத்தவிருக்கும் இந்தத் திட்டத்துக்கான ஒப்பந்தத்தை அந்த இடத்தில் இருக்கும் மக்களுடைய பிரச்சினைகளைத் தீர்த்த பின்னர்தான் செய்துகொள்ளும். முன்னைய காலத்தில் மக்களுடைய பிரச்சினையை அப்படியே வைத்துக்கொண்டுதான் ஒப்பந்தம் செய்தார்கள். அதனால் அந்த இடங்களுக்கு வரும் ஒப்பந்தகாரர்கள் பிரச்சினைகளுக்கு முகங்கொடுத்தார்கள். அவ்வாறு மன்னார் போன்ற பிரதேசங்களில் முன்னைய அரசாங்கம் சர்வாதிகாரப் போக்குடன் மேற்கொண்டிருந்த நடவடிக்கைகளால் அரசாங்கத்தைப் பொறுப்பேற்ற நாங்கள் பிரச்சினைகளுக்கு முகங்கொடுத்தோம். ஆனாலும், மாண்புமிகு ஜனாதிபதி அவர்கள் அதற்குச் சிறந்த முறையில் தீர்வைப் பெற்றுக் கொடுத்திருந்தார்.

இன்று நாங்கள் ஆட்சியில் இருப்போம், நாளை இருக்க மாட்டோம். ஆனால், எதிர்காலச் சந்ததியினருக்கு சிறந்ததொரு மின்சாரக் கட்டமைப்பை உருவாக்க வேண்டும். ஏனென்றால், இன்றைக்கு எங்கேயோ ஒரு நாட்டில் யுத்தம் நடைபெறுகிறது; இங்கே எரிபொருளின் விலை உயர்கிறது; அதனூடாக மின்சாரக் கட்டணம் உயர்கின்றது. நாங்கள் இயற்கை வளங்களிலிருந்து மின்சாரத்தைப் பெறுவோமானால், இவ்வாறான பாதிப்புகளை மக்கள்மீது சுமத்தத் தேவை யில்லை. அபிவிருத்தியானது ஒரே நாளில் நடைபெறுவ தில்லை; அதற்கு தூரநோக்குச் சிந்தனையுடன் நீண்டகாலப் பயணத்தை மேற்கொள்ள வேண்டும். அந்த வகையில், நாங்கள் எதிர்காலச் சந்ததியினர் எவ்வாறு வாழ வேண்டும் என்ற எண்ணக்கருவுக்கு அமைய இந்த மின்சார சபைக் கட்டமைப்பை மறுசீரமைத்திருக்கின்றோம்; அதற்கேற்ற வகையில்தான் செயற்படுகின்றோம். இன்றைக்கு மாத்திர மன்றி எதிர்காலச் சந்ததியினருக்கும் நல்லதொரு நாட்டைப் பெற்றுக் கொடுப்பதற்காகவே இந்த மின்சாரக் கட்டமைப்பில் சிறந்த பொறிமுறையை ஏற்படுத்தியிருக்கின்றோம். 2030ஆம் ஆண்டளவில் எமது மின்சாரத் தேவையில் 70 சதவீதத்தை இயற்கை வளங்களினூடாகப் பெறுவோமானால், நாங்கள் எந்த நாட்டிலும் தங்கியிருக்க வேண்டிய தேவையில்லை. அதை உணர்ந்துதான் எமது அரசாங்கம் இன்று இந்தப் பொறி முறையை முன்னோக்கிக் கொண்டுசெல்கின்றது. எதிர்வரும் காலத்தில் மின்சாரக் கட்டணம் குறைவதோடு, எரிபொருள் விலையும் குறையும் என்பதைக் கூறிக் கொள்கின்றேன்.

இன்று உலக நாடுகளிடையில் ஏற்பட்ட யுத்தம் காரணமாகத்தான் எரிபொருள் விலை அதிகரித்திருக்கிறது. உலக நாடுகளின் விலை அதிகரிப்புடன் ஒப்பிட்டுப் பார்க்கும்போது, மானிய ரீதியாக நாங்கள் எரிபொருள் கொடுப்பனவைச் செய்து மக்களுக்கு நிவாரணம் வழங்கு கிறோம். அதேநேரம், எதிர்வரும் காலத்தில் இவ்வாறான பிரச்சினை ஏற்படாத வகையில், 2030ஆம் ஆண்டளவில் புதுப்பிக்கத்தக்க சக்தியானது 70 சதவீதமான அடைவு மட்டத்தை எட்டும்வகையில் அரசாங்கம் ஒரு சிறந்த பயணத்தை மேற்கொண்டிருக்கின்றது என்பதை மக்களுக்கு நான் ஆணித்தரமாகக் கூறுகிறேன். இந்த விடயத்தில் எந்த வகையிலும் மக்களைப் பாதிக்காத வகையில் இந்த அரசாங்கம் தூரநோக்குச் சிந்தனையுடன் செயற்படுகின்றது என்பதை இந்த இடத்தில் கூறிக்கொண்டு, விடைபெறுகிறேன். நன்றி!

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.01]

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

වර්තමාන විදුලිබල ඇමතිතුමාත්, හිටපු විදුලිබල ඇමතිතුමාත් මෙතැන ඉන්න වෙලාවේ මට කථා කරන්න ලැබීම හොඳ දෙයක්. මොකද, මම කථා කරන කාරණය ඔබතුමන්ලා දෙදෙනාටම විසඳන්න පුළුවන් කාරණයක්. ඔබතුමන්ලා දෙදෙනා දන්නවා, අපේ විදුලි සම්ප්‍රේෂණ පද්ධතියට ඉතාම වැදගත් grid උපපොළවල් දෙකක් පැලියගොඩ සහ මීරිගම ඉදි කිරීම සඳහා වූ ටෙන්ඩරයක් පසුගිය කාලයේ ක්‍රියාත්මක වුණ බව. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මෙහිදී අන්තර්ජාතික ලංසු කැඳවීමක් තමයි සිදු වුණේ. 2025 ඔක්තෝබර් මස 17වැනි දින ම විවෘත කළා මේ ටෙන්ඩරය. මේ ටෙන්ඩර් කැඳවීම අනුව අඩුම ලංසුව රුපියල් මිලියන 9,396ට ඉදිරිපත් කළේ දේශීය සමාගමක්. ඔවුන් හා JV එකක් තිබෙනවා, විදේශීය සමාගමකට. රුපියල් මිලියන 10,251ක දෙවැනි අඩුම ලංසුව ඉදිරිපත් කර තිබෙන්නේ CCCE Consortium කියන චීන සමාගම. එතකොට මේ ලංසු දෙක අතර වෙනස රුපියල් මිලියන 850ක්. රුපියල් කෝටි නම් 85කට ආසන්න ප්‍රමාණයක්. 2025 නොවැම්බර් මාසේ 10වැනි දා High Level Procurement Committee - HLPC - එකෙන් ලංසුකරුවන්ට දැනුම් දෙනවා, අඩුම ලංසුව තියපු දේශීය සමාගම වන Ceylon Energy & Engineering Services (Pvt.) Limited එකට තමයි මේ ටෙන්ඩරය ලැබෙන්නේ කියන කාරණය. හැබැයි ඊට පස්සේ දෙවැනියට අඩුම ලංසුව තියපු සමාගම Procurement Appeal Board - PAB - එකට අභියාචනයක් ඉදිරිපත් කරනවා. මේ සමාගම් දෙක අතර රුපියල් කෝටි 85ක වෙනසක් තිබෙනවා.

සම්පූර්ණ චීන සමාගමක්, මේ දෙවැනි සමාගම. පළමුවැනි සමාගම බොහොම කීර්තිමත් දේශීය සමාගමක්. නමුත් අඩුම ගණනේ මේ අභියාචනා කමිටුවට දේශීය සමාගමට කැඳවීමක්වත් නොකර - අර අඩු ලංසුවට දෙන්නේ නැතුව - රුපියල් කෝටි 85ක් වැඩි ලංසුවට මේ කොන්ත්‍රාත්තුව පිරිනමන්න කටයුතු කරමින් සිටිනවා කියලා අපට දැනගන්න ලැබිලා තිබෙනවා. අපි දන්නවා, ලංකා විදුලිබල මණ්ඩලය නොවෙයි, National Transmission Network Service Provider (Pvt.) Limited - NTNSP - තමයි මේ ගිවිසුම්ගත වන්නේ කියන එක. මේ සමාගමේ Board එකත් කැමැතියි, දේශීය සමාගමට ටෙන්ඩරය දෙන්න. Board එකේත් නිර්දේශය තිබෙන්නේ දේශීය සමාගමට ඒක දෙන්න කියලා. එහෙනම් PAB එක අත්තනෝමතිකව රුපියල් කෝටි 85ක් වැඩි විදේශීය සමාගමකට මේ ටෙන්ඩරය දෙන්න කටයුතු කරන්නේ ඇයි? මම දන්න විධියට මේ ගැන අධිකරණයට ගිහිල්ලා තිබෙනවා, අඩුම ලංසුව ඉදිරිපත් කරපු සමාගම. අධිකරණයට ගිහිල්ලා තිබෙන මොහොතක, ඒ සම්බන්ධ නඩුවක් තිබෙන මොහොතක අද ඒ නඩුව ක්‍රියාත්මක වෙද්දිත් ඒ ටෙන්ඩරය award කරන්න උත්සාහ කරනවා, මේ දෙවැනි සමාගමට. මම දන්නේ නැහැ දැන් විදුලිබල ඇමතිතුමාත්, කලින් හිටපු විදුලිබල ඇමතිතුමාත් මේක දන්නවාද කියලා. දන්නවා ඇති මම හිතන්නේ. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරියකට සහ ඔබතුමන්ලා කොටස් කරන ලද NTNSP එකේ මේ ව්‍යාපෘතියට සම්බන්ධ එක්තරා කණ්ඩායමකට තමයි වුවමනා වෙලා තිබෙන්නේ රුපියල් කෝටි 85ක් වැඩියෙන් තිබෙන ලංසුවට මේක පිරිනමන්න. අපට මතකයි, ඔබතුමන්ලා සුළං විදුලිබල ව්‍යාපෘතියක් ලබා දුන්නා. එතැන procurementවල ප්‍රශ්න තිබුණා. හැබැයි ඔබතුමන්ලා කිව්වේ, අඩුම මුදලට ඒක හේලීස් සමාගමට දුන්නා කියලා. හැබැයි, විශේෂයෙන් නඩුවක් තිබෙද්දිත් අද මේ චීන සමාගමට රුපියල් කෝටි 85ක වැඩි මුදලකට මේ ටෙන්ඩරය දෙන්න කටයුතු කරන්නේ මොකද කියන ප්‍රශ්නය මම අහනවා. අනෙක් එක, මේ චීන සමාගමට මේ වාගේ කොන්ත්‍රාත්තුවක් - රුපියල් බිලියන 10කට ආසන්න කොන්ත්‍රාත්තුවක්, ඩොලර් මිලියන විසි ගණනක කොන්ත්‍රාත්තුවක් - ලබා දීමේදී ඊළඟට මොකක්ද වෙන්නේ?

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, චීන සමාගමකට මේක දුන්නාම සේරම චීනයෙන් තමයි එන්නේ. කම්කරුවාත් චීනයෙන් තමයි එන්නේ. ඒ සල්ලි ලංකාවේ කොන්ත්‍රාත්කරුවෙකුටවත්, උප කොන්ත්‍රාත්කරුවෙකුටවත්, අඩුම ගණනේ පොඩි පොඩි supply එකක් කරන මිනිහෙකුටවත් බෙදෙන්නේ නැහැ. සේරම සල්ලි ටික චීනයට යන්නේ. එහෙනම් කවුරු හරි ඔබතුමන්ලාටත් හොරෙන්, ඔබතුමන්ලාගෙත් ඇස් වහලා මේ විධියට වැඩි මුදලකට ලංසු ඉදිරිපත් කරපු චීන සමාගමට මේ ව්‍යාපෘතිය දෙන්න කටයුතු කරනවාද කියන එක මම වර්තමාන ගරු විදුලිබල ඇමතිතුමාගෙන් අහනවා. මේවා වෙන්න ඔබතුමන්ලා ඉඩ දෙනවාද? දැන් මේ NTNSP එකට අඩුම ගණනේ පඩි ටිකවත් ගෙවා ගන්න බැරුව ඉන්නේ. අමතරව රුපියල් කෝටි 85ක් එහෙම නැත්නම් රුපියල් මිලියන 850ක්, රුපියල් බිලියනයට ආසන්න වැඩි මුදලකට කොන්ත්‍රාත්තුවක් පිරිනමන්න කටයුතු කරන එකද මේ ආණ්ඩුවේ ඔබතුමන්ලාගේ වගකීම. එහෙම නැත්නම් වැඩි මුදලකට මේ කොන්ත්‍රාත්තුව දීමද ඔබතුමන්ලාගේ අභිලාෂය කියන එක මම විදුලිබල ඇමතිතුමාගෙන් අහනවා. මේ වාගේ දූෂණ, වංචා වෙන්නද ඔබතුමන්ලා ආණ්ඩුව හැදුවේ? සමහර විට ඔබතුමන්ලා මේ ගැන දන්නේ නැතුව ඇති. නමුත් ඔබතුමා අදම හොඳට හොයලා බලන්න. මෙතැන "ගේම්" එකක් තිබෙනවා. අඩුම ගණනේ මේ සම්බන්ධ අභියාචනයට දේශීය සමාගමට කැඳවීමක්වත් කරන්නේ නැතිව, අධිකරණයේ නඩුවක් තිබෙද්දීත්, ඒක ගැන සෙවීමක් බැලීමක් නැතුව, ඒ අධිකරණ කටයුත්තට ඉඩ කඩ දෙන්නේ නැතුව, අඩුම ගණනේ NTNSP එකේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අභිමතය ගැනවත් සලකන්නේ නැතුව මෙහෙම කටයුතු කරමින් ඉන්නේ මේ රුපියල් කෝටි 85 නිසාද කියන ප්‍රශ්නය තිබෙනවා.

ඔබතුමන්ලා විදුලිබල මණ්ඩලය ප්‍රතිව්‍යුහගත කළේ මේ සමාගම්වලට ස්වාධීනව කටයුතු කරන්න අවස්ථාව දෙන්නයි. එතකොට දැන් NTNSP එකේ Board එක වැඩක් තිබෙනවාද? NTNSP එකේ Board එකට මේ තීන්දුව ගන්න බැරි නම්, යම්කිසි පිරිසක් මේ ටෙන්ඩරය ප්‍රදානය කිරීමේදී උසස් මට්ටමේ ප්‍රසම්පාදන කමිටුවේ තීන්දුවට අභියෝග කරනවා නම්, එතැන පැහැදිලිවම හොරකමක්, වංචාවක්, දූෂණයක් තිබෙනවාය කියන එක අපට පේනවා. ඒ නිසා විදුලිබල ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් උත්තරයක් බලාපොරොත්තු වෙනවා. ඔබතුමා දැන්ම වහාම මැදිහත් වෙලා රුපියල් කෝටි 85ක මුදලක් රටට, රජයට අහිමි වීමට යන මේ කොන්ත්‍රාත්තුව ප්‍රදානය නතර කරලා, මේ සම්බන්ධ පරීක්ෂණයක් පවත්වලා, මේ සම්බන්ධව අධිකරණ කටයුත්තක් තිබෙන නිසා අධිකරණයට ඒ අවස්ථාව දීලා කටයුතු කරන්න කියලා මම කියනවා. මොකද, ඔබතුමන්ලා විදුලිබල මණ්ඩලය ගැන කථා කරද්දී, අපේ රටේ පාරිභෝගිකයා ගැන කථා කරද්දී විදුලි බිල අඩු කරනවා කියලා තමයි බලයට ආවේ. නමුත් මේ විධියට රුපියල් කෝටි 85ක් - රුපියල් මිලියන 850 ක්, රුපියල් බිලියනයකට ආසන්න මුදලක් - නාස්ති වෙනකොට කොහොමද ඔබතුමන්ලා විදුලි බිල අඩු කරන්නේ? විදුලි බිල සියයට 33කින් අඩු කරනවා කියලා නේ කිව්වේ; තුනෙන් එකකින් අඩු කරනවා කියලා නේ කිව්වේ. මේ වාගේ වංචා, දූෂණ වෙනවා නම්, මේ වාගේ වංචා, දූෂණවලට ඉඩ තියනවා නම්, මේ

[ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා]

වාගේ වංචා, දූෂණ වෙනකන් ඇස් පියාගෙන බලාගෙන ඉන්නවා නම් ඔබතුමන්ලාට මේ කප්පේදී විදුලි බිල අඩු කරන්න හම්බ වෙන්නේ නැහැ. ඒ නිසා ගරු වර්තමාන විදුලිබල ඇමතිතුමාට, ඒ වාගේම එතුමා ළඟින් ඉඳගෙන ඉන්න හිටපු විදුලිබල ඇමතිතුමා යන දෙදෙනාටම මේ ගැන වගකීමක් තිබෙනවා.

හිටපු විදුලිබල ඇමතිතුමනි, ඔබතුමාගේ කාලයේදී තමයි මේ ටෙන්ඩරය විවෘත කරලා තිබෙන්නේ. ගරු ඇමතිතුමනි, මම ඔබතුමාට ඇඟිල්ල දිගු කරනවා නොවෙයි. ඔබතුමන්ලා දෙදෙනාටම වගකීමක් තිබෙනවා, මොකක්ද මේ වෙලා තිබෙන්නේ කියලා රටට කියන්න, මේ පාර්ලිමේන්තුවට කියන්න වාගේම වරදක් වෙලා තිබෙනවා නම් ඒක නිවැරදි කරලා අඩුම ලංසුවට - දේශීය සමාගමට - මේ කොන්ත්‍රාත්තුව පිරිනමන්න කටයුතු කිරීමට. ඒ හරහා තමයි අපට විදුලි බිල අඩු කරන්න පුළුවන් වෙන්නේ. මේ වාගේ දැවැන්ත ව්‍යාපෘතිවලින් වංචා වෙනවා නම්, දූෂණ වෙනවා නම්, සුදුසුකම් ලබපු ආයතනයක් තිබෙද්දී ඒකට ටෙන්ඩරය නොදී වෙනත් විදේශීය සමාගමට මේ ටෙන්ඩරය දෙනවා නම් අපේ විදුලි බිල අඩු කරන්න හම්බ වෙන්නේ නැහැ. ඒකයි ඇත්ත.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද අපේ විදුලි බිල නිසා රටේ කර්මාන්ත කඩා වැටිලා. සුළු පරිමාණයේ කර්මාන්ත කඩා වැටිලා. කර්මාන්තශාලා ගණනාවක් වැහිලා ගිහිල්ලා රැකියා විශාල ප්‍රමාණයක් අහිමි වෙලා තිබෙනවා. දරාගන්න බැරි විදුලි බිලක් තිබෙන රටක්, අපේ රට. ඔබතුමන්ලා අයෝජකයන්ට අපේ රටට එන්න කියලා කථා කරනවා. විදේශ ආයෝජන - Foreign Direct Investments - එනකම් බලාගෙන ඉන්නවා. හැබැයි, ආයෝජකයෙක් ආපු ගමන් ඉස්සෙල්ලාම බලන්නේ රටේ විදුලි බිල කීයක් වෙනවාද කියන කාරණයයි. විදුලි බිල දැක්කාම අපේ රටට ආයෝජකයන් එන්නේ නැහැ. විදුලි බිල දැක්කාම කර්මාන්තකරුවෙක් අපේ රටේ කර්මාන්තයක් ආරම්භ කරන්නේ නැහැ. විදුලි බිල අඩු කරන තාක්කල් අපේ රටේ ආර්ථික වර්ධනයක් සිදුකරන්න හම්බවෙන්නේ නැහැ.

විදුලි බිල තුනෙන් එකකින් අඩු කරනවා කියලා ජනතාවගෙන් බලය ගත්ත ජනාධිපතිතුමාට, විදුලි බිල අඩු කිරීමට ජනවරමක් ගත්ත ආණ්ඩුවට දැන් අවුරුදු දෙකකට ආසන්න කාලයක් ගතවෙලා තිබුණත්, තවම විදුලි බිල අඩු කරන්න හැකියාවක් ලැබිලා නැහැ. මේ යන විධියට විදුලි බිල අඩු කරන්න නොවෙයි, විදුලි බිල වැඩි කරන්නයි වෙලා තිබෙන්නේ කියලා අපට පෙනෙනවා. දැන් ලෝක වෙළෙඳ පොළේ තෙල් මිල අඩු වෙලා තිබෙනවා. ඔබතුමන්ලා 30වෙනි දා වෙනකම් ඒකට බලාගෙන ඉන්න ඕනෑ නැහැ. පාකිස්ථානය බලාගෙන හිටියේ නැහැ, බොර තෙල් මිල අඩු වුණු ගමන් අඩු කළා. ඒක තවම අපේ රටේ ක්‍රියාත්මක වුණේ නැහැ. මෙච්චර යුද්ධයක් තිබිලාත්, ඉන්දියාවේ ඉන්ධන මිල වැඩි කළේ නැහැ. ඉන්ධන සහනය මේ රටේ ජනතාවට ලබා දෙන්න ඔබතුමන්ලා තවමත් කල්මරමින් ඉන්නවා. ඔබතුමන්ලා වහාම ඒ සඳහා කටයුතු කරන්න කියන ඉල්ලීම මම කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු අනුර කරුණාතිලක ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 16ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.10]

**ගරු අනුර කරුණාතිලක මහතා (වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ බලශක්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு அனுர கருணாதிலக்க - துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் வலுசக்தி அமைச்சரும்)
(The Hon. Anura Karunathilaka - Minister of Ports and Civil Aviation and Minister of Energy)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ගරු නලින් බණ්ඩාර මැතිතුමා කියපු procurement එක ගැන මම මුලින්ම කියන්නම්. ඇත්තටම එතැන සිද්ධ වුණේ මේකයි. අඩුම ලංසුව තිබුණු සමාගමට විරුද්ධව ඊළඟ ලංසුකරු PAB එකට appeal එකක් ඉදිරිපත් කළා. ඒ appeal එකේදී හෙළිදරව් වුණා, අඩුම ලංසුකරුගේ තාක්ෂණික ඇගයීම ප්‍රතික්ෂේප වුණා කියලා. ඒකට හේතුව මේකයි. ඔවුන් joint venture එකක් හැටියට තමයි මුලින් දැම්මේ. චීන සමාගමේ තිබෙන පළපුරුද්ද තමයි ඉදිරිපත් කරලා තිබුණේ. පස්සේ චීන සමාගම ඉවත් වුණා. ඒ අනුව තාක්ෂණික ඇගයීම මත තමයි අඩුම ලංසුකරු ප්‍රතික්ෂේප වුණේ. නීතිපති දෙපාර්තමේන්තුවේ උපදෙස් මත තමයි කටයුතු කරලා තිබෙන්නේ. සාමාන්‍යයෙන් Procurement Appeal Board එකට අමාත්‍යාංශයේ ඇමැතිවරයා හෝ වෙනත් කෙනෙක් මැදිහත් වෙන්නේ නැහැ. ඒ වාගේම අධ්‍යක්ෂ මණ්ඩලය මැදිහත්වීමක් කරන්නෙත් නැහැ.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු ඇමතිතුමනි, මට අවස්ථාව දෙන්න.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
වෙලාව ලබා දෙන්න ඇමතිතුමා එකඟද?

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)
අවසර දෙනවා. නමුත් මගේ වෙලාවෙන් නොවෙයි.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු ඇමතිතුමනි, ඔබතුමා කියපු කාරණය ගැන ඔබතුමා සොයලා බලන්න. JV එක තිබෙන චීන සමාගම බොහොම හොඳ සමාගමක්. CEB එක සමාගම් කිහිපයකට කැඩුණා වාගේ ඒ සමාගමත් අතරමැදි කාලයේදී - අවුරුදු 10ක් ඇතුළත - වෙනස් වෙලා තිබෙනවා. ඒ සම්බන්ධව documents ඉදිරිපත් කරලා තිබෙනවා. නඩුවේ තීන්දුව දෙන්න කලින් ඔබතුමන්ලා මේක award කරන්න යන එකයි ප්‍රශ්නය. මේ නඩුවේ තීන්දුව දෙනකම් බලාගෙන හිටියොත් අපට බලාගන්න පුළුවන් සාධාරණයක් වෙනවාද, නැද්ද කියලා. හැබැයි, නඩුවේ තීන්දුව දෙන්න කලින් ඔබතුමන්ලා මේක award කරන්න හදන එක බරපතළ ප්‍රශ්නයක්.

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)
ඔබතුමා කියපු එක හරියටම හරි. චීන සමාගමේ තාක්ෂණික ඇගයීම ඉදිරිපත් කරලා තමයි මෙයා ලංසුවට ඉදිරිපත් වුණේ. දැන් චීන සමාගම ඉවත් වෙලා තිබෙනවා. හැබැයි, මේ සමාගම තාක්ෂණික ඇගයීමේ සුදුසුකම සපුරාලන්නේ නැහැ. ඔය චීන සමාගමට තිබෙන හැකියාව පෙන්වලා තමයි ලංසුව ඉදිරිපත් කරලා තිබෙන්නේ.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ඉවත් වෙලා නැහැ.

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)
නැහැ, ඉවත් වෙලා තිබෙන්නේ. ඒක තමයි PAB එකට ගිහිල්ලා තිබෙන්නේ. PAB එකේ තීරණය ඇවිල්ලා තිබෙන්නේ ඒ විධියට. නඩුවේදී කිසිම විධියක interim order එකක් දෙන්න කියලා ඉල්ලීමක් ඇවිල්ලා නැහැ. ඒ අනුව අපට නීතිපතිතුමාගේ උපදෙස් මත තමයි කටයුතු කරන්න තිබෙන්නේ. *[බාධා කිරීමක්]* හරි. නමුත් තාක්ෂණික ඇගයීමෙන් සමත් වෙන්න ඕනෑ. තාක්ෂණික ඇගයීමෙන් පාස් වුණොත් තමයි ඊළඟ අඩුම ලංසුකරුට යන්නේ. ඔබතුමා දන්නවා මට වැඩිය හොඳට. හේලීස් එකත් එක්ක වැඩ කරනවා නේ?

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, 2024 අංක 36 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 1(2) වගන්තිය යටතේ එවකට විදුලිබල අමාත්‍යවරයා විසින් ප්‍රකාශයට පත් කරපු ගැසට් නිවේදනයක් සම්බන්ධයෙන් තමයි මේ සාකච්ඡාව තිබෙන්නේ. කවුරුත් එකඟ නිසා මම ඒ ගැන වැඩිදුර කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. කොහොම වුණත් අලුත් විදුලිබල පනතින් බලාපොරොත්තු වුණේ කාර්යක්ෂම විදුලි සේවාවක් වාගේම ස්ථාවර විදුලි සේවාවක් සපයන එක. ඒ වාගේම විදුලි පාරිභෝගිකයාට අඛණ්ඩ ස්ථාවර සැපයුමක් ලබා දීම. ඒ වාගේම සාධාරණ මිලක් ලබා දීම. ඒ වාගේම විදුලිබල ක්ෂේත්‍රයේ වෘත්තීය වගකීම සහිත මානව සම්පතක් ඇති කිරීමට තමයි ඇත්තටම එවකට තිබුණු විදුලිබල මණ්ඩලය අනුප්‍රාප්තික සමාගම් හතරකට සහ තවත් ප්‍රධාන සමාගම් දෙකකට වෙන් කරලා තිබෙන්නේ. බොහෝ අවස්ථාවල දී මෙතැන සාකච්ඡා කළා වාගේ මේක එක රැයකින් සිදු වෙන කාරණයක් නොවෙයි කියලා අපි දන්නවා. ඒ සඳහා තවත් ගොඩක් දේවල් සිද්ධ වෙන්න ඕනෑ.

අපි එක පැත්තකින් බලන්න ඕනෑ, විදුලි පාරිභෝගිකයාට සාධාරණ මිලකට විදුලිය ලබා දීම සඳහා අපේ උපාය මාර්ගය මොකක්ද කියන එක. අපි දන්නා කාරණයක් තමයි සාමාන්‍යයෙන් සියයට 20ක් විතර පොසිල ඉන්ධන මඟින් තමයි අපේ ජනනය සිදු වෙන්නේ කියන එක. නමුත්, ඒ ජනන වියදම ගත්තොත් ඒ සඳහා සියයට 40ක් පමණ වියදම් කරනවා. එහෙම නම්, අපට තිබෙන උපාය මාර්ගයක් තමයි මෙන්න මේ පොසිල ඉන්ධන මත ජනනය වන ප්‍රමාණය අවම කරලා පුනර්ජනනීය බලය වෙත යොමු වෙන එක. එතැනදී අපේ බලාපොරොත්තුව තමයි 2030 වෙනකොට මේ පොසිල ඉන්ධන මත විදුලි ජනනය අවම කර ගැනීම් සඳහා අපේ උපාය මාර්ගය ඉදිරියට ගෙන එන එක. අපේ ලංකාවේ පුනර්ජනනීය විදුලි බලය සඳහා තිබෙන විභවයන් කලාප හැටියට හඳුනා ගත්තොත්, උතුරු කලාපයේ solar energyවලින් මෙගාවොට් 1,700ක්; සුළං විදුලියෙන් මෙගාවොට් 1,400ක්; offshore wind energyවලින් 2,500ක් තිබෙනවා. ඒ වාගේ කලාප කිහිපයක විස්තර මට ඉදිරිපත් කරන්න පුළුවන්. ලංකාව පුරාම මෙන්න මේ පුනර්ජනනීය බලශක්තිය ලබා ගන්න විශාල විභවතාවක් තිබෙනවා.

නමුත්, පුනර්ජනනීය බලශක්තිය සඳහා විභවය තිබුණු පමණින්ම අපට ඒ සඳහා වන බලාගාර හදලා ප්‍රධාන පද්ධතියට ඇතුළත් කරන්න බැහැ. ඒකට අවශ්‍ය යටිතල පහසුකම් අපි හදා ගෙන නැත්නම්, විශේෂයෙන් ඒ විභවයන් සහිත ප්‍රදේශවල පුනර්ජනනීය බලාගාර හදලා ඒ පද්ධතියට ඇතුළත් කර ගැනීම සඳහා සම්ප්‍රේෂණ ජාලය අපි හදලා නැත්නම් කොයි තරම් විභවතාවක් තිබුණත්, ඒ වාගේම කොයි තරම් බලාගාර හැදුවත් ඒක ප්‍රධාන පද්ධතියට ඇතුළත් කර ගැනීමේ හැකියාවක් නැහැ. ඒ නිසා ඇත්තටම අපේ බලාපොරොත්තුව තමයි අඩුම වශයෙන් ඉදිරි වසර කිහිපය තුළ, 2030 වෙනකොට, මේ ප්‍රධාන සම්ප්‍රේෂණ ජාලය -කිලිනොච්චියේ ඉඳලා හබරන දක්වා කිලෝවොට් 400ක එකක්, නොරොච්චෝලයේ සිට වාරියපොළට ආදී වශයෙනුත්- ප්‍රධාන සම්ප්‍රේෂණ ජාල 4ක් අවම වශයෙන් පද්ධතියට එකතු කර ගැනීම. මේ සම්ප්‍රේෂණ ජාල අපි සම්පූර්ණ කළාට පස්සේ මේ ප්‍රදේශවල තිබෙන පුනර්ජනනීය විදුලිබල ශක්තිය විදුලිබල පද්ධතියට එකතු කර ගැනීම සඳහා අපට අවස්ථාව ලැබෙනවා. ඒ විතරක් නොවෙයි, පද්ධතියේ ස්ථායිතාව පවත්වා ගෙන යෑම සඳහාත් අපට විශාල වශයෙන් උපකාරී වෙනවා.

සමහර විදුලි සම්ප්‍රේෂණ ජාල රාජ්‍ය අරමුදල් භාවිත කරලා ආරම්භ කරන්න අපි සාකච්ඡා කරගෙන යනවා. උදාහරණයක් හැටියට ගත්තොත්, කිලිනොච්චියේ ඉඳලා හබරන දක්වා තිබෙන සම්ප්‍රේෂණ පද්ධති කිලෝවොට් 400 - 400 kV - රාජ්‍ය අරමුදල් භාවිත කරලා කරන්න පුළුවන්ද කියලා අපි මේ දවස්වල සාකච්ඡා කර ගෙන යනවා. ඒ වාගේම අලුත් පනතින් බලය ලබා දීලා තිබෙන ආකාරයට සමහර සම්ප්‍රේෂණ ජාල සඳහා පෞද්ගලික අංශයේ සහභාගිත්වය අරගෙන ඒක කරන්න පුළුවන්කම තිබෙනවාද කියලා අපි බලනවා. අන්න ඒ අවස්ථා දෙකම උපයෝගී කර ගනිමින් මේ රටට අවශ්‍ය වෙන සම්ප්‍රේෂණ ජාලය ශක්තිමත් කර ගැනීම සඳහා කටයුතු කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

ඒ වාගේම තවත් තිබෙන ගැටලුවක් තමයි පද්ධති පාලනය කිරීමේ දී ඇති වෙන ගැටලුව. විශේෂයෙන් සූර්ය බලය ගත්තාම ස්ථාවර එකකට වඩා විචලා විදුලි බලයක් තමයි ජනනයේදී ලබා දෙන්නේ. සමහර අවස්ථාවල විශේෂයෙන් නිවාඩු දවස්වල, අපි හිතමු අලුත් අවුරුද්ද කාලයේ එහෙම නැත්නම් වෙසක් පෝය, පොසොන් පෝය වාගේ ප්‍රධාන පෝය දවස්වල අපේ ඉල්ලුම මෙගාවොට් 600ට වඩා අඩුවන අවස්ථා තිබෙනවා. නමුත්, 2026 ජුනි මාසයේ 10වෙනි දා වෙනකොට අපට වහළ මත සවි කරන ලද සූර්ය බල ශක්ති ධාරිතාව මෙගාවොට් 450ක් තිබෙනවා. එතැන පාරිභෝගිකයන් 148,810ක්. ඒ වාගේම පොළොව මත සවි කළ සූර්ය විදුලි බලාගාර 159ක් තිබෙනවා. ඒ හරහා අපට මෙගාවොට් 428ක් ලැබෙනවා. එතකොට අර මෙගාවොට් 600ට වඩා බෙහෙවින්ම ඉහළ තැනක එය තිබෙන්නේ. නමුත්, වහල මත ඉදිකරන ලද මේ සූර්ය බලාගාර බොහෝ වෙලාවට අපට පාලනය කරන්න පුළුවන්කමක් නැහැ. පසුගිය අප්‍රේල් 10වැනි දා ඉඳලා 20වැනි දා දක්වා කාලය ගත්තොත්, කිලෝවොට් 300ට වඩා වැඩි ධාරිතාවක් තිබෙන වහල මත ඉදි කළ සූර්ය බලාගාර සම්පූර්ණයෙන්ම curtail කරන්න අපට සිද්ධ වුණා. ඒ කාලයේ අපේ පද්ධතියට මෙගාවොට් 620ක් ගන්න පුළුවන්කම ලැබුණේ නැහැ.

ඒ වාගේම ඔබට මතක ඇති, පසුගිය මැයි 30වැනි දා දිවයින පුරාම විදුලි සැපයුමට බාධා ඇතිවුණු ආකාරය. ඉල්ලුමට වඩා සැපයුම වැඩි feeders 120ක විදුලිය කපා හැරීමක් කරන්න එහිදී අපට සිද්ධ වුණා. මේකට හේතුව තමයි, මෙන්න මේ වාගේ හදිසි අවස්ථාවක් පැන නැඟිච්ච මොහොතක මේ තිබෙන විදුලි බලාගාර, විශේෂයෙන්ම වහල මත තිබෙන සූර්ය බලාගාරවලින් වැඩි කොටසක් පාලනය කිරීමේ හැකියාවක් අපට නොමැතිවීම. ඒ සඳහා අවශ්‍ය වන mechanism එකක් අපට ඇත්තේ නැහැ. ඒ නිසා අපි ආරම්භයේදී බලාපොරොත්තු වනවා, මෙන්න මේ වාගේ හදිසි අවස්ථාවකදී මේ බලාගාර පාලනය කිරීම සඳහා අවශ්‍ය වන යාන්ත්‍රණයක් හදන්න. ආරම්භයේදී කිලෝවොට් 100ට වඩා වැඩි වහල මත ඇති සූර්ය බලාගාර පාලනය කළ හැකි උපකරණ සවි කරන්න අපි බලාපොරොත්තු වනවා. ඒ හරහා හදිසි අවස්ථාවකදී

[ගරු අනුර කරුණාතිලක මහතා]

මෙගාවොට් 840ක් පාලනය කිරීම සඳහා අපට අවස්ථාව සැලසෙනවා. මේ සම්බන්ධයෙන් අපේ ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමාත්, ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාත් ප්‍රශ්නයක් මතු කළා, ඇත්තටම මේක curtail කරන්න ද අපි බලාපොරොත්තු වන්නේ කියලා. කිසිසේත්ම නැහැ. අපි මේකෙන් බලාපොරොත්තු වන්නේ නැහැ, curtail කරන්න. නමුත්, හදිසි අවශ්‍යතාවක් පැන නැඟිච්ච මොහොතක ඒ බලාගාරවල පාලනය NSO එකට ලබා ගැනීම සඳහා තමයි අපි මේ උපකරණ සවි කරන්න බලාපොරොත්තු වන්නේ.

ඒ වාගේම තමයි, මේ පුනර්ජනනීය විදුලිය භාවිත කරන pattern එක. පාරිභෝගිකයන් විසින් රාත්‍රි කාලයේදී වැඩියෙනුත්, දහවල් කාලයේදී අඩුවෙනුත් විදුලිය භාවිත කරනවා වෙනුවට, රාත්‍රි කාලයේදී භාවිත කරන විදුලි පරිභෝජනයෙන් කොටසක් අපි දහවල් කාලයට ගත්තොත් තමයි අපට මේ ජනන වියදම අඩු කර ගන්න පුළුවන්කම ලැබෙන්නේ. ඒ සඳහා උපක්‍රමයක් ලෙස BESS කියන system එක දැනටමත් හඳුන්වා දීලා තිබෙනවා. ඒ සඳහා 2027දී අපි මෙගාවොට් 560ක් එකතු කරන්න බලාපොරොත්තු වනවා. ඉදිරි අවුරුදු 3, 4 ඇතුළත තවත් මෙගාවොට් 1,100ක්, 1,200ක් මේ Battery Energy Storage System එක හරහා පද්ධතියට එකතු කිරීම සඳහා අපට ලබා ගන්න පුළුවන්. එතකොට දහවල් කාලයේදී සූර්ය බලයෙන් මේ පද්ධතිය ආරෝපණය කරලා, රාත්‍රි කාලයේදී එය භාවිත කිරීම සඳහා අපට අවස්ථාව ලැබෙනවා. ඒ වාගේම මේ පරිභෝජන රටාව වෙනස් කරන්න නම් ඒ සඳහා අපි පාරිභෝගිකයින්ට කිසියම් විධියක පෙළඹවීමක් ඇති කරන්න ඕනෑ. සමහර රටවල් dynamic tariff - time-of-use tariff - කියන එක පාවිච්චි කරනවා. කාලය මත පදනම්ව දහවල් කාලයේ එක tariff එකකුත්, රාත්‍රි කාලයේ තවත් tariff එකකුත් විධියට. නමුත්, අපි එතැනට යන්න තව බොහෝ දත්ත විශ්ලේෂණය කරන්න ඕනෑ.

දැනට විදුලි ඒකක 180ට වඩා වැඩියෙන් භාවිත කරන ගෘහස්ථ පාරිභෝගිකයින් 380,833ක් සිටිනවා. මේ දත්ත විශ්ලේෂණය කිරීම සඳහා අවශ්‍ය වන පහසුකම් සැපයීමේදී අපි බලාපොරොත්තු වනවා, වහල මත සවිකර තිබෙන සූර්ය බලාගාර 39,000ක් වාගේ ප්‍රමාණයකට smart meters සවි කරන්න. මේ ගැන අපි ADB එකත් එක්ක සාකච්ඡා කරමින් යනවා, මිලියන 10ක ප්‍රමාණයක් ඔවුන්ගෙන් ලබා ගන්න. තවත් මිලියන 7ක්, 8ක් අපට අවශ්‍ය වෙයි කියලා අපි හිතනවා. රජයේ අරමුදල් භාවිත කරලා හෝ මේ ටික කර ගන්න අපි බලාපොරොත්තු වනවා. අපට දුරස්ථ මීටර් කියවීම ඇතුළු වෙනත් පහසුකම් රැසක් මේ smart meters සවි කිරීම හරහා ලබා ගන්න පුළුවන්. මම කලින් සඳහන් කළා වාගේ, රාත්‍රි කාලයේ පරිභෝජනය කරන විදුලියෙන් කොටසක් දහවල් කාලයේදී පරිභෝජනය කිරීමට පාරිභෝගිකයන් පෙළඹවීම සඳහා අවශ්‍ය වන දත්ත විශ්ලේෂණය කරන්න, අවශ්‍ය වන දත්ත එක්රැස් කරන්න අපට හැකියාව ලැබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒ විතරක් නොවෙයි. අපේ රටේ විදුලිබල පද්ධතියේ තිබෙන ඊළඟ ප්‍රශ්නය මෙයයි. සූර්ය බලයෙන් නිපදවන විදුලිය අපේ ජාතික විදුලිබල පද්ධතියට එකතු කරනකොට පද්ධතියේ ස්ථායිතාව පවත්වා ගැනීම සඳහා kinetic energyවලින් එන ප්‍රමාණය තත්පරයට මෙගාවොට් 8,000ක අගයක තබාගන්න ඕනෑ. නමුත් පුනර්ජනනීය බලශක්තියෙන් එනකොට ඒ ප්‍රමාණය මෙගාවොට් 6,000ට වඩා අඩු වන අවස්ථාත් තිබෙනවා. ඒ වාගේ අවස්ථාවක පද්ධතියේ ස්ථායිතාව පවත්වාගෙන යෑම බරපතළ ගැටලුවක් වනවා. ඒ වාගේ අවස්ථාවකදී ඒ සඳහා විකල්ප ක්‍රියාමාර්ග ගන්න ඕනෑ. එතකොට වාලක ශක්තියෙන් එන ඒ අතිරේක අවස්ථිතිය ලබා දීම සඳහා සමහර බලාගාරවල අපට කටයුතු කරන්න පුළුවන්. උදාහරණයක් හැටියට ගත්තොත්, නව ලක්ෂපාන බලාගාරයේ දැනටමත් ඒ සඳහා පහසුකම් තිබෙනවා. නමුත් ඊළඟ අදියර හැටියට කරන්න තිබුණු උමා ඔය බලාගාරයට අදාළව ඒ සඳහා පියවර අරගෙන තිබුණේ නැහැ. ඒ වාගේම කැලණිතිස්ස බලාගාරයේ ඒ සඳහා වන GK machines දෙකක් තිබෙනවා. හැබැයි ඒවා අක්‍රිය වෙලා තිබෙන්නේ. නමුත් අපි බලපොරොත්තු වනවා, ඒ වාගේ බලාගාරවල අතිරේක අවස්ථිතිය, kinetic energy ලබා දීම සඳහා additional inertia generators භාවිත කරන්න. ඒ සඳහා ජලය හෝ ඉන්ධන භාවිත කරන්න අපි බලාපොරොත්තු වන්නේ නැහැ. නමුත් ඒ හරහා අපට පද්ධතියේ ස්ථායිතාව පවත්වාගෙන යෑම සඳහා අවශ්‍ය වන අතිරේක inertia එක ලබා ගන්න පුළුවන්.

හුදෙක් සූර්ය බලාගාර, සුළං බලාගාර කිය කියා ඉන්නේ නැතුව ඒවා පද්ධතියට ස්ථායී ලෙස ඇතුළත් කර ගැනීමට අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමත් එක්ක 2030 වර්ෂය වනකොට අපට වහල මත තිබෙන සූර්ය පැනලවලින් මෙගාවොට් 3,000ක් වාගේම grid එකට connect වෙච්ච solar panels හරහා මෙගාවොට් 1,102ක්, සුළං බලය හරහා මෙගාවොට් 527ක්, mini-hydro plantsවලින් මෙගාවොට් 515ක්, ඒ වාගේම Battery Energy Storage System - BESS - එක හරහා මෙගාවොට් 1,200ක් හා floating solar panels හරහා මෙගාවොට් 570ක් ලබා ගැනීම සඳහා අවස්ථාව හැදෙනවා. මෙන්න මේ අවස්ථා හැදෙනවාත් එක්කම, මෙන්න මේ පුනර්ජනනීය බලශක්ති ක්ෂේත්‍රයට යොමු වීමත් එක්කම අපට පුළුවන්කම තිබෙනවා, පොසිල ඉන්ධන සඳහා යන ජනන වියදම අඩු කර ගැනීමෙන් අපේ සම්පූර්ණ ජනන මිශ්‍රණයේ වියදම අවම කර ගන්න. ඒ අනුව ඒකේ වාසිය පාරිභෝගිකයාට ලබා දීම සඳහා අපට අවස්ථාව හැදෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, පුනර්ජනනීය බලශක්ති විදුලි බලාගාරවලින් පද්ධතියට විදුලි බලය එකතු කර ගන්නවා කියන එක පැයෙන් දෙකෙන්, දවසෙන් දෙකෙන් කරන්න බැහැ. නමුත් ඉදිරි වර්ෂ තුන හතර සඳහා ඒ සම්බන්ධයෙන් වන සැලැස්මක් අපට තිබෙනවා. ඒ සැලැස්ම අනුව අපි කටයුතු කරමින් ඉන්නවා. ඒ හරහා අඛණ්ඩ විදුලි සැපයුමක්, ස්ථායී විදුලි සැපයුමක් ලබා දෙන්න, ඒ වාගේම විදුලි පාරිභෝගිකයාට සාධාරණ විදුලි සැපයුමක් ලබා දෙන්න අපි කටයුතු කරනවා.

බොහොම ස්තුතියි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඒ අනුව අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 01 යථා පරිදි සම්මත වූ බව ප්‍රකාශ කරමි.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
Madam, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු ඇමතිතුමනි, ඔබතුමාව නොමඟ යවලා තිබෙනවා, යම් නිලධාරින් විසින්. කොළොන්නාව බැටරි ටෙන්ඩර් එකට අදාළව තමයි Chinese සමාගම අයින් වෙලා තිබෙන්නේ. ඒ ගැන හොයා බලන්න කියලා ඔබතුමාගෙන් මා ඉල්ලා සිටිනවා.

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)
කොළොන්නාවේ එක වෙන එකක්.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා, සභාවේ අවසරය ඇතුව නියෝග ඉදිරිපත් කිරීම.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද දින පැවති පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේ දී එළඹි තීරණය ප්‍රකාරව, සභාවේ විශේෂ අවසරය ඇතිව මා පහත සඳහන් නියෝග ඉදිරිපත් කරමි.

(i) 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ 82 වගන්තිය සහ 92 වගන්තිය සමඟ කියවිය යුතු 156 වගන්තිය යටතේ, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විමසා, අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2026 මාර්තු 30 දිනැති අංක 2482/03 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග; සහ

(ii) 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ 80(1) වගන්තියේ (ඉ) ඡේදය සමඟ කියවිය යුතු 156 වගන්තිය යටතේ, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විමසා, අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2026 මාර්තු 30 දිනැති අංක 2482/04 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග.

මෙම නියෝග අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද දවල් පැවති පක්ෂ නායක රැස්වීමේදී වත්කම් සහ බැරකම් ප්‍රකාශ ඉලෙක්ට්‍රොනික පද්ධතිය හරහා ලබා දීම සම්බන්ධයෙන් වන නියෝගය න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමට අපේ එකඟතාව පළ කළා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම විශේෂයෙන්ම මේ කාරණයත් කියන්න කැමැතියි. එම රැස්වීමේදී අපි පෙන්වා දුන් පරිදි වත්කම් සහ බැරකම් ප්‍රකාශ සම්බන්ධයෙන් මෙතෙක් පැවති විවෘතභාවයත්, මහජනතාවට එම තොරතුරුවලට ප්‍රවේශ වීමට තිබුණු හැකියාවත් එලෙසම ඉදිරියටත් පැවතිය යුතුය යන ස්ථාවරය මත රජය කටයුතු කළ යුතුය යන එකඟතාව ඇතිව තමයි අපි අද දින මෙම නියෝගය ඉදිරිපත් කිරීමට එකඟතාව පළ කළේ කියන එක සභාවේ දැනගැනීම සඳහා මම ප්‍රකාශ කරනවා.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි,-

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
අපි පස් වරු 2.30 වනකොට ප්‍රධාන වැඩකටයුතු අවසන් කරන්න ඕනෑ.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
මම ඒකට එකඟයි. මට තත්පර කීපයක් ලබා දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

මම පොරොන්දු වූ පරිදි මේ සම්පූර්ණ එක බැලුවා. ඔබතුමා ඉදිරිපත් කරන ලද කාරණාව මේ Regulationsවල නැහැ. ඒක වෙනත් ස්ථානයක ඇති. අපි ඒ ගැන වෙනම හොයා බලමු. නමුත් මේ Regulationsවල ඒ කාරණාව නැති බව මම කියන්න ඕනෑ.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
සභාව කල්තැබීම, ගරු නලින්ද ජයතිස්ස අමාත්‍යතුමා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඉස්සෙල්ලාම විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාට ස්තුතිවන්ත වෙනවා ඒ ලබා දුන් සහයෝගය වෙනුවෙන්.

# කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
2026.06.25 දින සභාව කල්තැබීමේ විවාදය තවදුරටත් පැවැත්වීම, ගරු ජේ.සී. අලවතුවල මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

Order, please! ඊට පෙර, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු චානක මාදුගොඩ මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, "ගරු චානක මාදුගොඩ මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු චානක මාදුගොඩ මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சானக மாதுகொட அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES left the Chair, and THE HON. CHANAKA MADUGODA took the Chair.*

# මත්ද්‍රව්‍ය උවදුරට එරෙහිව සටන් කිරීම
## போதைப்பொருள் அச்சுறுத்தலை எதிர்த்துப் போராடுதல்
## COMBATTING THE DRUG MENACE

[අ.භා. 2.31]

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සභාව කල්තැබීමේ යෝජනාව අනුව අපි කවුරුත් දන්නවා, මේ වනකොට අපේ රටේ අනාගත පරපුර මත්ද්‍රව්‍ය උවදුරට ගොදුරු වෙලා තිබෙන බව. ළමා හා කාන්තා කාර්යාංශය භාරව ඉන්න ඇමතිතුමිය කියනවා මම අහගෙන හිටියා, මේ වනකොට එන්න එන්නම මත්ද්‍රව්‍ය උවදුරට අපේ දරුවන්ගේ ඇබ්බැහි වීම ඉතා ශීඝ්‍රයෙන් ඉහළ ගිහිල්ලා තිබෙනවා කියලා. විශේෂයෙන්ම පාසල් ආශ්‍රිතව ඒ තත්ත්වය දකින්නට ලැබෙනවා.

දිගින් දිගටම පත් වන හැම රජයක්ම මේ සම්බන්ධයෙන් නොයෙකුත් ක්‍රියාමාර්ග අරගෙන තිබෙන බව අපි දකිනවා. ඒ පිළිබඳ මෙහෙයුම් හැමදාම සිදු වන බවත් අපි දකිනවා. තමුන්නාන්සේලාත් බලයට ඇවිල්ලා මේ වනකොට වසර එක හමාරකට වැඩි කාලයක් ගත වෙලා තිබෙනවා. ඒ කාලය තුළ මත්ද්‍රව්‍ය භාවිතය වැළැක්වීම සඳහා ක්‍රියාමාර්ග විශාල ප්‍රමාණයක් අරගෙන තිබෙනවා. ඒ වාගේම අපි මාධ්‍ය තුළින් දකිනවා, නිරන්තරයෙන්ම මත්ද්‍රව්‍ය වැටලීම් සිදු කරන බව. හැබැයි, ඒ මොන දේ කළත් මත්ද්‍රව්‍ය පාවිච්චි කරන, ඒවාට ඇබ්බැහි වන පිරිසේ අඩුවක් නම් දකින්න ලැබෙන්නේ නැහැ. ඒක තමයි තිබෙන විශාලම ගැටලුව. මත්ද්‍රව්‍ය වැටලීම් කිරීමේදී තොග ගණන්, කිලෝ ගණන් මත්ද්‍රව්‍ය අහු වුණාට ඒවා භාවිත කරන පිරිස එහෙම නැත්නම් මේකට අලුතින් එකතු වන පිරිස අඩු වෙලා තිබෙනවාය කියන වාර්තාවක් පිළිබඳව අපට කිසිම තැනකදී අහන්න ලැබෙන්නේ නැහැ. මේක ඉතා අවාසනාවන්ත තත්ත්වයක් හැටියට තමයි අපි දකින්නේ. මොකද, අද වනකොට නාගරිකව විතරක් නොවෙයි ග්‍රාමීය මට්ටමේ පාසල් ආශ්‍රිතව ගත්තාමත්, පාසල් දරුවනුත් විශාල ප්‍රමාණයක් මේ මත්ද්‍රව්‍ය භාවිතයට ඇබ්බැහි වෙලා තිබෙනවා. ඒක සමාජයේ විශාල ගැටලුවක් බවටත් පත් වෙලා තිබෙනවා. ඒ නිසා අපි රජයට කියන්න කැමැතියි, මත්ද්‍රව්‍ය උවදුර තුරන් කිරීම සඳහා විපක්ෂය හැටියට අපේ සහයෝගය ඕනෑම අවස්ථාවකදී සියයට සියයක්ම ලබා දෙන්න ලැස්තියි කියන එක.

විශේෂයෙන්ම මේ වනකොට රට තුළ විශාල ගැටලු ගණනාවක් පැන නැඟිලා තිබෙනවා. ගොඩක් වෙලාවට අපට පෙනෙනවා, මත්ද්‍රව්‍ය සමඟ දරිද්‍රතාවත් - දුප්පත්කමත් - යම් ප්‍රමාණයකට නොවෙයි, වැඩි ප්‍රමාණයකින් සම්බන්ධ වෙලා තිබෙන බව. මොකද, මත්ද්‍රව්‍ය ව්‍යාපාරයට සම්බන්ධ වෙලා ඉන්න පහළ මට්ටමේ අය දිහා බැලුවාම පෙනෙනවා, ඒ අයගේ ආර්ථික තත්ත්වය, දරිද්‍රතාව මේකත් සමඟ සම්පූර්ණයෙන්ම එකතු වෙලා තිබෙන බව.

මේ වනකොට අපි දන්නවා, දුප්පත්කම එන්න එන්නම වැඩි වෙලා තිබෙන බව. විශේෂයෙන්ම අලුතින් ලැබුණු වාර්තා අනුව මේ වනකොට අපේ රටේ ජනගහනයෙන් සියයට 30ක් විතර ඉතාම අමාරුවෙන් ජීවත් වන කණ්ඩායමක් බවට පත් වෙලා තිබෙනවා. මෙන්න මේ තත්ත්වයත් මේ මත් උවදුර ශීඝ්‍රයෙන් වර්ධනය වෙන්න බලපානවා. මොකද, ජීවත් වෙන්න බැරි වුණාම ඔවුන් මෙවැනි ක්‍රියාවලට යොමු වෙලා තිබෙනවා. අපි දන්නවා, ගොඩක් කාන්තාවන් මේවාට සම්බන්ධ වෙලා ඉන්න බව. උසාවියට ගිහිල්ලා බැලුවාමත් පෙනෙනවා, අද වනකොට උසාවිවල නඩු වැඩි ප්‍රමාණයක් තිබෙන්නේ මේ මත්ද්‍රව්‍ය හා සම්බන්ධ කාරණාවලට බව. මෙහිදී අපට පෙනෙනවා, කාන්තාවන් විශාල ප්‍රමාණයක් මේවාට සම්බන්ධ වෙලා ඉන්නවා කියලා. ඔවුන් මේ මත්ද්‍රව්‍ය බෙදා හැරීමේ ජාලවලට සම්බන්ධ වෙලා ඉන්නවා. ඒ නිසා දුප්පත්කමත් එක්ක මේ මත්ද්‍රව්‍ය බෙදා හැරීමේ ව්‍යාපාරය තුළ සිටින අයගේ විශාල සම්බන්ධයක් තිබෙනවාය කියන එක මම පැහැදිලිවම කියන්න ඕනෑ. මොකද, දරිද්‍රතාවේ ඉන්න පිරිස සම්බන්ධ කර ගෙන තමයි මේ ව්‍යාපාරය ගෙනියන්නේ කියන එක පැහැදිලියි. ඒ නිසා දුප්පත්කමත් මේ මත්ද්‍රව්‍ය ව්‍යාප්ත වීමට බලපා තිබෙනවා.

විශේෂයෙන්ම මම කියන්න ඕනෑ, මේ වනකොට රටේ භාණ්ඩ මිල වැඩි වෙලා තිබෙන බව. මේ රටේ හැම අංශයකම රැකියා කරන ජනතාව ගත්තොත්, පෞද්ගලික අංශයේ, රාජ්‍ය අංශයේ වාගේම එදිනෙදා වැඩ කරන මේ රටේ බහුතර ජනතාවට අද

එදිනෙදා ජීවිතය ගත කරන්න බැරි තැනකට පත් වෙලා තිබෙනවා. ඒකට හේතුව මේකයි. 2019, 2020 කාලයේ - මීට අවුරුදු 5, 6කට ඉස්සෙල්ලා - මිලදී ගත්ත භාණ්ඩ ප්‍රමාණය ගන්න අද වනකොට ඒ වාගේ දෙගුණයක, තුන් ගුණයක මුදල් අවශ්‍ය වනවා. ඒක හැම අංශයකම දකින්න ලැබෙනවා. ඉන්ධන බිල, විදුලි බිල, වතුර බිල වාගේම තමන් එදිනෙදා කන බොන දේවල් දිහා බැලුවත් ඒ තත්ත්වය තමයි දකින්න ලැබෙන්නේ.

අපේ ප්‍රධාන ආහාරය බත්. හාල් කිලෝවක මිල මේ වසර කිහිපය තුළ කොහොමද වෙනස් වෙලා තිබෙන්නේ කියලා තමුන්නාන්සේලාට බලා ගන්න පුළුවන්. 2019 අවුරුද්දත් එක්ක උදාහරණයට ගත්තොත් ජනතාවගේ ආදායම් මාර්ග මොකක්වත් වැඩි වෙලා නැහැ. ඒ කියන්නේ සියයට 150කින්, සියයට 200කින් මේ අවුරුදු කිහිපය තුළ බඩු මිල වැඩි වනකොට කාගේවත් පඩිය ඒ ප්‍රමාණයට වැඩි වෙලා නැහැ. ආදායම් මාර්ග වැඩි නොවී ජීවන බර විතරක් වැඩි වීම නිසා අද වනකොට ජනතාව ඉතාම පීඩාවකට පත් වෙලා තිබෙනවා. මොන ක්ෂේත්‍රයක වුණත් මේ තත්ත්වය දකින්න ලැබෙනවා. මෙන්න මේ කාරණාත් විශාල වශයෙන් බලපානවා, මේ මත්ද්‍රව්‍ය ව්‍යාප්තිය වැඩි වීමට. මොකද, දුප්පත්කම වැඩි වනකොට සමහර උදවිය මෙවැනි ව්‍යාපාරවලට යොමු කර ගන්න අවස්ථාව ලැබිලා තිබෙනවා. ඔවුන් මොන ක්‍රමයෙන් හරි ජීවත් වෙන්න බලනවා. මෙවැනි ව්‍යාපාරවලට ගොඩක් එකතු වෙන්නේ එවැනි දරිද්‍රතාවේ ඉන්න පිරිස්. එවැනි කොටස් තමයි ඒවාට හවුල් කර ගන්නේ කියන එක බොහොම පැහැදිලියි.

ළමා කටයුතු භාරව ඉන්න ඇමතිතුමිය මාධ්‍යයට කියලා තිබෙනවා මම දැක්කා, එන්න එන්නම මේ වනකොට දරුවන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය විශාල ප්‍රමාණයකින් වැඩි වෙලා තිබෙනවා කියලා. රජයක් හැටියට අද වනකොට තමුන්නාන්සේලාට වගකීමක් තිබෙනවා, මත්ද්‍රව්‍ය මර්දනය කිරීම වෙනුවෙන් ඒවා අල්ලනවා වාගේම, ජනතාවගේ මෙන්න මේ දැවෙන ප්‍රශ්නවලටත් විසඳුම් ලබා දෙන්නට. ජනතාව ජීවත් කරවීමේ මාර්ගයකට අවශ්‍ය වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න.

තමුන්නාන්සේලා බලයට පත් වෙනකොට ජනතාවට පොරොන්දු ගණනාවක් දුන්නා. දැන් මේ කථා කරන මන්ත්‍රීවරු බොහෝ දෙනෙක් කියනවා, "අපි ජනතාවාදී ආණ්ඩුවක්" කියලා. හැබැයි, ජනතාවාදී ආණ්ඩුවක් නම් ජනතාව ජීවත් කරවන ප්‍රධාන ක්‍රියාවලියක් ලෙස ජනතාවගේ ජීවන බර අඩු කරන්න අවශ්‍ය පියවර තමුන්නාන්සේලා ගන්න ඕනෑ. අපි ඉන්ධන මිල උදාහරණයකට ගත්තොත්, යුද්ධයත් එක්ක ඉන්ධන මිල වැඩි වුණා කියලා තමුන්නාන්සේලා කිව්වා. එදා ජනාධිපතිතුමාත් මෙතැනට ඇවිල්ලා කථා කරපු වෙලාවේ "අපට ඉන්ධන අවශ්‍ය ප්‍රමාණය තිබෙනවා" කිව්වා. ඇමතිවරුත් කිව්වා. නමුත්, යුද්ධය ආරම්භ කර දින දෙක තුනක් ඇතුළත ඉන්ධන මිල වැඩි කළා. දැන් යුද්ධය අවසන් වෙලා තිබෙනවා. දැන් ලෝක වෙළෙඳ පොළේ බොර තෙල් මිල අඩුවෙලා තිබෙනවා. හැබැයි, තමුන්නාන්සේලාට බැරි වුණා තවම ඉන්ධන මිල අඩු කරන්න. නමුත්, මේ වෙනකොට අපේ අසල්වැසි රටවල ඉන්ධන මිල අඩු කර තිබෙනවා. ඒත් අපි වාගේම ප්‍රශ්න තිබෙන රටවල්. පාකිස්තානය මේ වනකොට ඉන්ධන මිල අඩු කර තිබෙනවා. රටවල් ගණනාවක් ජනතාවට ඒ සහනය දීලා තිබෙනවා. හැබැයි, තමුන්නාන්සේලාට අද ඒවා කරන්න බැරි වෙලා තිබෙනවා.

මට මතකයි, යහපාලන රජයේ අවසන් කාලයේ - 2019දී - අපි මිල සූත්‍රය ගෙනාපු වෙලාවේ වර්තමාන ජනාධිපතිතුමා මෙතැන ඉඳලා කිව්වා, "ආණ්ඩුවක් ඕනෑද මෙවැනි මිල සූත්‍රයක් ගෙනෙන්න නම්" කියලා. ලෝක වෙළෙඳ පොළේ ඉන්ධන මිල අඩු වෙනකොට මිල අඩු කරන්නත්, වැඩි වෙනකොට මිල වැඩි කරන්නත්, ජනතාවට ඒ වාසිය යන්නත් අවශ්‍ය විධියට තමයි ඒ මිල සූත්‍රය ගෙනාවේ. නමුත්, අද තමුන්නාන්සේලා ඒ වාසිය ජනතාවට දෙන්නේ නැහැ. මේ වෙනකොට ඉන්ධන මිල විතරක් නොවෙයි, විදුලි ගාස්තුව අඩු කරනවා කියලා බලයට ආපු තමුන්නාන්සේලා විදුලි ගාස්තුව වැඩි කරලා තිබෙනවා; තවත් වැඩි කරන්න යනවා. මේ තත්ත්වය තුළ රටේ ජනතාව දැන් ඉතාම අමාරු තැනකට වැටිලා තිබෙනවා. මම අර කියපු හැම ක්ෂේත්‍රයකම ජනතාව -රාජ්‍ය සේවකයා ද, පෞද්ගලික අංශයේ සේවකයා ද, කම්කරුවා ද, ගොවියා ද - අද ඉතාම අමාරු තැනකට වැටිලා තිබෙනවා එදිනෙදා ජීවිතය ගත කරන්න බැරිව. මේක කොච්චර අමාරු තත්ත්වයකට පත්වෙලා තිබෙනවාද කිව්වොත්, අද ග්‍රාමීය මට්ටමේ, නාගරික මට්ටමේ පහළ ආදායම් ලබන බොහෝ දෙනෙකුට තුන්වේල කන්න බැරි තැනට පත්වෙලා තිබෙනවා. දෙවේලක් කන්නත් අමාරු කණ්ඩායමක් ඉන්නවා. තමුන්නාන්සේලා මෙන්න මේ සඳහා අවශ්‍ය පියවර ගන්නේ නැතිව කටයුතු කිරීම නිසා මේ පීඩනය වැඩි වෙනවා. මේ ජනතාවට ජීවත් වෙන්න බැරිකම එන්න එන්නම, දවසින් දවස වැඩිවෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)
මට තව තත්පර කිහිපයක් ලබා දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ නිසා මත්ද්‍රව්‍ය ගැන කථා කිරීමේදී ඒ හැම එකකටම දුප්පත්කම, දරිද්‍රතාව බලපානවා නම්, තමුන්නාන්සේලා රටේ ජනතාව ජීවත් කරවන වැඩ පිළිවෙළක් හදන්න කියලා අපි ආණ්ඩුවෙන් ඉල්ලා සිටිනවා. ජනතාවාදී ආණ්ඩුවක් නම් මුලින්ම කරන්න ඕනෑ ඒ දෙයයි. නමුත්, ජනතාව ගැන කිසිම හැඟීමක් නැතිව වැඩ කරන ආණ්ඩුවක් හැටියට තමයි වර්තමාන ආණ්ඩුව අපට පෙනෙන්නේ. ඒ නිසා රජයට අපි පැහැදිලිවම කියනවා, ජනතාවට ජීවත් වෙන්න පුළුවන් වැඩ පිළිවෙළක්, ජීවන බර අඩු කරන වැඩ පිළිවෙළක් හදන්න කියලා. මේ වෙනකොට උද්ධමනය සියයට 7න් එහාට ගිහින් තිබෙනවා. ඒක අඩු කරන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න කියා මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සුනිල් වටගල නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.43]

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Sunil Watagala, Attorney-at-Law - Deputy Minister of Public Security and Parliamentary Affairs)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂයේ අපේ ගරු අලවතුවල මන්ත්‍රීතුමා කියපු කාරණා සමඟ ගැටුමක් නැහැ. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියපු ගොඩක් කරුණු සත්‍යයයි. අපි පිළිගන්නවා, දුප්පත්කමත් මේකට හේතුවක් කියලා. අපි

[ගරු නීතිඥ සුනිල් වටගල මහතා]

ආණ්ඩුවක් ලෙස එය හඳුනාගෙන, ඊට අදාළ සංවර්ධන සැලසුම් ගණනාවක් ග්‍රාමීය දුප්පත්භාවය තුරන් කිරීම වෙනුවෙන් යෝජනා කර තිබෙනවා. විශේෂයෙන්ම "ප්‍රජාශක්ති" වැඩසටහන කියන්නේ ගමේ දුප්පත්කම දුරු කරන ඊට අදාළ ප්‍රවේශයක්ය කියන කාරණාව මතක් කරමින්, මේ වෙලාවේ මම අදාළ කාරණාවට ප්‍රවේශ වෙන්නම්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ලෝක මත්ද්‍රව්‍ය භාවිතයට සහ ජාවාරමට එරෙහි ජාත්‍යන්තර දිනයයි. අද වැදගත් දිනයක්. අද මේ විවාදය ඇවිල්ලා තිබෙන්නේ ඉතා තීරණාත්මක තැනකට. අද මේ විවාදයේ දෙවැනි දිනය. මේ විවාදයේ දෙවැනි දිනයේ, මතින් තොර රටක් නිර්මාණය කිරීම වෙනුවෙන් අපි දීපු පොරොන්දුව මොනතරම් දුරට එලගැන්වීමක් වෙලාද කියන කාරණාව බලන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතැනදී මම සූත්‍රයක් ඔබතුමාට ඉදිරිපත් කරන්නම්. ඒ තමයි, "දේශපාලනය + විෂ මත්ද්‍රව්‍ය + පාතාලය". ඕනෑ නම් කෙනෙකුට කියන්න පුළුවන්, "දේශපාලනය = විෂ මත්ද්‍රව්‍ය + පාතාලය" කියලා. ඔය ඕනෑම සූත්‍රයක් දමා ගන්න පුළුවන්. හැබැයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි සතුටින් කියන්න ඕනෑ, මේ ගෙවුණු අවුරුද්දයි මාස කිහිපය ඇතුළේ, අපි මේ දේශපාලනය නැමැති සාධකය, මත්ද්‍රව්‍යවලටත්, පාතාලයටත් අදාළ කාරණාව, ආණ්ඩුවක් ලෙස පැත්තකින් තියලා, විතැන් කරලා තිබෙනවාය කියන එක. ඒක ජයග්‍රහණයක්. ඒ වාගේම තමයි, 159වැනි පොලිස් දිනය වෙනකොට අපට පුළුවන් වුණා, ජාත්‍යන්තර මත්ද්‍රව්‍ය සැපයුම් ජාලයේ සිටින දැවැන්ත ජාවාරම්කරුවන් ප්‍රමාණයක් ඉන්දුනීසියාව, නේපාලය හා පාකිස්තානය වැනි රටවලින් මේ රටට අරගෙන ඇවිල්ලා අදාළ නීතිමය ක්‍රියාමාර්ග ගන්න.

ඒ වාගේම, අද 36වැනි ජාත්‍යන්තර මත් විරෝධී දිනය. අද අපේ විෂය භාර අමාත්‍යතුමා මේ වෙලාවේ පෙනෙන්න නැහැ. ඒ ඇයි? එතුමා සුවිශේෂ කටයුත්තකට මේ වෙලාවේ ගිහිල්ලා ඉන්නේ. ඒ කටයුත්ත තමයි, "රටම එකට" ජාතික මෙහෙයුමේ මෙහෙයුම් මධ්‍යස්ථානයක් අපි අද පස්වරු 2.00ට විවෘත කළා. කොහේද දන්නවාද? හිටපු අමාත්‍යවරයෙකුගේ නිල නිවසේ. ඒක අපි දීපු දේශපාලන පොරොන්දුවක්. අද සරත් ෆොන්සේකා හිටපු අමාත්‍යතුමාගේ නිවසේ ඒ කටයුත්ත වෙනවා. ඒ විතරක් නොවෙයි, අපි මේ වෙනකොට ශෙහාන් සේමසිංහ හිටපු රාජ්‍ය ඇමතිතුමා සිටි නිවස CID එකට අරගෙන තිබෙනවා. ඒ වාගේම, මහාධිකරණ හයක් අමාත්‍ය නිල නිවාසවල පිහිටුවා තිබෙනවා. ඒවා අරගෙන අපි ජනතා අභිලාෂය, අපි දීපු දේශපාලන පොරොන්දුව ඒ විධියටම ඒ ආකාරයෙන්ම පවත්වා ගෙන යනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මේ සංවාදය ඇතුළේ ඊයේ සෑහෙන්න කියැවුණා, දේශපාලන පළිගැනීමක් පිළිබඳව. වර්තමාන ආණ්ඩුව සලේ හරහා ලොකු දේශපාලන දඩයමක්, දේශපාලන පළිගැනීමක් සිද්ධ කරනවා කියන කාරණාව කියැවුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි කාරණාවක් විධියට කියනවා, සලේ අත් අඩංගුවට ගැනීම නීත්‍යානුකූලයි, සලේ රඳවා තබා ගැනීම නීත්‍යානුකූලයි, සලේගෙන් ප්‍රශ්න කිරීම නීත්‍යානුකූලයි කියලා. ඉතින්, ඒ විධියට නීත්‍යානුකූල වපසරියක් ඇතුළේ මෙය කරගෙන යනකොට, සලේගේ බිරිඳ, එහෙම නැත්නම් දරුවා මෙහෙයවමින් මේ කරන ප්‍රකාශ සහ හිටිගමන් දින 90කට පස්සේ සලේ උපවාසයක් ආරම්භ කිරීම හරහා ජන මනසේ සැකයක් ඇති කළා. ඊට පස්සේ ඒ සැකය තවදුරටත් තීව්‍ර කළා, අනාථ දේශපාලන කල්ලි. ඒගොල්ලෝ බැලුවා, තමන්ට නැති වෙච්ච ජන වරම, තමන්ට අහිමි වූ ජන වරම මේ ආකාරයෙන් හරි දිනා ගන්න පුළුවන් දැයි කියලා. "රණවිරුවා, රණවිරුවා" කියලා ඔහු වටේ පොර බදලා, ඔහු සම්බන්ධ සටනක් හදලා, ඒ සටන කුජීත කළා. ඒකෙන් මොකක්ද වුණේ? සලේ නැමැති සැකකරුවා මෙවැනි කාරණාවකට සම්බන්ධ දැයි කියන කාරණාව වඩාත් තහවුරු කරමින් ඉන්නවා, මේ කුජීත කල්ලි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කියන්නේ දැනුත් සලේට පුළුවන්, නිදොස් කොට නිදහස් වෙන්න. හැබැයි, එක කොන්දේසියකට යටත්ව. ඒ මොකක්ද? වරදක් කරලා නැත්නම් නිදොස් කොට නිදහස් වෙන්න පුළුවන්. ඒක තමයි ක්‍රමය. මා හිතන්නේ, මේ අනාථ කල්ලි සලේ අනාථ කළා. ඒක තමයි වුණේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දේශපාලන පළිගැනීම් කියන කාරණාව ගැන ඕනෑ නම් අපි ඔබතුමාට විස්තර කරන්නම්. දේශපාලන පළිගැනීම් කියන ඒවා අපි ද කරන්නේ? නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේ සියලු සාධනීය කරුණු කාරණා ඉෂ්ට කරන්නේ මේ ආණ්ඩුව ඇවිත් ගත වුණු අවුරුද්දයි මාස කිහිපය තුළයි. මේ රටේ මහජන දේපොළ මංකොල්ල කාපු, ඒවා අවභාවිත කරපු අයට නීත්‍යානුකූල ක්‍රමය ක්‍රියාත්මක වෙලා, ගරු අධිකරණ මඟින් දෙන නියෝග මත පදනම්ව දැන් දඬුවම් දෙමින් තිබෙනවා. ඒක දේශපාලන පළිගැනීමක් වෙන්නේ නැහැ. හැබැයි අපි දැක්කා පසුගිය ආණ්ඩුවලින් කළ දේශපාලන පළිගැනීම්.

2010 ජනවාරි 26වන දා තමයි සරත් ෆොන්සේකා මැතිතුමායි, මහින්ද රාජපක්ෂයි ජනාධිපතිවරණයට තරග කළේ. 2010 පෙබරවාරි 08වන දා සරත් ෆොන්සේකා මහත්මයා අත්අඩංගුවට ගත්තා. ඊනියා යුද අධිකරණයට දාලා එතුමා මාස 30ක් බන්ධනාගාරගත කර තිබුණා. අන්න පළිගැනීම්. පළිගැනීම් ගැන දැනගන්න ඕනෑ නම්, අන්න ඒ විස්තර බලන්න. ශිරානි බණ්ඩාරනායක මහත්මිය තමන්ගේ පවුලට අදාළව පක්ෂපාතී තීන්දුවක් දුන්නේ නැහැ කියලා අග්‍ර විනිශ්චයකාර ධුරයෙන් නෙරපා හැරියා. අන්න දේශපාලන පළිගැනීම්. ඒවා තමයි සැබෑ දේශපාලන පළිගැනීම් කියන්නේ. ආණ්ඩුවක් ආ විගස ඒගොල්ලෝ ඒ පළිගැනීම් කළා. ඒක තමයි දේශපාලන සංස්කෘතිය වෙලා තිබුණේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හැබැයි අපේ ආණ්ඩුව ඒ සංස්කෘතිය අනුගමනය කළේ නැහැ. අපි නීත්‍යානුකූල ක්‍රමයයි අනුගමනය කළේ.

දෙවන ලෝක යුද්ධයේදී හිට්ලර්ට හිටියා "එස්.එස්." හමුදාවක්. පසුගිය ආණ්ඩු කාලවලත් එහෙම "එස්.එස්." හමුදා - නීති විරෝධී කල්ලි - හදාගෙන හිටියා. ඒ කාලවල රට පාලනය කළේ කැබිනට් මණ්ඩලයවත්, මේ පාර්ලිමේන්තුවවත් නොවෙයි. ජනාධිපතිවරයා සහ ජනාධිපතිවරයා වටේ හිටපු කල්ලියක් තමයි රට පාලනය කළේ. ඒක තමයි ඇත්ත කථාව.

පාස්කු ඉරුදින ප්‍රහාරයේ විමර්ශන කරගෙන යද්දී අපි දැන් බලන්න ඕනෑ පාස්කු ප්‍රහාරයට අදාළ පාර්ශ්වකරුවන්, ඊට අදාළ සැකකරුවන්, අත් උදවුකරුවන් එක්නැලිගොඩ පැහැරගෙන යෑමට ඇත්ත වශයෙන්ම සම්බන්ධද කියලා. ඒවා කළේ එකම කල්ලියක්ද, කල්ලි ගණනාවක්ද කියන කාරණය පරීක්ෂණයට ලක් කරන්න ඕනෑ. එක්නැලිගොඩ පැහැරගෙන යෑම, පෝද්දල ජයන්තට පහර දීම, "සිරස" මාධ්‍ය ආයතනයට ගිනි තැබීම, තාජුඩීන් ඝාතනය, ලසන්ත වික්‍රමතුංග ඝාතනය කියන මේ අපරාධවලට අර ත්‍රාඩ කල්ලිය සම්බන්ධ ද කියලා බලන්න ඕනෑ. මේ ඝාතන රැල්ල පිටුපස ඒ කල්ලිය ඉන්නවාද කියලා බලන්න ඕනෑ. අන්න ඒ කරපු ඒවාට තමයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දේශපාලන පළිගැනීම් කියන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ විතරක් නොවෙයි. එදා මහා නරක ආදර්ශයක් සැපයුවා. තමුන්නාන්සේ දන්නවා මිනිහෙක් අතුරුදහන් වුණාම ගරු අභියාචනාධිකරණයට අපි දාන්නේ හබයාස් කෝපුස් නඩුවක් බව. හබයාස් කෝපුස් කියන්නේ දේහය

සොයා දීමේ නඩුව. දේහය සොයා දීමේ නඩු චරිත ලංකාපුරලා කළා. චරිත ලංකාපුරලා, විජයදාස ලියනාරච්චිලා කළේ ඒ නඩු. අන්තිමට මොකද කළේ තමුන්නාන්සේලාගේ ආණ්ඩුවලින්? දේහය සොයා දීමේ නඩු කරපු, හබයාස් කෝපුස් නඩු කරපු චරිත ලංකාපුර අතුරුදහන් කළා, මරා දැම්මා; විජයදාස ලියනාරච්චිව අතුරුදහන් කළා, මරා දැම්මා. අන්න තමුන්නාන්සේලාගේ ආණ්ඩුවලින් කළ වැඩ. දේශපාලන පළිගැනීම් කියන්නේ ඒවායි. ඒ ආණ්ඩුවල ඉතිහාසය ඒකයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සලේගේ උදාහරණයෙන් පේනවා හමුදාව කොහොමද තමන්ගේ දේශපාලන භාවිතාව වෙනුවෙන් යොදා ගත්තේ කියලා. කැත දේශපාලන අරමුණු වෙනුවෙන් හමුදාව පාවිච්චි කළේ කොහොමද කියන කාරණාව අපට එමඟින් හොඳින්ම පැහැදිලි වෙනවා. ඒක තමයි ඒ අය හමුදාව පාවිච්චි කළ විධිය.

මට මතකයි, වරක් සී.ඩී. වික්‍රමරත්න හිටපු පොලිස්පතිතුමා කළ ප්‍රකාශයක්. එතුමාට "ඕ.අයි.සී." පත් කිරීම් 230ක් දීලා, එක පත්වීමක් ඇරෙන්න සියලු පත්වීම් ආණ්ඩුවෙන් නම් කළා කිව්වා. අන්න එහෙමයි පොලීසිය දේශපාලනීකරණය වෙලා තිබුණේ; මේ රටේ ආණ්ඩුව, මේ රටේ පොලීසිය දේශපාලනීකරණය වෙලා තිබුණේ අන්න ඒ ආකාරයෙන්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. පළිගැනීම්වල ඉතිහාසය කියනවා නම්, ඒවා තමයි.

ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමන්ලා ඊයේත් අදත් ගරු අධිකරණය වෙත ඇඟිල්ල දිගු කරලා කියනවා මම දැක්කා, ඉහළ අධිකරණවල vacancies ප්‍රමාණයක් තිබෙනවා, ඒවාට පත් කරන්නේ නැහැ කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 119 වන ව්‍යවස්ථාවත්, 137 වන ව්‍යවස්ථාවත් ගත්තාම ඒවායේ හරිම පැහැදිලිව තිබෙනවා, ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ අභියාචනාධිකරණයේ සිටිය යුතු අවම විනිශ්චයකාරවරයන් සංඛ්‍යාව පිළිබඳව. ශ්‍රේෂ්ඨාධිකරණයේ නම්, අග්‍ර විනිශ්චයකාරතුමා ඇතුළුව 6 දෙනෙකුයි. අභියාචනාධිකරණයේ සිටිය යුතු විනිශ්චයකාරවරයන් සංඛ්‍යාව, අභියාචනාධිකරණයේ සභාපතිවරයා ඇතුළුව 5දෙනෙක්; ඔක්කොම 6දෙනායි. එතකොට 6දෙනා බැගින් තමයි ස්ථානගත වෙලා ඉන්න ඕනෑ. 16ක් සහ 21ක් ඉන්න තැනක vacancies 4ක් තිබෙනවා කියලා, ඒ vacancies ප්‍රමාණය ගැන මෙතැන උලුප්පමින් කියනවා, එය අධිකරණයේ ස්වාධීනත්වයට අදාළ කාරණාවක් කියමින්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ මන්ත්‍රීතුමාගේ කථාවෙන් පෙනුණා, ගරු අග්‍ර විනිශ්චයකාරතුමා ජනාධිපතිවරයා හම්බ වුණා කියලා. හම්බ වුණු කථාවක් නොවෙයි මෙතැනදී කිව්වේ. ඇත්ත වශයෙන්ම කිව්වේ අධිකරණය සම්බන්ධ වාර්තාවක් ඇවිල්ලා තිබෙනවා, පද්ධතියක් ලෙස එය ප්‍රතිසංස්කරණය කරන්නේ කෙසේද කියන කාරණාව ඒ වාර්තාව තුළ හොඳින් උලුප්පා තිබුණා කියලායි. ඒ කියන්නේ, ගරු මහේස්ත්‍රාත් අධිකරණයේ vacancies ලොකු ප්‍රමාණයක් තිබෙනවා, දිසා අධිකරණයේත් තිබෙනවා, මහාධිකරණයේත් තිබෙනවා කියලායි. ඒකම තමයි අභියාචනාධිකරණයෙන් සහ ශ්‍රේෂ්ඨාධිකරණයෙන් දිස් වෙන්නේ. එතකොට පද්ධතියක් ලෙස සංවර්ධනය කරන්න අවශ්‍ය මහේස්ත්‍රාත්වරුන් බඳවාගෙන තිබෙනවා. ඊට පසුව දිසා අධිකරණයේ vacancies ප්‍රමාණය පිරවෙනවා. ඊට පස්සේ මහාධිකරණයට අදාළව vacancies ටික පුරවනවා. ඊට පස්සේ අභියාචනාධිකරණයේ සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ පුරප්පාඩු ටික පුරවනවා. එහෙම තමයි ඒ ක්‍රමය තිබෙන්නේ. නමුත්, විපක්ෂය කියන්නේ මොකක්ද? High Court එකට කැරට් අලයක් පෙන්නලා, කැරට් අලය දීලා කියනවාලු, අපට වාසි තීන්දු ලියන්න කියලා. ඒ ඔබතුමන්ලාගේ ආණ්ඩුවල. පසුගිය ආණ්ඩුවලින් කළේ එහෙම තමයි. හැබැයි, අධිකරණයේ ස්වාධීනත්වය ගැන කථා කරනවා නම් ඒක ගැන කථා කරන්න සුජාත අයිතිය තිබෙන්නේ වත්මන් ආණ්ඩුවටයි කියන කාරණාව ඔබතුමා ඉස්සරහා මම ප්‍රකාශ කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඉතිහාසයේ අධිකරණයට ගල් ගහපු, ශ්‍රේෂ්ඨාධිකරණයේ හිටපු අගවිනිසුරුවරිය ඒ පුටුවෙන් පන්නපු ආණ්ඩුවල සිටි මහත්තුරු "අපි තමයි අධිකරණයේ ස්වාධීනත්වය රැක්කේ" කියන කථාව කීම විහිළුවක්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, කාලය අවසානයි.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කථාව අවසන් කරන්නයි යන්නේ.

අද මත්ද්‍රව්‍ය භාවිතයට සහ ජාවාරමට එරෙහි ජාත්‍යන්තර දිනයයි. ජාත්‍යන්තර මත්ද්‍රව්‍ය විරෝධී දිනය සමරන කොට අමාත්‍යාංශයක් ලෙස අපි සැලකිය යුතු වර්ධනයක් ලබා තිබෙනවා. හැබැයි, ඒ වර්ධනය ප්‍රමාණවත් නැහැ. එය තවත් එහාට යා යුතුයි. ඒකට අවශ්‍ය පසුබිම, සැලසුම් සියල්ල අපි සකසා අවසන්. "රටම එකට" ජාතික මෙහෙයුම යටතේ අපි මතින් තොර රටක් නිර්මාණය කරනවා, ඒ වෙනුවෙන් පෙළ ගැසෙනවා කියන කාරණය මම මේ වෙලාවේ මතක් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.57]

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ගරු නියෝජ්‍ය ඇමතිතුමාගේ කථාවෙන් පසුව මට කථා කරන්න අවස්ථාව ලබා දීම ගැන ස්තුතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂය හැටියට අපි පසුගිය දවස් ටිකේ නිතරම මතු කළේ ඉහළ අධිකරණවල තිබෙන ඒ පුරප්පාඩුවලට ඉතා ඉක්මනින් පත් කරන්න කියන එකයි. අවුරුදු 200ක ඉතිහාසයක් අධිකරණ පද්ධතියට තිබෙනවා. හැබැයි, ඒ ඉතිහාසය තුළ මෙතරම් කාලයක් ගියේ නැහැ, පවතින පුරප්පාඩුවලට පත් නොකර ඉන්න. පළමු වතාවට තමයි පුරප්පාඩුවලට පත් නොකර ඉන්න මෙතරම් කාලයක් අරගෙන තිබෙන්නේ. ඒ නිසා තමයි විපක්ෂය හැටියට අපි ඔබතුමන්ලාට අවධාරණය කළේ, ඉතා ඉක්මනින් එම පත් කිරීම් කරන්න කියලා. එසේ කළේ නැත්නම් අධිකරණ ක්‍රියාවලිය තුළ යම් යම් ගැටලු මතු වෙන්න බොහෝ දුරට ඉඩ කඩ තිබෙනවා. ඊළඟට, අධිකරණයේ ස්වාධීනත්වය පිළිබඳවත් ප්‍රශ්න මතු වෙන්න පුළුවන්. ඔබතුමන්ලා විනිවිදභාවය ගැන, නීතියේ ආධිපත්‍යය ගැන විශාල පොරොන්දු රාශියක් දීලා බලයට ආපු ආණ්ඩුවක් නිසා ඒ වගකීම ඔබතුමන්ලාට තිබෙනවා. එම නිසා ඉහළ අධිකරණවල තිබෙන එම පුරප්පාඩුවලට පමා නොකර පත් කිරීම් කළ යුතුය කියන කාරණය තමයි අප මෙතැනදී නිතර නිතර මතු කළේ.

[ගරු මුජිබුර් රහුමාන් මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මත්ද්‍රව්‍ය උවදුර මර්දනය කිරීම ඉතාම වැදගත් වාගේම මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය කිරීමත් ඉතාම වැදගත්.

ඒ නිසා මම මේ කාරණය මතු කරන්න කැමැතියි. මත්ද්‍රව්‍ය ව්‍යාපාරිකයන් මර්දනය කරන නීති රීති ක්‍රියාත්මක කරන ගමන්ම මේ සමාජයේ මත්ද්‍රව්‍ය උවදුරට ඇබ්බැහි වෙලා ඉන්න විශාල පිරිස පුනරුත්ථාපනය කිරීමත් අත්‍යවශ්‍ය කාර්යයක් හැටියට සලකන්න ඕනෑ. මම මේ ප්‍රශ්නය මතු කරන්නේ නියෝජ්‍ය ඇමතිතුමාත් ගරු සභාවේ ඉන්න නිසායි. බස්නාහිර පළාතේ තලංගම ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානයේ පිරිමි අංශය මේ වනකොට වසා දමලා තිබෙනවා. ඒක ඉතාම කනගාටුදායක තත්ත්වයක්. ඒක වයස අවුරුදු 35ට අඩු, මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වෙච්ච පිරිමි ළමයින් පුනරුත්ථාපනය කිරීමේ මධ්‍යස්ථානයක්. දැන් ඒ ළමයින්ට යන්න තැනක් නැහැ. ඒ ළමයි එක්කෝ නුවරට යන්න ඕනෑ. එහෙම නැත්නම්, ගාල්ලට යන්න ඕනෑ.

මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වෙලා ඉන්න පවුල් ගත්තාම, හුඟක් දුරට අඩු ආදායම්ලාභී පවුල්වල දූවා දරුවෝ තමයි ඇබ්බැහි වෙලා ඉන්නේ. එතකොට අවුරුදු 35ට අඩු අය පුනරුත්ථාපනය කරන්න ගාල්ලට, නුවරට යන්න කිව්වාම ඒගොල්ලන්ට තිබෙන ආර්ථික ප්‍රශ්න, මුදල් හිඟකම හින්දා ඒක මඟ හැරෙනවා. ඒ ළමයි යන්නේ නැහැ. ඒ හින්දා ඒ ළමයි තවත් විනාශ වන එක තමයි වෙන්නේ. ඒ නිසා අපි ආණ්ඩුවේ අවධානයට යොමු කරනවා, මේ අංශය වහන්න එපා කියලා. තලංගම මධ්‍යස්ථානයේ පිරිමි අංශය තියා ගන්න. දැන් ඒකේ පිරිමි අංශය වහලා දමලා තිබෙනවා, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. ඒක විවෘත කරන්න.

කොළඹ දිස්ත්‍රික්කය නියෝජනය කරන නියෝජ්‍ය ඇමතිවරයකු විධියට ඔබතුමා දන්නවා, කොළඹ දිස්ත්‍රික්කයේ මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වුණු විශාල පිරිසක් ඉන්න බව. මම හිතන විධියට, ගිය අවුරුද්දේ - 2025 වසරේ - සංඛ්‍යාලේඛන බලනකොට 113,000ක් විතර වාගේ ඉන්නවා, කොළඹ දිස්ත්‍රික්කය තුළ. ඒක විශාල ප්‍රමාණයක්. ඒ නිසා කොළඹ දිස්ත්‍රික්කයට ඒ මධ්‍යස්ථානය ඉතා අවශ්‍යයි. ඒ නිසා අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, වහාම ඒ මධ්‍යස්ථානය නැවත විවෘත කරන්න උත්සාහ කරන්න කියලා. මොකද, ඒකේ වැදගත්කම තමයි, වයස අවුරුදු 35ට අඩු අය තමයි ඒකට ඇතුළත් කර ගත්තේ. අවුරුදු 35ට වැඩි අයට නිට්ටඹුවේ මධ්‍යස්ථානයක් තිබෙනවා. වයස අවුරුදු 35ට වැඩි අයට ඒකට යන්න පුළුවන්. නමුත්, අවුරුදු 35ට අඩු අය මේක වසා දැමීම නිසා නුවරට, එහෙම නැත්නම්, ගාල්ලට යන්න වෙනවා. එතකොට ආර්ථික ප්‍රශ්න උඩ හුඟක් දෙමව්පියන් ඒ ළමයින් ඒ තරම් දුර ගෙනියන්නේ නැහැ. ඒ හින්දා ඒ ළමයි අනාථ වෙනවා. ඒ නිසා ඔබතුමාගේ අවධානයට ඒ කාරණය යොමු කරනවා.

ඊයේ ජනාධිපතිතුමාගේ කථාවේදී ලසන්ත, තාජුඩීන්, ප්‍රගීත් එක්නැලිගොඩ, කීත් නොයාර්, උපාලි තෙන්නකෝන්, පෝද්දල ජයන්ත වාගේම "සිරස", "සියත" නාළිකා ගැන කිව්වා. නමුත්, එතුමාට එක නමක් අමතක වුණා. ඒ, සිවරාම් මාධ්‍යවේදියාගේ ඝාතනය. මේ ඝාතන කළ අය අල්ලනවාට අපි කවුරුවත් විරුද්ධ නැහැ. ඒවා විය යුතු දේවල්. ඔබතුමන්ලා දන්නවා, මේ හුඟක් නඩු යහ පාලන ආණ්ඩුව එදා බලයට ඇවිල්ලා පරීක්ෂණ කරලා පවරපු නඩු කියලා. යහ පාලන ආණ්ඩුවෙන් දමපු නඩු තමයි මේ ඉස්සරහට යන්නේ. එතකොට අපි කවුරුත් ඒකට විරුද්ධ නැහැ. අපි ඉන්නේ ඒක වෙනුවෙන්. ඔබතුමන්ලාත් ඒක කථා කළා, අපිත් ඒක කථා කළා. නමුත් දැන් තිබෙන ප්‍රශ්නය මේකයි. ඔබතුමන්ලා කියනවා, ඒවා අල්ලනවාට විරුද්ධ වෙනවා කියලා. කවුද විරුද්ධ? ජනාධිපතිතුමාගේ වගකීම තමයි,- විරුද්ධ පක්ෂයේ හුඟක් කණ්ඩායම් ඉන්නවා නේ. පාර්ලිමේන්තුවේත්, එළියේත් විරුද්ධ පක්ෂයේ අය කථා කරනවා. ඒගොල්ලනුත් විරුද්ධ පක්ෂයේ ඉන්නවා. එහෙම නම්, ඒ විරුද්ධ අය කවුද කියලා කියන්න ඕනෑ. එහෙම නැතිව විරුද්ධ පක්ෂයේ ඉන්න සියලුදෙනාම එක ගොඩට දාලා, "විරුද්ධ පක්ෂය මේකට විරුද්ධයි" කියන එක තේරුමක් නැහැ. අපි කවුරුත් ඒකට විරුද්ධ නැහැ. අපි ඉන්නේ ඒ වෙනුවෙන්.

ඊළඟට එතුමා කිව්වා, ශානි, රවී ගැන. ශානිටයි, රවීටයි කවුද විරුද්ධ? ගෝඨාභය රාජපක්ෂගේ ආණ්ඩුව කාලයේ ශානිවයි, රවීවයි - ඒ දෙදෙනා - මර්දනය කරනකොට සජිත් ප්‍රේමදාස මැතිතුමා ඇතුළු සජබ මන්ත්‍රීවරු තමයි එදා විපක්ෂයේ ඉඳගෙන ඒ අය වෙනුවෙන් කථා කළේ; ශානි, රවී වෙනුවෙන් පෙනී සිටියේ. නමුත්, එතුමා කියනවා, ඒ අයටත් විරුද්ධයි කියලා. කවුද ඒ අයට විරුද්ධ? එදා ඒගොල්ලන්ට අසාධාරණකම් වනකොට අපි තමයි ඒගොල්ලන් වෙනුවෙන් මේ පාර්ලිමේන්තුවේ කථා කළේ. ඒ හින්දා ඔබතුමන්ලා කියන්න ඕනෑ කවුද මේකට විරුද්ධ කියලා. ශානිටයි, රවීටයි කවුද විරුද්ධ, අනෙක් උදවියට කවුද විරුද්ධ කියලා ඔබතුමන්ලා නොකියන්නේ ඇයි? සමහර විට ඔබතුමන්ලා නොකියන්නේ, - ඔබතුමන්ලාට කියන්න අපහසුයි - ඔබතුමන්ලාගේ පරණ යාළුවෝද මේකට විරුද්ධ? ඔබතුමන්ලාත් එක්ක ඒ කාලයේ ඉඳලා, ආණ්ඩු හදන්න ඔබතුමන්ලා උදවු කරපු අයද මේකට විරුද්ධ? ඒක ඔබතුමන්ලා කියන්න ඕනෑ. එහෙම නැතිව විරුද්ධයි, විරුද්ධයි කියලා විරුද්ධ පක්ෂයේ ඉන්න අපි ඔක්කොම එක ගොඩට දමන්න එපා. අපි ඒ ගොඩේ නැහැ. අපි කියන්නේ පාස්කු ඉරුදින බෝම්බ ප්‍රහාරකයන් අල්ලන්න ඕනෑ, ලසන්ත වික්‍රමතුංග, ප්‍රගීත් එක්නැලිගොඩ, විජය කුමාරතුංග, තාජුඩීන්, කීත් නොයාර්, සිවරාම් ඝාතනයට සම්බන්ධ අය අල්ලන්න ඕනෑ. ඔවුන් අල්ලන්න තමයි යහ පාලන ආණ්ඩුවත් එදා බලය ඉල්ලුවේ. ඒ පටන් ගත්ත විමර්ශන තමයි තවම යන්නේ. අපිත් ඒ වෙනුවෙන් තමයි ඉන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
තව විනාඩි දෙකක්ද තිබෙන්නේ? හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජනාධිපතිතුමා ඇහුවා තාජුඩීන් ඝාතනයට සම්බන්ධ අය අල්ලනවාට අපි විරුද්ධද කියලා. අපි විරුද්ධ නැහැ. අපි කවදාවත් විරුද්ධ නැහැ. එක වතාවක් මම මේ පාර්ලිමේන්තුවේදී ගුටි කන්නත් ගියා තාජුඩීන් ගැන කථා කරලා. ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමනි, ඔබතුමාටත් ඒ ගැන මතක ඇති. ඒ, අපේ යහ පාලන ආණ්ඩුව කාලයේදී. එදා විපක්ෂයේ හිටපු උදවියගෙන් 10දෙනෙක් විතර මගේ ළඟට ඇවිල්ලා මාව වට කරගත්තා, මේ පාර්ලිමේන්තුවේදී. මොකද, මම හිටියේ මේ පැත්තේ - *[බාධා කිරීම්]* අද ඔය ආණ්ඩු පක්ෂය පැත්තේ ඉන්න ඔබතුමන්ලාගේ පරණ යාළුවෝ ටික. *[බාධා කිරීම්]* ඒ, ඔබතුමන්ලාගේ බලයෙන් 2005දී බලයට ආපු උදවිය. *[බාධා කිරීම්]* ඔබතුමන්ලාගේ හයියෙන් මේ රටේ බලය අල්ලා ගෙන ඒ තුළ පවුල් පාලනය හදපු උදවිය ඒගොල්ලන් තමයි. *[බාධා කිරීම්]* ඔබතුමන්ලා දැන් කවුද, කවුද කියලා අහන්න එපා. ඔබතුමන්ලා කණ්ණාඩියක් ඉස්සරහට ගිහිල්ලා අහන්න, කවුද

කවුද කියලා. එතකොට හොඳට බලාගන්න පුළුවන්, කවුද කවුද කියලා. ඒ නිසා අපෙන් ඒ ගැන අහන්න එපා. කණ්ණාඩියක් ඉස්සරහට ගිහිල්ලා කවුද කියලා ඇහුවා නම්, හොඳට බලාගන්න පුළුවන්.

මම අහන්නේ තාජුඩීන් ඝාතනය ගැන සොයනවාට විරුද්ධ කවුද කියන එකයි. මතක තබා ගන්න, තාජුඩීන්ගේ ඝාතනයේ සාක්ෂි වසන් කළ උදවිය, තොරතුරු වසන් කළ උදවිය, එදා ඒ රාජපක්ෂ පාලනයත් එක්ක ගනුදෙනු කළ උදවිය අද ඔබතුමන්ලාගේ ආණ්ඩුවේ උපදේශකයෝ හැටියට ඉන්නවා. ඒක මතක තබා ගන්න. තාජුඩීන් ඝාතනයට සම්බන්ධ අය අල්ලනවාට අකමැතිද කියලා ජනාධිපතිතුමා ඒගොල්ලන්ගෙන් තමයි අහන්න ඕනෑ. මොකද, ඒගොල්ලන් එදා රාජපක්ෂලාත් එක්ක ඉඳිමින් ඒ සාක්ෂි වසන් කරලා ඒ තොරතුරු ලබා නොදී හැංගුවා. අද ඔවුන් තමුන්නාන්සේලාගේ ආණ්ඩුවේ උපදේශකයෝ වෙලා ඉන්නවා. මම ඒ ගැන කියන්න ඕනෑ නැහැ. නියෝජ්‍ය ඇමතිතුමන්ලා ඒ ගැන දන්නවා. මෙතුමා හිනා වෙනවා. අපි අහන්නේ, ඒගොල්ලන් උපදේශකයන් හැටියට තියාගෙන ඝාතනවලට සම්බන්ධ අය අල්ලන්නේ කොහොමද කියන එකයි. ඒකයි අපේ ප්‍රශ්නය. අපි ජනාධිපතිතුමාගෙනුත් ඒ ගැන අහනවා. ජනාධිපතිතුමාට අවංක වුවමනාවක් තිබෙන්න පුළුවන්. නමුත් ඒ අය අල්ලන්නේ කොහොමද?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මම කථාව අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

එදා තාජුඩීන්ලා මරනකොට එවකට පැවැති පාලන තන්ත්‍රයේ හිටපු අයත් එක්ක සම්බන්ධකම් පවත්වපු අය, ඒ සාක්ෂි සහ තොරතුරු වසන් කරපු අය අද ඔබතුමන්ලාගේ ආණ්ඩුවේ එක එක තැන්වල උපදේශකයෝ හැටියට ඉන්නවා.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
Best friends.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ඔව්, best friendsලා. ඉතින් එහෙම තියාගෙන ඒ අය අල්ලන්න බැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා විපක්ෂය හැටියට අපි ඒ ගැන ප්‍රශ්න කරනවා. අපි කියපු මේ ඝාතන කළ අය අල්ලන්න ඕනෑ. මේවා වැලි තලාවෙන් වැසී යන්න දෙන්න එපා. ඒක තමයි අපිත් කියන්නේ. නමුත් අපට තිබෙන ගැටලුව වන්නේ එදා ඒ පාලන තන්ත්‍රවල වැජඹුණු උදවිය අද තමුන්නාන්සේලාගේ ආණ්ඩුව තුළට රිංගලා සිටියදී මේවා අල්ලන්නේ කොහොමද කියන එකයි. ඒ ගැන තමයි අපි ප්‍රශ්න කරන්නේ.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි අටක කාලයක් තිබෙනවා.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)

*නැඟී සිටියේය.*
*எழுந்தார்.*
*rose.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමා.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා යොමු කළ ප්‍රශ්නයකට උත්තරයක් දෙන්න අවශ්‍යයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, කෙටි වෙලාවක් තුළ පිළිතුර ලබා දෙන්න.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
ගරු මන්ත්‍රීතුමනි, බාල වයස්කාර දරුවන්ගේ පරිපාලන පහසුව සඳහා තමයි තලංගම මධ්‍යස්ථානය ගොඩක් දුරට තිබෙන්නේ. කාන්තාවන් සහ බාල වයස්කාර දරුවන්ගේ පරිපාලනය සම්බන්ධ දැන් තීන්දුවක් ගෙන තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, දෙහිවලත් මධ්‍යස්ථානයක් විවෘත කර තිබෙනවා. ඒ මධ්‍යස්ථාවල කළමනාකරණයේ ප්‍රතිඵලයක් ලෙස තමයි ඒ තීන්දුව ගෙන තිබෙන්නේ. ඒ නිසා ඔබතුමා සඳහන් කළ ආකාරයේ තත්ත්වයක් නොවෙයි, පවතින්නේ. ඊට අදාළ සියලු පහසුකම් අපි සලසනවා.

[අ.භා. 3.07]

**ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා**
(மாண்புமிகு அசித நிரோஷண எகொட விதான)
(The Hon. Asitha Niroshana Egoda Vithana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මීට කලින් කථා කළ මන්ත්‍රීතුමා පැහැදිලි කළා, කොළඹ දිස්ත්‍රික්කය තුළ මත්ද්‍රව්‍ය ජාවාරම සහ මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් විශාල වශයෙන් වැඩි වී තිබෙනවා, ඒ වාගේම එම ජාවාරම ඉතා ඉහළින් ක්‍රියාත්මක වෙනවා කියලා. ඒක ඇත්ත. ඒ වාගේම තමයි පාතාලය සහ මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් එක්ක දේශපාලන සබඳතා පවත්වන අයත් වැඩිපුරම ඉන්නේ කොළඹ දිස්ත්‍රික්කයේ. ගරු ජනාධිපතිතුමා ඊයේ මේ පාර්ලිමේන්තුවේදී ප්‍රකාශ කළා, පාතාලයේ ප්‍රධාන නායකයෙක් සමඟ 92 වතාවක් දුරකථනය ඔස්සේ සම්බන්ධ වෙලා තිබෙනවා කියලා. ඒ මන්ත්‍රීවරයා තමයි 54 වතාවක් දුරකථන ඇමතුම් අරගෙන තිබෙන්නේ. ඒ නිසා අපි ඒ මන්ත්‍රීවරයාට කියනවා, ඒ කථා කළේ කවුද කියන එක කණ්ණාඩියක් ඉස්සරහට ගිහින් බලන්න කියලා. එතකොට ඒක එතුමාට හොයා ගන්න පුළුවන් වෙයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මීට කලින් විවාදයකදී අපේ රත්වත්තේ මන්ත්‍රීතුමිය කළ ප්‍රකාශයක් ගැන අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා කරුණක් මතු කළා. ඒ තමයි සජිත් ප්‍රේමදාස මැතිතුමාගේ නැඟණිය ව්‍යාජ මුදල් නෝට්ටු මුද්‍රණය කළාය කියා

[ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා]

චෝදනාවක් ඉදිරිපත් කළා කියන කාරණය. එය වරප්‍රසාද ප්‍රශ්නයක් විධියට මතු කරනවා කියලා අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා කිව්වා. මම එතුමාට කියන්න කැමැතියි, 2024 සැප්තැම්බර් මාසයේ 01වැනි දා හිටපු පොලිස් මාධ්‍ය ප්‍රකාශක අජිත් රෝහණ මහතා කළ මාධ්‍ය සාකච්ඡාව කරුණාකර බලන්න කියලා. එහිදී ඔහු කියා තිබෙනවා, දුලාංජලී ප්‍රේමදාස මැතිනිය කුරුඳුවත්තේ බැංකුවකට ලක්ෂ 20ක මුදලක් - 5,000 ව්‍යාජ මුදල් නෝට්ටු 400ක් - සවස 2.17 කියන වෙලාවේ සැප්තැම්බර් මාසයේ 01 වැනි දා තැන්පත් කළා කියලා. ඒවා ව්‍යාජ මුදල් නෝට්ටු විධියට ඒ බැංකුව හඳුනා ගෙන අදාළ නීතිමය කටයුතුවලට සම්බන්ධ වුණා කියලා එතුමා සඳහන් කර තිබෙනවා. ඒ නිසා හිටපු පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා කර තිබෙන ඒ ප්‍රකාශය වෙනුවෙන් ගත්ත නීතිමය ක්‍රියාමාර්ගය මොකක්ද කියලා මම අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමාගෙන් ප්‍රශ්න කරනවා. ඒ වාගේම මහින්ද රාජපක්ෂ මහතා ප්‍රසිද්ධ ජන හමුවකදී කියා තිබෙනවා, "මම ඒ නඩුවෙන් ප්‍රේමදාස මහත්මයාත්, එතුමාගේ නැඟණියත් බේරුවේ රණසිංහ ප්‍රේමදාස මහත්මයා මේ රටට කරපු සේවය නිසා" කියලා. ඒ නිසා අපේ රත්වත්තේ මන්ත්‍රීතුමියට විරුද්ධව වරප්‍රසාද ප්‍රශ්නයක් ගෙනෙන්න කරන්න කලින්, අර විධියේ ප්‍රසිද්ධ ප්‍රකාශ කරපු අජිත් රෝහණ මහත්මයා සහ මහින්ද රාජපක්ෂ මහත්මයා සම්බන්ධවත් ක්‍රියාමාර්ග ගන්න කියා මම එතුමාගෙන් ඉල්ලනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මත්ද්‍රව්‍ය පිළිබඳව සාකච්ඡා වෙන මේ අවස්ථාවේදී, ඒවා මර්දනය කිරීම සහ අපේ දරු පරම්පරාව රැක ගැනීම පිළිබඳව සාකච්ඡා වෙන මේ අවස්ථාවේදී මේ කාරණයත් මම කියන්න කැමැතියි. අද විපක්ෂයේ ඉන්න ගොඩක් අය ආණ්ඩු බලයේ ඉන්නකොට අපි විපක්ෂයේ කටයුතු කරද්දි, "ආණ්ඩු බලය හොබවන එක, රාජ්‍යය පාලනය කරන එක අතිශය දුෂ්කර වැඩක්. තමුන්නාන්සේලාට හරි ලේසියි, විපක්ෂයේ ඉඳලා උද්ඝෝෂණ කරන්න පුළුවන්, අදහස් දක්වන්න පුළුවන්, වගකීමක් නැහැ" කියලා අපට චෝදනා එල්ල කළා. විපක්ෂයේ දේශපාලනය හරිම පහසු දෙයක් කියාත් කිව්වා. විපක්ෂයේ ඉන්න අයගෙන් අපි දැන් මේ කාරණය අහනවා. ආණ්ඩු බලය හොබවන අපි සැලසුම් කරපු විධියට අපිට ලැබිච්ච මේ ධුර කාලය තුළ ඉලක්ක සහගතව ඉතාම සාර්ථකව රට මෙහෙයවමින් තිබෙනවා. ඒ අතරේ බාහිර ගැටලු එනවා. අපි ඒවාට නොබියව මුහුණ දෙමින් ඉතාම හොඳින් රටේ තත්ත්වය කළමනාකරණය කරනවා. හැබැයි විපක්ෂය විධියට ඔවුන් මුහුණ දෙන තත්ත්ව කළමනාකරණය කරගන්නවා වෙනුවට, හත්පොළේ ගාගෙන, නන්නත්තාර වෙලා සම්පූර්ණයෙන්ම අසාර්ථක දේශපාලන මැදිහත්වීමක් තමයි අද අපට දකින්න තිබෙන්නේ. සජිත් ප්‍රේමදාස මහත්මයා කෘත්‍යාධිකාරි මණ්ඩලය කැඳවනවා නේ. ගිය මාසයේ කැඳවන කෘත්‍යාධිකාරි මණ්ඩලයේ ඉන්න හාදයා මේ මාසයේ කෘත්‍යාධිකාරි මණ්ඩලය කැඳවනකොට නැහැ. ඔහු කරපු අපරාධයකට අත්අඩංගුවට පත් වෙලා. ඊළඟ සතියේ කෘත්‍යාධිකාරි මණ්ඩලයේ වාඩි වෙන කෙනා ඊට පසුව සතියේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "මහජන සම්පත" දිනුම් අදිනවා නේ. කලින් නම් "මහජන සම්පත", "ශනිදා වාසනාව" තුළින් කාලයකට සැරයක් තමයි ජයග්‍රාහකයෙක් එන්නේ. හැබැයි පසුගිය කාලයේ සතිපතා ජයග්‍රාහකයෝ එන්න පටන් ගත්තා. දැන් "මහජන සම්පත", "ශනිදා වාසනාව" දිනපතා ඇදෙන්න පටන් ගෙන තිබෙනවා. ඒ නිසා කෘත්‍යාධිකාරි මණ්ඩලයේ ඉන්න ගොඩක් අය අද බන්ධනාගාරගත වෙමින් තිබෙනවා. සතිපතා ඒ ජයග්‍රහණ ලබන අයට සුබ පතන්න තමයි අපට තිබෙන්නේ. මොකද, ඔවුන් ඒ ජයග්‍රහණවල හිමිකරුවන් බවට පත් වෙලා තිබෙනවා.

ප්‍රසිද්ධ පුවතක් අපට ඊයේ දැනගන්නට ලැබුණා. ඒ තමයි සංවිධානාත්මක අපරාධකරුවෙක් නිදහස් කර ගැනීම සඳහා රුපියල් කෝටි 12ක අල්ලසක් ලබාගෙන තිබෙනවාය කියන පුවත. නඳුන් චින්තක කියන, "හරක් කටා" කියලා ප්‍රසිද්ධ වෙච්ච පුද්ගලයා බූස්ස බන්ධනාගාරයෙන් වෙනත් බන්ධනාගාරයකට මාරු කර ගැනීම සඳහා ඔහුගේ රැඳවුම් නියෝගය ඉවත් කරගන්න රුපියල් කෝටි 12ක් හුවමාරු වුණා කියනවා. එවකට අධිකරණ ඇමති විජේදාස රාජපක්ෂ මහත්මයාගේ පුතා සමඟ චරිත් අබේසිංහ කියන සමඟි ජන බලවේගයේ හොරණ සංවිධායකවරයාත්, තවත් පුද්ගලයෙකුත් මේකට අත්අඩංගුවට ගෙන තිබෙනවා. ඒ වාගේම හිටපු පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතාත් මෙහිදී රුපියල් කෝටි 5ක මුදලක් ලබාගත්තාය කියලා සාකච්ඡා වෙච්ච දුරකථන සංවාදයක් දැන් සම්පූර්ණයෙන්ම එළියට ඇවිල්ලා තිබෙනවා. ඒ නිසා මේක ඉතා බරපතළ තත්ත්වයක් විධියට අපි දකිනවා. මොකද, ඒ රුපියල් කෝටි 12ක මුදල් මේ අපරාධකරුවන් මුදා ගන්න යොදාගත්ත මුදල්. ඒ අපරාධකරුවන් අයිස් විකුණලා, හෙරොයින් විකුණලා ගත්ත මුදල්. වයස අවුරුදු 15, 16, 20 තරුණයෝ අම්මලාට ගහලා, තාත්තලාගෙන් බලෙන් සල්ලි උදුරාගෙන අයිස් ගහන්න පාවිච්චි කරපු සල්ලි තමයි නඳුන් චින්තකලා මේ විධියට එකතු කරගෙන තිබෙන්නේ. මිනිස්සු පවුල් පිටින් අන්ත අසරණ තැනකට පත් කර තිබෙන වෙලාවක් මේක. ඒ මිනිස්සුන්ගේ දුක, කඳුළ, වේදනාව තමයි අද රුපියල් කෝටි 12ක අල්ලසක් අරගෙන මේ අපරාධකරුවන් නිදහස් කිරීම සඳහා පාවිච්චි කරලා තිබෙන්නේ. දේශපාලනය කරමින් ප්‍රධාන විපක්ෂයේ ඉන්න ප්‍රධාන ආසන සංවිධායකවරයෙක් මේ කටයුත්තට සම්බන්ධ වීම පිළිබඳව අපි ඉතාම කනගාටු වෙනවා.

සමඟි ජන බලවේගයේ බුද්ධික පතිරණ මහත්මයා මේ අය අත්අඩංගුවට ගත්ත විධිය වැරදියි කියලා ඊයේ මාධ්‍ය සාකච්ඡා තියලා හොටු හූරමින් ඇඬුවා. දැන් මේ අත්අඩංගුවට ගත් අපරාධකරුවෝ තමයි නඩු අහන්න ඕනෑ කවුද කියලා තීන්දු කරන්නේ. මේකට ශානි අබේසේකර හැර වෙන කෙනෙක් ඉදිරිපත් වෙන්න කියලා කියා තිබෙන්නේ, ඒ අපරාධකරුවෝ. ඒ වාගේම තමයි අත්අඩංගුවට ගන්න විධිය තීරණය කරන්නෙත් ඔවුන්. ගෙදරදී අත්අඩංගුවට ගත්තොත් "දරුවෝ බලන් හිටියා" කියනවා. අර අසූචි ගහපු සුගීශ්වර අත්අඩංගුවට ගන්නකොට "මහමඟදී වාහනයක් හරස් කරලා අත්අඩංගුවට ගත්තා, ඒක වැරදියි" කියනවා. තමුන්නාන්සේලා මේ කියන්නේ මොනවාද? සමඟි ජන බලවේගයට තිබෙන ප්‍රතිපත්තිය මොකක්ද? අත්අඩංගුවට ගන්න ඕනෑ ගෙදරදිද, පාරේදිද නැත්නම් කොහේදිද කියලා කරුණාකරලා කට්ටිය කථා කරගෙන එකක් කියන්න. එහෙම නම් තමන් කැමති තැනක් කියන්න. කරපු අපරාධවලට මුහුණ දෙන්න ලෑස්ති වෙන්න. අනිවාර්යයෙන්ම මේ තිබෙන තත්ත්වය වෙනස් කරමින් තිබෙනවා කියලා අපි කියන්න කැමැතියි. ඒ නිසා හුරතල් වෙන්න හදන්න එපා කියලා ඒ අපරාධකරුවන්ට අපි කියනවා. මේ රටේ දරු පරම්පරාව මුළුමනින්ම නැති කරලා, තරුණ පරම්පරාව විනාශ කරලා, අපරාධකරුවන්ට රැකවරණ දීලා, මත්ද්‍රව්‍ය ජාවාරම්වලින් මේ රට පුරවලා, කරන්න පුළුවන් වංචා, දූෂණ, අපරාධ සියල්ල කරලා දැන් නීතිය එක්ක හුරතල් වෙන්න එනවා. ඒ හුරුතල් වෙන කට්ටියට කියන්න තිබෙන්නේ, බන්ධනාගාරයට ගිහිල්ලා හුරතල් වෙන්න කියලායි. තමන් කසාද බැඳලා නම්, තාත්තා කෙනෙක් නම්, බිරිඳ, දරුවෝ ඉන්නවා කියන එක කල්පනා කරලා අපරාධවලට මැදිහත් වෙන්න ඕනෑ. තමන්ගේ දරුවෝ වාගේම එළියේ ඉන්න දරුවෝත් විනාශ කරලා තමයි ඔය අල්ලස් මුදල අරගෙන තිබෙන්නේ. විජයදාස රාජපක්ෂ මහත්මයාත් බුදු වෙලා වාගේ නේ පසුගිය කාලයේ හිටියේ. පන්සලකට ගියොත් බණ දේශනා කරනවා, ප්‍රධාන ස්වාමීන් වහන්සේලාටත් වඩා හොඳට. හැබැයි, දැවැන්ත ඩීල්කරුවෙක්. ඩුබායිවලට ගිහිල්ලා ඒ ඩීල් එකට සම්බන්ධ වුණා කියලාත් තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි. කථාව අවසන් කරන්න.

**ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා**
(மாண்புமிகு அசித நிரோஷண எகொட விதான)
(The Hon. Asitha Niroshana Egoda Vithana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩියක කාලයක් දෙන්න.

තාත්තා අධිකරණ ඇමති. පුතා ඩීල් දානවා. පසුගිය කාලයේ ආණ්ඩුව පෙරළන්න ලොකු හදිස්සියක් තිබුණා, විජයදාස රාජපක්ෂ මහත්තයාට. දැන් ඒ තදියම අවසන් වෙයි, මේ පරීක්ෂණ ඉස්සරහට යද්දී. සමස්ත සමාජය විනාශ කරන නිධන්ගත රෝගයක් විධියට තිබෙන මේ අපරාධ රැල්ල අපි නතර කරනවා.

ඒ වාගේම අද අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නාමය වෙනස් කිරීම සඳහා යෝජනාවක් ඇවිල්ලා තිබෙනවා. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නාමය "නිධන්ගත රෝග හඳුනා ගන්නා ස්ථානය" විධියට වෙනස් වුණා නම් විපක්ෂයටත් ටිකක් පහසු වෙයි. මොකද අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ඇතුළු වුණාට පස්සේ තමයි නිධන්ගත රෝග ටික එන්නේ, ධමනි කියක් හිර වෙලාද, stents කීයක් දාලා තිබෙනවාද කියලා. අවුරුදු හැටේ වැඩිහිටියන්ට වැලඳෙන සියලු රෝග වැලඳිලා තිබෙනවා ලු. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ඇතුළට ගිහිල්ලා ශානි අබේසේකර මහත්මයාගේ ඉස්සරහට ගියාට පස්සේ තමයි මේ නිධන්ගත රෝග ඔක්කෝම එළියට එන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා**
(மாண்புமிகு அசித நிரோஷண எகொட விதான)
(The Hon. Asitha Niroshana Egoda Vithana)
ඒ ආයතනයේ නාමයත් වෙනස් කරන්න සිදු වෙලා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපරාධ කරලා එහේ මෙහේ පැනලා, හැංගිලා ඉන්න තවත් හාදයෝ ඉන්නවා. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ස්වාධීනව කටයුතු කරනවා. අධිකරණය ස්වාධීනව කටයුතු කරනවා. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව ස්වාධීනව කටයුතු කරනවා. ඒක නිසා අපරාධ කරපු සියලුදෙනාම ඒකට මුහුණ දෙන්න ලැහැස්ති වෙන්න කියලා අපි ඉල්ලා සිටිනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[பி.ப. 3.17]

**ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் நடைபெறுகின்ற போதைப்பொருள் அச்சுறுத்தலை எதிர்த்துப் போராடுதல் தொடர்பான ஒத்திவைப்புப் பிரேரணை மீதான விவாதத்தில் கலந்துகொண்டு உரையாற்றுவதையிட்டு மிக்க மகிழ்ச்சியடைகின்றேன்.

நமது நாட்டில் ஆரம்ப காலத்தில் ஒவ்வொரு பிரதேசத்திலும் சிறிய தொகையினரே மதுபானம் அருந்துபவர்களாக இருந்தனர். எனினும், 2017-2025ஆம் ஆண்டு வரையிலான காலப்பகுதியில் நாடு பூராவும் 76,058 பேர் கஞ்சா பாவனையாளர்களாகவும், 81,339 பேர் ஹெரோயின் பாவனையாளர்களாகவும், 1,946 பேர் 'ஹஷீஷ்' பாவனையாளர்களாகவும் இருக்கின்றார்கள். இவ்வாறு மிகப் பெருந்தொகையினர் நாட்டில் போதைப்பொருள் பாவனையாளராக மாறி வருகின்றனர். நாம் எவ்வளவுதான் முயற்சி செய்தபோதிலும், போதைப்பொருள் பாவிப்போருடைய, அதனை விற்பனை செய்வோருடைய தொகையைக் குறைக்க முடியாத ஒரு துர்பாக்கிய நிலைமை இருக்கின்றது.

போதைப்பொருள் சார்ந்த அறிக்கைகளைப் பார்க்கும்போது, எமது நாட்டிலுள்ள 25 மாவட்டங்களில் கொழும்பு மாவட்டமே முதலாவது இடத்தைப் பெறுகின்றது. அங்கு 35,176 பேர் ஹெரோயின் பாவிக்கின்றார்கள்; 32,186 பேர் கஞ்சா பாவிக்கின்றார்கள்; 49,736 பேர் 'ஐஸ்' பாவிக்கின்றார்கள். இரண்டாவது இடத்தை கம்பஹா மாவட்டம் பெறுகின்றது. அங்கு 8,334 பேர் ஹெரோயின் பாவிக்கிறார்கள்; 4,044 பேர் கஞ்சா பாவிக்கிறார்கள்; 9,241 பேர் 'ஐஸ்' பாவிக்கிறார்கள். மூன்றாவது இடத்தை காலி மாவட்டம் பெறுகின்றது. அங்கு 5,433 பேர் ஹெரோயின் பாவிக்கிறார்கள்; 3,793 பேர் கஞ்சா பாவிக்கிறார்கள்; 4,834 பேர் 'ஹஷீஷ்' பாவிக்கிறார்கள். 2025ஆம் ஆண்டு வரை நமது நாட்டில் மொத்தமாக 250,080 பேர் போதைப்பொருள் பாவனைக்கு அடிமையாகி இருக்கிறார்கள்.

2026ஆம் ஆண்டு சனவரி மாதம் 01ஆம் திகதியிலிருந்து மே மாதம் வரையான காலப்பகுதியில், போதைப்பொருள் பாவனையாளர்கள், விற்பனையாளர்கள் மற்றும் அதனுடன் தொடர்புடையவர்கள் என மொத்தம் 121,266 பேர் கைதுசெய்யப்பட்டு விளக்கமறியலில் வைக்கப்பட்டுள்ளனர். உண்மையிலேயே நாங்கள் இந்த அரசாங்கத்துக்கு நன்றி சொல்ல வேண்டும். ஏனெனில், மாண்புமிகு சனாதிபதி அவர்களும் அரசாங்கமும் போதைப்பொருளை ஒழிப்பதில் மிகவும் கவனம் செலுத்துகின்றார்கள். கட்சி பேதமின்றி நாங்கள் எல்லோரும் ஒற்றுமைப்பட்டு, இந்த நாட்டில் போதைப்பொருள் இல்லாத சமுதாயத்தை உருவாக்குவதற்குப் பணிபுரிய வேண்டும். அந்தப் பாரிய பொறுப்பு நம் எல்லோருக்கும் இருக்கின்றது. மக்கள் பிரதிநிதிகள், மதத் தலைவர்கள், துறைசார்ந்த அதிகாரிகள் என எல்லோரும் இந்த விடயத்தில் அர்ப்பணிப்போடு செயற்பட்டு, நமது நாட்டில் போதைப்பொருள் பாவனையை முற்றாக இல்லாமல் செய்ய வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

தற்பொழுது, இந்தச் சபையில் பொதுமக்கள் பாதுகாப்புப் பிரதி அமைச்சர் அவர்கள் இருக்கின்றார். விடுதலைப் புலிகள் இயக்கமானது உலகளவில் பிரபல்யமான, பலமான ஓர் இயக்கமாக இருந்தது. அந்த இயக்கமானது 30 வருடங்கள் இந்த நாட்டில் ஆயுதப் போராட்டத்தில் ஈடுபட்டது. நமது நாட்டின் பாதுகாப்புப் படையினர்தான் பல தியாகங்களைச் செய்து நாட்டிலிருந்த யுத்த நிலைமையை இல்லாமல் செய்தார்கள். அதேபோல், போதைப்பொருளையும் முற்றாக இல்லாமல் செய்வதற்கு அர்ப்பணிப்புடன் செயற்பட

[ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා]

வேண்டிய பாரிய பொறுப்பு அவர்களுக்கு இருக்கின்றது. பாதுகாப்புப் படையினர், மக்கள் பிரதிநிதிகள் என இலங்கையில் வாழ்கின்ற எல்லோரும் ஒன்றுசேர்ந்து, நல்ல எண்ணத்தோடு போதைப்பொருளை ஒழிப்பதற்கு நடவடிக்கை எடுத்தால், மிக விரைவில் போதைப்பொருள் இல்லாத ஒரு நாட்டை எங்களால் உருவாக்க முடியும்.

இங்கு பொது மக்கள் பாதுகாப்புப் பிரதி அமைச்சர் அவர்கள் சில விடயங்களைப் பேசினார். எமது முஸ்லிம் சமூகம் சார்ந்த ஒரு விடயத்தை நான் உங்கள் மத்தியில் சொல்ல வேண்டும். 'ஈஸ்டர்' குண்டுத் தாக்குதல் சம்பந்தமான விசாரணை நடைபெற வேண்டும்; அதனுடன் சம்பந்தப்பட்டவர்களைச் சட்டத்துக்கு முன் நிறுத்த வேண்டும்; எமது முஸ்லிம் சமூகத்தின்மீது வீணாகச் சுமத்தப்பட்ட கறை அகற்றப்பட வேண்டும். 'ஈஸ்டர்' குண்டுத் தாக்குதல் சம்பந்தமான விசாரணைக்கு முஸ்லிம் சமூகம் ஒருபோதும் இடையூறு விளைவிக்காது. இந்த விடயத்தில் முஸ்லிம் சமூகத்துக்கு நீதி, நியாயம் கிடைக்க வேண்டும். இதனை இப்பொழுது முஸ்லிம் சமூகம் எதிர்பார்த்துக்கொண்டு இருக்கின்றது. எமது முஸ்லிம் சமூகம் எப்பொழுதும் மன்னிக்கின்ற சமூகமாகும்.

'ஈஸ்டர்' குண்டுத் தாக்குதலின் பின்னர், முஸ்லிம் சமூகத்தின்மீது வீண்பழி சுமத்தப்பட்டது; முஸ்லிம் சமூகத்தின் பாதுகாப்பு, அமைதி கேள்விக்குறி ஆக்கப்பட்டது; முஸ்லிம் சமூகத்தின் உடைமைகள் சேதமாக்கப்பட்டன. சுமார் 8,000 அப்பாவி முஸ்லிம் மக்கள் சந்தேகத்தின்பேரில் கைது செய்யப்பட்டார்கள்; முஸ்லிம் பெண்கள் 'பர்தா' அணிவதற்குத் தடை விதிக்கப்பட்டது; முஸ்லிம்களின் புனித அல்-குர்ஆன் இறக்குமதி தடைசெய்யப்பட்டது; முஸ்லிம் மக்களின் மத்ரஸாக்கள் மூடப்பட்டன; முஸ்லிம்களின் மார்க்கப் புத்தகங்கள் தடை செய்யப்பட்டன; முஸ்லிம் பெண்களின் பாதுகாப்பு அச்சுறுத்தலுக்கு உள்ளானது; முஸ்லிம்களின் 28 புனித பள்ளிவாசல்கள் இல்லாமல் செய்யப்பட்டன; பள்ளிவாசல்களுக்குள் நாய்களைக் கொண்டுவந்தார்கள். இது இனவாதத்தின் உச்சம் என்பதை உங்களுக்குச் சொல்கின்றேன்.

மேலும், கடந்த கால யுத்தத்தில் நூற்றுக்கணக்கான முஸ்லிம் மக்கள் இறந்திருக்கிறார்கள். அதேபோல், இனவாத சம்பவங்களிலும் நூற்றுக்கணக்கான முஸ்லிம் மக்கள் இறந்திருக்கிறார்கள். எங்களுடைய முஸ்லிம் பள்ளிவாசல்களில் வெள்ளிக்கிழமைகளில் நடைபெறுகின்ற 'ஜும்ஆ'வில் எங்களுடைய கண்ணியமிக்க உலமாக்கள் ஒருபோதும் ஓர் இன மக்களுக்கு எதிராக ஒரு வசனமேனும் பேச மாட்டார்கள். ஆனால், 2,000 பௌத்த விகாரைகளில் முஸ்லிம்களுக்கு எதிராக கூட்டங்களை நடாத்தி, இலங்கையில் வாழ்கின்ற முஸ்லிம்களை அழிப்பதற்குத் திட்டங்கள் தீட்டப்பட்டன. இது ஒரு வரலாற்று விடயமாகும். எனவே, சுமத்தப்பட்டு இருக்கின்ற குற்றச்சாட்டிலிருந்து முஸ்லிம் சமூகத்தை விடுதலை செய்ய வேண்டுமென பொது மக்கள் பாதுகாப்புப் பிரதி அமைச்சரிடம் கேட்டுக் கொள்கின்றேன். இதனுடன் சம்பந்தப்பட்ட குற்றவாளிகள் யாராக இருந்தாலும், அவர்களைச் சட்டத்தின்முன் நிறுத்துங்கள்! இந்த நாட்டில் இவ்வாறான சம்பவங்கள் இனிமேலும் நடைபெறாமல் இருக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

அடுத்து, தற்போது நமது நாட்டில் விவசாயப் பொருட்களின் உற்பத்திச் செலவு அதிகரித்துள்ள நிலையில், அரசாங்கத்தால் நெல்லுக்கான நிர்ணய விலை அதிகரிக்கப்படாமல் உள்ளது. இதனால் விவசாயிகள் பாரிய பிரச்சினைகளை எதிர்நோக்குகின்றனர். எனவே, விவசாயிகளின் உற்பத்திச் செலவுக்கு ஏற்ப, நெல்லின் விலையை அரசாங்கம் தீர்மானிக்க வேண்டும். நெல் அறுவடை ஆரம்பமானதும் நெல்லைக் கொள்வனவு செய்ய அரசாங்கம் நடவடிக்கை மேற்கொள்ளுமென அறிவித்தது. நாட்டின் பல பகுதிகளிலும் நெல் அறுவடை ஆரம்பமாகியுள்ள நிலையில், விவசாயிகள் தங்கள் நெல்லை விற்பனை செய்ய முடியாத நிலைமை ஏற்பட்டுள்ளது. எனவே, செலவுகள் அதிகரித்திருக்கின்ற நிலைமையைக் கருத்திற்கொண்டு, அரசாங்கமானது அவசரமாக நெல்லுக்கான உத்தரவாத விலையை உயர்த்த வேண்டுமென விவசாய மக்கள் சார்பாகக் கேட்டுக் கொள்கின்றேன்.

எமது அம்பாறை மாவட்டத்தில் ஓர் ஏக்கரில் வேளாண்மை செய்வதற்கு ஆகக் குறைந்தது 183,000 ரூபாய் செலவாகும். 65 கிலோ கிராம் கொண்ட ஒரு மூடை நெல் 5,000 ரூபாய்க்குத்தான் இப்பொழுது விற்பனை செய்யப்படுகின்றது. ஓர் ஏக்கரில் 30 மூடை நெல் உற்பத்தி செய்யப்பட்டால், 150,000 ரூபாய்தான் கிடைக்கும். விவசாயி ஓர் ஏக்கரில் நெல் உற்பத்தி செய்தால் 33,000 ரூபாய் நஷ்டம் ஏற்படுகின்றது. இது தொடர்பான விபரங்கள் அடங்கிய ஆவணத்தை நான் சபாபீடத்தில் ***சமர்ப்பிக்கின்றேன்.**

குத்தகைப் பணம் 30,000 ரூபாய், வரம்பு கட்டுக் கூலி 3,000 ரூபாய், உழவுப் பணம் 20,000 ரூபாய், விதை நெல் 18,000 ரூபாய், விதைப்புக் கூலி 1,000 ரூபாய், விதை நெல் அள்ளுவதற்கு 500 ரூபாய், எண்ணெய் அடிப்புக் கூலி 1,500 ரூபாய், அரச உர மானியம் 20,000 ரூபாய், ஏனைய பசளைகள் 10,000 ரூபாய், MOP 8,500 ரூபாய், நசலெண்ணெய் 2,000 ரூபாய் உட்பட மொத்தமாக 183,000 ரூபாயை செலவழித்து ஓர் ஏக்கரில் நெல் வேளாண்மை செய்தால் 33,000 ரூபாய் நஷ்டம் ஏற்படுகின்றது.

எனவே, இந்த அரசாங்கம் விவசாயிகளுடைய உணர்வுகளைப் புரிந்துகொள்ள வேண்டும். இன்று விவசாயிகள் பாதையில் இருக்கிறார்கள். கடந்த வருடம் விவசாயிகளிடம் இருந்து கொள்வனவு செய்யப்பட்ட நெல் நீண்ட காலமாக சந்தைப்படுத்தப்படாமல் நெற்களஞ்சியங்களில் இருப்பதால், இந்த வருட நெல் அறுவடையின்போது விவசாயிகளிடமிருந்து நெல்லைக் கொள்வனவு செய்ய முடியாத நிலைமை ஏற்படுமென 6 மாதங்களுக்கு முன்னரே நான் இந்தப் பாராளுமன்றத்தில் பல தடவை சொல்லியிருக்கிறேன். அதுமாத்திரமன்றி, விவசாயிகளைப் பாதுகாக்குமாறும் நான் சொன்னேன். ஆனாலும், உரியவர்கள் கேட்கவில்லை.

எமது அம்பாறை மாவட்டத்தில் மாத்திரம் நெல் சந்தைப்படுத்தல் சபைக்குச் சொந்தமான 60 நெற்களஞ்சியசாலைகளில் 50,000 மெற்றிக் தொன் நெல் நீண்ட காலமாக இருக்கின்றது. அம்பாறை மாவட்டத்தில் சென்ற வருடம் உற்பத்தி செய்த நெல்லை விற்க முடியாத நிலையில், 83,000 மக்கள் வாழுகின்ற சம்மாந்துறை மற்றும் 22,000 மக்கள் வாழுகின்ற நிந்தவூர் பிரதேசங்களிலுள்ள விவசாயிகள் உற்பத்தி செய்த நெல்லை விற்க முடியாத நிலையில் ஆயிரக்கணக்கான மொற்றிக் தொன் நெல்லை கையிருப்பில் வைத்திருக்கிறார்கள்.

---

** පුස්තකාලයේ තබා ඇත.*

** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

** Placed in the Library.*

அம்பாறை, அம்பாந்தோட்டை, மொனராகலை, இரத்தினபுரி மாவட்டங்களிலுள்ள நெல் சந்தைப்படுத்தல் சபைக்குச் சொந்தமான நெற்களஞ்சியங்களிலுள்ள நெல்லில், ஒவ்வொரு மாவட்டத்திலிருந்தும் தலா 15,000 மெற்றிக் தொன் நெல்லை வெளியே எடுப்பதற்கான விலைமனு கோரப்பட்டுள்ளது. 2026.07.09ஆம் திகதிதான் இது தொடர்பில் இறுதித் தீர்மானம் மேற்கொள்ளப்படுமென அறிவிக்கப்பட்டுள்ளது. சிலவேளை நெல் விலை சம்பந்தமான பிரச்சினை ஏற்பட்டால், அம்பாறை, அம்பாந்தோட்டை, இரத்தினபுரி மற்றும் ஏனைய மாவட்டங்களிலுள்ள storesஇல் நெல்லை அப்படியே வைத்திருக்கவேண்டிய நிலைமை ஏற்படும் என்பதைச் சொல்லி வைக்கின்றேன். எமது அம்பாறை மாவட்டத்தின் 60 நெற்களஞ்சியசாலைகளில் உள்ள 50,000 மெற்றிக் தொன் நெல்லில் 15,000 மெற்றிக் தொன் நெல்லை -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසාන නිසා කථාව අවසන් කරන්න.

**ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)
මට තව විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

மொனராகலையில் பெரியதொரு நெற்களஞ்சியம் வெற்றிடமாக இருக்கின்றது. மஹியங்கனையில் பெரியதொரு நெற்களஞ்சியம் இருப்பதாக நாங்கள் அறிகின்றோம். அதேபோன்று, பொலன்னறுவை மாவட்டத்திலும் பெரியதொரு நெற்களஞ்சியம் இருக்கிறது. எனவே, எங்களுடைய அம்பாறை மாவட்டத்தில் கையிருப்பில் இருக்கின்ற நெல்லை உடனடியாக விசேட திட்டத்தின்கீழ் மேற்படி களஞ்சியசாலைகளில் களஞ்சியப்படுத்தி, அம்பாறை மாவட்ட விவசாயிகளின் நெல்லை உயர்ந்த விலையில் கொள்வனவு செய்வதற்கான ஏற்பாடுகளை இந்த அரசாங்கம் மேற்கொள்ள வேண்டுமென அம்மாவட்ட விவசாயிகள் சார்பில் கேட்டு, சந்தர்ப்பம் வழங்கியமைக்கு நன்றி கூறி, விடை பெறுகின்றேன்.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමා.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පරිවර්තන දෝෂයක්ද දන්නේ නැහැ. ගරු මන්ත්‍රීතුමාගෙන් කියැවුණා, විමර්ශනයේදී විෂය භාර අමාත්‍යවරයාගේ අතින් හෝ මා අතින් මුස්ලිම් ජනතාව ඉලක්ක කර ගත් විවේචනයක් සිද්ධ වුණා කියලා. ඉතාම පැහැදිලියි, මුස්ලිම් ජනතාව ඉලක්ක කර ගත් කිසිම විවේචනයක් නැහැ කියන එක. සලේ සම්බන්ධයෙන් තිබෙන විමර්ශනවලට සහාය දෙන්න කියන කාරණාව පමණයි තිබෙන්නේ. ඒ හැරෙන්න මුස්ලිම් ජනතාව ඉලක්ක කරගත් විමර්ශනයට අදාළ විවේචනයක් සිද්ධ වුණේ නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
පැහැදිලියි, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි.

ගරු සුදත් බලගල්ල මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා. *[බාධා කිරීමක්]*

**ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කාරණාවක් තිබෙනවා පැහැදිලි කරන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔය කාරණය දිගින් දිගටම පැහැදිලි කර ගන්න ගියොත් ලොකු වෙලාවක් ගතවන නිසා ඉක්මනින් කියන්න.

**ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඇත්තටම මම කිව්වේ, පසුගිය ආණ්ඩුව තිබුණු කාලයේ අපේ මුස්ලිම් ජනතාව ඉලක්ක කරලා තමයි Easter attack එක කරලා තිබෙන්නේ කියලා. මේ ආණ්ඩුව ගැන අපි එහෙම කිව්වේ නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සුදත් බලගල්ල මන්ත්‍රීතුමනි, ඔබතුමා කථා කරන්න.

[අ.භා. 3.29]

**ගරු සුදත් බලගල්ල මහතා**
(மாண்புமிகு சுதத் பலகல்ல)
(The Hon. Sudath Balagalla)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාව ලබා දීම වෙනුවෙන් ඔබතුමාට ස්තුතිවන්ත වනවා.

ඉතිහාසයේදී අපේ රට හැඳින්වූවා, "ඉන්දියන් සාගරයේ මුතු ඇටය", "පෙරදිග ධාන්‍යාගාරය" කියලා. අපි බලයට එනකොට ඒ පෙරදිග ධාන්‍යාගාරය පුරවලා තිබුණේ විෂ මත් ද්‍රව්‍යවලින්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අවුරුදු 76ක් රට පාලනය කරපු එහා පැත්තේ ඉන්න සුදු ඇඳ ගත්ත මහත්වරු හෘදය සාක්ෂියට තට්ටු කරලා අහලා බලන්න, ඔබ මේ රටට කොපමණ නම් අපරාධයක් කළාද කියලා. අපේ රටේ දේපළ හොරකම් කිරීම වෙනම ප්‍රශ්නයක්. එහෙම නැත්නම් අපේ රටේ ආර්ථිකය කඩා වැට්ටවීම වෙනම ප්‍රශ්නයක්. හැබැයි, මේ රටේ සිංහල, දෙමළ, මුස්ලිම්, මැලේ, බර්ගර් කියන මුළු මහත් ජනතාවගේ තරුණ පරම්පරාව විනාශ කරන්න ඔබතුමන්ලා මේ රට තුළ විෂ මත්ද්‍රව්‍ය සමාජගත කරලා ඉවරයි. ඔබට ඒ අපරාධයෙන් කවදාවත් බේරෙන්න බැහැ. ඔය පුටුවල බලය පාවිච්චි කරලා, දේශපාලන හයිය අරගෙන, දේශපාලන රැකවරණය අරගෙන පාතාලය පෝෂණය කරලා, දේශපාලන බලයෙන් ලංකාව පුරාම මේ විෂ

[ගරු සුදත් බලගල්ල මහතා]

මත්ද්‍රව්‍ය අරගෙන ගියා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒකට එරෙහිව තමයි මේ රටේ ජනතාව පළමු වතාවට මහජන ආණ්ඩුවක් හැදුවේ. හොඳින් තේරුම් ගන්න, මේ ආණ්ඩුව මොකක්ද කියලා. මේ ආණ්ඩුව කියන්නේ ස්වේච්ඡාවෙන් වැඩ කරන ආණ්ඩුවක්. ඉතිහාසයේ පළමුවැනි වතාවට ස්වේච්ඡාවෙන් වැඩ කරන ආණ්ඩුක් බලයට පත් කරලා තිබෙනවා. දශක හතක් තිස්සේ පැවති මේ රටේ පාලනය වෙනස් කරන්න තමයි අරගළ කරලා අපි බලයට ආවේ. එහෙම බලයට ආවේ දශක ගණනාවක් මේ රට කරන්නයි. අවුරුදු 60ක් දුක් වින්දේ මාස 60න් ගෙදර යන්න නොවෙයි. තවත් දශක ගණනාවක් මේ රට තිබෙනවා. එම නිසා මේ ආණ්ඩුව ගැන හොඳින් තේරුම් ගන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අපේ ජනාධිපතිතුමා කිව්වා සමහරු කෙඳිරිගානවා කියලා. මම හිතන විධියට, දැන් ඒක කෙඳිරිල්ලක් නොවෙයි, අඳෝනාවක් බවට පත් වෙලා. ඒ අඳෝනාව පුංචි පුංචි උද්ඝෝෂණ අස්සේ රිංගලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට ලැබී ඇති සීමිත කාලය තුළ මම මේ කාරණයත් කියන්නම්. අපේ රටේ ගොවි ජනතාවට ප්‍රශ්නයක් ඇවිල්ලා තිබෙනවා කියලා මීට කලින් කරපු කථාවලදීත් කිව්වා. ඔබතුමන්ලා දන්නවාද, 1971දී වී අලෙවි මණ්ඩලය පිහිටුවූවාට පස්සේ මේ රටේ ජනතාවගේ වී මිලදී ගන්න යම් තැනක් හදලා තිබුණාය කියලා? හැබැයි, 1971දී පිහිටවපු වී අලෙවි මණ්ඩලය 1981 අවුරුද්ද වනවිට වට්ටන්න අදාළ පිඹුරුපත් හැදුවා. වී අලෙවි මණ්ඩලයට ලොරි 19ක් සහ ජීප් රථ 59ක් තිබුණා. අපි ආණ්ඩුව භාර ගන්නකොට එක ලොරියයි තිබුණේ, මහත්වරුනි. සේවකයෝ 1,826ක් හිටියා. අපි ආණ්ඩුව භාර ගන්නකොට සේවකයන් 159යි හිටියේ. ගබඩා සුන්නද්දූලි කරලා දාලා තිබුණේ. ඔය උද්ඝෝෂණය කරන මහත්වරුන්ගේ හදවත්වලට තට්ටු කරලා බලන්න, එක වී ඇටයක් ඒ ආණ්ඩු මිලදී ගත්තාද කියලා. නැහැ, එක වී ඇටයක් ඒ ආණ්ඩු මිලදී ගත්තේ නැහැ. ඒ මොහොතේ තමයි මේ මහජන ආණ්ඩුව බලයට පත් වෙලා, ගබඩා ටික සුද්ද කරලා, ගබඩා 256ක් වීවලින් පුරවන්න පටන් ගත්තේ. කුඩුවලින් පුරවන්න හිටපු රටක් තමයි අපි වෙනස් කළේ. දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? දැන් මේ විපක්ෂයේ මහත්වරු දන්නවා, මේ ගමන මෙහෙම ගියොත් සදාසොත්ති තමයි කියලා. ඔබතුමන්ලාට නැවත කවදාවත් ආණ්ඩුව පැත්තට එන්න වෙන්නේ නැහැ. ඒක නිසා දැන් පුංචි පුංචි ප්‍රශ්න මතු කරන්න පටන් ගන්නවා. ඒකයි මම කිව්වේ කෙඳිරිල්ල දැන් අඳෝනාවක් බවට පත් වෙලා තිබෙනවා කියලා. උද්ඝෝෂණය කරන මහත්වරු මේක පොඩ්ඩක් තේරුම් ගන්න බලන්න කියලා මම කියනවා.

අපේ ආණ්ඩුව බලයට පත් වුණාට පස්සේ ඉතිහාසයේ පළමුවැනි වතාවට ගොවීන්ට වීවලට හොඳ මිලක් ලබා දුන්නා. ඒ විතරක් නොවෙයි, වී මිලදී ගැනීමේ ක්‍රමයත් හැදුවා. ඒ වාගේම අපි කෘෂි කර්මාන්තයේ, වාරි ක්ෂේත්‍රයේ දැවැන්ත විප්ලවයක් කරමින් යනවා. ඒකට විපක්ෂයේ අය භය වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බලශක්තියටත් අපි උත්තරයක් දුන්නා. මේ රටේ විදුලි බලාගාරවලට සූර්ය විදුලි පද්ධතිය එකතු කළා. ඒ වාගේම සුළං විදුලි පද්ධතිය එකතු කළා. මේක ක්‍රමිකව ගියොත් මොකද වෙන්නේ? අපි කිව්වා වාගේම විදුලි බිල අඩු කරන්න පුළුවන්. නැඟෙනහිර පළාතේ තිබෙන මහ තෙල් ටැංකි ටික 1921දී හැදුවේ. ජපනා බෝම්බ දාලා එයින් 2ක් විනාශ කළා. තව 99ක් තිබුණා. ඒවා ඉන්දියාවට දුන්නා, සාටක මහත්වරු. හැබැයි, අපි බලයට ඇවිල්ලා එයින් ගබඩා 4ක් නැවත ප්‍රතිසංස්කරණය කළා. ඉන්ධන අර්බුදයට උත්තරය ඉදිරියේදී අපේ අතින් හම්බ වෙනවා. ඒවාට ඉදිරියේදී උත්තරය හම්බ වුණොත් මේගොල්ලන්ට ඉස්සරහට ගමනක් යන්න වෙන්නේ නැහැ. ඒ නිසා භයයි. එම නිසා අපේ රටේ ආදරණීය ජනතාවට අපි කියනවා, අවුරුදු 76ක් මේ පුටුවල ඉඳලා ඔයගොල්ලන්ගේ ජීවිත විනාශ කරපු, ඔයගොල්ලන්ගේ ජීවිතවලට කණ කොකා හඬවපු, ඔයගොල්ලන්ගේ දුවා දරුවන්ට බත් පත වෙනුවට කුඩු පැකට් එක ගෙනැත් දෙන්න හදපු මේ මිනිසුන්ට එරෙහිව තමයි මේ මහජන ආණ්ඩුව හැදුවේ කියන එක. ඒ මහජන ආණ්ඩුව කවදාවත් වට්ටන්න බැරි මෙන්න මේ හින්දායි, මහත්වරුනි. එදා අපට විශ්වාසය පළ කළේ හැටනවලක්ෂයක් වුණත් මේ අවුරුදු පහ ගෙවෙනකොට අපි මේ රටේ ජනතාවගේ විශ්වාසය තවදුරටත් දිනා ගන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ආණ්ඩු බලයට පත් වෙලා අපට බෙදා ගත්තේ නැහැ. අපේ විශ්‍රාම වැටුප අපි කපා ගන්නකොට, අපේ වාහන පර්මිට් එක අපි අහෝසි කර ගන්නකොට, අපේ වරප්‍රසාද එකින් එක කප්පාදු කරනකොට අපි රාජ්‍ය සේවකයන්ගේ වැටුප් වැඩි කළා. එදා අපි විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් විධියට මහපොළ ශිෂ්‍යාධාරය වැඩි කර ගන්න කොච්චර නම් කඳුළු ගෑස් ප්‍රහාරවලට ලක් වුණාද, කොච්චර ගුටි කෑවාද? හැබැයි, අපේ ආණ්ඩුව බලයට පත් වෙලා මහපොළ ශිෂ්‍යාධාරය සියයට සියයක් වැඩි කළා, එක උද්ඝෝෂණයක්වත් කරන්නේ නැතිව. විශේෂ ආබාධ සහිත කෙනෙක් විශ්වවිද්‍යාලයට ආවා නම් ඒ දරුවාට තවත් රුපියල් 10,000ක් දුන්නා. ඒවා ඉල්ලලා උද්ඝෝෂණ තිබුණේ නැහැ.

මේ රටේ වතු කම්කරුවන්ට ඉතිහාසගත වැටුප් වැඩිවීමක් කළා. ඒ විතරක් නොවෙයි, දරුවන් 300ට අඩු පාසල්වල ඉන්න හැම දරුවෙකුටම රුපියල් 6,000ක් දුන්නා. වකුගඩු රෝගීන් සඳහා ලබා දෙන දීමනාව වැඩි කළා. පොහොර සහනාධාරය සියයට සියයකින් වැඩි කළා. ඔය උද්ඝෝෂණය කරන මහත්වරු ඒවා ගැනත් හිතන්න. කලින් පොහොර සහනාධාරය හැටියට හෙක්ටෙයාරයකට රුපියල් 15,000යි ලැබුණේ. ඊට පසුව හෙක්ටෙයාරයකට ලැබුණේ රුපියල් 30,000යි. ඒක දැන් රුපියල් 60,000ක් වෙලා තිබෙන්නේ. ජනතාවට එහෙම සහනාධාර බෙදපු ආණ්ඩුවක් මේක. එහෙම නැතුව මේක අපට බෙදා ගත්ත ආණ්ඩුවක් නොවෙයි. අපට තිබෙන සියලු දේවල් කප්පාදු කරමින් - කපා ගනිමින් - මහජනතාවට බෙදන ආණ්ඩුවක් මේක.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එදා අපේ රටේ කොළඹට විතරක් සීමා වෙච්ච විෂ මත්ද්‍රව්‍ය භාවිතය අද ගම් දනව් පුරා ගිහින් තිබෙනවා. අන්න ඒ විෂ මත්ද්‍රව්‍ය මර්දනය කරනකොට හීන් කෙඳිරිලි නොවෙයි, අඳෝනා එනවා. හරක් කටාගේ නියෝජිතයන් මේ පුටුවල ඉඳගෙන ඉන්නවා. සුදුවට ඇඳගෙන සාටක දමාගෙන ඔවුන් මේක ඇතුළේ ඉන්නවා. අන්න ඒ සාටක දමා ගත්ත හරක් කටාගේ නියෝජිතයන්ට අපි මේ කාරණය කියනවා. මේ ආණ්ඩුව බලයට පත් කරනකොට අපි කිව්වා, නීතිය හැමෝටම උඩින් කියලා. අන්න ඒ නීතිය ඔබ හොයා ගෙන එනවා. ඒක නවත්වන්න බැහැ. මේ මහජන ආණ්ඩුව කවදා හෝ මේ රටේ ජනතාවට යුක්තිය ඉෂ්ට සිද්ධ කරනවා කියන කාරණය කියමින්, මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු කේ. සුජිත් සංජය පෙරේරා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.36]

**ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා**
(மாண்புமிகு கே. சுஜித் சஞ்ஜய பெரேரா)
(The Hon. K. Sujith Sanjaya Perera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විෂ මත්ද්‍රව්‍ය තුරන් කිරීම සහ ජාතික ආරක්ෂාව සම්බන්ධව සභාව කල් තබන අවස්ථාවේ ගෙනා යෝජනාව ගැන අදහස් දක්වන්න අවස්ථාව ලැබීම ගැන මම සතුටු වෙනවා. පසුගිය කාල සීමාව තුළ මත්ද්‍රව්‍ය සම්බන්ධව කිසිම ආණ්ඩුවක් කිසිම අවස්ථාවක ක්‍රියා කළේ නැහැ, නීතිමය පැත්තෙන් ක්‍රියාමාර්ගයක් ගත්තේ නැහැ කියන එක තමයි මෙම යෝජනාව ඉදිරිපත් කළ මන්ත්‍රීතුමිය මේ සභාවේදී පැහැදිලි කරන්න උත්සාහ දැරුවේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය කාල සීමාව තුළ තිබුණු හැම ආණ්ඩුවක්ම මත්ද්‍රව්‍ය උවදුර නතර කරන්න, මත්ද්‍රව්‍ය අත්අඩංගුවට ගන්න වාගේම ඒවා පාලනය කරන්න ලොකු කාර්යභාරයක් ඉෂ්ට කළ බව මම කියන්න කැමතියි. ඒ විධියට කටයුතු කළේ මේ ආණ්ඩුව විතරක් නොවෙයි. මේ ආණ්ඩුව බලයට ඇවිත් දැන් අවුරුදු දෙකක් ගත වෙලා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ ආණ්ඩුවේ ඉන්න මන්ත්‍රීවරුන්ගෙන් සහ ඇමතිවරුන්ගෙන් මම අහන්න කැමැතියි, ඔබතුමන්ලා මේ අවුරුදු දෙකක කාල සීමාව තුළදී මෙච්චර මත්ද්‍රව්‍ය අත්අඩංගුවට ගත්තා නම්, මේ සා විශාල ප්‍රමාණයක වැඩ කටයුතු කළා නම්, මත්ද්‍රව්‍ය උවදුර සම්පූර්ණයෙන් අවසන් කරන්න ඔබතුමන්ලාට පුළුවන්කමක් ලැබිලා තිබෙනවාද කියලා.

මත්ද්‍රව්‍ය උවදුර කියන්නේ ලෝකයේ සංවිධානාත්මක ජාලයක් බව අපි දන්නවා. මේක සියයට සියයක් සම්පූර්ණයෙන් නැති කරන්න කාටවත් පුළුවන්කමක් නැහැ. ඒ නිසා මම මේ අවස්ථාවේදී කියන්න කැමතියි, මේ වාගේම අත්අඩංගුවට ගැනීම් පසුගිය කාල සීමාවේදීත් කළ බව. ඒ නිසා මේක ඔබතුමන්ලාගේ ආණ්ඩුවේ කාර්යභාරයක් හැටියට විතරක් පෙන්වන්න උත්සාහ දරන්න එපා.

මේ යෝජනාව ගැන කථා කරනවාට වඩා මේ සභාවේදී වැඩිපුර කථා කළේ පසුගිය ආණ්ඩුවල තිබුණු අඩුපාඩුකම් ගැන. මට ඉස්සෙල්ලා කථා කරපු මන්ත්‍රීතුමා කිව්වේ මොකක්ද? 1971දී වී ගබඩා ටික ආරම්භ කරලා වී අලෙවි මණ්ඩලය ස්ථාපිත කළාය කිව්වා. ඒක ඇත්ත. ඒක අපි පිළිගත්තා. නමුත්, ඒ අවස්ථාවේදී ගරු සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය ඒ වාගේ ජනතාවාදී ව්‍යාපාර පටන් ගන්නකොට ඒවාට විරුද්ධව කැරලි ගැහුවේ කවුද කියන එකත් අපි අහන්න ඕනෑ. ඒ ආණ්ඩුව පිහිටුවා අවුරුද්දක්වත් ගියේ නැහැ, ඒ කාලයේ හිටපු ඔබතුමන්ලාගේ නායකයෝ ඒ අවස්ථාවේ සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියට එරෙහිව කැරලි ගහලා කටයුතු කළා. එහෙම කරලා ඒ වෙලාවෙත් අපේ රටේ තරුණ තරුණියන් දහස් ගණනක් මරන්න කටයුතු කළේ කවුද කියන එකත් මම මේ අවස්ථාවේදී අහන්න ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ වාගේම කිව්වා, 1971න් පස්සේ වී ගබඩා ටික නැති කළාලු, වී අලෙවි මණ්ඩලය නැති කළාලු. වී අලෙවි මණ්ඩලය නැති කළේ, 1988-89 කාලයේ. ඒ කාලයේ වී අලෙවි මණ්ඩලය සතු වී ගබඩා තිස් ගණනකට වැඩිය විනාශ කරන්න කටයුතු කළා. රජයේ ගොඩනැඟිලි විනාශ කළා.

අද ප්‍රවාහනය ගැන කථා කරනවා. පතුල පහත් වෙච්ච බස් ගෙනාවාලු. ඒ බස් ගෙනැල්ලා මේ රටේ ජනතාවට පොදු බස් සේවයක් ආරම්භ කරලා තිබෙනවාලු, ප්‍රවාහන සේවයක් ආරම්භ කරලා තිබෙනවාලු. අපි කියන්න කැමැතියි, ඒ කාලයේ ලංගම බස් රථ විතරක් 553ක් ගිනි තියන්න කටයුතු කළ බව. වී ගබඩා ටිකට ගිනි තැබුවා. තැපැල් කන්තෝරු ටිකට ගිනි තැබුවා. අද තේ කර්මාන්තය ගැන කථා කරනවා, වතු කම්කරුවන් ගැන කථා කරනවා, සේවකයන් ගැන කථා කරනවා. කර්මාන්තශාලා ටික, රබර් කර්මාන්තශාලා ටික ගිනි තැබුවේ කවුද? ඒවා වුණේ අවුරුදු 76ක ශාපයෙන්ද? මේ ඔක්කෝටම වග කියන්න ඕනෑ තමුන්නාන්සේලායි. ඒ නිසා තමුන්නාන්සේලා ඔතැන ඉඳගෙන චෝදනා කරන්න එපා. සමගි ජන බලවේගය කිසිම අවස්ථාවක මෙවැනි චෝදනාවලට මුහුණ දීලා නැහැ. සමගි ජන බලවේගයට චෝදනා කරන්න තමුන්නාන්සේලාට පුළුවන්කමක් නැහැ, ගරු මන්ත්‍රීතුමනි. මේ හැම ශාපයකටම තමුන්නාන්සේලාත්, එල්ටීටීඊ සංවිධානයත් තමයි වග කියන්න ඕනෑ.

1971දී කැරැල්ලක් ගෙනාවා. ඊට පස්සේ 1988-89 කාලයේත් ගෙනාවා. තරුණ තරුණියෝ 60,000ක් විතර මරන්න කටයුතු කළා. ඒ දේපොළ විනාශය ගත්තොත්, අලාභය ඩොලර් බිලියන 200ක්. එල්ටීටීඊ සංවිධානයයි, ජනතා විමුක්ති පෙරමුණයි එකතු වෙලා රටට කරපු අපරාධයේ අලාභය, ඩොලර් බිලියන 200ක්. ඒ තමයි ඒ දෙගොල්ලෝ එකතු වෙලා කරපු අපරාධය. ඒ අපරාධය කරලා අවුරුදු 76ක ශාපය කියලා අපට චෝදනා කරන්න හදනවා. මම තමුන්නාන්සේලාට කියන්නේ මේකයි. අවුරුදු 76ක ශාපය නොවෙයි, රට බංකොලොත් කරපු නායකයන්ට විතරක් චෝදනා කරන්න. අපට චෝදනා කරන්න එන්න එපා. රට බංකොලොත් කරන්න ඔබතුමන්ලා තමයි උදව් කළේ. 2005දී රාජපක්ෂ මහත්වරුන් වෙනුවෙන් පෝස්ටර් ගහලා, රාජපක්ෂ මහත්වරු බලයට ගෙනැල්ලා මේ රටට මේ විනාශය කළා නම්, - රට විනාශ කෙරුවා කියලා තමුන්නාන්සේලා නේ කියන්නේ - තමුන්නාන්සේලා තමයි සියයට සියයක්ම ඒ වගකීම භාර ගන්න ඕනෑ. එහෙම නැතිව සමගි ජන බලවේගයටවත්, අපටවත් තමුන්නාන්සේලා චෝදනා කරන්න එන්න එපා. මම මේ අවස්ථාවේදී ඒක කියන්න ඕනෑ.

ඒ වාගේම නොයෙකුත් ආකාරයේ අස්ථාන චෝදනා කළා. සජිත් ප්‍රේමදාස මැතිතුමාගේ නැඟණියටත් චෝදනා කළා. මම අහගෙන හිටියා ඊයේ මන්ත්‍රීතුමියක් කිව්වා, අද තවත් මන්ත්‍රී කෙනෙක් කිව්වා, හොර සල්ලි අච්චු ගැහුවා කියලා. මම තමුන්නාන්සේලාට කියන්න ඕනෑ ඒ ගැන. එතුමියට ලැබුණු ණය මුදලක් බැංකුවට දමන්න යනකොට තමයි එවැනි ප්‍රශ්නයක් මතු වුණේ. ඊට පස්සේ ඒකට කොළඹ මහෙස්ත්‍රාත් උසාවියට ගියා. තමුන්නාන්සේලාට ඕනෑ නම් අපි දෙන්නම් ඒකට ලැබුණු තීන්දු තීරණ. අවසානයේ අපේ සජිත් ප්‍රේමදාස මැතිතුමාගේ සොහොයුරිය වන්දියකුත් ගත්තා, ඒ චෝදනා සියල්ලෙන්ම නිදහස් වෙලා. දැන් මඩ ගහන්න දෙයක් නැතිව තමුන්නාන්සේලා සජිත් ප්‍රේමදාස මහත්තයාට ඒ චෝදනා කරන්න හදනවා.

මම තමුන්නාන්සේලාට තවත් කාරණයක් කියන්න ඕනෑ. මෙතැන කථා කරපු හැම කෙනාම කථා කළේ මොකක්ද? වරිත් අබේසිංහ කියලා මහත්මයෙක් ඉන්නවාලු, අපේ හොරණ සංවිධායක හැටියට. හොරණ සංවිධායක හරි කවුරු හරි කමක් නැහැ, චෝදනාවක් තිබෙනවා නම් අපටත් පුළුවන් ඒ වෙනුවෙන් පියවර ගන්න. දැන් ඔබතුමන්ලා අහනවා, "සජිත් ප්‍රේමදාස මහත්තයා මොකද කරන්නේ, හොඳ මිනිස්සු හොයා ගන්න බැරිද?" කියලා. මම මේ කාරණය අහන්න කැමැතියි. ජනාධිපතිතුමා මෙතැනට ඇවිල්ලා ඊබ්‍රාහිම් නානා ගැන කිව්වේ මොකක්ද, "ජාතික ලැයිස්තුවට අපි දැම්මා තමයි. අපට හොයා ගන්න බැරි වුණා. අපි කාලා බැලුවේ නැහැ" කිව්වා. ඉතින් එහෙම නම් සජිත් ප්‍රේමදාස මහත්තයාටත්, අපටත් කියන්න තිබෙන්නේ, "අපිත් කාලා බැලුවේ නැහැ" කියලායි. අපට මිනිස්සු කාලා බලන්න පුළුවන්කමක් නැහැ තමයි ඔබතුමන්ලා කියනවා වාගේ ම. ඒ සඳහා මොකක්ද ගත්ත පියවර කියලා සජිත් ප්‍රේමදාස මහත්තයාගෙන් ඇහුවා නේ. අපි නම් පියවර ගත්තා. ඒ කෙනාගේ පක්ෂ සාමාජිකත්වය තහනම් කළා. එතුමා දැරූ තනතුරුවලින් ඉවත් කළා. ඒ කටයුතු ඔක්කෝම කළා. ජනාධිපතිතුමා ඇතුළු

[ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා]

ඔබතුමන්ලාගෙන් මම මේ කාරණය අහන්න කැමැතියි. දැන් ඔබතුමන්ලාගෙත් චෝදනා තිබෙන මැති ඇමතිවරු ඉන්නවා නේ. ඒ අය සම්බන්ධයෙන් ගත්ත පියවර මොනවාද? කන්ටේනර් ප්‍රශ්නය තිබෙනවා. වැඩිය ඕනෑ නැහැ, පොහොර case එක තිබෙන ඇමතිවරයෙක් ඉන්නවා නේ, බාල ගල් අඟුරු ගෙනාපු. එතුමාට මොකක්ද කළේ? එතුමාට චෝදනාවක් තිබුණා කියලා අවශ්‍ය පියවර ගත්තාද? පක්ෂ සාමාජිකත්වය තහනම් කළා ද? එහෙම කළාද? හිටපු කථානායකතුමා හොර සහතික දුන්නා. චෝදනා මොනවාද ඉදිරිපත් කළේ? අඩුම ගණනේ පක්ෂ සාමාජිකත්වය තහනම් කරන්න කටයුතු කළාද? එහෙම නම්, අර

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

*[බාධා කිරීමක්]* ඔබතුමා නොවෙයි. අර ගුරු සංගම් හදාගෙන ගුරුවරු ටික මුළා කරපු කෙනා. එතුමාට චෝදනාවක් තිබෙනවා, කම්කරු ගොඩනැඟිල්ලක් හොරට ගත්තා කියලා, අර විදුලිබල මණ්ඩලය විනාශ කරපු නගරාධිපතිතුමාත් එක්ක එකතු වෙලා. කැබිනට් ඇමතිවරුත් ඉන්නවා. ඒගොල්ලන්ට ගත්ත පියවර මොකක්ද? අපි නම් අඩුම ගණනේ අර කියපු සංවිධායකතුමාගේ සාමාජිකත්වය හෝ අහෝසි කළා. ඒ වාගේම අපි පක්ෂය පැත්තෙන් එතුමාට විරුද්ධව පියවර ගත්තා. ඔබතුමන්ලාත් දෙන්නකෝ ආදර්ශයක්. කෝ, ඔබතුමන්ලාගේ නායකතුමන්ලා? දෙන්නකෝ ආදර්ශයක්. පුළුවන් නම් ගල් අඟුරු සිද්ධියට සම්බන්ධ ඇමතිතුමා සාමාජිකත්වයෙන් අයින් කරන්න. *[බාධා කිරීමක්]* වටගල මැතිතුමා දමන්න පුළුවන්. ගරු වටගල නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා හරි කමක් නැහැ ඒක බාර ගන්න. ගරු මන්ත්‍රීතුමනි, මේ වාගේ චෝදනා තමයි තිබෙන්නේ. ඔබතුමන්ලා මහ ලොකුවට කථා කරනවා පූර්වාදර්ශ දෙන්න. අඩුම ගාණේ ඔබතුමන්ලාගේ පැත්තෙන් ආදර්ශයක් දෙන්නකෝ. ආදර්ශයක් දීලා මේ රටේ ජනතාවට පෙන්වන්නකෝ, අපි මෙහෙමයි කරන්නේ කියලා. නිකම් කථාවෙන් විතරක් කියලා වැඩක් නැහැ නේ. ක්‍රියාවෙනුත් ඔප්පු කරලා පෙන්වන්න. සජිත් ප්‍රේමදාස මහත්මයා ඇතුළු අපි ඒ කටයුත්ත කෙරුවා. ඒ නිසා මම ඔබතුමන්ලාට කියන්නේ නිකම් අස්ථාන චෝදනා ඉදිරිපත් කරන්න එපා කියායි.

විශේෂයෙන්ම මම තව එක කාරණාවක් කියන්න ඕනෑ. ඒ වෙනුවෙන් මට විනාඩියක් ලබා දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය නම් දැන් අවසානයි. එම නිසා ඉක්මනින් කථාව අවසන් කරන්න.

**ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා**
(மாண்புமிகு கே. சுஜித் சஞ்ஜய பெரேரா)
(The Hon. K. Sujith Sanjaya Perera)
මේ කාරණාව මාතෘකාවට අදාළ කාරණාවක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. විශේෂයෙන්ම නුවරඑළිය දිස්ත්‍රික්කයේ එළවලු වගාවට සම්බන්ධ වෙලා සිටින ගොවි ජනතාවගේ ඉල්ලීමක් තිබෙනවා. ඒ අය බොහොම දුක් මහන්සියෙන් තමයි මේ එළවලු වගාව කරන්නේ. ඒ එළවලු නුවරඑළිය ආර්ථික මධ්‍යස්ථානයට ගෙන ගියාම නුවරඑළිය ආර්ථික මධ්‍යස්ථානයේ ඉන්න මුදලාලිලා, ඒ කියන්නේ එළවලු මිලදී ගන්නා අයට සාමාන්‍යයෙන් සියයට 20ක, 30ක විතර කොමිෂන් එකක් දෙනවා. ඒක ලබා දෙමින් තිබියදීත් ආපහු ඒ අය ගොවීන්ගෙන් තවත් රුපියල් 100ක්, 200ක් අය කර ගන්නවා. මෙතැනදී දෙපැත්තෙන්ම ගසා කෑමක් සිද්ධ වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අනෙක් පැත්තෙන් තවත් සිදුවීමක් වෙනවා. ඒ තමයි, එළවලු දමන බෑග් එකකට සාමාන්‍යයෙන් රුපියල් 200ක, 300ක විතර මිලකුත් නියම කරනවා. මේ එළවලු වගා කරන ගොවි ජනතාව නොයෙකුත් දුෂ්කරතා මැද්දේ, අපහසුතා මැද්දේ අව්වට වේළෙමින්, වැස්සට තෙමෙමින් එළවලු වගා කරලා ඒවා ආර්ථික මධ්‍යස්ථානයට අරන් ගියාම, ඒ නියමිත මුදල ලැබෙන්නේත් නැහැ. එතැනදීත් ගසාකෑමක් සිද්ධ වෙනවා. ඒ නිසා මම ඉල්ලා සිටින්න කැමැතියි, ඒ සම්බන්ධයෙන් අදාළ ඇමතිවරුන්ගේ - දැන් නම් සභාවේ පෙනෙන්න නැහැ - අවධානය යොමු කරන්න කියලා. මේ ගැන සොයා බලා එළවලු ගොවීන්ට මොකක් හරි සාධාරණයක් කිරීමට කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සංජීව රණසිංහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.45]

**ගරු සංජීව රණසිංහ මහතා**
(மாண்புமிகு சஞ்ஜீவ ரணசிங்ஹ)
(The Hon. Sanjeewa Ranasingha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විෂ මත්ද්‍රව්‍ය තුරන් කිරීම හා ජාතික ආරක්ෂාව පිළිබඳ විවාදය පැවැත්වෙන මේ මොහොතේදී ඒ සම්බන්ධයෙන් කථා කරන්නට අවස්ථාව ලැබීම පිළිබඳව මම සතුටු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මීට කලින් කථා කරපු විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශයට පත් කරන්න උත්සාහ කළා, මේ රටේ ආර්ථිකය, මේ රටේ සංස්කෘතිය, මේ රටේ දේශපාලනය බංකොලොත් කළේ ජනතා විමුක්ති පෙරමුණයි කියන එක. එහෙම නැත්නම් 1988-89 වකවානුවේ එය සිදු වුණා කියන එක තමයි එතුමාගේ අදහස වුණේ. අපි දන්නවා, වසර 76ක් තිස්සේ පැවති දේශපාලන ක්‍රමය ඇතුළේ මේ රටේ ජනතාව රවටන්න, අතරමං කරන්න, මංමුළා කරන්න කටයුතු කළ ආකාරය. ඒ සාම්ප්‍රදායික දේශපාලන මතධාරීන්, ඒ දේශපාලනඥයන් හැමදාම උත්සාහ කළේ, 1988-89 කාලයේ දේශපාලනය නිසා තමයි මේ රටේ ආර්ථිකය බංකොලොත් වුණේ, එහෙම නැත්නම් සමාජ සංස්කෘතිය කඩා වැටුණේ කියන එක හුවා දක්වන්නයි. ඒ ගැන අපි කනගාටු වෙනවා. මේ රටේ ජනතාව පරාජයට පත් කරපු, බැහැර කරපු, ප්‍රතික්ෂේප කරපු එවැනි සාම්ප්‍රදායක මත තවදුරටත් කරපින්නා ගෙන එන්න උත්සාහ කරනවා නම්, විපක්ෂය හෙට දවසේ කොහේද නවතින්නේ කියන එක පිළිබඳව අපට හරිම පැහැදිලියි. අපි ඒ කාරණයත් කියන්න ඕනෑ.

මීට කලින් කථා කරපු ඒ ගරු මන්ත්‍රීවරයා ඇතුළු විපක්ෂය පැත්තෙන් ආපු කාරණය තමයි, ආර්ථිකය කඩා වැටීම, බිඳ වැටීම හරහා විෂ මත්ද්‍රව්‍ය ජාවාරම් පැතිරෙනවා කියන එක. ඒක අපි දන්නවා. ගෙවුණු වසර 76ක කාලවකවානුව ඇතුළේ බිඳ වැටුණු, බංකොලොත් වුණු, ආර්ථිකය ක්ෂය වුණු, ගෑස් නැවක්, තෙල් නැවක් ගෙන්වා ගන්න බැරි වුණු ආර්ථිකයක් නිර්මාණය කරපු ඒ දේශපාලන සංස්කෘතියේ ගමන් මඟ ඇතුළේ ඒ අයට ඕනෑකම තිබුණා, අර කලින් කථා කරපු මන්ත්‍රීවරයා වාගේ තවදුරටත් එවැනි චෝදනා, එවැනි මතවාදවලින් මේ සමාජය රවට්ටාගෙන ඉන්න.

ඉතිහාසයේ වෙච්ච දේ මොකක්ද? අපි පුංචි කාලයේ ආසාවෙන් බලපු චිත්‍රපටයක් තිබුණා. "ගෙදර බුදුන් අම්මා" තමයි ඒ චිත්‍රපටයේ නම. කමල් අද්දරආරච්චි කියන කලාකරුවා තමයි ඒ චිත්‍රපටයේ ප්‍රධාන චරිතයට පණ පෙව්වේ. ඔවුන් ප්‍රකාශ කරනවා වාගේම අතීතයේදී ගමකට විෂ මත්ද්‍රව්‍ය පිළිබඳ මතකයක්, අත්දැකීමක් නැහැ; ආශ්වාදයක් නැහැ. ඒවාට සමීප බවක් තිබුණේ නැහැ. නගරයේ විතරයි තිබුණේ. හැබැයි, පසුගිය කාලයේ මොකක්ද වුණේ? අපේ නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා වාගේ දේශපාලනඥයා, පාතාලය ඇතුළු අනෙකුත් කණ්ඩායම් හරහා තමයි මේවා පෝෂණය වුණේ. ඒ නිසා කඩා වැටුණු ආර්ථිකයට, බිඳ වැටුණු ඒ සංස්කෘතියට, ඒ ජීවිතවලට උත්තර දෙන්න බැරි පාලකයෝ හැමදාම බලාපොරොත්තු වුණා, අපේක්ෂා කළා, සොම්බි සමාජයක්. ප්‍රශ්නවලට සංවේදී නැති සමාජයක්, ගැටලු පිළිබඳව හිතන්න බැරි සමාජයක්, දියුණු විධියට කල්පනා කරන්න බැරි සමාජයක් ඔවුන් අපේක්ෂා කළා. ඒ නිසා තමයි අද මේක ඔඩු දුවපු, පාලනය කර ගන්න අපහසු සංකීර්ණ ගැටලුවක් දක්වා වර්ධනය වෙලා තිබෙන්නේ. සොම්බි සමාජයක් බවට පත් කරන්න හදපු, හිතන්න බැරි, කල්පනා කරන්න බැරි, තර්කානුකූල නොවන සමාජයක් නිර්මාණය කරන්න උත්සාහ කරපු මේ රටේ සමාජය අලුතින් හිතන, නිර්මාණශීලී සමාජයක් බවට පත් කරන්න නම්, තරුණ පරම්පරාවේ දැතින් ගොඩනහන්න පුළුවන් සමාජයක්, රටක් බවට පත් කරන්න නම්, විෂ මත්ද්‍රව්‍ය මේ රටින් සහමුලින් තුරන් කරන්න ඕනෑය කියලා අපි විශ්වාස කරනවා. ඒ වෙනුවෙන් තමයි වර්තමාන රජය සක්‍රියව මැදිහත් වෙලා, "රටම එකට" ජාතික මෙහෙවර සඳහා අත්වැල් බැඳගෙන ඉන්නේ.

පසුගිය කාලය පුරා ආගමික සිද්ධස්ථාන මට්ටමින්, පාසල් මට්ටමින්, ගම්මානවල තිබෙන පොදු සමාජ සංවිධාන මට්ටමින් අපි ඒ කාර්යය සඳහා මැදිහත් වෙමින්, සංවිධානය කරමින් කටයුතු කළා. ගම් බිම්වල තරුණයන්ට ඒ දැනුම, අවබෝධය ලබා දෙමින්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස හරහා, ශාසනාරක්ෂක බල මණ්ඩල හරහා අදාළ මැදිහත්වීම් කරමින්, "රටම එකට" නම් වූ මත්ද්‍රව්‍ය තුරන් කිරීමේ ජාතික වැඩ පිළිවෙළට අදාළව දැවැන්ත මෙහෙවරක් දියත් කරගෙන ගියා. කලින් මත්ද්‍රව්‍ය ඇල්ලුවා, වැටලීම් කළා, අත්අඩංගුවට ගැනීම් කළා කිව්වාට ඒ සියල්ල නාමිකව කළ ඒවා විතරයි. ඇත්ත වුවමනාවෙන්, කැපවීමෙන්, ජාතික අරමුණක් සහිතව ඒකට මැදිහත් වුණා නම් මේ තත්ත්වය වර්ධනය වෙන්නේ නැහැ. නමුත් ජාතික ජන බලවේගය ආණ්ඩුවේ "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන සංකල්පය ඇතුළේ, මතින් තොර රටක්, දියුණු සමාජයක්, දියුණු ආර්ථිකයක්, දියුණු සංස්කෘතියක් කියන සංකල්ප ඇතුළේ, මේ රට ඉදිරියට ගෙන යන්න අවශ්‍ය කරන ගමන් මඟ ඇතුළේ ඉවත් කළ යුතු මූලිකම දෙයක් ලෙස තමයි අපි මේ විෂ මත්ද්‍රව්‍ය හඳුනාගෙන තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය දවස්වල අපි දැක්කා, ඒ පැරණි දේශපාලනය පාතාලයත් එක්ක, මත්ද්‍රව්‍ය ජාවාරම්කාරයන් එක්ක කෙතරම් දුරට එකට බැඳිලා හිටියාද කියලා. ඊයේත්, පෙරේදාත්, මෑත ඉතිහාසය පුරාමත් සිදු වුණු ඒ අත්අඩංගුවට ගැනීම්, ඒ නීතිය ක්‍රියාත්මකවීම් ඇතුළේ දඬුවම් ලබපු, දඬුවම් නියම වුණු සියලුදෙනා දෙස බලනකොට අපට අවබෝධ වෙනවා, අපට තහවුරු වෙනවා, මේ විෂ මත්ද්‍රව්‍ය උවදුර කෙතරම් දුරට, කෙතරම් ගැඹුරු තැනකට, කෙතරම් අපහසු තැනකට පත් කරලා තිබෙනවාද කියලා. ඒ නිසා අපි ඔබට කියනවා, අපි විපක්ෂයට අවධාරණය කරනවා අපට ඕනෑ හොඳ රටක් අවශ්‍ය බව. ඒ වෙනුවෙන් අපි දේශපාලනඥයන් ලෙස ඒ පැවැති දේශපාලන සංස්කෘතිය වෙනස් කළා. මේ රටේ ජනතාවට ගොඩක් දුරින් තිබුණු, මේ රටේ ජනතාවට සමීප වෙන්න බැරි වෙලා තිබුණු, මේ රටේ ජනතාව භීතියට පත් කරපු, යට කරගෙන හිටපු, මේ රටේ ජනතාවට වඩා ගොඩක් උඩින් තිබුණු දේශපාලන සංස්කෘතිය අපි වෙනස් කළා. දේශපාලනඥයා සහ ජනතාව අතර තිබුණු පරතරය අපි ඉවත් කළා.

අපේ අනෙකුත් සහෝදර මන්ත්‍රීවරුත් කිව්වා වාගේ මේ රටේ හිටපු මන්ත්‍රීවරු, ඇමතිවරු භුක්ති විඳපු වරප්‍රසාද, වරදාන ජාතික ජන බලවේගය ආණ්ඩුවේ මන්ත්‍රීවරු, ඇමතිවරු ලෙස අපි ප්‍රතික්ෂේප කළා. ඒ විතරක් නොවෙයි, ඒ තිබුණු දේශපාලන සංස්කෘතිය නැවත මේ රටේ බිහි නොවෙන්න අවශ්‍ය තහවුරු කිරීම අපි කරනවා. විපක්ෂයට නොවෙයි, මේ රටේ ජනතාවට අපි මේ කියන්නේ. වසර 76ක් තිස්සේ බංකොලොත් වුණු, කඩා වැටුණු, සොම්බි රාජ්‍යයක් කරා ගමන් කරපු මේ රට ගොඩ නඟන්න, ආර්ථිකය ශක්තිමත් කරන්න අපි කටයුතු කරන්න ඕනෑ. ඒ වාගේම සියලු ජාවාරම්කරුවන්ට එරෙහි නීතියක් අපි ස්ථාපිත කරන්න ඕනෑ. නීතියේ ආධිපත්‍යය අපි තහවුරු කරලා තිබෙනවා. ඒ තුළ අද රට පුරාම විනිවිදභාවයෙන් කටයුතු කරනවා. තරාතිරම නොබලා අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමනි. කථාව අවසන් කරන්න.

**ගරු සංජීව රණසිංහ මහතා**
(மாண்புமிகு சஞ்ஜீவ ரணசிங்ஹ)
(The Hon. Sanjeewa Ranasingha)
අපි මේ රටේ ජනතාවට කියනවා, ඔබේ අනාගත පරම්පරාව රකින්න, මේ රටේ තරුණයා දෙපයින් නඟා සිටුවන්න, විෂ මත්ද්‍රව්‍ය අපේ රටින් සහමුලින් තුරන් කිරීමට කරන්න පුළුවන් හැමදේම අපි කරන බව. ඒ බවට සහතික වෙමින්, මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හතක කාලයක් තිබෙනවා.

[පි.ප. 3.52]

**ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා**
(மாண்புமிகு கதிரவேலு சண்முகம் குகதாசன்)
(The Hon. Kathiravelu Shanmugam Kugathasan)
மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, போதைப்பொருள் அச்சுறுத்தலை எதிர்கொள்வது குறித்து இன்று நாடாளுமன்றத்தில் முன்வைக்கப்பட்டுள்ள ஒத்திவைப்புப் பிரேரணைமீதான விவாதத்தில் எனது கருத்துகளையும் எடுத்துரைக்க விழைகின்றேன். போதைப் பொருள் பாவனையானது, ஒரு சமூகச் சிக்கல் என்ற நிலையிலிருந்து கடுமையான தேசிய நெருக்கடியாக உருவெடுத்துள்ளது. இது இலங்கையின் நகர்ப்புறங்களை மட்டுமன்றிச் சிற்றூர்கள் வரையிலும் விரவி ஒட்டுமொத்த நாட்டையும் ஆட்கொண்டுள்ளது. இனம், மொழி, இறைநெறி, வர்க்கம் மற்றும் புவியியல் எல்லைகளைத் தாண்டி இந்த நாட்டின் இளைஞர்களை இலக்குவைக்கும் இப்பேரிடரானது, நாட்டின் சமூக, பொருளாதார மற்றும் ஒழுக்க விழுமியங்களின் அடித்தளத்தையே ஆட்டம் காண வைத்துள்ளது. இச்சிக்கலானது, வெறும் சட்ட ஒழுங்கு சார்ந்ததாக மட்டுமன்றி, ஒரு பன்முகத்தன்மை கொண்ட சமூகச் சிக்கலாகவும் காணப்படுகின்றது. கடந்த காலங்களில் போலன்றி, இன்றைய சூழலில் செயற்கைப் போதைப் பொருட்களின் வருகை மற்றும் இணையவழி போதைப் பொருள் வணிகம் ஆகியவை புதிய அறைகூவலாக உருவெடுத்துள்ளன. இந்த அவையில் இச்சிக்கல் குறித்து

[ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා]

விவாதிக்கும்வேளையில், அரசியலுக்கு அப்பால் சென்று இலங்கையின் தேசிய போதைப்பொருள் கட்டுப்பாட்டு உத்தியைத் துல்லியமாகவும் புறநிலையாகவும் மதிப்பீடு செய்து செயலாற்ற வேண்டும். இலங்கையின் காவற்றுறை மற்றும் கடற்படையினர் தொடர்ந்து முயன்றபொழுதிலும், இந்த நடவடிக்கையின் முடிவுகளை இந்தச் சபை புறநிலையாக ஆராயவேண்டியது இன்றியமையாததாகும்.

2026ஆம் ஆண்டின் நடுப்பகுதிக்குள் போதைப்பொருள் தொடர்பில் அரசால் பெருமளவானோர் கைது செய்யப் பட்டுள்ளபொழுதிலும், அவர்களில் பெரும்பாலானோர் குறைந்த வருமானம் பெறும் தெருமட்டப் பயனாளிகளும் சிறு அளவிலான வணிகர்களுமே ஆவர். இவர்கள் பெரும்பாலும் தமது பாவனைக்காக வைத்திருந்த மிகச் சிறிய அளவிலான போதைப்பொருட்களுக்கான தண்டப் பணத்தைச் செலுத்த முடியாமையினாலேயே சிறைகளில் வாடுகின்றனர். பாதுகாப்பை மட்டுமே முதன்மைப்படுத்திய இந்த அணுகுமுறை, இலங்கையின் சிறைச்சாலைகளில் கடுமையான நெரிசலை ஏற்படுத்தியுள்ளது. அதேவேளையில், பன்னாட்டுப் போதைப்பொருள் கடத்தல் மன்னர்களும் அவர்களுக்கு உள்நாட்டில் துணைபோகின்றவர்களும் குறியாக்கம் செய்யப் பட்ட எண்மியத் தொடர்பாடல்களையும் எண்மிய பணக் கொடுக்கல்வாங்கல் முறைகளையும் பயன்படுத்தி வெளிநாடு களில் இருந்தவாறே தமது நடவடிக்கைகளைத் தொடர்ந்தும் முன்னெடுத்து வருகின்றனர்.

அரசு தெருமட்டச் சோதனைகளில் மட்டுமே கூடுதல் கவனம் செலுத்துகின்றது. அதேநேரம், எல்லை கடந்த போதைப்பொருள் வழங்கலின் முதன்மையான வலைய மைப்புகள் எவ்வித பாதிப்புமின்றி அப்படியே நீடிக்கின்றன. இந்தப் போதைப்பொருள் நெருக்கடியின் தாக்கம் நாட்டின் வட, கிழக்குப் பகுதிகளில் மிகக் கடுமையாக உணரப் படுகின்றது. போதைப்பொருள் வணிகத்தின்மூலம் ஈட்டப்படும் பணம் இலங்கையின் அரச எந்திரத்திற்குள்ளும் ஊடுருவி யுள்ளதாகக் குற்றம் சாட்டப்படுகின்றது. இது கடத்தல்காரர்கள் சிறைச்சாலைகளுக்குள் இருந்துகொண்டே தங்களது வலையமைப்புகளைத் தொடர்ந்து வழிநடத்துவதற்கு வழிவகுத்துள்ளது. போதைப்பொருள் கட்டுப்பாட்டுக்குப் பொறுப்பான அரச முகவர் அமைப்புகளை அரசு வலுப்படுத்த வேண்டும்; தூய்மைப்படுத்த வேண்டும். உள்ளக ஊழல்களுக்கு அரசு தீர்வு காணாவிடில், வெளியில் காட்டப்படும் அதிரடிச் சோதனைகள் யாவும் பயனற்றுப் போய்விடும்.

இதேபோல, அரசின் மறுவாழ்வு அணுகுமுறையானது, இராணுவத் தலைமையிலான கட்டமைப்பு மாதிரியை தொடர்ந்தும் நம்பியிருக்கின்றது. இருப்பினும், மருத்துவ வல்லுநர்களும் மனித உரிமை ஆர்வலர்களும் போதைப் பொருள் பழக்கத்தை ஒரு மருத்துவ மற்றும் உளவியல் அடிப்படையிலான குறைபாடாகவே கருத வேண்டுமேயன்றி, அதற்கு இராணுவ ஒழுக்கக் கட்டுப்பாடு என்பது முறையான தீர்வாகாது என்பதைச் சுட்டிக்காட்டி வருகின்றனர். கந்தக்காடு மற்றும் சேனபுர முதலிய கட்டாய மறுவாழ்வு நடுவங்களில் நிகழும் வன்முறைகள் மற்றும் கண்காணிப்புக் குறைபாடுகள் குறித்த அறிக்கைகள், இந்த நடுவங்கள் குணப்படுத்தும் இடங்களாகச் செயற்படுவதற்கு மாறாக, தற்காலிக சிறைச் சாலைகளைப் போலவே இயங்கி வருகின்றன என்பதைக் காட்டுகின்றன. போதைப்பொருள் பாவனை தொடர்பான இலங்கையின் தேசிய உத்தியை, தண்டிக்கும் செயலாக்க மாதிரியிலிருந்து பொதுச் சுகாதாரத்தை நடுவண்ணாகக் கொண்ட ஒரு சமநிலையான கட்டமைப்பாக முற்றிலும் மாற்றியமைக்க வேண்டும். இதன் பொருட்டாக நான் பின்வரும் பரிந்துரைகளை முன்வைக்கின்றேன்:

முதலாவதாக, ஒருவர் தனது பயன்பாட்டுக்காகச் சிறிதளவு போதைப்பொருள் வைத்திருப்பதைப் பெரும் குற்றமாகக் கருதாமல், இத்தகையோரை சுகாதார வல்லுநர்களால் நடத்தப்படும் தன்னார்வ, சமூக அடிப்படையிலான மருத்துவத் திட்டங்களுக்கு ஆற்றுப்படுத்த வேண்டும். இரண்டாவதாக, இலங்கையின் மறுவாழ்வு அமைப்பானது, குடிசார் மற்றும் மருத்துவத் தலைமைகளின்கீழ் இயங்க வேண்டும் என்பதோடு, அனைத்துச் சிகிச்சை முறைகளும் சான்றுகள் மற்றும் பண்பாட்டு அடிப்படையை உள்ளடக்கியதாகவும், இரு ஆட்சி மொழிகளிலும் முழுமையாகக் கிடைக்கப் பெறுவதாகவும் அமைய வேண்டும். மூன்றாவதாக, சட்டச் செயலாக்க வளங்களை, போதைப்பொருள் கடத்தல் வலையமைப்புத் தலைவர்களின் சொத்துக்கள் மற்றும் கடத்தலுக்குப் பயன்படுத்தப்படும் வழிமுறைகள் ஆகியவற்றை இலக்கு வைக்கும் நோக்கில் திசைதிருப்ப வேண்டும். நான்காவதாக, அனைத்து முதன்மையான துறைமுகங்கள் மற்றும் விமான நிலையங்களில் நவீன, அதிவேக scanners நிறுவுவதன்மூலம், இலங்கையின் எல்லைப் பாதுகாப்பு உட்கட்டமைப்பை மேம்படுத்த வேண்டும் அல்லது வலுப்படுத்த வேண்டும். ஐந்தாவதாக, எல்லாவற்றுக்கும் மேலாக பொதுமக்களுக்குப் போதைப்பொருள் பாவனை பற்றியும், அதனால் ஏற்படும் பாதகமான விளைவுகள் பற்றியும் விழிப்புணர்வை ஏற்படுத்த ஆவன செய்ய வேண்டும்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, போதைப்பொருள் அச்சுறுத்தலுக்கு எதிராக இரக்கமுள்ள, அறிவார்ந்த மற்றும் ஒருங்கிணைந்த செயற்பாடு இன்றியமை யாதது ஆகும். மக்களைக் கைது செய்வதன்மூலம் மட்டும் இந்த நெருக்கடியில் இருந்து மீண்டுவிட முடியாது. போதைப் பொருள் வழங்கலின் உண்மையான மூல ஆதாரங்களை இலக்கு வைப்பதற்கான சட்டச் சீர்திருத்தங்களை நடைமுறைப் படுத்த வேண்டும். அதே நேரத்தில், போதைப்பொருள் பாவனையால் பாதிக்கப்பட்ட இலங்கையின் குடிமக்கள் குணமடைந்து மீண்டும் சமூகத்துடன் இணைவதற்குத் தேவையான உண்மையான மனிதாபிமான அடிப்படையிலான ஆதரவை வழங்க வேண்டும்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, சமூகச் சிக்கல் என்ற நிலையிலிருந்து, தேசிய நெருக்கடியாக மாறி யுள்ள போதைப்பொருள் அச்சுறுத்தலை, அரசுப் படைகள், அரசாங்க அதிகாரிகள் அல்லது அரச அமைப்பு களால் மட்டும் எதிர்கொள்ள முடியாது. போதைப்பொருளுக்கு எதிரான அரச சார்பற்ற அமைப்புகள், ஆசிரியர்கள், பெற்றோர், இளையோர் அமைப்புகள், சமூக நலன் நாடும் அமைப்புகள், சமய நிறுவனங்கள், சமயத் தலைவர்கள், அரசியல்வாதிகள் உள்ளிட்ட அனைவரும் ஒன்றிணைந்து, பற்றுறுதியோடு செயற்பட்டால் மட்டுமே போதைப்பொருள் அச்சுறுத்தலை எதிர்கொள்ளலாம் என்று கூறி, எனது உரையை நிறைவு செய்கின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ඕෂානි උමංගා මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.58]

**ගරු ඕෂානි උමංගා මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஒஷானி உமங்கா)
(The Hon. (Mrs.) Oshani Umanga)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ මාතෘ භූමියේ අනාගතය තීරණය කරන ඉතා තීරණාත්මක සහ සාර්ථකව ක්‍රියාත්මක වන ජාතික මෙහෙයුමක් පිළිබඳවයි අද අපි සාකච්ඡා කරන්නේ. මේ සාකච්ඡාව අතුරතුර විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගෙන් නිරන්තරයෙන් ඇසුණු කථාවක් තමයි, "අපි කාලා බලලා නොවෙයි පත් කර ගත්තේ" කියන එක. කාලා බලලා පත් කර ගත්තේ නැතිවෙන්න පුළුවන්. හැබැයි, මුදල් විශුද්ධිකරණ වරද යටතේ එංගලන්තයේ දී වරදකරුවෙකු වෙලා එරටින් පලවා හැරපු පුද්ගලයෙක්, තමන්ගේ පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලයට, හොරණ ආසන සංවිධායකවරයා හැටියට පත් කරනකොට ඔහු වරදකරුවෙකු වෙලා රටකින් පිටුවහල් කළ අයෙකු බව විපක්ෂ නායකතුමා නොදැන ඉන්න බැහැ නේ. කාලා බලලා නැතුව ඇති. නමුත්, ඒ බව දැන දැනම - පක්ෂයේ සුදුසුකම් තිබෙන අය ඉදිද්දී - තමයි චරිතයක් නැති පුද්ගලයෙක් තමන්ගේ පක්ෂයේ තනතුරුවලට පත්කර ගත්තේ.

ඊයේ විපක්ෂ නායකතුමා විනය ගැන කථා කළා. හැබැයි, එතුමා කථා කරපු විනය හවසට ඇවිල්ලා බුද්ධික පතිරණ මහත්මයා හෝදලා දමනවා. එක පැත්තකින් ඒක සාධාරණීකරණය කරනවා. අනෙක් පැත්තෙන් සුදු හුණු ගානවා. අපි චරිත් අබේසිංහගෙන් අහන්න කැමැතියි, ඔය සල්ලි හොයාගත්තේ අහිංසක අම්මා තාත්තාගේ දරුවන්ට විෂ මත්ද්‍රව්‍ය පොවලා, මිනී මරලා, පාතාලයට සම්බන්ධ වෙලා නේද කියලා. හොරණ ඉන්න කාන්තාවන් බැල්ලපිටිය හෝටලයකට ගෙන්වලා ආණ්ඩුවට එරෙහිව voice cut දෙන්න, video clips හදන්න යොදා ගත්තේ ඒ හොයාගත් මුදල්වලින් නේද? තෙල් පෝලිම් මවලා, ඊට පස්සේ ඒ පෝලිම්වල ඉඳලා මාධ්‍යවේදීන්ට කියලා voice-cuts ගන්න වියදම් කරපු මුදලුත් පාතාලයෙන් ගත්ත අල්ලස් ද කියලා අපි චරිත්ගෙන් අහන්න කැමැතියි. මීට වඩා හොඳ, එදා ඉඳලා ම දේශපාලනයේ නිරතවෙච්ච සංවිධායකවරු හොරණ සිටියදී තමයි විපක්ෂ නායකතුමා මොහු උඩින් ගෙනැල්ලා හොරණ ආසනයට බැස්සුවේ. අපි ලජ්ජා වෙනවා, පාතාල අපරාධකාරයෝ සමඟ සම්බන්ධතා තිබෙන මිනිස්සුන්ට තමන්ගේ පක්ෂයේ තනතුරු දීපු එක පිළිබඳව. චරිත් අබේසිංහට අගමැතිතුමිය එක්කයි මාලිමාවේ කණ්ඩායම එක්කයි ලොකු "ඇරියස්" එකක් තිබුණා. එයා ඇතිවෙන්න අපට මඩ ගහන්න පටන් ගත්තා. මඩ ගහලා මඩ ගහලා බැරිම තැන කතරගම දේවාලයේ පොල් ගහන්නත් පටන් ගත්තා.

චරිත් ගැහැනු දම්මලා මාලිමාවේ ගැහැනුන්ට ගහපු පොල් ගෙඩියේ එක පොල් බෑයක් චරිත්ගේ ඔළුවටම ආපහු පත බැවුණා. දිට්ඨ ධම්මවේදනීය කර්මය කියන්නේ ඒකට. "කරන කලට පව් මීරිය මීසේ, විඳින කලට දුක් දැඩිවෙයි ගිනි සේ”. අද විපක්ෂයට වෙලා තිබෙන්නේ ඒක තමයි. ගොනා පසුපස ගමන් කරන කරත්ත රෝදය වාගේ තමන් කරපු පව් තමා පසුපස ගමන් කරනවා. තාජුඩීන් අවසන් මොහොතේ පණ අදිනකොට දැනුණු වේදනාව මේ බේබිලාගේ කන්වලට ඇහෙන්න ඕනෑ. එක්නැලිගොඩ ඝාතනය කරනකොට ඔහුට දැනුණු වේදනාව මේ බේබිලාට ඇහෙන්න ඕනෑ, ඒගොල්ලන්ගේ අම්මලාට ඇහෙන්න ඕනෑ. පාස්කු ප්‍රහාරය නම් political narrative එක plan කරලා, ඒකෙන් අහිංසක අම්මා, තාත්තා, දරුවෝ, ආදරවන්තයෝ, විදේශ රටවලින් ආපු මිනිස්සු මැරෙනකොට නඟපු විලාපය මේගොල්ලන්ට රැව් පිළිරැව් දෙන්න ඕනෑ. ඒ විතරක් නොවෙයි. ඒවා plan කරපු අයගේ බිරින්දෑවරු, අම්මලා අද ඉබාගාතේ ඇවිදිනවා. අද ඒගොල්ලන්ට ඒ පව් පඩිසන් දීලා තිබෙන්නේ. එදා පල්ලි ඇතුළේ ඇහුණු විලාපය අද මේගොල්ලන්ගේ ආත්ම ඇතුළේ දෝංකාර දෙන්න පටන්ගෙන තිබෙනවා.

එදා, අපේ ආරක්ෂක අංශ ගැන, පොලීසිය ගැන ජනතාවට තිබුණු විශ්වාසය බිඳිලා තිබුණේ. ඉස්සර මිනිස්සු ජාවාරම්කාරයන්ට හයයි. පොලීසියට call එකක් දෙනකොට ඒගොල්ලෝ හිතුවා, ඒ දීපු call එක පිළිබඳව ජාවාරම්කාරයන්ට දැනුවත් කරයි කියලා. හැබැයි, අද වෙනකොට පොලීසිය ගැන එදා තිබුණු විශ්වාසභංගත්වය නැතිවෙලා තිබෙනවා. අද, පොලීසිය විශ්වාස කරන්න පටන්ගෙන තිබෙනවා. ඉස්සර හැංගිලා හිටපු පොලිස්පතිවරු හොයන්න පොලීසියට යන්න සිද්ධ වුණා. පොලීසියෙන් ගිහිල්ලා පොලිස්පති අත් අඩංගුවට ගත්ත රටක් මේක. බන්ධනාගාරයේ ප්‍රධානියා, බන්ධනාගාරගතවෙලා ඉන්න රටක් මේක. RMV එකේ ප්‍රධානියා අත්අඩංගුවේ ඉන්න රටක් මේක. Department of Immigration and Emigrationහි ප්‍රධානියා අත්අඩංගුවේ ඉන්නේ, වංචා, දූෂණ, අල්ලස් කියන සියල්ලටම වරදකරුවෙලා. එහෙම රටක් තමයි අපි විනයක් සහිතව, ශිෂ්ට සම්පන්න ලෙස පොහොසත් රටක් බවට පත් කරමින් යන්නේ. පොලිස් ස්ථානාධිපතිවරු 180ක් දේශපාලන පත්වීම් මත පත් කරපු රටක් මේක. පොලිස්පති කියනවා, මට දෙන්නයි පත්කර ගන්න පුළුවන් වුණේ, අනෙක් අය ඔක්කෝම දේශපාලන පත්වීම් කියලා.

මීට මාස කිහිපයකට පෙර අපි රටක් විධියට ජාති, ආගම්, කුල මල භේද, ගැහැණු, පිරිමි සහ පක්ෂ භේදවලින් තොරව එකම පෙරමුණකට එකට එකතුවෙලා පටන් ගත්තා, විෂ මත් ද්‍රව්‍ය නැමැති මාරක උවදුරෙන් අපේ රට ගලවා ගැනීමේ දැවැන්ත මෙහෙයුම. රටක් ලෙස අපි එක හඬින් මත් ද්‍රව්‍ය ජාවාරම්කරුවන්ට කිව්වා, වහාම මේ විනාශකාරී ක්‍රියාවෙන් ඉවත් වෙන්න, නැතහොත් රටේ පොදු ජනතාවගේ නීතිය සහ බලපෑමට ඔවුන් හසුවීමට තිබෙන ඉඩකඩ වැඩියි කියලා. අපි එදා දැමූ ඒ දැවැන්ත අත්තිවාරම, මුළු රටම එකට එකතුවෙලා ආරම්භ කළ ඒ වැඩපිළිවෙළ අද වන විට හුදෙක් සටන් පාඨයකට සීමා නොවී ඉතා සාර්ථකව ක්‍රියාත්මක වෙමින් පවතිනවා. අපේ මූලික ඉලක්කය වුණේ, විෂ මත් ද්‍රව්‍ය රට තුළට බෙදා හරින ජාලය අඩපණ කිරීමයි. අද වෙනකොට අපට ඉතා ආඩම්බරයෙන් ප්‍රකාශ කරන්න පුළුවන්, රාජ්‍ය බුද්ධි අංශය මෙන්ම ගම් මට්ටමේ තිබෙන සිවිල් ආරක්ෂක අංශය, මහජන ආරක්ෂක කමිටු එකතුවෙලා මේ මත් ද්‍රව්‍ය මත ගොඩනැඟුණු ජාලය බිඳ වට්ටලා මත් ද්‍රව්‍ය ජාවාරම්කරුවන්ගේ කොඳු නාරටියම කඩා දමලා තිබෙන බව.

ඒ වාගේම අපි මේ වෙනකොට රටක් විධියට එකට එකතුවෙලා එකම පෙරමුණකට ඇවිල්ලා විෂ මත් ද්‍රව්‍යවලින් අපේ රට මුදාගෙන අනාගතයේ දිනක අපේ දරුවන් නිදහස්, සෞඛ්‍ය සම්පන්න, මතින් තොර සුන්දර දේශයක ජීවත්වන විට ඒ වෙනුවෙන් මේ මුළු රටේම ජනතාව අපි ගත්ත තීරණ පිළිබඳව ප්‍රසාදය පළ කරයි. "රට අනුරට" කියන slogan එක හරහා මේ පාර්ලිමේන්තුවේ හිටපු ඒ විනය නැති අශිෂ්ට සියලුදෙනාම සුද්ද පවිත්‍ර කරලා මාලිමාවට ආණ්ඩුවක් හදාගන්න ජනතාව ඉඩ දුන්නා. ඒ වාගේම “රටම එකට” කියන slogan එකත් අපේ රටේ ජනතාව ඉහළින්ම පිළිඅරගෙන තිබෙනවා.

අපි හොඳ රටක් ගොඩ නඟමු කියමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු අම්ර්තනාදන් අඩෛක්කලනාදන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[பி.ப. 4.07]

**ගරු අමිර්තනාදන් අඩෛක්කලනාදන් මහතා**
(மாண்புமிகு அமிர்தநாதன் அடைக்கலநாதன்)
(The Hon. Amirthanathan Adaikkalanathan)
நன்றி, கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே!

இன்றைய தினம் போதைப்பொருள் ஒழிப்புச் சம்பந்தமாக நடைபெற்றுக் கொண்டிருக்கின்ற ஒத்திவைப்புப் பிரேரணையின்மீது நானும் சில விடயங்களைப் பற்றி உரையாற்றலாமென எண்ணுகின்றேன். உண்மையிலே, போதைப்பொருள் ஒழிப்புச் சம்பந்தமாக அரசாங்கம் எடுத்துக் கொண்டிருக்கின்ற பெருமைப்படக்கூடிய பல விடயங்கள் தொடர்பில், எங்களுடைய செயற்பாடுகளும் அதை ஆதரிக்கக்கூடிய வகையில், இந்த அரசாங்கத்துக்குச் சார்பாக இருக்கும் என்பதை நான் இங்கே கூறிக்கொள்ள விரும்புகின்றேன். குறிப்பாக, எமது வடக்கு, கிழக்கிலே உள்ள இளைஞர்கள்தான் இந்தப் போதைப்பொருள் வியாபாரிகளால் குறிவைக்கப்படுகின்றார்கள். அங்கேதான் இளைஞர், யுவதிகளைக் குறிவைத்து, அவர்களை இந்தப் போதைக்குள் உள்ளீர்க்கின்ற செயற்பாடுகள் கூடுதலாக முன்னெடுக்கப் படுகின்ற ஒரு நிலைப்பாடு காணப்படுகின்றது. ஆனால், ஒன்றை நீங்கள் புரிந்துகொள்ள வேண்டும். அதாவது, இதற்கெதிராகப் பல வழிகளிலே உங்களுடைய செயற்பாடுகள் இருந்துகொண்டிருக்கிற நிலையில், இதற்காக உழைக்கின்ற அத்தனை பேருக்கும் எங்களுடைய ஆதரவை நாங்கள் வழங்குகின்றோம். எங்களுடைய கௌரவ பிரதியமைச்சர் அவர்களும் இங்கே இருக்கின்றார். உண்மையிலே, இந்தப் போதைப்பொருள் ஒழிப்புச் சம்பந்தமான விடயத்திலே அரசாங்கம் எடுக்கின்ற முயற்சிகள் பாராட்டத்தக்கது என்பதை நான் இங்கே குறிப்பிட விரும்புகின்றேன்.

இதிலே குறிப்பிடத்தக்க ஒரு விடயம் என்னவென்றால், போதைவஸ்து தொடர்பான ஊழல் என்பது அல்லது போதைவஸ்து ஒழிப்பு என்பது கடற்படை உட்பட எல்லாத் துறைகளாலும் செயற்படுத்தப்படுவதாக இருக்க வேண்டும். வடக்கில் எங்களுடைய பிரதேசங்களுக்கு இந்தியாவிலிருந்து அல்லது வேறிடத்தில் இருந்து அவற்றைக் கொண்டுவருகின்ற போது, தேசிய கடல் எல்லையைத் தாண்டித்தான் வரவேண்டிய ஒரு சூழல் இருக்கின்றது. ஆகவே, நேற்றைய தினம் மாண்புமிகு ஜனாதிபதி அவர்கள் குறிப்பிட்டதுபோல, இவ்விடயத்தில் யாருக்கும் பாகுபாடு பார்க்காத ஒரு சூழலை உருவாக்குவது என்பதை நல்லதொரு விடயமாக நான் பார்க்கின்றேன். ஆகவே, எங்களுடைய இளைஞர்களின் எதிர்காலத்தைப் பேணுகின்ற வகையிலான இந்தப் போதைப்பொருள் ஒழிப்பை எங்களுடைய கடமையாக எண்ணி நாங்கள் ஆதரவை வழங்கத் தயாராக இருக்கிறோம்.

அடுத்த விடயம், எங்களுடைய அதி வணக்கத்துக்குரிய ஆயர் இராயப்பு ஜோசப் தன்னுடைய தத்ரூபமான கணிப்பின்படி, இறுதியுத்த காலத்தில் காணாமற்போன எமது மக்களுடைய எண்ணிக்கை சுமார் 146,644 பேர் எனக் குறிப்பிட்ட தரவு இன்றைக்கு ஐ.நா. வரைக்கும் சென்றிருக்கிறது. மேலும், செம்மணிப் புதைகுழியில் இதுவரை 409 மனித எச்சங்கள் கண்டுபிடிக்கப்பட்டிருக்கின்றது. இது எங்களுடைய ஆயர் அவர்கள் குறிப்பிட்ட எண்ணிக்கையைத் தாண்டப்போகிறதா அல்லது அதற்குள் வரப்போகிறதா என்ற கேள்வி எங்களைப் பொறுத்தமட்டிலே எழுகிறது. ஏனென்றால், இந்த எச்சங்கள் கூடுதலாகக் கண்டெடுக்கப்படும்பொழுது, தமிழ் மக்கள் பல்வேறு இடங்களில் இருந்தும் அங்கு கொண்டுவரப்பட்டுப் படுகொலை செய்யப்பட்டிருப்பார்களோ என்ற சந்தேகம் எழுகிறது.

உலகத்திலே மனித எச்சங்கள் கூடுதலாகக் கண்டுபிடிக்கப்பட்ட இடங்களில் ஒன்றாக இந்தச் செம்மணிப் புதைகுழியைத்தான் நான் இங்கு குறிப்பிட விரும்புகின்றேன். அங்கு கண்டெடுக்கப்பட்ட குழந்தைகள் உட்படப் பலரது எச்சங்களின் அவலத்தைப் பார்க்கும்போது, அவர்கள் எந்தளவுக்குச் சித்திரவதைக்கு உள்ளாக்கிக் கொல்லப் பட்டிருப்பார்கள் என்பதை எண்ணி உண்மையிலேயே எங்களுடைய இரத்தம் உறையும் அளவுக்கு மிக வேதனையாக இருக்கின்றது. நேற்றைய தினம் எங்களுடைய பாராளுமன்ற உறுப்பினர்களான கௌரவ சாணக்கியன், கௌரவ கஜேந்திரகுமார் பொன்னம்பலம் ஆகியோர் இதுபற்றி எழுப்பிய கேள்விகளுக்குக் கௌரவ நீதி அமைச்சர் அவர்கள் பதிலளிக்கும்போது, இந்த மனித எச்சங்களைக் கண்டறிந்து பகுப்பாய்வு செய்வதற்காகச் சர்வதேச தடயவியல் உதவியை நாடப்போவதாகக் குறிப்பிட்டிருந்தார். அது வெறும் சொல் வடிவில் மட்டும் இல்லாமல் துரித கதியில் செயற்படுத்தப்பட வேண்டும். ஏனென்றால், இந்த விடயங்களில் காலம் கடந்துபோகின்ற ஒரு சூழலைத்தான் எங்களுடைய மக்கள் சந்தித்துக் கொண்டிருக்கின்றார்கள். ஆகவே, இந்த அரசாங்கம் அந்த எச்சங்களைத் துரித கதியில் பகுப்பாய்வு செய்ய உடனடியாக நடவடிக்கைகளை மேற்கொள்வதுதான் சரியாக இருக்கும் என்று நான் நினைக்கின்றேன்.

என்னைப் பொறுத்தவரையில், இந்த உயிர்த்த ஞாயிறு தாக்குதல் சம்பந்தமாக அரசாங்கம் மிகத் துரிதமாக விசாரணைகளை நடத்தி, சம்பந்தப்பட்டவர்களைக் கைது செய்ய வேண்டும் என்பது எனது கருத்தாகும். சுரேஷ் சலே என்பவர் கைது செய்யப்பட்டு, சித்திரவதைக்குள்ளாக்கப்பட்டு, உண்ணாவிரதம் இருப்பதாகக் கூறப்படும் நிலையில், உதய கம்மன்பிலவும் எதிர்க்கட்சியினர் சிலரும் அவரைக் காப்பாற்றுவதற்காகத் துள்ளிக் குதித்துக் கொண்டிருக் கிறார்கள். எனவே, உதய கம்மன்பிலவும் கைது செய்யப்பட்டு விசாரணைக்கு உட்படுத்தப்பட வேண்டும் என்று நான் இந்தச் சபையிலே கேட்டுக் கொள்கின்றேன். ஏனென்றால், அவர் துள்ளுவதைப் பார்த்தால் இந்த உயிர்த்த ஞாயிறு தாக்குதலில் அவருக்கும் சம்பந்தம் இருக்குமோ என்ற சந்தேகம் எழுகிறது. எனவே, அவரிடமும் விசாரணை நடத்தப்பட வேண்டும். ஏனென்றால், தவறை மறைப்பதற்காகவே இவ்வாறு துள்ளிக்குதிக்கின்ற ஒரு செயற்பாட்டை அவரிடம் பார்க்க முடிகின்றது. ஆகவே, அவருக்கும் இதில் தொடர்பு இருக்கின்றதா என்பது குறித்து முறையான விசாரணை செய்யப்பட வேண்டும் என்ற கோரிக்கையை நான் முன்வைக்கின்றேன்.

இந்த அரசாங்கம் தொடர்ந்து இவ்வாறான விடயங்களைச் செய்து கொண்டிருக்கின்றபோதிலும், சில குறைபாடுகளையும் நான் இங்கு குறிப்பிட விரும்புகின்றேன். இன்று எங்களுடைய விவசாயிகள் நெல்லை உற்பத்தி செய்து சரியான விலைக்குக் கொடுக்க முடியாமல் மிகவும் திண்டாடிக் கொண்டிருக் கிறார்கள். நெல்லுக்கான நியாயமான விலையினை வழங்கக் கோரிப் போராட்டங்களும் இப்பொழுது நடைபெற்றுக் கொண்டிருக்கின்றது. வடக்கில் மல்லாவி, கிளிநொச்சி, மன்னார் போன்ற பகுதிகளிலும் அம்பாறை உட்பட கிழக்கின் பல பகுதிகளிலும் விவசாயிகள் தாங்கள் அறுவடை செய்த நெல்லை நல்ல விலைக்கு விற்க முடியாமல் தவித்துக் கொண்டிருக்கும் இந்தச் சூழ்நிலையில், அரசாங்கம் அரிசியை இறக்குமதி செய்ய முயற்சிகளை மேற்கொள்வது ஏன்? என்பதை இந்தச் சந்தர்ப்பத்தில் நான் கேட்டுக்கொள்ள விரும்புகின்றேன். இந்த விடயத்தை நீங்கள் கவனத்திற் கொள்ள வேண்டும். எங்களுடைய விவசாயிகளுக்குக் கைகொடுத்துத் தூக்கிவிடுவதனூடாகத்தான் நெல்

உற்பத்தியில் நாம் தன்னிறைவு அடைய முடியும். அதற்கான வாய்ப்புகளை உண்டுபண்ணும்போதுதான் எங்கள் நாட்டு விவசாய மக்களின் மனம் நிறைவடையும் என்பதை நான் இங்கு குறிப்பிட விரும்புகிறேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, නියමිත කාලය අවසානයි. අවසන් කරන්න.

**ගරු අමිර්තනාදන් අඩෛක්කලනාදන් මහතා**
(மாண்புமிகு அமிர்தநாதன் அடைக்கலநாதன்)
(The Hon. Amirthanathan Adaikkalanathan)
எனக்கு இன்னும் ஒரு நிமிடம் தாருங்கள்!

அடுத்தபடியாக, எங்களுடைய வவுனியா மாநகர சபை முதல்வர் வட மாகாண ஆளுநர் அவர்களால் பதவி நீக்கம் செய்யப்பட்டுள்ளார். ஜனநாயக தமிழ்த் தேசிய கூட்டணியைச் சார்ந்தவர்கள்தான் இதில் பாதிக்கப்பட்டிருக்கிறார்கள். சாவகச்சேரி நகர சபையின் உப தவிசாளராக இருப்பவரும் ஜனநாயக தமிழ்த் தேசியக் கூட்டமைப்பின் அங்கத்தவர்தான். அந்த வகையில், ஜனநாயக தமிழ்த் தேசிய கூட்டணியைப் பலவீனப்படுத்துவதற்காகவா அல்லது அதைச் சிதைப் பதற்காகவா இத்தகைய நிலை என்று எங்களுக்கு சந்தேகம் எழுகின்றது. அதேநேரம், ஒரு விடயத்தை நான் ஆளுநரிடம் கேட்க விரும்புகின்றேன். அரசாங்கம் ஊழல் சம்பந்தமாகப் பல நடவடிக்கைகளை எடுத்துக் கொண்டிருக்கின்றபொழுது, மன்னார் நகர சபையில் நடந்த பல ஊழல்கள் நிரூபிக்கப்பட்ட பின்பும்கூட, அதற்கான நடவடிக்கைகளை எடுக்காமல், அதிகாரிகளைக் காப்பாற்றுவதற்கு அரசாங்கமும் ஆளுநரும் முயற்சிக்கின்றார்களா என்ற ஒரு சந்தேகம் எழுகிறது. எனவே, அதற்கும் உடனடியாக நடவடிக்கைகளை எடுக்க வேண்டுமென்று கேட்டு விடைபெறுகின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නජිත් ඉන්දික මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

Order, please! ඊට ප්‍රථම, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු සංජීව රණසිංහ මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු ආනන්ද විජේපාල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஆனந்த விஜேபால - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்)
(The Hon. Ananda Wijepala - Minister of Public Security and Parliamentary Affairs)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු සංජීව රණසිංහ මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු චානක මාදුගොඩ මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු සංජීව රණසිංහ මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு சானக மாதுகொட அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சஞ்ஜீவ ரணசிங்ஹ அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. CHANAKA MADUGODA left the Chair and THE HON. SANJEEWA RANASINGHA took the Chair.*

[අ.භා. 4.16]

**ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබාදීම වෙනුවෙන් බොහොම ස්තුතියි.

ඊයේ සහ අද යන දින දෙකේම ආණ්ඩු පක්ෂය විසින් යෝජනා කරන ලද සභාව කල් තැබීමේ විවාදය තමයි මේ පැවැත්වෙන්නේ. විශේෂයෙන්ම අවුරුද්දකට අඩු කාලයක් තමයි විෂ මත්ද්‍රව්‍යවලට එරෙහි විශේෂ මෙහෙයුම ක්‍රියාත්මක කරන්න පටන් අරගෙන ගත වෙලා තිබෙන්නේ. ඒක ක්‍රියාත්මක කරන්න පටන් අරගෙන මාස අටක්, දහයක් වාගේ කාලයක් ගතවන මොහොතක එහි සාර්ථකත්වය, විෂ මත්ද්‍රව්‍ය සහ ඒ උවදුරට අදාළව ආණ්ඩුව අරගෙන තිබෙන ක්‍රියාමාර්ගවල සාර්ථකත්වය, ප්‍රතිඵලය සහ දැනට තිබෙන තත්ත්වය සහ ඊට තිබෙන අභියෝග යන මේ සියල්ල ගැන සාකච්ඡා කරන්න තමයි මේ කල් තැබීමේ විවාදය ආණ්ඩු පක්ෂයෙන් ලබා ගත්තේ. ඊයේ ජනාධිපතිතුමාත් ඇවිල්ලා මේ ගැන දීර්ඝ වශයෙන් අදහස් දැක්වීමක් පාර්ලිමේන්තුවේ කළා.

දැන් අපි ප්‍රායෝගික අත් දැකීමෙන් දන්නවා, පසුගිය මාස කිහිපය තුළ විශාල වශයෙන් මේ විෂ මත්ද්‍රව්‍යවල අඩුවීමක්, මේ සංවිධානාත්මක අපරාධවල අඩුවීමක් තිබෙන බව. විශේෂයෙන්ම කොළඹ නගරය ගත්තොත්, මෝදර, මට්ටක්කුලිය, වැල්ලම්පිටිය වාගේ red areasවලට අපි ගිහිල්ලා ඒවායේ ඉන්න අය එක්ක කථා කරනකොට, ඒ ප්‍රදේශවල ඉන්න පොලිස් නිලධාරින් එක්ක කථා කරනකොට, ඒ මිනිස්සු එක්ක කථා කරනකොට තේරෙන එක දෙයක් තමයි මත්ද්‍රව්‍යවල හරි පැහැදිලි අඩු වීමක් වෙලා තිබෙන බව මිනිසුන්ට දැනිලා තිබෙන කියන කාරණය. ඒ නිසා මේක සාර්ථක වෙමින් යන ව්‍යාපෘතියක් බව මේ ප්‍රායෝගික තත්ත්වය ඇතුළේ අපට බොහොම හොඳින් කියන්න පුළුවන්. මම මේ කියන්නේ තිබෙන සංඛ්‍යා ලේඛනවලට අමතරව. ඇමතිතුමා ඉදිරිපත් කළ සංඛ්‍යා ලේඛනවලින් ඉදිරිපත් කළා, කොයිතරම් ප්‍රමාණයක් අත් අඩංගුවට ගන්නවාද, මේ වෙද්දී ටොන් කීයක් අරගෙන තිබෙනවාද කියන කාරණා. අපි ඒවා දැක්කා. මේ රටේ තරුණ පරම්පරාව, දරුවන් විෂ මත්ද්‍රව්‍යවලින් ගලවා ගන්න පුළුවන් ප්‍රායෝගික තලයේ තැනකට අපි තල්ලු වෙමින් ඉන්නවාය කියන විශ්වාසයක් මේ මාස කිහිපය තුළ හැදිලා තිබෙනවා. අපි සියලුදෙනා පක්ෂ භේදයකින් තොරව ඒ ගැන සතුටු වෙන්න ඕනෑ.

ජනාධිපතිතුමා පැහැදිලිව කිව්වා වාගේම, අපි හැමදාම කථා කරනවා වාගේම, මේ විෂ මත්ද්‍රව්‍ය සහ සංවිධානාත්මක අපරාධ කියන එක ගහට පොත්ත වාගේ එකට බැඳිලායි තියෙන්නේ. මේ දෙක වෙන් කරන්න බැහැ. ඒවා එකට බැඳිලා, එකට ක්‍රියාත්මක වෙනවා. මේ රටේ යම් ආකාරයක විෂ මත්ද්‍රව්‍ය, හෙරොයින්, අයිස් ජාවාරමක යම් කෙනෙක් නිරත වුණාද, ඒක නිකම් අහිංසක විධියට කළේ නැහැ. ඒවා කළේ පිටිපස්සේ තුවක්කු තියාගෙන. ඒවා කළේ පිටිපස්සේ ආයුධ තියාගෙන. සංවිධානාත්මක අපරාධ කල්ලි විසින් නායකත්වය ලබා දෙමින් තමයි මේ රටේ ඒවා කරගෙන ගියේ. ඒක හැමෝම දන්නවා. මොකද, සංවිධානාත්මක අපරාධ කල්ලිවල නම ගිය මිනිස්සු අත් අඩංගුවට ගන්නකොට, ඔවුන්ට එරෙහි චෝදනා විධියට ඒවා ගොනු වෙන්නේ එහෙමයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක දැවැන්ත ලාභ ලබන ව්‍යාපාරයක්. මේ ව්‍යාපාරය ආයුධ සහිතව ලේ හොල්ලමින් කරපු ව්‍යාපාරයක්. ඒ වාගේම අනෙක් සත්‍ය තමයි මේක හැමදාම මේ රටේ දේශපාලනඥයන්ගේ අනුග්‍රහය සහිතව ක්‍රියාත්මක වෙච්ච

[ගරු (වෛද්‍ය) නලින් ඉන්දික මහතා]

ව්‍යාපාරයක් කියන එක. අන්න ඒක තමයි වැදගත්ම දේ. මොකද, නිකම්ම මේවා වෙන්න බැහැ. රටේ පොලීසිය, ආරක්ෂක හමුදා සියල්ල තියෙද්දී, තුන්වෙනි පාර්ශ්වයකට ආයුධ අරගෙන හන්දිවල සැරි සරන්න, ආයුධ අරගෙන ගිහිල්ලා වෙඩි තියන්න පුළුවන් තත්ත්වයක් නිකම් අහම්බෙන් එන්නේ නැහැ. ඉඳලා හිටලා දෙයක් වෙන එක ගැන නොවෙයි මම මේ කියන්නේ. දිගින් දිගටම එකම දේ වෙනවා නම්, ඒක අනුග්‍රයක් ඇතුව සිදු වෙනවා. බලය සහිත තැනක අනුග්‍රහය නැතුව ඒක වෙන්න බැහැ. ඒක හැමෝම දන්න දෙයක්. ඒ නිසා තමයි අර පාතාල නායකයෝ කියලා නම් කියැවෙච්ච අයත් එක්ක හැම තිස්සේම ඇමති කෙනෙකුගේ නමක්, නැත්නම් මන්ත්‍රී කෙනෙක්ගේ නමක්, ප්‍රදේශයේ දේශපාලනඥයෙකුගේ නමක් ගැට ගැහිලා තිබුණේ. අතන අහවල් කෙනා වැඩ කරන්නේ මෙයත් එක්ක, මේ ගමේ මෙයා වැඩ කරන්නේ මෙයත් එක්ක ආදී විධියට නමක් ගැට ගැහිලා තිබුණා.

අපට කලින් රට කරපු මේ දේශපාලන පක්ෂවල මිනිස්සු දිගටම මේ දේවල් නඩත්තු කළා. එහෙම නඩත්තු කරපු නිසා තමයි ඒක මේ තරම් ඉස්සුණේ. අපි ඒක කඩපු නිසා, ඒ තිබුණු බැඳීම, ඒ සම්බන්ධය කඩපු නිසා, දේශපාලනඥයා සහ අපරාධ කල්ලි සාමාජිකයා අතර තිබුණු සම්බන්ධය දේශපාලන පක්ෂයක් විධියට, ආණ්ඩුවක් විධියට අපි කඩපු නිසා තමයි අද මේ විධියට අතුගාලා දාන්න පුළුවන් වෙලා තියෙන්නේ. ඒක අපට ඇස් පනා පිට පෙනෙන සත්‍යයක්. ඒක පිළිගන්නේ නැති කවුරුවත් මෙතැන ඉන්නවා කියලා මම හිතන්නේ නැහැ. මේ ආණ්ඩුව සංවිධානාත්මක අපරාධ, විෂ මත්ද්‍රව්‍ය කල්ලිත් එක්ක තිබුණු සම්බන්ධය කඩලා ඔවුන්ට විරුද්ධව සෘජුව ක්‍රියාත්මක වෙන්නේ නැහැ කියලා විපක්ෂයේ කාටවත් අපට ඇඟිල්ල දිගු කරලා කියන්න බැහැ කියලා මම හිතනවා. ඒක පිළිගන්නේ නැතුව ඉන්න කාටවත් බැහැ. එහෙම තත්ත්වයක් තුළ තමයි ජනාධිපතිතුමා ඊයේ කිව්වේ, අර නිලධාරීන් හතුරන් වශයෙන් සැලකීම ගැන. විමර්ශනය කළ නිලධාරින්, මේ විමර්ශන කටයුතුවලට මූලිකත්වය අරගෙන ඉන්න දෙපාර්තමේන්තුවල පුද්ගලයන් ගැන දිගින් දිගටම බොරු වපුරන්න, ඔවුන් discredit කරන්න, ඔවුන්ගේ විශ්වසනීයත්වය නැති කරන්න, පොහොට්ටුව වාගේ පක්ෂ නොවෙයි, සමගි ජන බලවේගයේ ඇතැම් මන්ත්‍රීවරුන් පවා දිගටම ක්‍රියාත්මක වනවා. මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා පාස්කු ප්‍රහාරය ගැන කියලා, "හොඳයි, ශානි මේක කරන්න ඕනෑ, ශානි අසාධාරණයට ලක් වුණා" කියද්දී, ඊට එහා පැත්තේ පුටුවක වාඩිවෙලා ඉන්න දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා හැම දාම ඒක ප්‍රශ්න කරනවා, එයා අරහෙමයි, මෙහෙමයි කියලා. ඒ ගැන ප්‍රශ්න කරන එක නොවෙයි මෙතැන තිබෙන ප්‍රශ්නය. මේගොල්ලන් ඒ නිලධාරින්ව discredit කරනවා. මේක දේශපාලන වැඩක්. ඉතිහාසයේ පළමුවන වතාවට මේ තිබෙන තත්ත්වය අනෙක් පැත්තට කරකවන මේ නිලධාරින්, ඒ අවදානම සම්පූර්ණයෙන් අරගෙන කටයුතු කරන නිලධාරින්ව discredit කරන්න, ඒ නිලධාරින්ගේ විශ්වසනීයත්වය නැති කරන්න තමයි මේ පිරිස දිගටම කටයුතු කරන්නේ. එතකොට ඒක පිටුපස තිබෙන හේතුව අපි හැමෝම හිතාගන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය දශක දෙක තුළ වැඩිම කාලයක් මේ රට පාලනය කරපු පක්ෂය සහ ව්‍යාපාරය විධියට ඔය පොහොට්ටුව සහ පොහොට්ටුවේ හිටපු ඇමතිලා සම්බන්ධයෙන් චෝදනා එල්ල වුණා. දැන් ඔය නඩු එහෙමත් යන්නේ. කප්පම් අරගෙන නඩු යනවා, වංචා කරලා නඩු යනවා, පාතාලයට සම්බන්ධ වෙලා කියලා චෝදනා තිබෙනවා. හැම ආකාරයකින්ම ඒවාට සම්බන්ධ වෙලා කියලා පොහොට්ටුවේ හිටපු ඇමතිලාට, මන්ත්‍රීලාට විරුද්ධව මේ වෙද්දි කටයුතු කරනවා. මිනිස්සුත් එහෙම හිතාගෙන ඉන්නවා. හැබැයි, වැඩේ තිබෙන්නේ දැන් මේ සමගි ජන බලවේගයේ නමත් මේවාට පැටලෙන්න පටන් අරගෙන තිබෙන එකනේ. අපි දන්නවා, කප්පම්කාරයෝ හිටියා, වංචාකාරයෝ හිටියා, පාතාල නායකයෝ, සංවිධානාත්මක අපරාධ නායකයෝ හිටියා කියලා. හැබැයි, සමගි ජන බලවේගයේ ඉන්නේ ඊට වඩා සුපිරි බඩු. කලින් හිටියේ වෙන වෙනම නේ. හැබැයි, දැන් පාතාලයෙන් කප්පම් අරගෙන ඒ පාතාලයටම වංචාවක් කරපු කෙනෙක් ඇවිල්ලා තිබෙනවා, සජබයේ නායකත්වයට. නායකත්වයට කිව්වාට, සමගි ජන බලවේගයේ කෘත්‍යාධිකාරී මණ්ඩල සාමාජිකයකු විධියට ඔහු ඇවිල්ලා තිබෙනවා. ඔහුට තිබෙන චෝදනාව තමයි, පාතාලයෙන් කප්පම් අරගෙන වංචා කිරීම. ඒ කියන්නේ, කප්පම් අරගෙන වැඩේ කරලාත් නැහැ, එතැනටත් වංචාවක් කරලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමගි ජන බලවේගයේ කෘත්‍යාධිකාරී මණ්ඩලය කියන්නේ ඒකේ නායකත්වය නේ. ඔය කෘත්‍යාධිකාරී මණ්ඩලයේ මෙතැන ඉන්න හැම මන්ත්‍රීවරයෙක්ම නැහැ නේ. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හැමෝම නැහැ, මම දන්නා විධියට. එච්චර විශ්වාසයෙන් තමයි ඒ අය ඇතුළට අරගෙන තිබෙන්නේ. එහෙම ඇතුළට අරගෙන පක්ෂ නායකත්වයේ කටයුත්තක් භාර දෙනවා කියන්නේ ලේසි වැඩක් නොවෙයි නේ. පක්ෂයේ නායකකම් නිකම් පාරේ යන අයට කථා කරලා දෙන්නේ නැහැ නේ. ඒ නිසා ඒ පුද්ගලයා ගැන යම් තහවුරුවක් ඒ අයට තිබෙන්න ඕනෑ, මීට කලින්. ඒක එහෙම නැතිවෙන්න බැහැ. එහෙම නැතිව පක්ෂ නායකත්වයට මිනිස්සුන්ව පත් කරන්නේ නැහැ. එහෙම තිබියදී, ඒ පුද්ගලයා හිටපු අධිකරණ ඇමතිගේ පුතාත් එක්ක ගිහිල්ලා පාතාල කල්ලි සාමාජිකයෙක් -සංවිධානාත්මක අපරාධ කල්ලි සාමාජිකයෙක්- හිරගෙයින් වෙනත් හිරගෙයකට මාරු කරන්න පුළුවන් කියලා සල්ලි ගන්නවා කියන්නේ, මේ රටේ තිබුණු ක්‍රමය කොහොමද එකක්ද කියලා හිතන්නකෝ. එහෙම වැඩ තමයි මේගොල්ලන් කරලා තිබෙන්නේ. වැඩේ තිබෙන්නේ, ඒ ගැන විපක්ෂ නායකතුමා එකක් කියනවා, අනික් පිරිස තව එකක් කියනවා. හැබැයි ඒ වැරැද්ද වුණාට පස්සේ.

සමගි ජන බලවේගයේ නායකත්වය ඇතුළේ එච්චර වංචාවක් කරපු පුද්ගලයෙක් ඉඳලාත්, එච්චර අපරාධයකට හවුල් වෙච්ච පුද්ගලයෙක් ඉඳලාත්, විපක්ෂ නායකතුමා ඊයේ මොකක්ද කිව්වේ? එතුමා කියනවා, සිංගප්පූරු ක්‍රමය ගෙනෙන්න ඕනෑ, එල්ලන්න ඕනෑ වාගේ කථාවක්. හැබැයි, දැන් ටිකකට කලිනුත් මම දැක්කා, විපක්ෂ නායකතුමාගේ photo එකක් දාගෙන, ඒගොල්ලන්ගේ කාර්යාලයේ මාධ්‍ය සාකච්ඡාවක් තියලා තවත් කෘත්‍යාධිකාරී මණ්ඩල සාමාජිකයෙක් කියනවා, ඒ ගත්ත ගණන ගාස්තුව ද දන්නේ නැහැ කියලා. බලන්නකෝ, මට ඒ කථාව ගැන පුදුම හිතුණා. ඒ රුපියල් ලක්ෂ 1,200 නීතිඥ ගාස්තුව ද දන්නේ නැහැ, ඒවා බලන්න ඕනෑ කියනවා, පක්ෂයේ තව නායකයෙක්. මට තේරෙන්නේ නැහැ, මේ මිනිස්සුන්ට මොකක්ද වෙලා තිබෙන්නේ කියලා. අඩුම තරමින් වැරැද්දක් වුණාට පස්සේ, මෙච්චර දෙයක් වුණාට පස්සේ කට වහගෙන ඉන්න එපායැ, නැත්නම් තමන්ගේ නායකයා කියන දේ විශ්වාස කරන්න එපායැ. විපක්ෂ නායකතුමා සිංගප්පූරු ක්‍රමය ගෙනෙන්න ඕනෑය කියනවා, එල්ලන්න ඕනෑය කියනවා. හැබැයි විපක්ෂ නායකතුමාගේ මාධ්‍ය ප්‍රකාශක එක්ක තමයි ඒ කියන පුද්ගලයා යුටියුබ් කරන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)
මම තව තත්පර 30ක් ගන්නම්.

විපක්ෂ නායකතුමාගේ මාධ්‍ය ප්‍රකාශක, පාර්ලිමේන්තු මන්ත්‍රී ප්‍රසාද් සිරිවර්ධන. මේ දෙදෙනා YouTube කළේ එකට. ඒවාත් කළේ ඔය සල්ලිවලින් ද දන්නේ නැහැ. මම කියන්නේ, මේවා ඔක්කෝම හොයන්න ඕනෑය කියලායි. ඔය මට්ටමේ අපරාධයක් වෙලා තිබෙනවා නම් ඒ ඔක්කෝම හොයන්න ඕනෑ. ඒවා එහෙම ලේසියෙන් යන්න දෙන්න පුළුවන් ඒවා නොවෙයි. මේ සල්ලි ගියේ කොතැනකටද කියන ඒ ඔක්කෝම හොයන්න ඕනෑ.

ඒ වාගේම පාතාලයේ කුඩු විකුණපු මනුස්සයෙකුට හිර ගෙදරදී calls 92ක් ගත්ත මන්ත්‍රීවරු ඉන්නවා. පාතාල නායකයන්ගෙන් කප්පම් ගන්න මන්ත්‍රීවරු ඉන්නවා. මේ ඔක්කෝම ගත්තාට පස්සේ සමගි ජන බලවේගය මේකේ නව උරුමක්කාරයා වෙමින් යනවා කියලා අපට හිතෙනවා. මොකද, පොහොට්ටුවට බලය නැතිවෙලා පොහොට්ටුව කොහොමත් පැත්තකට තල්ලු වෙන එක ඇතුළේ, ආණ්ඩුව එක්ක මේ සංවිධානාත්මක අපරාධ වාගේ දෙයක් ගැන හිතන්නවත් බැරි තත්ත්වයක් ඇතුළේ, මේ ඉතිරි වෙලා ඉන්න පාතාල කල්ලි සාමාජිකයන් හෝ කුඩු ව්‍යාපාරිකයන් හෝ හිතා මතා සමගි ජන බලවේගයත් එක්ක ගනුදෙනුවක් කරමින් ඉන්නවාද කියන සැකය අපට බරපතළ විධියට තිබෙනවා. ඒ ගැන ඇත්තටම අපි හොයන්න ඕනෑ. නැත්නම් මේ අහඹු සිදුවීම් එක, දෙක එළියට එන්න විධියක් නැහැ. අපි හිතනවා, සමගි ජන බලවේගයේ නායකයන් එක්ක මේ පාතාල කල්ලි සාමාජිකයන් යම් යම් සම්බන්ධතා හදාගෙන මේ වැඩේ ඉස්සරහට ගෙනයනවා කියලා. ඒක තමයි දිගින් දිගටම සිදුවන මේ සිද්ධිවලින් පෙනෙන්න තිබෙන්නේ. ඒක එහෙම නොවෙයි නම්, පක්ෂ නායකයන්ට ඇවිල්ලා අර වාගේ විකාර කියන්න බැහැ නේ. එහෙම නම් විපක්ෂ නායකතුමා කියන එකම අනෙක් අයත් කියන්න ඕනෑ. එහෙම කියන්නේත් නැහැ. පක්ෂ කාර්යාලයේ මාධ්‍ය සාකච්ඡාවක් අරගෙන පක්ෂ නායකයෝ කියනවා, "මේක ගාස්තුව ද දන්නේ නැහැ, ඒවා විමර්ශනවලින් තමයි හොයන්න ඕනෑ, ගාස්තුව වෙන්නත් පුළුවන් නේ" වාගේ කථා. ඒ නිසා මේ කැත වැඩේ මේගොල්ලන් කොහොමද කරන්නේ කියලා මට තේරෙන්නේ නැහැ. මේගොල්ලන් මීට කලින් රාජපක්ෂලාට මාර චෝදනා කරමින් හිටියේ. මේගොල්ලන් මලෙන් උපන්නා වාගේයි හිටියේ. ඒ නිසා මේගොල්ලන් කවුද කියලා තේරුම් ගන්න ඕනෑ. මේ සමගි ජන බලවේගයට ලජ්ජාවක් තිබෙනවා නම්, හැමෝම එකතු වෙලා එකක් කියන්න ඕනෑ. එකක් කියලා අඩුම තරමින් මේකට විරෝධය දක්වන්න ඕනෑ, මෙච්චර ඇස් පනා පිට මේ සිද්ධිය තිබියදී. හැබැයි මේ අය ඒකවත් කරන්නේ නැති තරම්. මේ අය මෙතැනට ඇවිල්ලා කියවන්නේ මොනවාද? අපට තේරෙන්නේ නැහැ, මොන වාගේ බැඳීමක්ද තිබෙන්නේ, අර මුදල් කොහේ කොහේද ගිහිල්ලා තිබෙනවාද කියලා. මේ නිකම් කථා කරනවා වෙන්න බැහැ නේ. සමහර විට මේ සල්ලි කථා කරනවා වෙන්න පුළුවන්. ඔහොම නේ දේවල් වෙන්නේ. ඒ නිසා ඒවා මුල සිට නැවත සොයන්න ඕනෑය කියලා මම යෝජනා කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඉම්රාන් මහරූෆ් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[பி.ப. 4.27]

**ගරු ඉම්රාන් මහරූෆ් මහතා**
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)
நன்றி, கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே! இன்று இச்சபையில் கொண்டுவரப்பட்டு இருக்கின்ற "போதைப்பொருள் அச்சுறுத்தலை எதிர்த்துப் போராடுதல்" என்ற தொனிப்பொருளிலான ஒத்திவைப்புவேளைப் பிரேரணையானது, எங்களுடைய நாட்டுக்கு மிகவும் தேவைப்படுகின்ற, கட்டாயமாகக் கவனிக்கப்பட வேண்டிய ஒரு விடயமாகக் காணப்படுகின்றது.

இன்று போதைப்பொருள் கலாசாரமானது எல்லா இடங்களிலும் பரவி, எல்லாத் தரப்பினரையும் ஆக்கிரமிக்கின்ற ஒரு விடயமாக மாறியிருக்கின்றது. நான் பிரதிநிதித்துவப்படுத்துகின்ற திருகோணமலை மாவட்டத்தில் கூட, போதைப்பொருள் பாவனை அதிகரித்திருக்கின்றது. குறிப்பாக, பாடசாலை மாணவ, மாணவிகளுக்குக்கூட போதைப்பொருளை வழங்குகின்ற நடவடிக்கைகள் நடைபெற்றுக்கொண்டு இருக்கின்றன. இதைக் கட்டுப்படுத்துவது உண்மையிலேயே கடினமான ஒரு செயற்பாடாக இருந்தாலும், இந்த நாட்டுக்காக, எங்களுடைய சமூகத்துக்காக, எங்களுடைய மக்களுக்காகச் செய்யவேண்டிய மிக முக்கியமானதொரு பணியாகவே நாங்கள் இதைப் பார்க்கின்றோம். போதைப்பொருளை ஒழிப்பதற்கு அல்லது அது தொடர்பில் ஒரு தீர்வைப் பெறுவதற்கு நாங்கள் கட்சி பேதங்களை மறந்து, இன, மத வேறுபாடுகளைத் தாண்டி, ஒன்றுபட்டுச் செயற்பட வேண்டும்.

இன்று எங்களுடைய மாவட்டத்தில் போதைப்பொருள் காரணமாகப் பல இளைஞர்களுடைய வாழ்க்கை பாதிப்படைந்து இருக்கின்றது. இன்று அவர்களுடைய எதிர்காலம் கேள்விக்குறியாகக் காணப்படுகின்றது. எங்களுடைய பிரதேசத்தில் இருக்கின்ற விளையாட்டு வீரர்களாக இருந்தாலும் சரி, கல்வியில் சிறந்து விளங்குகின்ற மாணவர்களாக இருந்தாலும் சரி, அவர்களுடைய வாழ்க்கைகூட கேள்விக்குறியாகின்ற அளவுக்கு போதைப்பொருளின் தலையீடு கூடுதலாகக் காணப் படுகின்றது. எனவே, இதனை முழுமையாக ஒழிப்பதற்கு அரசாங்கம் அர்ப்பணிப்போடு செயற்பட வேண்டும். அதற்கு எங்களுடைய முழுமையான ஆதரவு என்றும் இருக்கும். போதைப்பொருள் பாவனைமூலம் பல பிரச்சினைகள் எங்களுடைய மாவட்டத்தில் மாத்திரமல்ல, நாடளாவிய ரீதியிலும், ஏன் உலகில்கூட ஏற்பட்டுக்கொண்டு இருக்கின்றன. எனவே, இதனை ஒழிப்பதற்கான நல்ல வேலைத்திட்டங்களை அரசாங்கம் கொண்டுவர வேண்டும். போதைப்பொருளோடு தொடர்புபடுகின்ற யாராக இருந்தாலும், அவர்களுக்குக் கடுமையான தண்டனைகளை வழங்கக்கூடிய வகையிலான சட்டங்களை நிறைவேற்ற வேண்டிய நிலைப்பாட்டில் நாங்கள் இருந்துகொண்டு இருக்கின்றோம்.

போதைப்பொருள் வியாபாரம் செய்கின்றவர்கள், அதை விநியோகிக்கின்றவர்கள், அதைப் பயன்படுத்துகின்றவர்கள் எந்தத் தரப்பினராக இருந்தாலும், அவர்களுக்கு எதிராகச் சட்ட நடவடிக்கை எடுப்பதற்குரிய சரியான வேலைத் திட்டத்தை அரசாங்கம் அமுல்படுத்த வேண்டும். அதனை கிராம மட்டத்திலிருந்து முழுமையாக அமுல்படுத்துவதன் மூலம் போதைப்பொருளை ஒழிப்பதற்கான நடவடிக்கைகளை மேற்கொள்ள வேண்டுமென அரசாங்கத்தை வலியுறுத்து கின்றேன்.

[ගරු ඉම්රාන් මහරූෆ් මහතා]

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று எங்களுடைய மாவட்டத்தில் டெங்கு நோய் பாரிய சவாலாக மாறியிருக்கின்றது. இப்போது எங்களுடைய மாவட்டத்தில் டெங்கு நோயாளர்களின் எண்ணிக்கை அதிகரித்து வருகின்ற ஒரு சூழல் காணப்படுகின்றது. இலங்கையிலுள்ள எல்லா மாவட்டங்களிலும் இந்த நிலைமை காணப்பட்டாலும், எங்களுடைய பிரதேசங்களில் அதிகளவான டெங்கு நோயாளர்கள் இனங்காணப்பட்டு இருக்கின்றார்கள். எனவே, டெங்கு நோயைத் தடுப்பதற்குரிய நடவடிக்கைகளை மேற்கொள்ள வேண்டிய நிலையில் நாங்கள் இருக்கின்றோம். நாங்கள் அங்கிருக்கின்ற MOH மற்றும் வைத்தியர்களோடு கலந்துரையாடும்போது, அவர்கள் சொல்கின்ற விடயம் என்னவென்றால், "நாங்கள் இந்த நோயை ஓரளவுக்குக் கட்டுப்பாட்டுக்குள் வைத்திருந்தாலும், எங்களுடைய தேவைப்பாடுகளைப் பூர்த்திசெய்கின்றபொழுது அங்கு டெங்கு நோயை முழுமையாகக் கட்டுப்படுத்த முடியும்" என்றுதான். குறிப்பாக, எங்களுடைய பிரதேசங்களிலுள்ள MOH காரியாலயங்களில் நுளம்புகளைக் கொல்வதற்காகப் புகை அடிக்கும் fogging machine தட்டுப்பாடாகக் காணப்படுகின்றது. எனவே, அவற்றை உடனடியாக வழங்க வேண்டும். அதேபோல், ஊழியர்களும் பற்றாக்குறையாக இருக்கின்றார்கள். அவர்களையும் நியமிக்க வேண்டும். இம்முறை எங்களுடைய மாவட்டத்தில் டெங்கு நோயின் தாக்கம் மிகக் கூடுதலாக ஏற்படலாம் என்ற அச்ச நிலை காணப்படுவதால், அங்குள்ள MOH காரியாலயங்களுக்குத் தேவையானவற்றை அரசாங்கம் வழங்க வேண்டுமென்ற கோரிக்கையை இந்த இடத்தில் முன்வைக்கின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று பாராளுமன்றத்தில் இடம்பெறுகின்ற வாதப் பிரதிவாதங்களைப் பார்க்கும்பொழுது, ஓர் ஆரோக்கியமான விடயம் எங்களுக்கு விளங்கினாலும், இன்னொரு விடயம் எங்களுக்குச் சந்தேகமாகக் காணப்படுகின்றது. இன்று யார் குற்றம் செய்தாலும் அவர்கள் தண்டிக்கப்பட வேண்டும் என்பது எல்லோராலும் ஏற்றுக்கொள்ளக்கூடிய ஒரு விடயமாகும். கள்வர்களைக் கண்டுபிடித்து, அவர்களைக் கைதுசெய்து விசாரணைகளை மேற்கொள்ள வேண்டும் என்ற எதிர்பார்ப்புடனேயே மக்கள் இந்த அரசாங்கத்தை மாத்திரமல்ல, சென்ற 'நல்லாட்சி' அரசாங்கத்தையும் ஏற்படுத்தினார்கள். 'நல்லாட்சி' அரசாங்கம் இவ்வாறான செயற்பாடுகளைச் சரியாகச் செய்யாததன் காரணமாகவே, எங்களுடைய ஆட்சி நிலைக்காமல் போனது; நாங்கள் எதிர்க்கட்சிக்கு வர வேண்டிய சூழல் ஏற்பட்டது.

எனவே, நாங்கள் இப்பொழுது இருக்கின்ற அரசாங்கத்திடம் வலியுறுத்துகின்ற விடயம் என்னவென்றால், யார் தப்பு செய்தாலும், யார் களவு எடுத்தாலும், யார் ஊழல் புரிந்தாலும் அவர்களுக்கான தண்டனையை வழங்க வேண்டும் என்றுதான். அவர் எந்தக் கட்சியைச் சேர்ந்தவர், எந்த மதத்தைச் சேர்ந்தவர், எந்த இனத்தைச் சேர்ந்தவர் என்பதைப் பார்க்க வேண்டிய அவசியம் கிடையாது. தூய்மையான, நேர்மையான ஆட்சியை உருவாக்க வேண்டும் என்பதுதான் எங்களுடைய எதிர்பார்ப்பாகவும் காணப்படுகின்றது. ஊழலற்ற, சிறந்த, நேர்மையான ஆட்சியை அமைப்பதற்கு நாங்கள் எப்பொழுதும் பக்கபலமாக இருப்போம். எங்களுடைய கட்சியைச் சேர்ந்தவர்களாக இருந்தாலும் சரி, ஏனைய கட்சிகளைச் சேர்ந்தவர்களாக இருந்தாலும் சரி, அவ்வாறானவர்களைக் கைதுசெய்து சட்டத்தின் முன் நிறுத்த வேண்டும்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට ලැබී ඇති කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු ඉම්රාන් මහරූෆ් මහතා**
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)
මම මේ කාරණයත් කියා මගේ කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

பொருளாதார நெருக்கடி ஏற்படும்பொழுது அல்லது பொருட்களின் விலை அதிகரிக்கும்பொழுது அல்லது மக்கள் கஷ்டப்படும்பொழுதுதான் இவ்வாறான விசாரணைகளையும் கைதுகளையும் நீங்கள் செய்கின்றீர்களா? என்ற சந்தேகம் எங்களுக்கு ஏற்படுகின்றது. அதாவது, பொருளாதார நெருக்கடி ஏற்படும்பொழுது அல்லது எரிவாயு, பெற்றோலின் விலை அதிகரிக்கும்பொழுது அல்லது நாட்டு மக்கள் கஷ்டத்தில் இருக்கும்பொழுது இவ்வாறான ஒரு விடயத்தைக் கையிலெடுத்து, அதைப் பெரிதாகப் பேசுகின்றீர்கள். பின்பு பிரச்சினை ஓரளவு குறையும்பொழுது, அதனை மறந்துவிட்டு வேறொரு விடயத்துக்குள் சென்று விடுகின்றீர்கள். ஜனநாயக ரீதியாக வழங்கப்பட்டிருக்கின்ற இந்த ஆட்சியில் ஊழல்வாதிகளைக் கண்டுபிடிக்க வேண்டிய பொறுப்பு உங்களுக்குக் காணப்படுகின்றது. அதனை நீங்கள் சரியாகச் செய்ய வேண்டுமென நாங்கள் இந்த இடத்தில் வலியுறுத்துகின்றோம்.

மேலும், நாட்டு மக்களையும் கவனிக்க வேண்டும். ஏனெனில், இன்று அவர்கள் பல பிரச்சினைகளை எதிர்நோக்குகின்றார்கள்; அவர்கள் பொருளாதார நெருக்கடியில் இருக்கின்றார்கள். இன்று அரச ஊழியர்கள் மாத்திரமல்ல, எல்லோரும் கஷ்டப்படுகின்ற நிலையிலே இருந்துகொண்டு இருக்கின்றார்கள். எனவே, மக்களுடைய பொருளாதார விடயத்தைக் கவனத்திற்கொண்டு, அவர்களுக்கான தீர்வுகளை வழங்கும் ஓர் அரசாங்கமாக நீங்கள் செயற்பட வேண்டுமென இந்த இடத்தில் கேட்டு, எனது உரையை முடித்துக் கொள்கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ආනන්ද විජේපාල අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 20ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.35]

**ගරු ආනන්ද විජේපාල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஆனந்த விஜேபால - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்)
(The Hon. Ananda Wijepala - Minister of Public Security and Parliamentary Affairs)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මත්ද්‍රව්‍ය භාවිතයට සහ ජාවාරමට එරෙහි ජාත්‍යන්තර දිනය අද දිනට යෙදී තිබෙනවා. ඊයේත් මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් සාධනීය විවාදයක් පැවැත්වුණා. අදත් එම විවාදය පැවැත්වෙමින් තිබෙනවා. ඔබතුමන්ලා දන්නවා, මේ මත්ද්‍රව්‍ය ව්‍යසනය හරහා රටේ සෑම සමාජ තීරුවකටම දැඩි බලපෑම් ඇති කරලා තිබෙන තත්ත්වයක් තුළ තමයි අපි මේ විවාදය පවත්වන්නේ කියලා. රජයක් හැටියට අපි බලයට පත් වුණාට පස්සේ මේ මත්ද්‍රව්‍ය ව්‍යසනය රටින් මුලිනුපුටා දැමීම

සඳහා දැවැන්ත ක්‍රියාමාර්ග රාශියක් ගත්තා. ඒ ක්‍රියාමාර්ග යම් සාධනීය තැනකට එහෙම නැත්නම් සාර්ථක දිශානතියකට එළඹෙමින් තිබෙන අවස්ථාවක තමයි අපි මේ විවාදය පවත්වන්නේ. අද උදෑසන අපි දැවැන්ත පා ගමනක් ගෝල් ෆේස් සිට කොල්ලුපිටිය දක්වා ආරම්භ කළා, ජාත්‍යන්තර මත්ද්‍රව්‍ය විරෝධී දිනය නිමිත්තෙන්. ඒ වාගේම රට පුරාම ඒ සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන්, පත්‍රිකා බෙදීම් සහ සම්මන්ත්‍රණ රාශියක් පවත්වනු ලැබුවා.

රටක් හැටියට මුහුණ දීලා තිබෙන මේ දැවැන්ත ව්‍යසනය අවසන් කිරීම සඳහා රජය ප්‍රමුඛත්වය ලබා දීලා තිබෙනවා. ඔබ දන්නවා, පහළම මහජන ආරක්ෂක කමිටු 14,125කට ආසන්න ප්‍රමාණයක් පක්ෂ පාට භේදයකින් තොරව නිර්මාණය කරලා තිබෙනවාය කියන එක. විපක්ෂ නායකවරයා මේ ගරු සභාවේදී ඊයේත් මතු කළා, මේවා දේශපාලනීකරණය කරලා කියලා. එතුමාට මේ පිළිබඳ අවබෝධයක් නැහැ. ග්‍රාම නිලධාරි තමයි ඒ කමිටුවේ සභාපති වෙන්නේ. ඒ වාගේම මේවා ප්‍රජා පොලිස් නිලධාරියා කැඳවුම්කරු වන විධිමත්ව, ව්‍යුහගතව වෙනස් කරලා පිහිටුවපු මහජන ආරක්ෂක කමිටු. ඒ කමිටු හරහා බිම් මට්ටමින් සෑම ග්‍රාම නිලධාරි කොට්ඨාසයක්ම ආවරණය වන විධියට සැලසුම් සහගතව සංවිධානගත කරලා තිබෙන්නේ. ඒ වාගේම, ඊට ඉහළින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය පදනම් කරගෙන ප්‍රාදේශීය මෙහෙයුම් කමිටු හදලා තිබෙනවා. ඊට ඉහළින් දිස්ත්‍රික් සංවර්ධන සභාව හදලා තිබෙනවා. ජාතික සභාව ගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන්, සභාපතිත්වයෙන් අපි හැදුවේ මේක රටේ ප්‍රමුඛ කාර්යයක් කොට සලකා, මේ ව්‍යසනයෙන් අපේ රටේ අනාගත තරුණ පරපුරත් මුදා ගැනීමේ වුවමනාව සහිතවයි.

ඒ ප්‍රමුඛත්වය අපි මේ වෙනකොට ලබා දීලා තිබෙනවා. සමාජය ජාලගත කරලා දැලක් එලුවා වාගේ අපි සියලු සමාජ තීරු ආවරණය වන පරිදි මේක සංවිධානය කරලා තිබෙනවා. ඒ දැලට හාල්මැස්සෝ විතරක් නොවෙයි, තෝරු මෝරුත් අහු වෙනවා. ඒ වාගේම රාජ්‍ය ආයතන, රාජ්‍ය නොවන ආයතන සහ පාසල් පද්ධතිය තුළත් සංවිධානගතව අපි ඒ කමිටු ආරම්භ කරලා තිබෙනවා. එහෙම කරන්න අවශ්‍ය වෙලා තිබෙනවා. ඒ තරම් දැවැන්ත අර්බුදයක් බවට මේ අර්බුදය ගෙනැත් තිබෙනවා, පසුගිය දශක දෙක තුනක කාලයක් පුරා මේ රට පාලනය කරපු පාලකයන් විසින්. දේශපාලන ආශීර්වාදය ඇතිව නිර්මාණය කරපු සංවිධානාත්මක අපරාධ කණ්ඩායම් හරහා තමයි මේ මත්ද්‍රව්‍ය ව්‍යාපාරය දියත් වුණේ සහ වර්ධනය වුණේ. මේවා කරගෙන ගියේ ඔවුන්ගේ බලය පවත්වා ගෙන යෑම සඳහායි. සමහර අය අද මේ සභාවට ඇවිල්ලා බොරුවට කිඹුල් කඳුළු හෙළුවාට පසුගිය වකවානුවල මේ රට පාලනය කළ, මේ රටට දැවැන්ත විනාශයක් කළ බොහෝ පාලකයෝ මේ ව්‍යසනයට වග කියන්න ඕනෑ, මේ ව්‍යසනය මෙතරම් උත්සන්න කිරීමට වග කියන්න ඕනෑ. රටේ අස්සක් මුල්ලක් නෑර සෑම සමාජ තීරුවකටම මේ ව්‍යසනය පතුරුවා හැරපු ඒ පාලකයෝ ඒ ව්‍යාපාරවලට ආශීර්වාද කළා. ඒ සඳහා ඇති තරම් උදාහරණ තිබෙනවා. මත්ද්‍රව්‍ය ජාවාරම්කාරයෝ බදා ගත්ත අවස්ථා තිබෙනවා. මත්ද්‍රව්‍ය ජාවාරම්කාරයන්ට ආධාර අනුබල දුන්නු අවස්ථා තිබෙනවා.

ඊයේ කළ අත්අඩංගුවට ගැනීම් ගැනත් මේ සභාවේ කථා වුණා. එහිදී සිද්ධ වෙලා තිබෙන්නේ මොකක්ද? එක් සංවිධානාත්මක අපරාධකරුවෙක් බේරා ගැනීම සඳහා අල්ලස් ගන්නවා. ඒකේ අදහස මොකක්ද? මේ සංවිධානාත්මක අපරාධ තවදුරටත් පවත්වාගෙන යන්න ආධාර අනුබල දීමයි. වෙන මොකක්ද ඒ හරහා කියැවෙන කථාව? එහෙම කථාවක් තමයි එතැන තිබෙන්නේ. අපි දිගින් දිගටම කිව්වා, සමහර දේශපාලන පක්ෂවල ඉන්න පිරිස් පාතාල ක්‍රියාකාරකම්වලට, මත්ද්‍රව්‍ය ජාවාරම්වලට සම්බන්ධයි කියලා. අපි ඒක ආරම්භයේ ඉඳලාම කිව්වා. අපි ඒ පිළිබඳ විමර්ශන පවත්වමින් ඉන්නවා. සමහර අය එළියේ ප්‍රවෘත්ති සාකච්ඡා තියලා අහනවා මත්ද්‍රව්‍යවලට, පාතාලයට සම්බන්ධ එක දේශපාලනඥයෙක් ගැන කියන්න කියලා. අපි දේශපාලන වශයෙන් සලකලා ඒ විමර්ශන කිසිවක් කරන්නේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපි ඒ විමර්ශන කරන්නේ ඉතාම විද්‍යාත්මක සාක්ෂි පදනම් කරගෙන. සමහරවිට ඒ සඳහා කාලයක් ගත වෙනවා. කොතරම් කාලයක් ගත වුණත් නිවැරදි දේ කරන්න අවශ්‍යයි, ස්වාධීනව විමර්ශන කරන්න අවශ්‍යයි, සාක්ෂි පදනම් කරගෙන විමර්ශන කරන්න අවශ්‍යයි. ඒ නිසා තමයි ඒවාට යම් කාලයක් ගත වෙන්නේ. ඒවා නිවැරදිව සිද්ධ වෙනවා. කිසිවෙකුටත් අපරාධ කරලා, මත්ද්‍රව්‍ය ජාවාරම් කරලා, සංවිධානාත්මක අපරාධකරුවන්ට ආධාර අනුබල දීලා නිදහසේ ගැලවිලා යන්න ඉඩ කඩක් නැහැ.

ඒක අපි මේ රටේ ජනතාවට පොරොන්දු වෙලා තිබෙනවා. ජනතාවගේ ජන වරමේ හරය අපි තේරුම් අරගෙන තිබෙනවා. ඒ අනුව අපි මේ විමර්ශන ක්‍රියාවලිය මෙහෙයවනවා. අල්ලසට, දූෂණයට, වංචාවට එරෙහිව, මත්ද්‍රව්‍ය ව්‍යාපාරවලට එරෙහිව සහ පාතාල ක්‍රියාකාරකම්වලට එරෙහිව විමර්ශන ක්‍රියාවලිය දියත් කරලා අපි මේ වෙනකොට සාර්ථක ප්‍රතිඵල විශාල වශයෙන් ලබාගෙන තිබෙනවා. අපට තව දුරක් යන්න තිබෙනවා. අපි ඒක අනිවාර්යයෙන්ම කරනවා. මේ රටේ ජනයා ඉල්ලපු ප්‍රධාන කාරණයක් තමයි අල්ලස, දූෂණය, වංචාව, පාතාල ක්‍රියාකාරකම් සහ මත්ද්‍රව්‍ය ව්‍යසනයට එරෙහිවත් කටයුතු කරන්න කියන එක. ඒ නිසා තමයි අපි මේ සමාජය සංවිධානගත කරලා දැක්මක්, සැලැස්මක්, වැඩ පිළිවෙළක් ඇතිව ඉලක්කයක් කරා ගමන් කරමින් ඉන්නේ. මේ වෙනකොට ඒකේ යම් සාර්ථක ප්‍රගතියක් අත්පත් කරගෙන තිබෙනවා. අපේ මන්ත්‍රී සහෝදරවරු වාගේම විපක්ෂයේ සමහර මන්ත්‍රීවරුත් ඒ කරුණු මේ සභාවට අවධාරණය කළා.

විශේෂයෙන්ම මත්ද්‍රව්‍ය ව්‍යසනය නිසා දරුවන්ගේ අධ්‍යාපනය බිඳ වැටිලා තිබෙනවා, පවුල් විසංවිධානය වෙලා තිබෙනවා, පවුලේ ආර්ථිකය බිඳ වැටිලා තිබෙනවා, දැවැන්ත ව්‍යසනයක් සමාජයට අත්පත් කර දීලා තිබෙනවා. කුඩා දරුවන්ගේ ඉඳලා, තරුණ තරුණියෝ, විවිධ රැකියා කරන අය, පොලීසියේ අය, හමුදාවේ අය, විවිධ වෘත්තිකයන් පවා ඒවාට සම්බන්ධ වෙලා ඒවා භාවිතයට හුරු වෙලා තිබෙනවා. ඔවුන් එයින් මුදා ගන්න ඕනෑ. සමාජ පද්ධතිය පිරිහෙනකොට, පද්ධතියේ තිබෙන සෑම සමාජ තීරුවක්ම මේ ව්‍යසනයට ගොදුරු වෙමින් සිටිනවා. ඒ නිසා අපට රජයක් හැටියට, ජාතික ජන බලවේගය ආණ්ඩුව හැටියට තවදුරටත් හැකියාවක් නැහැ නිහඬව මේ දෙස බලාගෙන ඉන්න. ඒ නිසා තමයි අපි මේ දැවැන්ත වැඩ පිළිවෙළ සමාජගත කරලා මේ රටේ අනාගත පරපුරත්, නූපන් දරුවාත් බේරා ගැනීමේ දැවැන්ත ක්‍රියාන්විතය ආරම්භ කරලා තිබෙන්නේ. සාධනීය ලෙස ඒ ක්‍රියාන්විතය දියත් වෙමින් තිබෙනවා.

ඒ ව්‍යාපෘතිය, නැත්නම් ඒ ක්‍රියාන්විතය තවත් තීව්‍ර කරන්න අවශ්‍යයි. අපි අද සන්ධ්‍යා කාලයේ විජේරාම මාවතේ ජාතික මෙහෙයුම් කාර්යාලයක් ආරම්භ කළා, මාධ්‍ය මෙහෙයුම් මධ්‍යස්ථානයක් සහිතව. පොලීසිය, ත්‍රිවිධ හමුදාව, රේගු දෙපාර්තමේන්තුව, තැපැල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා පොලීසිය, STF එක ඇතුළු සියලු රාජ්‍ය ආයතන ඒකාබද්ධ කරමින්, සංවිධානගතව මේ මෙහෙයුම් ක්‍රියාවලිය දියත් කරන්න අවශ්‍යයි. ඒ සඳහා වූ මෙහෙයුම් කාර්යාලයක් අපි ආරම්භ කළා, ඒ වාගේම මාධ්‍ය මධ්‍යස්ථානයක් ආරම්භ කළා. අපට අවශ්‍යයි අපි මේ ආව ගමන තවත් ශක්තිමත් කරලා ජනතාවගේ විශ්වාසය සහිතව, ජනතාවගේ ආශීර්වාදය සහිතව මේ ව්‍යාපාරය ඉදිරියට අරගෙන යන්න. මොකද, මේ ව්‍යසනයට එරෙහිව අපි කටයුතු කළොත් මිස, අපි හිතන්නේ නැහැ වෙනත් කිසිම දේශපාලන ව්‍යාපාරයක් ඊට එරෙහිව කටයුතු කරයි කියලා. ඔවුන්ගේ ආශීර්වාදය මැද වැජඹෙන, ඔවුන්ගේ ආධාර අනුබල දීම් මත යැපෙන, සමහර

[ගරු ආනන්ද විජේපාල මහතා]

දේශපාලන ව්‍යාපාරවලට මේවාට එරෙහිව කටයුතු කරන්න කිසිදු හැකියාවක් නැහැ කියලා තමයි අපි විශ්වාස කරන්නේ. අපි ආරම්භ කරලා තිබෙන මේ දැවැන්ත ක්‍රියාන්විතයට, මේ ව්‍යාපාරයට රටේ ජනතාව මේ වනකොට තොරතුරු විශාල වශයෙන් ලබා දෙමින් ඉන්නවා. ඒ තොරතුරු හරහා අපි වැටලීම් සිද්ධ කරනවා. ශ්‍රී ලංකා පොලීසිය, නාවික හමුදාව වාගේම විශේෂ කාර්ය බලකාය - STF එක - ඒ තොරතුරු හරහා කරන වැටලීම් මේ වනකොට සාර්ථක අදියරට ඇවිල්ලා තිබෙනවා. ඒ නිසාම පසුගිය කාලය පුරාම කරන ලද වැටලීම්වලින් -අපි බලයට ආවාට පසුව මේ ගෙවී ගිය මාස දහඅටක, විස්සක කාලය ඇතුළත කරන ලද වැටලීම්වලින්- විවිධාකාරයේ මත්ද්‍රව්‍ය ටොන් 25කට අධික ප්‍රමාණයක් අත්අඩංගුවට ගන්න හැකියාව ලැබිලා තිබුණා. ඒ කාලයේ ග්‍රෑම්වලින් කථා කළා, කිලෝවලින් කථා කළා. පසුව ටොන්වලින් කථා කරන මට්ටමට මේ මත්ද්‍රව්‍ය ව්‍යසනය ව්‍යාප්ත වෙලා තිබුණේ. දැන් මේ මත්ද්‍රව්‍ය ව්‍යසනය අවසන් කරන්න, එයට තිත තබන්න කාලය ඇවිල්ලා කියලායි අපි හිතන්නේ. ඒ නිසා තමයි මේ සියලු ක්‍රියාමාර්ග අපි අරගෙන තිබෙන්නේ.

ඒ විතරක් නෙවෙයි. මෙතැන කියැ වුණා වාගේම මේකට සංවිධානාත්මක අපරාධකරුවන් ඍජුවම සම්බන්ධ වෙලා ඉන්නේ. ඔවුන් දේශපාලන ආශීර්වාදය ඇතිව කාලයක් ස්ථාපිත වෙලා හිටියා; ශක්ති සම්පන්න වෙලා හිටියා; බලය පවත්වාගෙන යන්න පාතාල ක්‍රියාකාරකම් උපයෝගි කර ගත්තා. අපි මේ වනකොට ඒවා යම් ප්‍රමාණයකට පාලනයකට නතු කරලා තිබෙනවා. මේවා අවසන් කරන්න අවශ්‍යයි. මොන තරම් අභියෝග ආවත්, මොන තරම් බාධක ආවත් අපි මේ ක්‍රියාන්විතය නතර කරන්නේ නැහැ. ඊට එරෙහිව අපි මේ රටේ ජනතාවත් පෙළ ගස්වලා මත්ද්‍රව්‍ය ව්‍යාපාරයත් ඒ වාගේම සංවිධානාත්මක අපරාධත් මේ රටින් තුරන් කරන්න අවශ්‍ය පියවර ගන්නවා.

ඔබ දන්නවා red notice යටතේ හිටපු සංවිධානාත්මක අපරාධකරුවන් 23දෙනෙක් මේ වනකොට මේ රටට ගෙනැවිල්ලා තිබෙන බව. ඒ වාගේම රතු නිවේදන නොමැති 35දෙනෙක් ද ඇතුළුව අපරාධකරුවන් 58දෙනෙක් පසුගිය මාස විස්සක කාලය ඇතුළත මේ රටට ගෙනැල්ලා තිබෙනවා. Red notice දුන්නු තවත් 232ක් ඉන්නවා. ඒ 232ක පිරිස අතරින් 96දෙනකු සංවිධානාත්මක අපරාධකරුවන්. ඒ 96දෙනා අතරින් 37දෙනක් මේ වනකොට විවිධ රටවල ඉන්නවා. ඔවුන් හඳුනාගෙන තිබෙනවා. විශේෂයෙන් UAEවල 19දෙනෙක්, ඉන්දියාවේ 11දෙනෙක්, මලයාසියාවේ එක්කෙනෙක්, UKවල එක්කෙනෙක්, Franceවල එක්කෙනෙක්, Canadaවල එක්කෙනෙක්, රුසියාවේ එක්කෙනෙක්, ඉතාලියේ එක්කෙනෙක්, සවුදි අරාබියේ එක්කෙනෙක් යනාදි වශයෙන් 37දෙනෙක් හඳුනාගෙන ඉන්නවා, red notice දීපු. ඉදිරි කාලයේදී අපි ඔවුන් මේ රට ගෙන්වා ගැනීමට අවශ්‍ය පියවර ගන්නවා. මොකද, ඔවුන් තමයි මැද පෙරදිග කලාපයේ රටවල හිඳිමින් මත්ද්‍රව්‍ය ජාවාරම මෙහෙය වන්නේ. එම මෙහෙයුම්කරුවන් අත්අඩංගුවට ගන්න ඕනෑ.

ඒ වාගේම එම මෙහෙයුම්කරුවන්ගේ දෙවැනි පෙළට, තුන්වන පෙළට එරෙහිව අපි මේ වනකොට ක්‍රියාමාර්ග අරගෙන තිබෙනවා. අපි රට තුළ ඉන්න අය හඳුනාගෙන තිබෙනවා. ඔවුන් මෙම ව්‍යාපාර හරහා අත්පත් කර ගන්නා අනීතික ධනය රාජ සන්තක කිරීම සඳහා අවශ්‍ය පියවර අපි ගනිමින් ඉන්නවා. ඔබ දන්නවා පසුගිය දවසක මේ පාර්ලිමේන්තුවේදී අපරාධයකින් උත්පාදිත දේ පිළිබඳ පනත සම්මත වුණා. ඒ පනත සම්මත වුණාට පසුව අපි පොලිස් කොට්ඨාසයක් හැදුවා, අපරාධයකින් උත්පාදිත දේ පිළිබඳ විර්ශන කොට්ඨාසය කියලා. අනීතික ලෙස අත්පත් කර ගත්ත දේපළ සම්බන්ධයෙන් ඒ කොට්ඨාසය හරහා විමර්ශන ආරම්භ කරලා තිබෙනවා.

මත්ද්‍රව්‍ය ව්‍යාපාරය හරහා විතරක් නොවෙයි, සංවිධානාත්මක අපරාධ හරහා උපයාගත් දේපළ සම්බන්ධයෙන්, අල්ලස හා දූෂණය හරහා උපයාගත් දේපළ සම්බන්ධයෙන් මේ අපරාධයකින් උත්පාදිත දේ පිළිබඳ විමර්ශන කොට්ඨාසය හරහා විමර්ශනය කිරීමට අවශ්‍ය පියවර මේ වනකොට අරගෙන තිබෙනවා. එම කොට්ඨාසයට විවිධාකාරයේ පැමිණිලි ලැබෙමින් තිබෙනවා. දේශපාලනඥයන් පිළිබඳ පැමිණිලි විශාල වශයෙන් ලැබෙමින් තිබෙනවා. මත්ද්‍රව්‍ය හරහා යම් කෙනෙක් යම් ධනයක් උපයාගෙන, අනීතික ලෙස දේපළ අත්පත් කරගෙන තිබෙනවා නම් ඔවුන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කරනවා. රටේ ජනයාට විෂ මත්ද්‍රව්‍ය දීලා ඒ හරහා උපයා ගත් දේපළ ඔවුන්ට වුවමනා විධියට භුක්ති විඳලා සුරසැප විඳින්න අනාගතයේ කිසි ආකාරයක ඉඩකඩක් ලැබෙන්නේ නැහැ. ඒ වාගේම දේශපාලනඥයන්ට ඔවුන්ගෙන් අල්ලස් ලබාගෙන ඒ විධියට සුරසැප විඳින්න අවස්ථාවක් ලැබෙන්නෙත් නැහැ. ඒ සම්බන්ධ නීති රීති සකස් වෙලා තිබෙන්නේ.

රටකට නීතියක් අවශ්‍යයි. නීතියේ ආධිපත්‍යය ස්ථාපිත කරන්න අවශ්‍යයි. යුක්තියක් අවශ්‍යයි. නීතිගරුක දේශයක්, සාධාරණ දේශයක් හදන්න අවශ්‍යයි. ඒක තමයි ජාතික ජන බලවේගයේ අභිප්‍රාය. ඒ වෙනුවෙන් තමයි අපි බලය ඉල්ලා සිටියේ. ඒ වෙනුවෙන් තමයි අපි මේ පදනම දාලා තිබෙන්නේ. ඒ වෙනුවෙන් තමයි අපි මේ කටයුතු කරමින් ඉන්නේ. විපක්ෂයට සටන් පාඨ නැති වුණාම, ගිහිල්ලා ජනතාව සමඟ දේශපාලනය කරන්න බැරි වුණාම, මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා මේ ස්ථානයේදී උදේට පැයක් දෙකක් මාධ්‍ය ආයතනවලට ප්‍රවෘත්ති සපයනවා. සාධනීය විවේචන වෙනුවට දේශපාලන වශයෙන් කිසිදු හරයක් නැති විවේචන මේ ගරු සභාවට විශාල වශයෙන් ගෙන එනවා.

අද උදෑසනත් මම දැක්කා, දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා මා පිළිබඳව ප්‍රකාශ කරමින්, "මට විරුද්ධව විනය පරීක්ෂණ නැද්ද" කියලා ඇහුවා. මට විනය පරීක්ෂණ තියන්න මම කරලා ඇති වරදක් නැහැ. හැබැයි, පසුගිය දවසක මෙතැනදී කියැවුණා, ඔහු ජනාධිපති අරමුදලින් මුදල් අරගත්තා කියලා. ඒ සම්බන්ධයෙන් විමර්ශනයක් යනවා. ඒ විමර්ශනයේදී එතුමා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරලා තිබෙනවා, හොරට හදපු බිල්. ඒ ගත්තු මුදලට වඩා වැඩි මුදලක් තමන්ට වැය වුණා කියලා, තමන් වැඩි වියදමක් දැරුවා කියලා හොර බිල් ඉදිරිපත් කරන අය මෙතැනට ඇවිල්ලා අනෙක් අය ගැන කථා කරනවා. තමන් සදාචාර සම්පන්න පුද්ගලයකු යැයි සිතාගෙන මෙතැනට ඇවිල්ලා අනෙක් අයට බොරු චෝදනා නඟනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ හැම එකක් පිළිබඳවම විමර්ශන සිද්ධ වෙනවා. මේවා පිළිබඳව මේ වෙලාවේ මම වැඩිදුර ප්‍රකාශ කරන්න කැමැති නැහැ. නමුත් සමහර අය හිතාගෙන ඉන්නවා, තමන්ගේ විමර්ශන අවසන් කියලා. එහෙම නැහැ.

මා මුලින් කිව්වා වාගේ මේ එකක්වත් දේශපාලනිකව නොවෙයි සිද්ධ වෙන්නේ. අපි පොලීසියට නිදහස දීලා තිබෙනවා, විමර්ශන ස්වාධීනව කරන්න වටපිටාව හදලා තිබෙනවා. අපි ඔවුන්ට අවශ්‍ය නායකත්වය ලබා දෙනවා. ගරු ජනාධිපතිතුමා මත් ද්‍රව්‍ය ව්‍යාපාරය මර්දනය සඳහා, එය පාලනය සඳහා "රටම එකට" ජාතික මෙහෙයුම් සභාවේ සභාපති හැටියට සිටිමින් නායකත්වය දෙනවා. එතුමාගේ නායකත්වය අතිශයින් වැදගත්. ඒ නිසා රජය හැටියට අපට පුළුවන් වෙලා තිබෙනවා, මේ රටේ සියලු රාජ්‍ය ආයතන, ත්‍රිවිධ හමුදාව, පොලීසිය ඒකාබද්ධ කරගෙන මේ යාන්ත්‍රණය දියත් කරන්න. ඒ වාගේම ඊයේ ජනාධිපතිතුමා මේ සභාවේ ප්‍රකාශ කළ පරිදි අල්ලස, දූෂණය, වංචාව, දේශපාලනය කියන සියල්ල ඒකාබද්ධවයි යන්නේ. ඒවාට එරෙහිව ක්‍රියාත්මක වන කොට ඒකට විරුද්ධව නැඟී සිටින්න කාටවත් හැකියාවක්

නැහැ කියලා තමයි අප විශ්වාස කරන්නේ. හැබැයි, විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු අද මෙතැන කිඹුල් කඳුළු හෙළනවා, එතුමන්ලාගේ කාලවල සිද්ධ වෙච්ච දේවල් එතුමන්ලාට අමතක වුණා සේ සලකා.

මා මෙතැනට එනවිට එක්තරා මන්ත්‍රීවරයෙක් කියමින් සිටියා, රට බංකොලොත් කරන්න අපි සම්බන්ධයි කියලා. ඔවුන් දන්නේ නැති වුණාට යහපාලන ආණ්ඩුව කාලයේ සජබ, යූඑන්පී එකට තමයි සිටියේ. වත්මන් විපක්ෂ නායකවරයා එදා ඇමති මණ්ඩලයේ සිටියා. ඒ කාලයේ තමයි ඉහළ පොලී අනුපාතයක් යටතේ ඇමෙරිකානු ඩොලර් බිලියන 12.5ක ණයක් අරගෙන තිබුණේ. ඒකත් එක හේතුවක් වුණා, මේ රට බංකොලොත් වෙන්න. කවුද රට බංකොලොත් කළේ කියලා ශ්‍රේෂ්ඨාධිකරණය තීන්දුවක් ප්‍රකාශයට පත් කර තිබෙනවා. හැබැයි, යහපාලන ආණ්ඩුව කාලයේ ගත්තු ඇමෙරිකානු ඩොලර් බිලියන 12.5ක වාණිජ ණය මුදලත් රටේ බංකොලොත්භාවයට යම් ප්‍රමාණයකට හේතු වුණා. නමුත්, ඔවුන් දැන් සුදනන් වාගේ කථා කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම තවත් කාරණා කිහිපයක් මෙතැනදී ඉදිරිපත් වුණා. ඒවාටත් කෙටියෙන් හෝ පිළිතුරු දෙන්න අවශ්‍යයි. අද උදය වරුවේ මෙතැනදී විශේෂයෙන් කියැවුණා, 2024දී මා ඇමතිවරයා හැටියට උපපොලිස් පරීක්ෂකවරුන් බඳවා ගැනීම නතර කළා කියලා. ඔව්, බඳවා ගැනීමට සූදානම් කර තිබුණු උපපොලිස් පරීක්ෂකවරුන් 100 බඳවා ගැනීම නතර කරන්න සිදු වුණා. මොකද, ඒ සම්බන්ධයෙන් පැමිණිලි 17ක් ආවා. ඒවා විමර්ශනය කළා. සමහර අය ශ්‍රේෂ්ඨාධිකරණයට ගිහිල්ලා නඩු දැම්මා. සමහර අය Bribery Commission එකට ගිහිල්ලා අපට විරුද්ධව පැමිණිලි කළා. ආපු පැමිණිලි 17න් කියැවුණේ 2024 අපි බලයට පත් වෙනකොට තෝරාගෙන තිබුණු කණ්ඩායමෙන් යම් ප්‍රමාණයක් අනීතික ලෙස තෝරාගෙන තිබෙනවා, සහතික නැතිව ලකුණු දීලා තිබෙනවා කියලායි. අපි ඒවා හොයන්න කමිටුවක් පත් කළා. ඒ කමිටුව එය ගැඹුරින් විමර්ශනය කරලා තීන්දුවක් දුන්නා, "අනීතික ලෙස තෝරා ගත්තු උපපොලිස් පරීක්ෂකවරු 19දෙනෙක් ඉන්නවා, ඒ අය සහතික නැතුව ලකුණු දීලා තෝරා ගත්තු අය" කියලා. ඒ අනුව අපි නැවත මුල සිට 2,500ක් දෙනා සම්මුඛ පරීක්ෂණයට භාජන කරලා නිවැරදි 100 තෝරා ගත්තා. අර මුලින් කියපු 19දෙනා ඉවත් වෙලා සාධාරණ ලෙස තවත් 19දෙනෙක් එකතු වුණා. ඒ වරද නිවැරදි කරලා දැන් 100 දෙනෙක් සාධාරණව බඳවාගෙන තිබෙනවා. ඒ අය දැන් PTS එකේ, එහෙම නැත්නම් පොලිස් විද්‍යාලයේ පුහුණුව ලබමින් ඉන්නවා. අපි නිවැරදිව ඒ කටයුතු කරමින් ඉන්නවා. එහෙම නැතුව ඔවුන් අධිකරණ ක්‍රියාමාර්ග ගැනීම නිසා හෝ මෙතැනට ඇවිල්ලා පාර්ලිමේන්තුවේදී මොනවා හරි කිව්වාට ඒකට යට වෙලා හෝ අපි කටයුතු කරන්නේ නැහැ. සාධාරණවත්, යුක්තිගරුකවත් තමයි ඒ හැම අවස්ථාවකම කටයුතු කරලා තිබෙන්නේ.

ජාතික ජන බලවේගය ආණ්ඩුව හැටියට අපට ඕනෑම සිද්ධියකදී පදනමක් තිබෙනවා. අප ඒ පදනම හදාගෙන තිබෙන්නේ මේ රටේ මහ ජනයාගේ පැතුම, එහෙම නැත්නම් ජනවරමේ හරය පදනම් කරගෙනයි. අපි ඒ අනුව කටයුතු කරමින් ඉන්නවා. නීතියේ ආධිපත්‍ය, සාධාරණත්වය, යුක්තිය ආදිය තමයි අපේ පදනම. ඒ අනුව අපි සෑම ක්ෂේත්‍රයකම වැඩ කටයුතු කරමින් ඉන්නවා. විපක්ෂය මොනවා කිව්වත් අපි සැලෙන්නේ නැහැ. විපක්ෂයට බිමේ ගිහිල්ලා ජනතාව එක්ක දේශපාලනය කරන්න බැරි වුණාම මෙතැන ඇවිල්ලා කෑ ගැහුවාට වැඩක් වෙන්නේ නැහැ. ඒකෙන් නිවැරදි දේශපාලනයක් සිදු වෙන්නේ නැහැ. ඒ හේතුවෙන් ඔවුන් තවතවත් බංකොලොත්භාවයටයි පත් වෙන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසන්, ගරු අමාත්‍යතුමනි.

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
මේ රටට ව්‍යසනයක් වෙලා තිබෙන මත්ද්‍රව්‍ය ජාවාරම, පාතාල ක්‍රියාකාරකම්, සංවිධානාත්මක අපරාධ මේ රටේ ජනතාව එක්ක එකතු වෙලා, ජනතාවගේ විශ්වාසය දිනා ගනිමින්, ජනතාවගේ සහයෝගය සහිතව මේ රටින් තුරන් කිරීම සඳහා අවශ්‍ය සියලු පියවර ගන්න සූදානම් කියන පණිවුඩය, ප්‍රතිඥාව මේ ගරු සභාවට ලබා දෙමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ෆස්මින් ෂරීෆ් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.56]

**ගරු ෆස්මින් ෂරීෆ් මහතා**
(மாண்புமிகு பஸ்மின் ஷரீப்)
(The Hon. Fasmin Sharif)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි.

ජාත්‍යන්තර මත්ද්‍රව්‍ය විරෝධී දිනය වන අද දිනයේ විෂ මත්ද්‍රව්‍ය ගැන කථා කිරීමට ලැබීම සතුටුයි. අපි මත්ද්‍රව්‍ය කියන දේ මේ ලෝකයෙන්ම තුරන් කරන්න ඕනෑ. ඒකට අවශ්‍ය වන වැඩ කටයුතු කරන්න අතිගරු ජනාධිපතිතුමාගේ මූලිකත්වයෙන්, අපේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු සියලුදෙනා එකතු වෙලා අඩිතාලම තබලා ඉවරයි. ඒ නිසා තමයි අපි අද සැහෙන්න මත්ද්‍රව්‍ය අල්ලන්නේ. ඔබතුමන්ලාත් දන්නවා, පසුගිය කාලයේ නිමල් ලාන්සා මත්ද්‍රව්‍ය එක්ක අහුවෙන කොට හිටපු ජනාධිපති කෙනෙක් හෙලිකොප්ටරයෙන් ගිහිල්ලා ඔහු බදා ගත්තා කියලා. ඒ වුණාට, මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් කවුරු හරි අත් අඩංගුවට ගත්තා නම් අපේ මන්ත්‍රීවරු, ඇමතිවරු, කවුරුවත් එයාව බේරගන්න මෙච්චර කල් පොලීසියට හෝ වෙනත් කාට හෝ කෝල් එකක්වත් දීලා නැහැ. අපට ඒක වගකීමෙන් කියන්න පුළුවන්.

මත්ද්‍රව්‍ය තුරන් කරන්න උදව් කරන එක අප සියලුදෙනාගේම වගකීමක්. අපි සියලුදෙනා ඒ සඳහා උදවු කරන්න ඕනෑ. ඒ වාගේම ආගමික නායකයෝ, ඉස්කෝලවල ඉන්න විදුහල්පතිවරු, රජයේ නිලධාරින් ඒකට උදව් කරන්න ඕනෑ. ඉස්සර කාලේ ආර්ථික වශයෙන් අඩු කට්ටිය තමයි මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වෙලා හිටියේ. අද එහෙම නොවෙයි. වැඩියෙන්ම මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වෙන්නේ හොඳට ඉගෙන ගත්තු, හොඳට සල්ලි තිබෙන පවුල්වල ළමයි. වතු ආශ්‍රිතවත් මත් ද්‍රව්‍ය ව්‍යාප්ත වෙලා තිබෙනවා. ඒවා ගැන විශේෂ අවධානය යොමු කරලා මත් ද්‍රව්‍ය උවදුර නැති කරන්න අපි සියලුදෙනා කැප වෙලා වැඩ කරන්න ඕනෑ.

මේ දවස්වල කතා වෙන තවත් ප්‍රශ්නයක් තමයි අපේ මුස්ලිම් සමාජයේ හජ් වන්දනාකරුවන් මුහුණ දෙන ගැටලු. ඒ ගැන විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරු හැම දාම වගේ කථා කරනවා. අපි මේ

[ගරු ෆයිස්මින් ෂරීෆ් මහතා]

අවුරුද්දේ National Hajj Act එකක් ඉදිරිපත් කරනවා. ඒ National Hajj Act එකෙන්, මුස්ලිම් ජනතාවට හජ් වන්දනාවට යෑමේදී තිබෙන සියලු ප්‍රශ්න විසඳනවා. මම අද උදේත් ගරු ඇමතිතුමා එක්ක ඒ ගැන කථා කළා. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, Muslim Religious and Cultural Affairs Department එකේ කණ්ඩායමක්, civil society එකේ කණ්ඩායමක් ඇතුළත් කමිටුවක් අපි පත් කරනවා. හජ් වන්දනාවේ යන අයට මොනවා හරි ප්‍රශ්න, ගැටලු තිබෙනවා නම් ඒ කමිටුව ඒවා සාකච්ඡා කරලා විසඳනවා.

ඒ වාගේම තව දෙයක් කියන්න ඕනෑ. මේ පාර හජ් වන්දනාවේ යන අයට වැසිකිළි - toilets - අඩුයි කියලා කිව්වා. අපි ඒක ඇත්තටම පිළිගන්නවා. මේක අද ඊයේ තිබෙන ප්‍රශ්නයක් නොවෙයි. හජ් වන්දනාවේ යන හැම කාලයකම, අවුරුදු ගණනාවක් තිස්සේ මේ ප්‍රශ්න තිබෙනවා. මේ ප්‍රශ්න ඒ කාලයේ විසඳුණේත් නැහැ. පසු කාලයේ විසඳුවේත් නැහැ. නමුත් මේ ප්‍රශ්න විසඳන්න අපේ රජය උපරිමයෙන් වැඩ කටයුතු කළා. අපේ නියෝජ්‍ය ඇමතිතුමා එතැනට ගිහින් උපරිමයෙන් ඒ කටයුතු කළා. දවසක් තමයි ඇත්තටම ඒ ප්‍රශ්න තිබුණේ. විරුද්ධ පක්ෂයේ සමහර කට්ටියත් සමහර mediaවල මේක ඕනෑය කියලා ප්‍රචාරය කළා. එහෙම නොවෙයි. ඇත්තටම පසුගිය අවුරුදුවල ජනතාව හජ් වන්දනාවේ ගියේ ලක්ෂ 20ක්-25ක් විතර දීලා. මෙවර සමහර කට්ටිය ලක්ෂ දහඅටහමාරක් දීලා ගිහින් තිබෙනවා. ඇත්තටම අපිට ලක්ෂ 20ට යවන්න පුළුවන් වුණා. ඒ වාගේම එතැන උපරිම පහසුකම් සලසන්නත් අපට හැකියාව ලැබුණා. ඉදිරි කාලයේදී ඒ වාගේ මොනවා හෝ ප්‍රශ්නයක්, අඩු පාඩුවක් වුණොත් අපි ඒවා අනිවාර්යයෙන්ම විසඳනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැනට පැය භාගයකට පමණ කලින් කථා කළ මුස්ලිම් මන්ත්‍රීවරයෙක් පාස්කු ප්‍රහාරය ගැන සඳහන් කරමින් මුස්ලිම් ජනතාව ගැන අනුකම්පාවෙන්, ආදරයෙන් කථා කළා. ඒ මන්ත්‍රීතුමා එදා ඇත්තටම හිටියේ අතාඋල්ලා ඇමතිතුමා සහ මහින්ද රාජපක්ෂ එක්ක. එතකොට ඒ මන්ත්‍රීතුමාට මුස්ලිම් ජනතාව ගැන ආදරයක් තිබුණාද, නැද්ද කියලා අපි දන්නේ නැහැ. එදා මහින්ද රාජපක්ෂ වෙනුවෙන් අත් දෙකම ඔසවමින්, මුස්ලිම් ජනතාවට ගහනකම් බලාගෙන හිටපු ඒ මන්ත්‍රීතුමා අද සුද්දවන්තයා වාගේ මුස්ලිම් ජනතාව ගැන කියමින් කඳුළු හෙළනවා. ඒ වාගේ බොරු සෝබන දමන්න එපා. මොකද, ඔයගොල්ලන් කරපු සියලු දේවල් අපි දන්නවා.

මේ දවස්වල මුස්ලිම් සමාජය කථා කරන තව කාරණයක් තිබෙනවා. ඒ තමයි සුරේෂ් සලේ මුස්ලිම්ද, දෙමළද, සිංහලද කියන කාරණය. සුරේෂ් සලේ කවුරු වුණත් අපට වැඩක් නැහැ. මිනිහා වැරදි කළා නම් අනිවාර්යයෙන්ම දඬුවම් දිය යුතුයි. ඔහු මුස්ලිම් හෝ මොන ජාතියක වුණත් අපට අදාළ නැහැ. ඒ වාගේම මුස්ලිම් සමාජය තුළ මේ දවස්වල කියන තව කාරණයක් තිබෙනවා. බේරුවල අපේ මුස්ලිම් සහ සිංහල ජාතීන් අතර ඒ දවස්වල ප්‍රශ්න ඇති වුණා. ඇත්තටම මේ වනවිට මුස්ලිම් ජනතාවට සිංහල ජනතාවත් එක්ක කිසිම ප්‍රශ්නයක් නැහැ. ඇත්තටම එවකට සිටි දේශපාලනඥයන්ට තිබුණු වුවමනාව, ඒ කියන්නේ ජාතීන් දෙක කොටවා තමන්ගේ ඡන්ද ගොඩ වැඩි කරගන්න එක තමයි මහින්ද රාජපක්ෂගේ පාලන කාලයේ කළේ.

ඒ කාලයේ බේරුවල ඇති වුණු ප්‍රශ්නය ගැන සුරේෂ් සලේ, අලි සබ්රි සහ lawyer හිජාස් හිස්බුල්ලා බේරුවල මොහිදීන් ජුම්මා පල්ලියේදී සාකච්ඡාවක් පවත්වා තිබෙනවා. ඒ අවස්ථාවේදී සුරේෂ් සලේ හිජාස් හිස්බුල්ලා එළවා තිබෙනවා. ඇත්තටම එතැන කුමන්ත්‍රණයක් වෙලා තිබෙනවා. ඒ කුමන්ත්‍රණය ගැනත් සුරේෂ් සලේගෙන් විමසන්න කියලා මම අපේ නියෝජ්‍ය ආරක්ෂක ඇමතිතුමාට කියනවා. මොකද, මුස්ලිම් සමාජය වෙනත් ජාතීන් එක්ක ගහගෙන, කොටාගෙන කවදාවත් රජයක් පිහිටුවන්නේ නැහැ. අපි සිංහල සහ දෙමළ ජනතාව සමඟ එකට ඉන්න කැමැති ජනතාවක්. අදත් මම දැක්කා, එක ස්වාමීන් වහන්සේ නමක් පවසනවා, සුරේෂ සලේ කියන්නේ මුස්ලිම් කෙනෙක් කියලා. ඇත්තටම අපිවත් ඒ ගැන දන්නේ නැහැ. අපට අදාළත් නැහැ. මේවා ගැනත් හොයන්න. මොකද, ඇතැම් අය ජාතීන් අතර සමඟිය නැති කරලා, තවත් ප්‍රශ්න ඇති කරන්න උත්සාහ කරනවා. ඒ නිසා ඒවා ගැනත් හොයන්න.

உண்மையாகவே நான் ஒரு விடயத்தைச் சொல்லிக்கொள்ள வேண்டும். ஹஜ் யாத்திரை ஒழுங்குகள் சம்பந்தமாக இன்றைக்கு கௌரவ பிரதி அமைச்சர் முனீர் அவர்கள்மீது பல குற்றச்சாட்டுகளை முன்வைக்கிறார்கள். இவர்கள் முன்னைய கால அரசாங்கங்களில் இருந்துகொண்டு ஹஜ்ஜாஜிகளுக்கு என்ன செய்தார்கள் என்பதை நாங்கள் விளங்கிக்கொள்ள வேண்டும். கிட்டத்தட்ட 25 இலட்சம் ரூபாய்வரை இருந்த ஹஜ் கட்டணம் இன்றைக்கு 20 இலட்சம் - 19 இலட்சம் - 18 இலட்சம்வரை குறைக்கப்பட்டிருப்பது உங்களுக்குத் தெரியும். அதேநேரம், toilet வசதி போன்ற ஒருசில பிரச்சினைகள் உண்மையிலேயே இருந்தது என்பதை நாங்கள் ஏற்றுக் கொள்கிறோம். அது சம்பந்தமாகப் பாராளுமன்ற உறுப்பினர்களாகிய நாங்களும், Hajj Committeeஉம், civil society உறுப்பினர்களும் கலந்துரையாடி, எதிர்வரும் காலங்களில் இந்தப் பிரச்சினைகளை நிவர்த்தி செய்வதற்கான ஓர் அமைப்பை ஏற்படுத்தித் தருவதாக கௌரவ அமைச்சர் அவர்கள் சொல்லியிருக்கிறார். அதேமாதிரி, Hajj யாத்திரை சம்பந்தமான Act ஒன்றும் இந்த வருடத்தில் தயாரிக்கப்படும்; அதன்மூலம் அது தொடர்பான பிரச்சினைகள் தீர்க்கப்படும். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු කේ. කාදර් මස්තාන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[பி.ப. 5.04]

**ගරු කේ. කාදර් මස්තාන් මහතා**
(மாண்புமிகு கே. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, போதைவஸ்து ஒழிப்பு சம்பந்தமான இன்றைய ஒத்திவைப்புப் பிரேரணைமீது பேசுவதற்கு எனக்கும் நேரம் ஒதுக்கித் தந்தமைக்காக நன்றியைத் தெரிவித்துக் கொள்கிறேன். மாண்புமிகு ஜனாதிபதி அவர்களின் தலைமையில் இயங்கும் இந்த அரசாங்கம் தேர்தல் காலங்களில் மக்களுக்குப் பல வாக்குறுதிகளை அளித்திருந்தது. அவற்றில் பல வாக்குறுதிகளை நிறைவேற்றுவதில் அரசு கவனமெடுத்துச் செயற்படுகின்றது. குறிப்பாக, போதைவஸ்து ஒழிப்பு, 'ஈஸ்டர்' தாக்குதலின் பிரதான சூத்திரதாரிகளை அடையாளப்படுத்தல் போன்ற செயற்பாடுகள் மிகவும் நேர்த்தியாகவும் நேர்மையாகவும் நடைபெறுகின்றன என்பது என்னுடைய நிலைப்பாடாகும். அந்த வகையில், இந்த அரசாங்கத்தின் போதைவஸ்து ஒழிப்புக்கான அனைத்து வகையான செயற்பாடுகளுக்கும் என்னுடைய ஆதரவை நான் இங்கு தெரிவித்துக் கொள்கிறேன். போதைவஸ்து ஒழிப்பாக

இருக்கலாம், 'ஈஸ்டர்' தாக்குதலின் பிரதான சூத்திரதாரிகளை அடையாளம் காண்பதிலாக இருக்கலாம், இவற்றுக்கு முயற்சி எடுக்கும் இந்த அரசாங்கத்துக்கும் அதற்குத் தலைமைதாங்கும் மாண்புமிகு ஜனாதிபதி அவர்களுக்கும் பொலிஸ்மா அதிபர் மற்றும் ஏனைய பாதுகாப்புத் தரப்பினர் அனைவருக்கும் அவர்களது சிறப்பான பணிக்காக எனது பாராட்டுக்களையும் வாழ்த்துகளையும் நன்றியையும் இந்த இடத்தில் தெரிவித்துக் கொள்கிறேன்.

இங்கு பொதுமக்கள் பாதுகாப்பு அமைச்சர் அவர்கள் இருக்கின்றவேளையில் அவரிடம் ஒரு விடயத்தைச் சொல்லிக்கொள்ள விரும்புகின்றேன். மன்னார், முசலிப் பகுதிகளில் இப்பொழுது புதிதாக மறுபடியும் உலமாக்களை விசாரணைக்காக CIDஇற்கு வருமாறு அழைக்கின்றனர். 'ஜும்ஆ பிரசங்கம்' என்பது மக்களுக்கு நல்ல அறிவுரைகளை, மார்க்க விடயங்களைக் கூறுவதற்குரிய ஒரு களம். அத்தகைய களங்களுக்கு உலமா சபையினர் உலமாக்களை அனுப்புவதைப் பற்றி பிழையாக யாரோ காட்டிக் கொடுத்திருப்பதுதான் அதற்குக் காரணம். உங்களுக்குத் தெரியும், 'ஈஸ்டர்' தாக்குதலின் பின்னர் தேவையற்ற காட்டிக்கொடுப்புகளால் கைது பண்ணப்பட்ட கிட்டத்தட்ட இரண்டாயிரம் பேர் எந்தக் குற்றச்சாட்டும் இல்லாமல் இறுதியில் விடுவிக்கப்பட்டார்கள் என்பது. அத்தகைய ஒரு சூழ்ச்சி தற்பொழுது முசலிப் பகுதிகளில் நடைபெறுகின்றது. நீங்கள் பொலிஸ் திணைக்களத்துக்குப் பொறுப்பான அமைச்சர் என்ற அடிப்படையில், அவ்வாறான பிழையான தகவல்களுக்கு அடிபணிந்து எமது உலமாக்களுக்குப் பிரச்சினை கொடுப்பதற்குரிய ஏற்பாடுகளைச் செய்யாமல், ஒழுங்காக, நீதியாக இதனைச் செயற்படுத்த வேண்டுமென இந்த நேரத்தில் கேட்டுக் கொள்கின்றேன்.

இன்று அரிசி இறக்குமதி செய்யப்பட்டிருப்பது பாரிய பிரச்சினையாகி இருக்கிறது. அதனால் உண்மையில் எமது விவசாயிகள் பாரிய பாதிப்புக்குள்ளாகி இருக்கின்றார்கள். அதற்குப் பல காரணங்கள் சொல்லப்பட்டாலும், கீரி சம்பாவிற்குப் பதிலாக பால் பொன்னி அரிசியை மட்டும் இறக்குமதி செய்திருந்தால் பரவாயில்லை. அவ்வாறில்லாமல், ஏனைய பொன்னி அரிசி வகைகளையும் சிவப்பு நாடு, வெள்ளை நாடு என ஏனைய அனைத்து வகை அரிசிகளையும் இறக்குமதி செய்ததால் எமது விவசாயிகளின் அரிசி விற்பனையில் பாரிய பாதிப்பு ஏற்பட்டிருக்கின்றது. அந்த வகையில், பெரும்போகத்தில் உற்பத்தி செய்யப்பட்ட நெல்லை இன்னும் விற்பனை செய்ய முடியாமல் இருக்கின்றனர். சிறுபோக அறுவடையும் இப்போது நடைபெறுகின்றது. எனவே, இவ்வாறான பிழையான நடவடிக்கைகளைக் கையாள வேண்டாமென இந்த அரசாங்கத்தின் வரவு செலவுத் திட்டத்தை ஆதரித்தவன் என்ற வகையில், அரசாங்கத்திடம் நான் கேட்டுக் கொள்கிறேன்.

அண்மையில் நான் அம்பாறை மாவட்டத்திற்குச் சென்றிருந்தேன். தூர இடங்களிலிருந்து அங்குள்ள கல்முனை, அக்கரைப்பற்று, அம்பாறை போன்ற பகுதிகளுக்கு பஸ்கள் வருகின்றபோதும், அங்கு ஓர் இலட்சத்துக்கும் மேற்பட்ட மக்கள் வாழும் சம்மாந்துறை வரை செல்வதில்லை என்பதை அப்போது அறிந்தேன். எனவே, தூர இடங்களிலிருந்து அந்தப் பகுதிகளுக்குப் பிரயாணம் செய்கின்றவர்களுக்கு வசதியாக அந்த பஸ்களை சம்மாந்துறை வரை நீடிக்கக்கூடியதாக ஏற்பாடு செய்து கொடுக்கும் வகையில் கௌரவ போக்குவரத்து அமைச்சர் அவர்கள் இந்த விடயத்தில் கவனஞ்செலுத்த வேண்டும் என்ற வேண்டுகோளையும் விடுக்கிறேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, அண்மையில் இந்த உயரிய சபையில் அம்பாறை மாவட்டப் பாராளுமன்ற உறுப்பினர் ஒருவர் என்மீது முன்வைத்த விமர்சனங்களையும் அவர் பயன்படுத்திய தரங்குறைந்த வார்த்தைகளையும் நான் மிகுந்த அவதானத்துடன் கவனித்தேன். ஒரு மக்கள் பிரதிநிதி, சபையின் கண்ணியத்தைக் கருத்திற்கொண்டு பேசவேண்டிய இடத்தில், தனிநபர் காழ்ப்புணர்ச்சியை வெளிப்படுத்தியது துரதிருஷ்டவசமானது. தாராபுரத்தில் உள்ள பலநோக்குக் கட்டிடம் மற்றும் காணி கொள்முதல் தொடர்பான விவகாரங்கள் தொடர்பில் வினா எழுப்பியதற்காக என்மீது வீணான பழிகளைச் சுமத்தி எனக்கு அவப்பெயரை ஏற்படுத்துவதாகவே அவருடைய செயற்பாடுகள் இருக்கின்றன. உண்மையில், நேருக்குநேர் பிரச்சினைகளை எதிர்கொள்ளத் திராணியற்றவர்கள் அபாண்டங்களைச் சுமத்துவதையும், அதன் பின்னால் மறைந்துகொள்வதையும் வழக்கமாகக் கொண்டுள்ளனர். அந்த அடிப்படையில், என்னை 'முஸ்லிம் பெயர் தாங்கி' என்றும், 'விஷமி' என்றும் அவர் வர்ணித்திருக்கிறார். இனம், மதம் கடந்து இந்த நாட்டுக்காகவும், நாட்டு மக்களுக்காகவும் சேவை செய்வதை நான் எனது கடமையாகக் கருதுகிறேன். வன்மத்தையும், காழ்ப்புணர்ச்சியையும் மட்டுமே அரசியலாகக் கொண்டிருப்பவர்களுக்கு, சுயநலமற்ற அரசியலைப் புரிந்துகொள்வது கடினம் என்பது எனக்குத் தெரியும். தனிப்பட்ட தாக்குதல்களைவிடவும், மக்களுக்குச் செய்த சேவைகளே ஒரு MPயின் உண்மையான அடையாளம். அந்த அடையாளத்தை மக்கள் அழகாக அறிவார்கள்.

குற்றச்சாட்டுக்கள் முன்வைக்கப்பட்டால், அதற்கான ஆதாரங்களைச் சபையில் சமர்ப்பிக்கத் தயாராக இருக்க வேண்டும். ஆதாரமற்ற வார்த்தைகளால் எனது நற்பெயருக்குக் களங்கம் விளைவிக்க நினைப்பது தவறு. இத்தகைய ஆரோக்கியமற்ற விவாதங்களுக்குத் தகுந்த பதிலை மக்களே எதிர்காலங்களில் வழங்குவார்கள். குறிப்பாக, நாங்கள் ஊழலுக்கு எதிராகக் கதைத்தால் சிலருக்குத் தாங்க முடியாமல் இருக்கின்றது. தங்களுடைய தலைவர்களைப் பாதுகாக்க, அந்தத் தலைவர்களிடம் நல்ல பெயர் எடுப்பதற்காக, நாங்கள் சொல்வதில் உள்ள உண்மைத் தன்மைகளை அறியாமல் இவ்வாறான குற்றச்சாட்டுக்களை அவர்கள் முன்வைப்பது உண்மையில் மிகவும் மனவருத்தத்துக்குரிய விடயம் என்பதை இங்கு கூறிக்கொள்கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
*අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.*

**ගරු කේ. කාදර් මස්තාන් මහතා**
(மாண்புமிகு கே. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)
இன்னும் ஒரு நிமிடம் தாருங்கள், முக்கியமான விடயம் தொடர்பில் கூற வேண்டும்.

வவுனியா மாநகர சபையில் இடம்பெற்ற பாரிய ஊழல் மற்றும் நிதி மோசடி நடவடிக்கைகளில் சம்பந்தப்பட்ட முதல்வர் அவர்களை கௌரவ ஆளுநர் அவர்கள் பதவி நீக்கம் செய்தமைக்கு எனது நன்றிகளைத் தெரிவித்துக் கொள்கின்றேன். ஏற்கனவே நான் இங்கு கூறியதுபோல், இன்று ஊழலுக்கு எதிராக நடவடிக்கை எடுக்கும்போது, எதிர்க்கட்சியில் இருக்கும் சிலருக்கு அது பிடிப்பதில்லை. அந்த அடிப்படையில் என்னென்னவோ கதைக்கின்றார்கள். அங்கு

[ගරු කේ. කාදර් මස්තාන් මහතා]

நடைபெற்ற ஊழல் நிரூபிக்கப்பட்டிருக்கின்றது. வவுனியா மாநகர சபையில் இடம்பெற்ற ஊழல் சம்பந்தமாக CLGஆல் விசாரிக்கப்பட்டு, அது உண்மையென்று ஆளுநருக்கு அறிக்கை சமர்ப்பிக்கப்பட்டு, அதன் பிறகு ஆளுநர் ஓய்வுபெற்ற நீதிபதி ஒருவரை நியமித்து, மேலதிக விசாரணையை நடத்தி, அந்தக் குற்றச்சாட்டுக்கள் நிரூபிக்கப்பட்டமைக்கு அமைய அவர் பதவி நீக்கம் செய்யப்பட்டிருக்கின்றார். இவ்வாறே முன்னாள் வட மாகாண முதலமைச்சர் சி.வி. விக்கினேஸ்வரன் ஐயா அவர்களும் ஊழல் செய்த ஒருவரைப் பதவி நீக்கம் செய்துள்ளார்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
තවත් කාලය ලබා දෙන්න බැහැ, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු කේ. කාදර් මස්තාන් මහතා**
(மாண்புமிகு கே. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)
இன்னும் முப்பது வினாடிகள் தாருங்கள்!

அதேபோல, முன்னாள் ஆளுநராக இருந்த திருமதி சாள்ஸ் அம்மா அவர்களும் பதவி நீக்கம் செய்துள்ளார். இப்போது தென்பகுதியில் பல ஊழல்வாதிகள் அப்புறப்படுத்தப்பட்டு இருக்கின்றார்கள். இவ்வாறிருக்க, ஊழலுக்கு எதிராக ஆளுநர் அவர்கள் எடுத்த நடவடிக்கைக்காக அவருக்குச் சேறுபூசும் விடயத்தை நாங்கள் வன்மையாகக் கண்டிக்கின்றோம். ஊழல் செய்தவர்கள் தண்டிக்கப்பட வேண்டும். இவ்விடயத்தில் கௌரவ ஆளுநர் அவர்கள் எடுத்த முடிவு சரி என்பதை இந்தச் சபைக்குத் தெரிவித்து, வீணாக அவருக்குச் சேறு பூச வேண்டாம் என்று கேட்டுக்கொள்ள விரும்புகின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු තිලංක යූ. ගමගේ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හතක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.11]

**ගරු තිලංක යූ. ගමගේ මහතා**
(மாண்புமிகு திலங்க யூ. கமகே)
(The Hon. Thilanka U. Gamage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විෂ මත් ද්‍රව්‍ය මුලිනුපුටා දැමීම සහ පාතාලය සම්බන්ධයෙන් අද පැවැත්වෙන මේ විවාදයට සහභාගි වීමට අවස්ථාව ලබා දීම වෙනුවෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

මත් ද්‍රව්‍ය භාවිතය සහ නීති විරෝධී මත් ද්‍රව්‍ය ජාවාරමට එරෙහි ජාත්‍යන්තර දිනය යෙදිලා තිබෙන අද දවසේ අපේ ගරු මන්ත්‍රීතුමිය විසින් ඉදිරිපත් කළ ඉතාම වැදගත් යෝජනාව පිළිබඳව තමයි අපි මේ විවාදය කරනු ලබන්නේ. මේ යෝජනාව ගැන කථා කරගෙන යද්දී විපක්ෂයේ හැම කෙනෙක් තුළින්ම මහ අඥෝනාවක් තමයි ගොඩක් වෙලාවට නැඟුණේ. මීට කලින් කථා කළ ගරු මන්ත්‍රීතුමා නම් අපි ආණ්ඩුවක් විධියට කරන මේ වැඩේ පිළිබඳව ඉතාම සාධනීය ලෙස හොඳ දැක්මකින් යුතුව කථා කළා. අපි ඒ මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා.

අපි දන්නවා, විෂ මත් ද්‍රව්‍ය සහ පාතාලය කියන දෙක වෙන්ව පැවතුණේ නැහැ කියලා. එහෙම නැත්නම් හුදෙකලාව මේ එකක්වත් සංවිධානය වුණේ නැහැ. අපි දන්නා විධියට විෂ මත් ද්‍රව්‍ය -කුඩු, අයිස් වැනි මත් ද්‍රව්‍ය- භාවිතයත් එක්ක තමයි පාතාලය ගැට ගැහිලා තිබෙන්නේ. ඉතිහාසයේ ඉඳන්ම දේශපාලන රැකවරණයත් එක්ක තමයි මේ හැම එකක්ම ගැටගැහිලා තිබුණේ. එහෙම නැතිව මේ එකක්වත් හුදෙකලාව සංවිධානය වෙලා මේ දක්වා වැඩි දියුණු වෙලා නැහැ. ඉතිහාසය පුරා කාලයෙන් කාලයට එක් ආණ්ඩුවක් ඉවත් වෙලා තවත් ආණ්ඩුවක් බලයට එනකොට ඔවුන් වෙනම පාතාලයක් හදාගන්නවා. එවකට පැවැති පාතාලය යම් විධියකින් අකර්මණ්‍ය කරලා ඔවුන්ට හිතවත් පාතාලයක් හදාගන්නවා. එමඟින් ඔවුන්ගේ දේශපාලන බලය, ඔවුන්ට අවශ්‍ය පරිදි ඔවුන්ගේ යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය බලය හැම තැනකම පතුරවා ගෙන තමයි හිටියේ. ඔවුන්ට බලය පතුරවාගෙන සිටීම සඳහා අවශ්‍ය ඕනෑම දෙයක් කරගෙන යන්න කුඩා කණ්ඩායමකට, කල්ලියකට අවස්ථාව ලබා දුන්නා. ඒකත් එක්ක මුළුමහත් සමාජයක් විනාශ කරන්න ඔවුන් විෂ මත් ද්‍රව්‍ය භාවිත කළා. ඔවුන් විශාල මුදල් ප්‍රමාණයක් මේ හරහා ගොඩ ගහගත්තා. අපේ ගම්වල දුප්පත් අහිංසක අම්මා තාත්තාගේ දරුවන්ට මේවා පාවිච්චි කරන්න අවස්ථාව හදලා දීලා, මේවාට ඇබ්බැහි කරවලා, අද වෙනකොට ඔවුන් නන්නත්තාර වෙලා තිබෙනවා; ඔවුන්ගේ ජීවිත අහිමි වෙලා තිබෙනවා; ඔවුන්ගේ පවුල් සම්පූර්ණයෙන්ම කඩා වැටිලා තිබෙනවා. සමහර පවුල්වල දරුවන්ට අධ්‍යාපනය අහිමි වෙලා තිබෙනවා. ඔවුන්ට ඉතාම බරපතළ ඛේදජනක තත්ත්වයක් උරුම වෙලා තිබෙනවා.

මෙවැනි තත්ත්වයක් තුළ තමයි අපේ ගරු ජනාධිපතිතුමා "රටම එකට" ජාතික ව්‍යාපාරය ගොඩනඟලා මේ රටින් විෂ මත් ද්‍රව්‍ය තුරන් කිරීම සඳහා වැඩ පිළිවෙළක් සකස් කරන්නේ. ඒ වෙනුවෙන් අපි ජාතික කමිටුවක් හදලා, ඉන් පසුව දිස්ත්‍රික් කමිටු, ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු, මහජන ආරක්ෂක කමිටු දක්වා පුළුල් යාන්ත්‍රණයක් හදලා ඒකත් එක්ක බද්ධ වෙච්ච තවත් අනුකමිටු රාශියක් ගොඩ නඟලා තිබෙනවා. අද වනවිට හැම තැනම පොලිස් ස්ථානාධිපතිවරුන්ගෙන් පවා ඇහෙන දෙයක් තිබෙනවා. පොලිස් ස්ථානාධිපතිවරු මහජන ආරක්ෂක කමිටුවල, වෙනත් පොදු උත්සව අවස්ථාවල කියන දෙයක් තිබෙනවා. "වෙන දා කවුරු හරි කෙනෙක් ඇල්ලුවාම ඔහු නිදහස් කරන්න කියලා ඒ ආසනයේ මන්ත්‍රීවරයාගෙන් call එනවා, හැබැයි මේ වනවිට කිසිදු මන්ත්‍රීවරයකුගෙන් එහෙම බලපෑම් එන්නේ නැහැ" කියලා ඒ අය කියනවා. නිදහස් කරන්න කියන එක වෙනුවට මත් ද්‍රව්‍ය ඉතා ඉක්මනින් රට තුළින් ඉවත් කිරීම සඳහා කරන බලපෑම තමයි හැම තැනින්ම එන්නේ කියනවා.

පසුගිය අවුරුද්දක වාගේ කාලය ඇතුළත මේ ගත්ත වෑයමේ ප්‍රතිඵල අද වෙනකොට ටික ටික බිම් මට්ටමට ඇවිල්ලා තිබෙනවා. අද මේ රටට මත් ද්‍රව්‍ය ගෙන්වන්නේ ටොන් ගණන්වලින්. වෙන දා මත් ද්‍රව්‍ය ගැන කථා කළේ ග්‍රෑම් ගණන්වලින්. අද මත් ද්‍රව්‍ය ටොන් ගණන්වලින් අහුවෙන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. අපි ඒවා ටිකෙන් ටික මේ සමාජයෙන් තුරන් කරන්න කටයුතු කරනවා. මේ පොර බැදීම තව අවුරුදු දෙකක් තුනක් කරනකොට විෂ මත් ද්‍රව්‍යවලින් තොර රටක්, පාතාලය, වංචාව, හොරකම, දූෂණය යනාදියෙන් තොර රටක් අපි ගොඩ නඟනවා කියලා අපට සහතික වශයෙන්ම කියන්න පුළුවන්. ඒ වෙනුවෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නවාය කියන එක මා මේ වෙලාවේ කියන්න ඕනෑ.

අපි දන්නවා, හැම දාම ඔවුන් නඩත්තු කළ බව. අපි දන්නවා, සොත්ති උපාලි, ගෝනවල සුනිල්, බැද්දගානේ සංජීව, ජුලම්පිටියේ අමරේ, වම්බොට්ටා, මාකඳුරේ මධුෂ්, හරක් කටා වාගේ දැවැන්ත පාතාල අපරාධකරුවන් විශාල වශයෙන් මේ රටට කරපු හානිය. ඔවුන් සියලු දේශපාලන පක්ෂ නායකත්වය එක්ක ගැටගැහිලා තිබුණේ. පසුගිය දවස්වල අපි දැක්කා, හිටපු අධිකරණ අමාත්‍ය විජේදාස රාජපක්ෂගේ පුතා රවිත රාජපක්ෂ, ඒ වාගේම සමගි ජන බලවේගයේ හොරණ ආසන සංවිධායක වරිත්

අබේසිංහ අත්අඩංගුවට ගත් ආකාරය. දැන් කිඹුල් කඳුළු හෙළනවා, පක්ෂය ඇතුළේ ගන්න ඕනෑ විනය ක්‍රියාමාර්ග ගන්නවා කියලා. හැබැයි අපි දන්නවා, ඔවුන් එක්ක කාලයක් පුරාවට මේ සම්බන්ධතා පවත්වා තිබෙනවා කියලා. ඔවුන් එහෙම අයථා විධියට තමයි මුදල් උපයා ගන්නේ. අද වනකොට ඔවුන් මහ විහිළුවක් බවට පත් වෙලා තිබෙනවා. ඇත්තටම මේක විහිළුවක් කියන්නේ මේ නිසායි.

සාමාන්‍යයෙන් අපි දැකපු දෙයක් තිබුණා. අපරාධ, විෂ මත්ද්‍රව්‍ය මැඩලීම සඳහා අපි කරන මේ විශාල කාර්යභාරය තුළ වෙන දා නම් දැක්කේ ඒවාට එරෙහිව ක්‍රියාත්මක වන එක. ඒ වෙනුවට අද ඔවුන් අපරාධවලට යොමු වෙච්ච අයගෙනුත් කප්පම් ගන්න තත්ත්වයට පත් වෙලා තිබෙනවා. අද ඒ අයගෙන් කප්පම් ගන්න, ඒ අය නඩත්තු කරන පක්ෂ බවට මේ පක්ෂ පත් වෙලා තිබෙනවා. දැන් ඔවුන්ගේ අඳෝනාව, ඒ මුහුණු තුළින් අපට දක්නට ලැබෙනවා. හෙට දවසේ මේකට ගොදුරු වෙන්නේ කවුද කියන එක ගැන ඔවුන් බියෙන් ඉන්නේ. මොකද, දැන් නීතිය ක්‍රියාත්මක වනවා. කාටවත් නීතියෙන් පැනලා යන්න බැහැ. ස්වාධීන නීති ක්‍රමයක්, ස්වාධීන අධිකරණ පද්ධතියක් ඇතුළු සියලු දේවල් අපි ස්ථාපිත කරලා ඉවරයි. ඒ නිසා අපට පැහැදිලියි, ඔවුන්ට දැන් මේකෙන් ගැලවෙන්න කිසිසේත්ම ඉඩක් ඇත්තේ නැහැ කියන එක. ඒ නිසා අපට නිශ්චිතව කියන්න පුළුවන්, හෙට දවසේ මේ සියලු අපරාධ මේ රටින් තුරන් කරන්න පුළුවන් කියලා.

ඒ අපරාධකරුවන් නම ඉස්සරහට යම් යම් වචන දාගෙනයි තිබුණේ. විශේෂයෙන්ම ඔවුන් නම ඉස්සරහට ඒ වචන දාගෙන ඒවායෙන් තමයි ආමන්ත්‍රණය කළේ. අපි දැකපු දේ තමයි, දුමින්ද, ලාන්සා වැනි අය නම ඉස්සරහට "කුඩු" කියන වචනය දාගෙන සිටි බව. මේවා ලෙහෙසි පහසු දේවල් නොවෙයි. එහෙම රටක් අපි මේ සුද්ධ කරන්නේ. වංචා, දූෂණවලට අහු වෙලා පොලීසියෙන් අල්ලාගෙන ගිහිල්ලා අත්අඩංගුවට ගන්නකොට, ඔවුන් ජනතාවට මාංචු පෙන්නුවේ හරි උජාරුවෙන්. ඔවුන් ජනතාවට පෙන්නුවේ ඔවුන් ඇතුළට ගියාට නැවත ඉක්මනින් එළියට එනවා කියන එකයි. එහෙමයි ඔවුන් ඇතුළට ගියේ.

හැබැයි, අද ඒ හැමදෙනාගේම මුහුණුවල හැටි බලන්න. අද ඔවුන් බය වෙලා තිබෙනවා. ඔවුන් බයවෙන්න ඕනෑ. අපි දඬුවම් කරන්නේ නැත්නම්, අපි මේ නීතිය හරියට ක්‍රියාත්මක කරන්නේ නැත්නම්, මේ අපාරාධවලට, වංචාවලට එරෙහිව හරියට කටයුතු කරන්නේ නැත්නම් වෙන කවුද කරන්නේ? ඒක තමයි අපේ කාර්යභාරය. ඒක තමයි මේ රටේ ජනතාව අපට ලබා දුන් ජන වරම. ඒ නිසා අපි මේ වෙනුවෙන් කටයුතු කරනවා කියන එක පැහැදිලිව කියනවා. අපි තව අවුරුදු දෙකක්, තුනක් ඇතුළත මේ රට සහමුලින්ම සුද්ධ කරලා දරුවන්ට හොඳ රටක්, සතුටින් ජීවත් වෙන්න පුළුවන් රටක් නිර්මාණය කරනවා කියන එක මතක් කරමින් මා නිහඬ වනවා.

බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ක්‍රිශාන්ත අබේසේන අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.19]

**ගරු (මහාචාර්ය) ක්‍රිශාන්ත අබේසේන මහතා (විද්‍යා හා තාක්ෂණ අමාත්‍යතුමා)**
(மாண்புமிகு (பேராசிரியர்) கிரிஷாந்த அபேசேன - விஞ்ஞான மற்றும் தொழில்நுட்ப அமைச்சர்)
(The Hon. (Prof.) Chrishantha Abeysena - Minister of Science and Technology)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි අද කථා කරන්නේ විෂ මත්ද්‍රව්‍ය උවදුර පිළිබඳවයි. හැබැයි ප්‍රධාන විපක්ෂය ගත්තොත්, අද ඒගොල්ලන් කථා කළේ ඒ පිළිබඳව නොවෙයි. නිකම් මුමුණමින් කියනවා, විෂ මත්ද්‍රව්‍ය කිව්වාමත් ඒගොල්ලන්ට මතක් වෙන්නේ 87-89 කාලය කියලා. ඒකෙන්ම පෙනෙනවා, ඒගොල්ලන් අද කොයිතරම් බංකොලොත් වෙලා තිබෙනවාද කියලා. ඒ වාගේම අපේ රටේ මිනිස්සු බොහෝදෙනෙක් හිතාගෙන හිටියා, විෂ මත්ද්‍රව්‍ය ගැන කථා කරද්දී මේකට සම්බන්ධ වෙන්නේ අනෙක් පැත්තේ - පොහොට්ටුවේ - හිටපු අය කියලා. හැබැයි ඊයේ-පෙරේදා අපට ඔප්පු වුණා, සමගි ජන බලවේගයත් ඒ අතරම ඉන්නවා කියාත්, අනෙක් කාණ්ඩයට වඩා ඒක දෙවැනි නැහැ කියාත්.

ඒ වාගේම ජනාධිපතිතුමා අපට කිව්වා, පසුගිය කාලයේ ඒ මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් දේශපාලන පක්ෂ පවා හදමින් ඉන්නවා කියලා. අපි හිතුවා, ඔවුන් අලුත් දේශපාලන පක්ෂ හදාගෙන එළියට එන්න හදනවා කියලා. හැබැයි දැන් අපට අවිශ්වාසයක් තිබෙනවා, සමගි ජන බලවේගය කියන පක්ෂයත් මේකට රිංගලාද කියලා. ඖෂධ ජාවාරම්කාරයෝ, විෂ මත්ද්‍රව්‍ය විකුණන මුදලාලිලා ඒකට ගිහිල්ලා තිබෙනවා. ඔවුන් අලුත් දේශපාලන පක්ෂයක් හදාගෙන කියලා අපි හිතුවාට සමගි ජන බලවේගයත් ඒකට ගිහිල්ලා නම් සමගි ජන බලවේගයට කියන්න වෙන්නේ "මත්ද්‍රව්‍ය බලවේගය" කියලායි. අන්න ඒ තත්ත්වයට ඔවුන් අද පැමිණ තිබෙනවා.

මත්ද්‍රව්‍ය ගැන කථා කරද්දී දේශපාලනඥයෝ, පාතාලකරුවෝ, ව්‍යාපාරිකයෝ ඇතුළු ඔක්කෝගෙම ලොකු ජාලයක් මේ වෙලාවේ ඇති වෙලා තිබෙනවා. මේක එසේ මෙසේ දෙයක් නොවෙයි. කොයිතරම්ද කිව්වොත්, හිටපු පොලිස්පති බලන්න. එහෙම නේද? ඔහුත් මේකට සම්බන්ධයි. හිතාගන්න පුළුවන්ද, මේ ජාවාරම මේ සමාජය තුළ කොයිතරම් දුරට පැලපදියම් වෙලා තිබෙනවාද කියලා. ඒ නිසා තමයි අපි 2026-2030 කියලා උපාය මාර්ගික සැලැස්මක් හැදුවේ. ඒ සැලැස්ම තුළ කණු, එහෙම නැත්නම් strategic directions 8ක් තිබෙනවා. අපි මේකට අදාළ වන සියලු කාරණාවලට ඒ කණු 8 තුළ වැඩ පිළිවෙළක් හදලා තිබෙනවා, දිස්ත්‍රික්ක මට්ටමින් වාගේම ජාතික මට්ටමින්. ඒ දිස්ත්‍රික්ක මට්ටමේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීමට ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් වැඩ පිළිවෙළක් අපි හදාගෙන යනවා. මේ වැඩ පිළිවෙළට රජයේ ආයතන වන අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය, පුනරුත්ථාපන කාර්යාංශය මෙන්ම සෞඛ්‍ය අංශ සම්බන්ධ කර ගන්නවා.

රට ඇතුළට විෂ මත්ද්‍රව්‍ය ඇතුළු වීම අපි වළක්වන්න ඕනෑ. අපේ රජය බලයට ආ පසු ඒ සඳහා ලොකු ක්‍රියාමාර්ගයක් ගත්තා. මේ වෙද්දී විෂ මත්ද්‍රව්‍ය කිලෝග්‍රෑම් 10,000කට වඩා අල්ලා තිබෙනවා. ඒ වාගේම පෙති ගත්තොත්, ලක්ෂ 80කට වඩා අපි අල්ලා ගෙන තිබෙනවා. හිටපු පොලිස්පති දේශබන්දුගේ නිලධාරින් තමයි අපි බලයට එද්දී හිටියේ. ඒ පොලිස් නිලධාරින් එක්ක තමයි අපි වැඩ කළේ. අපේ අමාත්‍ය ගරු ආනන්ද විජේපාල මැතිතුමාගේ නායකත්වයෙන්, වර්තමාන පොලිස්පතිතුමාගේ නායකත්වයෙන් අපි මේ කටයුතු ක්‍රියාත්මක කරමින් යනවා. ඒ නිසා තමයි අපට හැකියාව ලැබුණේ මේ විධියට විෂ මත්ද්‍රව්‍ය අත්අඩංගුවට ගන්න.

ඒ වාගේම අපි කියන්න ඕනෑ, මේ වැඩ පිළිවෙළ තුළ මත්ද්‍රව්‍ය සොයා ගැනීම විතරක් ප්‍රමාණවත් නැහැ කියන එක. අද වනකොට අපේ රටේ ලක්ෂ ගණනක් වූ තරුණ තරුණියෝ මේවාට ඇබ්බැහි වෙලා ඉන්නවා. ඒ නිසා අපට අවශ්‍ය වනවා, ඒ අය හඳුනා ගන්න. ඒ හඳුනා ගැනීමේ වැඩ පිළිවෙළ සෞඛ්‍ය අංශ මඟින් තමයි කරන්නේ. ඒ සඳහා වැඩ පිළිවෙළක් යෝජනා වෙලා තිබෙනවා. අපි දැනටමත් ඒ අය හඳුනා ගැනීමට විශේෂ සායන ක්‍රියාත්මක කරමින් පවතිනවා. ඒ වාගේම ඒ අයට ලබා දිය හැකි ඖෂධ වෙනම තිබෙනවා. මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වෙච්ච අයට ඒ ඖෂධ ලබා දෙන්න අවශ්‍ය වැඩ පිළිවෙළක් අපි ක්‍රියාත්මක කරනවා.

ඒ වාගේම මේකත් එක්ක පුනරුත්ථාපනයත් ක්‍රියාත්මක වනවා. පුනරුත්ථාපනය ගත්තොත්, මධ්‍ය කාලීන පුනරුත්ථාපනය, දීර්ඝ කාලීන පුනරුත්ථාපනය කියලා එක එක

[ගරු (මහාචාර්ය) ක්‍රිෂාන්ත අබේසේන මහතා]

මට්ටමේ පුනරුත්ථාපන වැඩ පිළිවෙළ තිබෙනවා. ඒ පුනරුත්ථාපන වැඩ පිළිවෙළ සෞඛ්‍ය අංශත්, ආරක්ෂක අංශත් එකතු වෙලා පොදු වැඩ පිළිවෙළක් හැටියට ගෙනියන්න අවශ්‍ය ක්‍රියාමාර්ග අපි ක්‍රියාත්මක කරනවා. උදාහරණයක් විධියට අපේ ගම්පහ දිස්ත්‍රික්කය ගත්තොත්, කටුනායක පැත්තේ වෙනම පුනරුත්ථාපන මධ්‍යස්ථානයක් හදන්න අපි plan කරලා තිබෙනවා. අපට අවශ්‍ය වන්නේ නැහැ, අපේ දරුවන් කන්දකාඩුම යවන්න. අපට අවශ්‍ය වනවා, ඒ පළාතේම පුනරුත්ථාපන මධ්‍යස්ථානයක් ඉදිකරලා, ඒවායේ ප්‍රමිතිය වැඩි කරලා, හොඳ වැඩ පිළිවෙළක් යටතේ අපේ දරුවන්, ඒ තරුණ තරුණියන් නැවතත් මතට ඇබ්බැහි නොවන විධියට පුනරුත්ථාපනය කරන්න. ඒක තමයි සාර්ථක වන්නේ.

ඊට අමතරව අපි දන්නවා, පාසල්, පල්ලි, පන්සල් එකතු කරගෙනත් මත්ද්‍රව්‍ය භාවිතය වැළැක්වීමේ වැඩසටහන් ක්‍රියාත්මක වන බව. ඒ වාගේ ලොකු වැඩසටහනක් මේ වන විටත් අපි දියත් කරමින් ඉන්නවා. ඒ වාගේම ගරු ඇමතිතුමා කිව්වා, මේ වැඩ පිළිවෙළ එක්ක නීතිය ක්‍රියාත්මක කරනවා කියලා. මේ සම්බන්ධව අපි අලුත් නීති හැදුවා. මත්ද්‍රව්‍ය මඟින් අයුතු විධියට සල්ලි එකතු කරලා තිබෙනවා නම් ඒ සම්බන්ධයෙන් අපි නීති හදලා තිබෙනවා. 2030 වෙද්දි සාමාන්‍ය - හොඳ - රටක් හැදෙයි කියලා අපි බලාපොරොත්තු වනවා, අපේ මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක වීම තුළ.

මම මෙතැන ඉඳන් වෙනත් කරුණක් සඳහා, එනම් අධ්‍යාපනය වෙනුවෙන් වෙලාව ටිකක් ගන්නවා. මම මේ කථා කරන්නේ කතෝලික අධ්‍යාපනය ගැන විතරක්ම නොවෙයි. කතෝලික, බෞද්ධ, හින්දු, මුස්ලිම් කියන හැමෝටම බලපාන අධ්‍යාපනය ගැනයි මම කථා කරන්නේ. අපි දන්නවා, අපේ රටේ බොහෝ අධ්‍යාපන ආයතන තිබෙනවා කියලා.

අපි ආගම ගත්තොත්, ආගම හැමෝටම පෞද්ගලිකයි. අපේ රටේ සිටින බහුතරයක් බෞද්ධාගමිකයන්. බෞද්ධ පරිසරය තුළ, ත්‍රිපිටකය තුළින් ඔවුන්ගේ හැදියාව, ඔවුන්ගේ චරිතය, ඔවුන් ජීවත් වන වටපිටාව හැදිලා තිබෙනවා. ඒ වාගේම මුස්ලිම් අය ගත්තොත්, කුරානය තුළින් තමයි ඔවුන්ගේ පරිසරය හැදිලා තිබෙන්නේ. හින්දු ආගමිකයන් ගත්තොත්, භගවත් ගීතාව ඇතුළේ ඒ ආගම එක්ක තමයි ඔවුන්ගේ ජීවිතය හැඩ ගස්වාගෙන තිබෙන්නේ. ඒ වාගේම කතෝලික ක්‍රිස්තියානි අය ගත්තොත් - මමත් කතෝලික - බයිබලය තුළින් තමයි අපි අපේ ජීවිත හැඩ ගස්වාගෙන තිබෙන්නේ. හැමෝටම ආගමක් තිබෙනවා. හැමෝම විශ්වාස කරන දේවල් තිබෙනවා. සමහර වෙලාවට සමහර ආගමික ස්ථානවලින් අන්තවාදය දැක ගන්න පුළුවන්. සමහර වෙලාවට අපි හිතනවා, අපි තමයි නිවැරදිම කියලා; ඒක තමයි පරම සත්‍ය - absolute truth - කියලා අපි හිතනවා. එහෙම හැමෝම හිතනකොට තමයි ප්‍රශ්න ඇති වෙන්නේ. හැමෝටම තමන්ගේ ආගම සත්‍යයි. ඒ ගැන කිසි ප්‍රශ්නයක් නැහැ.

රජයේ පාසල් තිබෙනවා. ඒ වාගේම රජයට පවරා ගත්ත පාසල් තිබෙනවා. එමෙන්ම පෞද්ගලික පාසල් තිබෙනවා, ආගම් මට්ටමින් පවත්වා ගෙන යන. ඒ ගැන මම කථා කරන්නේ නැහැ. අධ්‍යාපනය කියන්නේ අයිතියක්. ඒ අධ්‍යාපන අයිතිය පිළිබඳව එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ 26වන වගන්තියේ සඳහන් වනවා. ඒ වාගේම ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තියේ 14වන වගන්තියේ ඒ පිළිබඳව සඳහන් වනවා. එමෙන්ම International Covenant on Civil and Political Rightsහි, Article 18වල තිබෙනවා, අධ්‍යාපන අයිතිය පිළිබඳව. වෙනස්කොට සැලකීමක් - discrimination - නැතිව හැමෝටම ආගම ඉගෙන ගැනීමේ අයිතිය තිබෙන්න ඕනෑ. ඒ වාගේම ආගම ඇදහීමේ අයිතියක් තිබෙන්නත් ඕනෑ. එම නිසා මම ඒ ගැන ප්‍රශ්න කරනවා. ඉතිහාසය ගත්තොත්, රජයේ පාසල්වල එවැනි දෙයක් තිබුණේ නැහැ. ඒක හදා ගත යුතු දෙයක් කියලා අපි හිතනවා.

ඒ වාගේම රජයට පවරා ගත් පාසල් තිබෙනවා. එලෙස රජයට පවරා ගත් පාසල් තිබෙන්නේ පනත් දෙකක් යටතේ. එක පනතක් තමයි, 1960 අංක 05 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (විශේෂ විධිවිධාන) පනත. අනෙක් පනත තමයි, 1961 අංක 08 දරන උපකෘත පාඨශාලා සහ අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනත. මේ පනත් යටතේ තමයි පාසල් රජයට පවරා ගෙන තිබෙන්නේ. හැම ආගමකම පාසල් පවරා ගෙන තිබෙනවා. විශේෂයෙන් වැඩිපුරම පවරා ගෙන තිබෙන්නේ බෞද්ධාගමික පාසල්. ඊට පස්සේ ක්‍රිස්තියානි ආගමික පාසල්. ඊළඟට හින්දු ආගමික පාසල්. ඒ වාගේ හැම ආගමකම පාසල් පවරා ගෙන තිබෙනවා. ඒ අනුව පාසල් 2,635ක් රජයට පවරා ගෙන තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට ලැබී ඇති කාලය අවසානයි, ගරු අමාත්‍යතුමනි.

**ගරු (මහාචාර්ය) ක්‍රිෂාන්ත අබේසේන මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) கிரிஷாந்த அபேசேன)
(The Hon. (Prof.) Chrishantha Abeysena)
මට තව විනාඩි දෙකක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

1961 අංක 8 දරන උපකෘත පාඨශාලා සහ අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනතේ වගන්ති කීපයක් මට highlight කරන්න ඕනෑ. එම පනතේ 7වන වගන්තියේ තිබෙනවා, "පවරා ගත් දේපළ ඒවායේ මුල් අයිතිකරුවන්ගේ ආගමික වත් පිළිවෙත් සඳහා භාවිත කළ හැකි බව සහ වෙනත් ආගමිකයන්ගේ වත් පිළිවෙත් සඳහා භාවිත නොකළ හැකි බව" කියලා. ඒ පනතේ තවත් වගන්තියක තිබෙනවා, "පවරා ගත් දේපළ පාසලේ අවශ්‍යතාව සඳහා භාවිත නොවන අවස්ථාවලදී ඒවායේ මුල් අයිතිකරුවන්ගේ අවශ්‍යතා සඳහා භාවිත කළ හැකි බව" කියලා. එහි 10වන වගන්තියේ තිබෙනවා, "පවරා ගත් දේපළක් ඒවායේ මුල් අයිතිකරුවන් භාවිත කළ අදහස සඳහා පමණක් භාවිත කළ යුතු බව" කියලා. මේවායේ මුල් හිමිකම තිබෙන්නේ ඒ ආගමික සංස්ථාවට, මොන ආගමක වුවත්. මම ආගම් වාදයක් පිළිබඳව නොවෙයි කථා කරන්නේ. මම හැම ආගමකම අයිතිවාසිකම් වෙනුවෙන් කථා කරනවා. කතෝලිකද, හින්දුද, මුස්ලිම්ද, බෞද්ධද කියන එක මට වැඩක් නැහැ. බෞද්ධ අයගේ අයිතිවාසිකමක් කොහේ හෝ කඩ වෙනවා නම් මම එතැනත් ඉන්නවා. ආගම් වාදයක් ගැන නොවෙයි අපි කථා කරන්නේ.

මේ Act එකේම තිබෙනවා, රජයට පවරා ගත්ත දවසේ තිබෙන සංයුතිය තමයි තිබෙන්න ඕනෑ කියලා. මම මේ ගැන කථා කරන්නේ මෙකයි. සාමාන්‍යයෙන් මේ ආගමික පාසල් තිබෙන්නේ එක්කෝ ආගමික සිද්ධස්ථානයක් ළඟ. පන්සලක් ළඟ තිබෙන පාසලක වෙනත් ආගමකට අදාළ පිළිමයක් තිබුණොත් ඒක සදාචාර විරෝධීයි නේ. ඒ වාගේම පල්ලියක් ළඟ තිබෙන පාසලක වෙනත් ආගමකට අදාළ පිළිමයක් තිබුණොත් ඒක සදාචාර විරෝධීයි නේ. ඒ නිසා අපට නීතිය මඟින් විතරක් මේවා හදන්න බැහැ. අපි ඒ සංස්කෘතික පැත්තත් බලන්න වෙනවා. ආගමික පාසල් ගත්තාමත් අපි කියන්නේ "එක රටක් - එක නීතියක්" කියලා. අපි කියලා නැහැ, එක නීතිය, එක රට, එක ආගම, එක ජාතිය කියලා. එහෙම අපි කොහේදීවත් කියලා නැහැ. මම මේ කාරණයත් කියන්න කැමතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. පොහොසත් රටක් ලස්සන ජීවිතයක් කියන තැන සියලු ජාතිකත්ව සහ ආගමික කණ්ඩායම්වල ආරක්ෂාව සහ අන්‍යෝන්‍ය අවබෝධය, විශ්වාසය සහ අයිතිවාසිකම් අපි ආරක්ෂා කරනවා කියලා තිබෙනවා. ඒක තමයි අපට සංහිඳියාවට අවශ්‍ය වෙන්නේ.

ඒ වාගේම රාජ්‍ය සේවය ගත්තොත් අපි කියලා තිබෙනවා, "කුසලතා මත පත්වීම් සහ උසස්වීම සඳහා කුසලතා" කියලා. ඒක ඇත්ත. එහෙම දමන්න හේතුව අපේ හිටපු විපක්ෂය දේශපාලන පත්වීම් කළ නිසායි. එහි තේරුම ඒකයි. අපි ඒකයි කුසලතා මත තමයි පත්වීම් සහ උසස්වීම් දෙන්නේ කියලා කියා තිබෙන්නේ. නමුත්, ඒකෙන් අදහස් වෙන්නේ නැහැ, සංස්කෘතිය අමතක කරනවා කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නායකකන්ද යහපත් එඬේරාගේ කන්‍යාරාම බාලිකා පාසලට විදුහල්පතිනියක් පත් වෙලා තිබෙනවා. අවුරුදු 99ක් එම පාසල පවත්වාගෙන ගියේ ගරු කන්‍යා සොහොයුරියන් යටතේ. නමුත්, ඒ පාසලට වෙන විදුහල්පතිවරියක් පත් වෙලා තිබෙනවා. Grade III එකට අයත් විදුහල්පතිතුමියක් තමයි පත් වෙලා තිබෙන්නේ. නමුත් ඒ පාසලේ Grade II කාණ්ඩයේ විදුහල්පතිවරියක් තමයි ඉන්න ඕනෑ. එතැන එවැනි ප්‍රශ්නයකුත් තිබෙනවා. නමුත් දේශපාලන ව්‍යාපාරයක් හැටියට අපි කිසිම ආගමකට, ජාතියකට විශේෂයක් කරලා නැහැ. අපි එහෙම නැහැ. අපි හැමෝටම නිසි තැන දෙනවා. අපි හැමෝටම ගරු කරනවා. හැබැයි, අපේ රාජ්‍ය සේවය ගත්තොත් එවැනි දෙයක් වෙනවාද කියන ප්‍රශ්නය තිබෙනවා. ඒ නිසා තමයි මෙවැනි ප්‍රශ්න ඇති වෙන්නේ. අපි මේ වැඩ කරන්නේ දේශපාලනය හරහා ඡන්ද ගන්න නොවෙයි. අපි එදා ඉඳන් නිදහස් අධ්‍යාපනය, නිදහස් සෞඛ්‍ය සහ සමාජ සාධාරණත්වය ගැන කථා කළා. මම මේ දේවල් ආලා හෙට ගෙදර ගියත් මට රස්සාවක් කරන්න පුළුවන්. ඒ ගැන කිසිම ප්‍රශ්නයක් නැහැ. හැබැයි, විපක්ෂය කියන විධියට අපට එහෙම ප්‍රශ්න නොවෙයි තිබෙන්නේ. නමුත්, විපක්ෂය එතැනට ඇවිල්ලා ඒවා කඩාකප්පල් කළා. ඔවුන් එතැනට ඇවිල්ලා ඒ පාසල පිළිබඳව කථා කළේ නැහැ. ඒ අය ඇවිල්ලා මට විරුද්ධවයි කථා කළේ. ඒකෙන් වුණේ මොකක්ද? ඒ ව්‍යාපාරය අඩපණ කරන්න ඒගොල්ලන් පැහැදිලිවම කටයුතු කළා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට ලැබී ඇති කාලය අවසානයි, ගරු ඇමතිතුමනි.

**ගරු (මහාචාර්ය) ක්‍රිෂාන්ත අබේසේන මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) கிரிஷாந்த அபேசேன)
(The Hon. (Prof.) Chrishantha Abeysena)
මට තව තත්පර කිහිපයක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අවසාන වශයෙන් මම ධම්මපදයේ සඳහන් ගාථාවක තේරුමක් කියලාම මගේ කථාව අවසන් කරන්නම්. මම මේක කියන්නේ අපේ දේශපාලන ව්‍යාපාරය වෙනුවෙන්.

"සිදුරු නැති මහා පර්වතයක් සුළඟින් නොසැලෙන්නාක් මෙන්, නුවණැතියන් නින්දා, ප්‍රශංසා දෙකේදීම නොසැලෙති."

මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

***එකල්හි වේලාව අ.භා. 5.30 වූයෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***
***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, 2026 ජූලි 07වන අඟහරුවාදා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේ ය.***

*அப்பொழுது, பி.ப. 5.30 மணியாகிவிடவே மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*அதன்படி பாராளுமன்றம், 2026 யூலை 07, செவ்வாய்க்கிழமை மு.ப. 9.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*It being 5.30 p.m., THE HON. PRESIDING MEMBER adjourned Parliament without Question put.*
*Parliament adjourned accordingly until 9.30 a.m. on Tuesday, 07th July, 2026.*

# ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු
## வினாக்களுக்கு எழுத்துமூல விடைகள்
## WRITTEN ANSWERS TO QUESTIONS

ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා විසින් අසන ලද, අද දින න්‍යාය පත්‍රයේ සඳහන් 1වන ප්‍රශ්නයට - 893/2025 - පිළිතුර දීමට කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා සති තුනක කාලයක් ඉල්ලා ඇත.

மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ் அவர்களால் கேட்கப்பட்ட இன்றைய ஒழுங்குப் பத்திரத்திலுள்ள 1ஆம் இலக்க வினாவுக்கு - 893/2025 - விடையளிப்பதற்கு, கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சர் மாண்புமிகு கே.டீ. லால் காந்த அவர்கள் மூன்று வார கால அவகாசம் கோரியுள்ளார்.

The Hon. K.D. Lal Kantha, Minister of Agriculture, Livestock, Land and Irrigation, has requested for three weeks' time to reply to Question No. 01 - 893/2025 - raised by the Hon. (Dr.) M.L.A.M. Hizbullah appearing in today's Order Paper.

ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා විසින් අසන ලද, අද දින න්‍යාය පත්‍රයේ සඳහන් 2වන ප්‍රශ්නයට - 894/2025 - පිළිතුර දීමට කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා සති තුනක කාලයක් ඉල්ලා ඇත.

மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ் அவர்களால் கேட்கப்பட்ட இன்றைய ஒழுங்குப் பத்திரத்திலுள்ள 2ஆம் இலக்க வினாவுக்கு - 894/2025 - விடையளிப்பதற்கு, கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சர் மாண்புமிகு கே.டீ. லால் காந்த அவர்கள் மூன்று வார கால அவகாசம் கோரியுள்ளார்.

The Hon. K.D. Lal Kantha, Minister of Agriculture, Livestock, Land and Irrigation, has requested for three weeks' time to reply to Question No. 02 - 894/2025 - raised by the Hon. (Dr.) M.L.A.M. Hizbullah appearing in today's Order Paper.

ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා විසින් අසන ලද, අද දින න්‍යාය පත්‍රයේ සඳහන් 3වන ප්‍රශ්නයට - 895/2025 - පිළිතුර දීමට කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා සති තුනක කාලයක් ඉල්ලා ඇත.

மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ் அவர்களால் கேட்கப்பட்ட இன்றைய ஒழுங்குப் பத்திரத்திலுள்ள 3ஆம் இலக்க வினாவுக்கு - 895/2025 - விடையளிப்பதற்கு, கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சர் மாண்புமிகு கே.டீ. லால் காந்த அவர்கள் மூன்று வார கால அவகாசம் கோரியுள்ளார்.

The Hon. K.D. Lal Kantha, Minister of Agriculture, Livestock, Land and Irrigation, has requested for three weeks' time to reply to Question No. 03 - 895/2025 - raised by the Hon. (Dr.) M.L.A.M. Hizbullah appearing in today's Order Paper.

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

හැන්සාඩ් වාර්තා
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි**
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්**
**මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්**
**බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.